324 වන කාණ්ඩය - 07 වන කලාපය
தொகுதி 324 - இல. 07
Volume 324 - No. 07

2026 ජනවාරි 22 වන බ්‍රහස්පතින්දා
2026 சனவரி 22, வியாழக்கிழமை
Thursday, 22nd January, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තීරුව 1153]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 1155]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1157-1206]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
සේවක අර්ථසාධක අරමුදලේ පාරිතෝෂිකය විශ්‍රාම වැටුප් ක්‍රමයකට පරිවර්තනය කිරීම පිළිබඳ පුවත් වාර්තා [ තීරුව 1206]

**මුලතිව්-සිලාවත්ත ප්‍රදේශයේ කුගනේෂන් ඩිනෝජා දැරියගේ මරණය:**
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1208]

**වරප්‍රසාද යෝජනා:**
මාධ්‍ය තුළ ව්‍යාජ ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීම [තීරුව 1211]

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
යූඑන්වී පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු ඉම්රාන් මහරූෆ් මහතා] - පළමුවන වර කියවන ලදී [තීරුව 1211]

**කල් තැබීමේ යෝජනාව:**
පූර්ණ අධ්‍යාපන පරිවර්තනීය ක්‍රියාවලිය සඳහා සහාය [තීරු 1213-1334]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
பாராளுமன்ற ஓய்வூதியம் (நீக்குதல்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 1153]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 1155]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1157-1206]

**தனி அறிவித்தல் மூல வினா:**
ஊழியர் சேமலாப நிதியத்தின் பணிக்கொடையை ஓய்வூதியத் திட்டத்துக்கு மாற்றுதல் தொடர்பான செய்தி அறிக்கைகள் [ப: 1206]

**முல்லைத்தீவு, சிலாவத்தைப் பகுதியைச் சேர்ந்த குகனேசன் டினோஜா என்ற சிறுமியின் இறப்பு:**
சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று [ப: 1208]

**சிறப்புரிமைப் பிரேரணைகள்:**
ஊடகங்களில் உண்மைக்குப் புறம்பான செய்திகளைப் பரப்புதல் [ப: 1211]

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
யூஎன்வி மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு இம்ரான் மஹ்ரூப்] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1211]

**ஒத்திவைப்புப் பிரேரணை:**
விரிவான கல்வி மறுசீரமைப்புச் செயன்முறைக்கான ஆதரவு [ப: 1213-1334]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Parliamentary Pensions (Repeal) Bill: Petition to the Supreme Court [Col. 1153]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1155]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1157-1206]

QUESTION BY PRIVATE NOTICE:
News Reports on Conversion of Employees' Provident Fund Gratuity into a Pension Scheme [Col. 1206]

DEATH OF GIRL NAMED KUGANESHAN DINOJA FROM SILAWATTA, MULLAITIVU:
Statement by Hon. Minister of Health and Mass Media [Col. 1208]

PRIVILEGE MOTIONS:
Dissemination of Fake News on Media [Col. 1211]

PRIVATE MEMBERS' BILLS:
UnV Foundation (Incorporation) - [The Hon. Imran Maharoof] - Read the First time [Col. 1211]

ADJOURNMENT MOTION:
Support for Comprehensive Educational Transformation Process [Cols. 1213-1334]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2026 ජනවාරි 22වන බ්‍රහස්පතින්දා*
*2026 சனவரி 22, வியாழக்கிழமை*
*Thursday, 22nd January, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m., MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
### பாராளுமன்ற ஓய்வூதியம் (நீக்குதல்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
### PARLIAMENTARY PENSIONS (REPEAL) BILL: PETITION TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 ජනවාරි 20 සහ 21 දෙදින මාගේ නිවේදනයන්හි සඳහන් පෙත්සම් හතරට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව "පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Hon. Speaker, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මොකක්ද point of Order එක, ගරු කාරියප්පර් මන්ත්‍රීතුමා?

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

පෙරේදා මා විසින් ඉදිරිපත් කරන ලද රීති ප්‍රශ්නයට, Standing Order No. 92.(2)(c) යටතේ ඔබතුමාගේ නියෝගය ලබා දෙනවා කියලා මට කිව්වා. Sir, it is about the Constitutional Council. The Ruling is ready, I am told, and the Hon. Speaker is supposed to deliver the Ruling on the vacancies in the Constitutional Council, which have not been filled. When I raised it, the Chair informed me that the Hon. Speaker will give the Ruling at the first available opportunity under Standing Order No. 92.(2)(c).

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, until the new members are appointed, there is no violation of the Constitution.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Yes, as per Article 41F of the Constitution, it will continue. That is right; that is a good guidance.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන්, ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය නමැති පනත් කෙටුම්පත 2025.11.26 දින පාර්ලිමේන්තුවට පිළිගන්වා, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 50(2) විධිවිධාන ප්‍රකාරව, ආර්ථික සංවර්ධන සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදුව, එකී කාරක සභාව විසින් මෙම පනත් කෙටුම්පත යථා පරිදි සලකා බැලීමෙන් අනතුරුව එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබීම යෝග්‍ය බවට නිර්දේශ කර ඇති බැවින්, එම ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය නමැති පනත් කෙටුම්පත සභාවේ අවසරය ඇතිව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත ද යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 හා 2024 වර්ෂ සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා සහ වාර්ෂික ගිණුම්;

(ii) 2021/2022, 2022/2023 හා 2023/2024 වර්ෂ සඳහා සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තා;

(iii) 2023 හා 2024 වර්ෂ සඳහා සමුපකාර සේවක කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(iv) 2023 හා 2024 වර්ෂ සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(v) 2021 හා 2022 වර්ෂ සඳහා ලංකා සතොස ලිමිටඩ්හි වාර්ෂික වාර්තා;

(vi) 2023 හා 2024 වර්ෂ සඳහා වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(vii) 2022 වර්ෂය සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(viii) 2022 වර්ෂය සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ix) 2021 හා 2022 වර්ෂ සඳහා ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ වාර්ෂික වාර්තා හා ගිණුම්

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, මට තත්පර කිහිපයක් දෙන්න.

ආංශික අධීක්ෂණ කාරක සභාවල පරණ වාර්තා ටික තමයි ඇත්තටම මේ අනුමත කර එවන්නේ. මේවායේ ලොකු වැඩ කොටසක් තිබෙනවා. මේ සම්බන්ධව කථා කරන්න ගොඩක් දේවල් තිබෙනවා. මොකද, පරණ වාර්තාවල ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ආංශික අධීක්ෂණ කාරක සභා සඳහා නිලධාරීන් වාගේම තොරතුරු ඒක රාශි කරගන්න කණ්ඩායම් අවශ්‍යයි. ඔබතුමාට පුළුවන්, ඒ සඳහා පහසුකම් සපයන්න. මම මේ කාරණය කියන්නේ, එකකට නොවෙයි, කාරක සභා සියල්ලටම අදාළවයි. මම සභාපතිත්වය දරන කාරක සභාව ගැන විතරක් නොවෙයි, සියලුම කාරක සභා ගැනයි මම මේ කියන්නේ. මේකෙන් විශාල සහයෝගයක් ලැබෙන්නේ, ආණ්ඩුවට. මේ සඳහා පහසුකම් වැඩිපුර සපයන්න හැකි නම් ඒක ඉතාම වැදගත්, මේ පාර්ලිමේන්තුවේ අපි කරන කටයුතුවලට.

බොහොම ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, ආංශික අධීක්ෂණ කාරක සභාවක සභාපතිතුමා වශයෙන් ඔබතුමා ඉදිරිපත් කරපු කාරණය සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂය විධියට අපි සම්පූර්ණයෙන්ම එකඟ වනවා.

මේ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා විධියට ඔබතුමාට අනික් කාරක සභා සභාපතිවරු එක්කත් කථා කරලා මේ කාරණය නිශ්චිත යෝජනාවක් ලෙසම ඉදිරිපත් කරන්න පුළුවන් නම්, අපි Parliamentary Business Committee එකේදී යෝජනා කරන්නම්, ඒ සම්බන්ධයෙන් පැය තුනක විතර කල් තැබීමේ විවාදයක් හෝ විශේෂ විවාදයක් පවත්වමු කියලා. ඒ අනුව, මේ විගණන වාර්තා දිගු කාලීනව ප්‍රමාද වීම සම්බන්ධව මන්ත්‍රීවරුන්ගේ සහ සභාපතිවරුන්ගේ අදහස් උදහස් අරගනිමු. ඒ වාගේ දෙයක් කරලා, අපි මේක ඉස්සරහට ගනිමු. ඇත්තටම 2021, 2022 වාගේ පරණ වාර්තා අනුමත කරන්න සිදු වීම ජනතාවට කරන වැරැද්දක්.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

ගරු කථානායකතුමනි, පිළියන්දල, හොන්නන්තර උතුර, ජයන්ති උයන, අංක 232/19 යන ලිපිනයෙහි පදිංචි එම්.එම්. ඩිංගිරි බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
ගරු කථානායකතුමනි, පොළොන්නරුව, නව නගරය, මහසෙන් පෙදෙස, 3 වන පටුමඟ, අංක 54/1 යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්.එස්.ඩී. දසනායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුරංග රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
ගරු කථානායකතුමනි, ඉපලෝගම, ගන්තිරියාගම, අංක 62 යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්.යූ.යූ.ආර්. රාජකරුණා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)
Hon. Speaker, I present a petition from Mr. W. M. Sarath Nandasiri Bandara of Weerasola, Bakmeewewa, Ambanpola.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS\

### රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රෝහල්: විස්තර
### திருகோணமலை மாவட்டத்தில் நிரல் அமைச்சின் கீழுள்ள வைத்தியசாலைகள்: விபரம்
### HOSPITALS IN TRINCOMALEE DISTRICT UNDER LINE MINISTRY: DETAILS

1116/2025

**1. ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) රේඛීය අමාත්‍යාංශය විසින් පාලනය කරනු ලබන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති රජයේ රෝහල් කවරේද;
(ii) ත්‍රිකුණාමලය මූලික රෝහල සංවර්ධනය කිරීම සඳහා සකස් කර ඇති සැලසුම් කවරේද;
(iii) කාර්යක්ෂම සේවයක් සැපයීමට බාධාවක් වී ඇති බවට හඳුනාගෙන ඇති කන්තලේ රෝහලේ පවතින ගැටලු කවරේද;
(iv) එම ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நிரல் அமைச்சினால் நிருவகிக்கப்படுகின்ற திருகோணமலை மாவட்டத்திலுள்ள அரச வைத்தியசாலைகள் யாவை;
(ii) திருகோணமலை ஆதார வைத்தியசாலையை அபிவிருத்தி செய்வதற்காகத் தயாரிக்கப்பட்டுள்ள திட்டங்கள் யாவை;
(iii) வினைத்திறன்மிக்க சேவையை வழங்கும்பொருட்டு கந்தளாய் வைத்தியசாலையில் தடையாக உள்ளதென இனங்காணப்பட்டுள்ள சிக்கல்கள் யாவை;
(iv) மேற்படி சிக்கல்களைத் தீர்த்துவைப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -
(i) government hospitals in Trincomalee District that are administrated by the Line Ministry;
(ii) plans prepared for the development of the Trincomalee Base Hospital;
(iii) issues identified at the Kantale Hospital as those hindering the delivery of an efficient service; and
(iv) measures that will be taken to resolve the issues?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) රේඛීය අමාත්‍යාංශය විසින් පාලනය කරන රෝහල් දෙකක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තිබෙනවා. ඒ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහල සහ කන්තලේ මූලික රෝහල.
(ii) ගරු කථානායකතුමනි, ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහල කියන්නේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට සහ නැඟෙනහිර පළාතට තිබෙන ඉතාම වැදගත් රෝහලක් බව ඔබතුමාත් දන්නවා. අපි JICA ව්‍යාපෘතිය යටතේ තට්ටු 8ක හෘදය රෝග ඒකකයක් ඉදිකිරීම සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහල තෝරාගෙන තිබෙනවා. එය රුපියල් මිලියන 2,300ක් වැය වන ව්‍යාපෘතියක්. දැනට මෙහි ප්‍රසම්පාදන කටයුතු තිබෙන්නේ අවසන් අදියරේ. ඒ අනුව ඉදිකිරීම් කටයුතු මැයි මාසයේදී ආරම්භ කරන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඇත්තටම මේක මීට කලින් හදලා අවසන් කරලා මේ වනවිට වැඩ කටයුතු පටන් ගන්න තිබුණු හෘදය රෝග ඒකකයක්. නමුත්, ඔබතුමා දන්නවා, JICA ව්‍යාපෘතිවලට සිදු වුණු දේ. ඒ අනුව නතර වුණු ව්‍යාපෘතියක් හැටියට තමයි මේක තිබෙන්නේ. ඒ කටයුතු අපි නැවත ආරම්භ කරනවා.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

මීට අමතරව, JICA ව්‍යාපෘතියක් යටතේම අපට ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහල සඳහා මලාපවහන පද්ධතිය අලුත් කරන්න පුළුවන්කම ලැබුණා. එහි ඉදිකිරීම් කටයුතු මේ වසරේදී අපි අවසන් කරනවා. අපි පසුගිය සැප්තැම්බර් මාසයේදී අලුත් incinerator එකක් ලබා දුන්නා. විශේෂයෙන්ම ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලට විතරක් නොවෙයි, අවට රෝහල්වල සායනික අපද්‍රව්‍ය දහනය සඳහාත් මේක වැදගත් වනවා.

ඒ වාගේම දැනට තිබෙන තට්ටු 3ක වාට්ටු ගොඩනැඟිල්ලක ඉතුරු තට්ටු 2ක සම්පූර්ණ කරමින් පවතිනවා. එයට තවත් විශාල අඩුපාඩුවක් තිබුණා. Mortuary coolers 8ක් ලබා දෙනවා. දැනට ඒ tender එක award කරලා තිබෙන්නේ. ඒ වාගේම A&E building එකක් අපි ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලට ලබා දෙනවා. එහි ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරලා තිබෙන්නේ. ඒක තට්ටු 3ක ගොඩනැඟිල්ලක්. ඒ තට්ටු 3 ගොඩනැඟිල්ල සඳහා රුපියල් මිලියන 1,000ක් වැය කරනවා. අපි බලාපොරොත්තු වෙනවා, 2026 වසරේ අග හෝ උපරිම වශයෙන් ගත්තොත් 2027 ජනවාරි වනකොට A&E - Accident and Emergency - building එකේ කටයුතු අවසන් කරන්නට. මේ ව්‍යාපෘතිවලට අමතරව මේ වනවිටත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලේ අලුත්වැඩියා කටයුතු සඳහා විශාල මුදල් ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා. ඒ කටයුතු බොහෝ ප්‍රමාණයක් පසුගිය අවුරුද්දේ අවසන් වුණා.

(iii) දැනට අනුමත කාර්ය මණ්ඩලය විටින් විට සපයා ගෙන යනවා, අපි බඳවා ගන්නා ආකාරය අනුව. ඒ වාගේම එහි මතු වී තිබෙන සෞඛ්‍ය කාර්ය සහායකයින්ගේ ප්‍රශ්නයට තවත් සති කිහිපයක් යනකොට උත්තරයක් ලැබේවි. ඒ වාගේම වෛද්‍යවරු බඳවා ගන්නා ආකාරයට සහ හෙදියන් බඳවා ගන්නා ආකාරයට ඉතුරු සෞඛ්‍ය කාර්ය මණ්ඩලය ලබා දෙමින් ඉන්නවා.

(iv)
- මම කලින් කිව්වා වාගේ, අමාත්‍යාංශයේ දැනට පවතින ප්‍රතිපාදන මඟින් ඉදිකිරීම් කටයුතු සහ උපකරණ ලබා දීම කරගෙන යනවා.
- කාර්ය මණ්ඩලය යාවත්කාලීන කිරීම - cadre upgrade කිරීම - සඳහා දැනට අපි ඉල්ලීමක් කරලා තිබෙනවා. එය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පවතින්නේ.
- රෝහලේ පවතින පුනරුත්ථාපන අංශය වැඩිදියුණු කිරීමට අවශ්‍ය කරන අනුමැතිය ලබා දීලා ඒ කටයුතු කරගෙන යනවා.

(ආ) පැන නොනඟී.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, සෞඛ්‍ය අමාත්‍යතුමාටත්, සෞඛ්‍ය අමාත්‍යාංශයටත්. පසුගිය අවුරුද්දේ කන්තලේ රෝහලේ තිබුණු ප්‍රධාන අඩුපාඩු ගණනාවක් විසඳා ගන්න අපට විශාල සහායක් ලබා දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, කන්තලේ රෝහල කියන්නේ පසුගිය ආණ්ඩු සමයේ, පසුගිය කාලපරිච්ඡේදවල නොසලකා හැරපු, සම්පත් වෙන් නොකරපු, පරිපාලන ගැටලු ගණනාවක් ඇති වෙච්ච රෝහලක්. කන්තලේ සහ තඹලගමුව වැනි දිස්ත්‍රික්කයේ විශාලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකක ජනතාව ප්‍රධාන වශයෙන් ප්‍රතිකාර ලබන රෝහලක් තමයි කන්තලේ රෝහල. නමුත් පසුගිය කාලයේ කන්තලේ රෝහල සම්බන්ධයෙන් ප්‍රදේශයේ ජනතාවට තිබුණේ, නරක ප්‍රතිරූපයක්. ඒ, එහි තිබුණු පරිපාලන ගැටලු, සම්පත් හිඟතාව ආදිය නිසා. නමුත් අපේ ආණ්ඩුව පත් වීමත් එක්ක පසුගිය අවුරුද්දේ අපට පුළුවන් වුණා, එහි තිබුණු ප්‍රධාන ගැටලු කිහිපයක් විසඳාගෙන, අලුත් ගමනක් යන්න වැඩකටයුතු ආරම්භ කරන්න. එහි ප්‍රධාන ඖෂධ ගබඩාව නවීකරණය කරන්න අපට මුදල් හම්බ වුණා. මාතෘ වාට්ටු අලුත්වැඩියා කරන්න මුදල් හම්බ වෙලා ඒ කටයුතු දැන් සිදු වෙමින් යනවා. වාහන නැවතුම්පොළවල් අලුත්වැඩියා කරලා තිබෙනවා. ඒ වාගේම රෝහලේ record room එක අලුත්වැඩියා කරලා තිබෙනවා. ඒ සඳහා මුදල් හම්බ වෙලා තිබෙනවා. Matron's quarters සහ සුව සේවක quarters අලුත්වැඩියා කරන්න මුදල් හම්බ වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙන ගමන් සෞඛ්‍ය ඇමතිතුමාගෙන් මම මේ කාරණය අහන්න කැමැතියි. කන්තලේ රෝහලේ තිබෙන තවත් ප්‍රධාන ගැටලුවක් තමයි, නව සායනික ගොඩනැඟිල්ලක අවශ්‍යතාව. සියලුම සායනික කටයුතු වෙනම ගොඩනැඟිල්ලක් කරා රැගෙන යාමේ අවශ්‍යතාව තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න. දැනට විනාඩි දෙකකටත් වැඩි කාලයක් අරගෙන තිබෙනවා.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

ඒ සඳහා යෝජනාව අපි අමාත්‍යාංශයට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගන්න පුළුවන්ද කියලා මම අහන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අපි දැනට ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතියක් යටතේ අපේ මූලික රෝහල් 82හි මෙවැනි ආකාරයේ නව ඉදිකිරීම් සහ අලුත්වැඩියාවලට ඉදිරි වසර හතර තුළදී රුපියල් මිලියන 31,000ක් වියදම් කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අපේ රජයේ අරමුදල්වලින් ඊළඟ වසරේදී PIP ව්‍යාපෘති හැටියටත් ඒක කරන්න පුළුවන්කමක් තිබෙනවා.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. කන්තලේ රෝහල දියුණු කිරීමේදී හඳුනා ගත් තවත් ප්‍රධාන ගැටලුවක් තමයි මානව සම්පත්

හිහය. ගරු අමාත්‍යතුමනි, වෛද්‍යවරුන් ලබා දීම සම්බන්ධයෙන් මතු වී තිබෙන ගැටලුව මේකයි. කන්තලේ රෝහලට ගොඩක් වෛද්‍යවරුන් එන්නේ replacements විධියට. වාර්ෂික ස්ථාන මාරුවීම්වලින් එන වෛද්‍යවරු ප්‍රමාණය අඩුයි. එම නිසා එන වෛද්‍යවරුන් බොහෝ විට උපරිම අවුරුද්දක් වාගේ කාල සීමාවක් තුළ පමණයි රෝහලේ කටයුතු කරන්නේ. එබැවින් වෛද්‍යවරුන්ගේ සේවය අඛණ්ඩව වර්ෂ 5ක්වත් ලබා ගැනීමේ දුෂ්කරතාවක් තිබෙනවා. එවැනි සේවයක් ලැබෙන්නේ මුල් පත්වීම් ලබා ගෙන එන වෛද්‍යවරුන්ගෙන් පමණයි. අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදී අපට පුළුවන්කමක් තිබෙනවා නම් වාර්ෂික ස්ථාන මාරු තුළින් වෛද්‍යවරුන් කන්තලේ රෝහලට යොමු කරන්න. ඒ වෛද්‍යවරුන්ගේ සේවය අඛණ්ඩව කාලයක් ලබා ගන්න පුළුවන් වීමෙන් ජනතාවට එයින් පහසුවක් ලැබෙයි කියලා හිතනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එතුමා කියන කාරණයේ යම් සත්‍යයක් තිබෙනවා. ඇත්තටම අවුරුද්දක් නොවෙයි, සමහර වෙලාවට අවුරුදු දෙකක, දෙකහමාරක කාලයකට දුෂ්කර රෝහල් හැටියට හඳුනා ගත් රෝහල්වලට වෛද්‍යවරු යොමු කරනවා. මෙහි තිබෙන ප්‍රශ්නය තමයි වාර්ෂික ස්ථාන මාරු නිවැරදිව, නිසි කලට ක්‍රියාත්මක නොවීම. 2013න් පසුව වාර්ෂික ස්ථාන මාරු නිසි පරිදි ක්‍රියාත්මක වෙලා නැහැ. අපි පෙබරවාරි මුල් සතියේදී එකතු වී තිබෙන වාර්ෂික ස්ථාන මාරු සියල්ලම ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. එතකොට යම් ප්‍රමාණයකින් මේ රෝහල්වලට සහනයක් ලැබේවි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -1180/2025- (3), ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -1317/2025- (2), ගරු කේ. කාදර් මස්තාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන ආබාධිත සිසුන්: පහසුකම්

### அரச பல்கலைக்கழகங்களில் கல்வி கற்கும் மாற்றுத்திறனுடைய மாணவர்கள்: வசதிகள்

### DISABLED STUDENTS STUDYING AT STATE UNIVERSITIES: FACILITIES

1323/2025

**4. ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ආබාධ සහිත සිසුන්ට සිය පාඨමාලාවන් හැදෑරීම සඳහා පහසුකම් රජයේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තිබේද;

(ii) බ්‍රේල් මාධ්‍යය, සංඥා භාෂාව සහ විශාලනය කරන ලද අකුරු ඇතුළු වෛකල්පිත සන්නිවේදන මාධ්‍යය ප්‍රවර්ධනය කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) විභාගවලට පෙනී සිටීමේදී ආබාධ සහිත සිසුන්ට ලබාදී ඇති පහසුකම් කවරේද;

(v) විභාගවලදී ඒ ඒ ආබාධිත තත්ත්වයන්ට සාපේක්ෂව ආබාධිත සිසුන්ට සාධාරණ අවස්ථා නිර්මාණය වී තිබේද;

(vi) පරිගණක ආශ්‍රයෙන් විභාගවලට පිළිතුරු සැපයීමට සෑම විශ්වවිද්‍යාලයකදීම ආබාධ සහිත සිසුන්ට අවස්ථාව ලැබෙන්නේද;

(vii) ආබාධ සහිත සිසුන්ට පුස්තකාල පරිශීලනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් පුළුල් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ආබාධ සහිත සිසුන් සඳහා ප්‍රමාණවත් ප්‍රවේශ පහසුකම් රජයේ විශ්වවිද්‍යාලවල තිබේද;

(ii) නොඑසේ නම්, ප්‍රවේශ පහසුකම් පුළුල් කිරීමට පියවර ගන්නේද;

(iii) ඒ වෙනුවෙන් 2026 වර්ෂයට අදාළ අය වැය තුළින් ප්‍රතිපාදන වෙන් කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

( அ) (i) மாற்றுத்திறனுடைய மாணவர்கள் தமது கற்கை நெறிகளைத் தொடர்வதற்கான வசதிகள் அரச பல்கலைக்கழக கட்டமைப்பினுள் காணப்படு கின்றதா என்பதையும்;

( ii) பிரெய்லி முறை, சைகை மொழி மற்றும் உருப்பெருப்பிக்கப்பட்ட எழுத்துக்கள் உள்ளிட்ட மாற்றுத் தொடர்பூடகங்களை மேம்படுத்துவதற் குப் போதுமான நடவடிக்கைகள் எடுக்கப் பட்டுள்ளனவா என்பதையும்;

(iii) இன்றேல், அதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) பரீட்சைகளுக்குத் தோற்றுகின்றபோது மாற்றுத் திறனுடைய மாணவர்களுக்கு வழங்கப்பட்டுள்ள வசதிகள் யாவை என்பதையும்;

(v) பரீட்சைகளில் மாற்றுத்திறனுடைய மாணவர் களுக்கு அந்தந்த மாற்றுத்திறன் தன்மைக் குரியதாக நியாயமான வாய்ப்புகள் உருவாக்கப் பட்டுள்ளனவா என்பதையும்;

(vi) மாற்றுத்திறனுடைய மாணவர்களுக்கு ஒவ்வொரு பல்கலைக்கழகத்திலும் கணினி களைப் பயன்படுத்தி பரீட்சைகளில் விடையளிப் பதற்கான வாய்ப்புக் கிடைக்கின்றதா என்பதையும்;

(vii) மாற்றுத்திறனுடைய மாணவர்கள் நூலகங் களைப் பயன்படுத்துவதற்குத் தேவையான வசதிகளை விரிவுபடுத்த எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அரச பல்கலைக்கழகங்களில் மாற்றுத் திறனுடைய மாணவர்களுக்குப் போதுமான அணுகல் வசதிகள் காணப்படுகின்றனவா என்பதையும்;

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

(ii) இன்றேல், அணுகல் வசதிகளை விரிவுபடுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(iii) 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தில் அதற்கான நிதி ஒதுக்கீடுகள் செய்யப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether there are facilities in the government university system for students with disabilities to pursue their courses;

(ii) whether adequate steps have been taken to promote alternative means of communication including Braille system, sign language and enlarged fonts;

(iii) if not, the steps that are taken in that regard;

(iv) the facilities that have been provided for students with disabilities when appearing for examinations;

(v) whether fair opportunities have been established for students with disabilities in relation to their respective disabilities during examinations;

(vi) whether students with disabilities have the opportunity to answer examinations using computers in every university; and

(vii) the steps taken to expand the facilities required for students with disabilities to use libraries?

(b) Will she also inform this House-

(i) whether adequate accessibility facilities are there for students with disabilities in government universities;

(ii) if not, whether steps will be taken to expand accessibility facilities; and

(iii) whether provisions required for this purpose will be allocated in the Budget for the year 2026?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ආබාධ සහිත සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක කෙරෙන විශ්වවිද්‍යාලවල කායික අශක්නුතාවන් ඇති අපේක්ෂකයන් ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා, වාණිජ්‍ය හා කලා යන උපාධි පාඨමාලා හැදෑරීම සඳහාද, දෘෂ්‍යාබාධිත අපේක්ෂකයන් කලා උපාධි පාඨමාලාව හැදෑරීම සඳහාද පහසුකම් සලසා ඇත. නමුත්, සියලු උපාධි පාඨමාලා සඳහා මේ වන විට එම අවස්ථාව නොමැත. මේ වන විට ආබාධ සහිත සිසුන් සඳහා ප්‍රතිපත්ති සකස් කරලා තිබෙනවා. ඒ වාගේම ඉතිරි පාඨමාලා සඳහා ශිෂ්‍යයන් බඳවා ගැනීමට අදාළ කටයුතු සූදානම් වෙමින් තිබෙනවා.

(ii) දෘශ්‍යාබාධිත සිසුන් බඳවා ගන්නා විශ්වවිද්‍යාලයන්හි එම සිසුන්ට බ්‍රේල් මාධ්‍යය, විශාලනය කරන ලද අකුරු යන පහසුකම් සපයා තිබේ. මීට අමතරව එම සිසුන්ට ආබාධිත සිසුන් සඳහා වන විශේෂ මෘදුකාංගය ඉගැන්වීම සිදු කරනු ලැබේ. ඒ මඟින් දෘශ්‍යාබාධිත සිසුන්ට හෝ වෙනත් විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට පරිගණකය මඟින් ප්‍රශ්න පත්‍රය කියවා ගැනීමට අවශ්‍ය වන පරිදි ප්‍රශ්න පත්‍රය සකස් කිරීමද, එය ශ්‍රවනය කිරීමට පහසුකම් සැලැස්වීමද සිදු කරනු ලබයි. අවශ්‍ය සිසුන්ට වාචිකව පිළිතුරු සැපයීමේ - voice typing - පහසුකම් සපයා ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ආබාධ සහිත සිසුන්ට ඕනෑම ප්‍රථම උපාධි පාඨමාලාවකට විශ්වවිද්‍යාල ප්‍රවේශ ලබා දීම සඳහා නව ප්‍රතිපත්තියක් අනුමත කර ඇති අතර, එය ඉදිරියේදී ක්‍රියාත්මක කෙරෙන විට මෙම පහසුකම් තව තවත් පුළුල් කිරීම සඳහා සැලසුම් කරමින් පවතී.

(iii) ඉහත (ii) ප්‍රශ්නයේ පිළිතුරම අදාළ වේ.

(iv)
- සියලුම විභාගවලදී විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට පැයකට විනාඩි 10ක අතිරේක කාලයක් විභාග සඳහා පෙනී සිටීමට ලබා දීම සහ පැය 03ක කාලයක් සඳහා විනාඩි 30ක අතිරේක කාලයක් ලබා දීම සිදු කරයි.
- සියලුම විශේෂ අවශ්‍යතා සහිත (ආබාධ සහිත) සිසුන් සඳහා වෙනම විභාග මධ්‍යස්ථාන ලබා දීම
- පිළිතුරු සැපයීම සඳහා සහ ප්‍රශ්න පත්‍ර කියවා ගැනීමට voice typing සඳහා අවශ්‍ය වන පරිගණක පහසුකම් සියල්ල සැපයීම
- ඇතැම් විශ්වවිද්‍යාලයන්හි නේවාසිකාගාරයේ සිට විශ්වවිද්‍යාලය වෙත පැමිණීමට සහ ආපසු යෑමට ප්‍රවාහන පහසුකම් සපයා තිබීම
- විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට පන්තිය තුළ පැවැත්වෙන ඇගයීම් සඳහා අනෙකුත් සිසුන්ට වඩා වැඩි කාලයක් -ඒ ඒ ආබාධවලට අදාළව- අවශ්‍ය වන බැවින් දේශන අවසන් වී යම් කාලයක් ඇතුළත ඇගයීම් භාර දීමට ඉඩ කඩ සැලසීම
- ලිවීමේ අපහසුතා සහිත සිසුන්ට විභාගයන්හිදී පිළිතුරු ප්‍රකාශ කරන විට එය පටිගත කරන අතරතුර, කාර්ය මණ්ඩලයේ අයෙකු විසින් එම සිසුවා වෙනුවෙන් ඔහු හෝ ඇය ලබා දෙන පිළිතුර ලිවීම

- විශාලනය කරන ලද අකුරු සහිත ප්‍රශ්න පත්‍ර ලබා දීම
- විභාග ශාලාවල විශේෂ පහසුකම් සැපයීම (රෝද පුටු හෝ විශේෂිත පුටු ගෙන යෑමේ පහසුකම)

  විභාගය තිබෙන්නේ උඩු මහලක නම් පහළ මහලට අවස්ථාව ලබා දීම

(v) විභාගවලදී සියලුම ආබාධ සහිත සිසුන්ට අතිරේක කාලයක් සැපයීම, කාර්ය මණ්ඩලයේ සහය, විශාල කරන ලද ප්‍රශ්න පත්‍ර සහ විශාලන යන්ත්‍ර සැපයීම සහ අවශ්‍ය සියලු පහසුකම් සහිතව සාධාරණ අවස්ථා සැපයීම ආදි අවස්ථා උදා කර දී ඇත.

ඉදිරියේදී බඳවා ගන්නා සිසුන් සඳහා ඒ ආබාධ සහිත සිසුන්ට අවශ්‍ය පහසුකම් සැපයීමට කටයුතු සලසා දෙනවා.

(vi) ඇතැම් විශ්වවිද්‍යාලවල පරිගණක ආශ්‍රයෙන් විභාගවලට පිළිතුරු සැපයීමට අවස්ථාව සලසා ඇත.

(vii) ආබාධ සහිත සිසුන්ට පුස්තකාල පරිශීලනය කිරීම පහසු කිරීම සඳහා ඇතැම් විශ්වවිද්‍යාල ගෙන ඇති පියවර කිහිපයක් පහත සඳහන් වේ.

- කථන ග්‍රන්ථ ව්‍යාපෘති ආරම්භ කර තිබීම
- බ්‍රේල් ක්‍රමයේ පොත් සහ මුද්‍රිත පොත පත විශේෂ මෘදුකාංගයක් මඟින් හඬ කවා එය ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දී තිබීම
- පුස්තකාල ප්‍රවේශය - entrance - පහසු වනලෙස සකසා තිබීම
- පුස්තකාල සහායකවරුන්ගේ සහාය ලබා දීම
- සෝපාන පහසුකම් සැලසීම

(ආ) (i) ඔව්.

වර්තමානය වන විට විශ්වවිද්‍යාල හතරක මේ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දී තිබෙනවා. නමුත් ඉදිරියේදී -ලබන අවුරුද්ද වනකොට- රුපියල් මිලියන 200ක් පාවිච්චි කරනවා, තවත් විශ්වවිද්‍යාල 5ක් දක්වා මෙය වර්ධනය කිරීම සඳහාත්, සියලු පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමටත්, ඇතුළත් කර ගත්තු ශිෂ්‍යයන්ට ඒ ඒ අවශ්‍යතා අනුව පහසුකම් සැලසීම සඳහාත්.

මේ සම්බන්ධව වැඩි විස්තර පහත පරිදි දැක්විය හැක.

වර්තමානය වන විට රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ආබාධ සහිත සිසුන් ඇතුළත් කර ගනු ලබන්නේ ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා, වාණිජ්‍ය හා කලා යන උපාධි පාඨමාලා හැදෑරීම සඳහා පමණි.

2024 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය පදනම් කරගෙන ආබාධ සහිත සිසුන් ඇතුළත් කර ගන්නා ඉහත පාඨමාලාවන්ට අමතරව පහත සඳහන් පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමට විශ්වවිද්‍යාල එකඟතාව ලබා දී ඇති අතර එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

| විශ්වවිද්‍යාලය | පාඨමාලාව | දෘශ්‍යාබාධිත සිසුන් | කායික අශක්නුතාවන් සහිත සිසුන් |
|---|---|---|---|
| ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | කළමනාකරණය | - | 05 |
| | කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය | - | 02 |
| වවුනියා විශ්වවිද්‍යාලය | ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා) | - | 05 |
| | ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා) | - | |
| | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) | - | |
| | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | - | 10 |
| ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | කළමනාකරණය | - | 05 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | සංගීතය | 03 | 03 |
| | දෘශ්‍ය කලා | - | 03 |
| එකතුව | | 03 | 33 |

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මේ සඳහා නව ප්‍රතිපත්තියක් අනුමත කර ඇති අතර, ඉදිරියේදී ප්‍රවේශ පහසුකම් වැඩි කිරීමට පියවර ගනු ඇත. ඒ අනුව දැනට පවතින පාඨමාලාවන්ට අමතරව සියලු පාඨමාලාවලට කායික අශක්නුතාවන් ඇති සිසුන් බඳවා ගැනීමට බලාපොරොත්තු වේ.

(ii) ඉහත (i)හි පිළිතුරම අදාළ වේ.

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාලවල දෘශ්‍යාබාධිත සහ කායික අශක්නුතා ඇති සිසුන් සඳහා පහසුකම් වැඩිදියුණු කිරීමට 2026 වර්ෂයට අදාළ අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

මෙහිදී සියලු උපකුලපතිවරුන්ට දන්වා තිබෙනවා, 2026 වර්ෂයට අදාළ අය වැය මත ඊට අදාළ vote එකක් තීරණය කරගෙන 2026 වර්ෂයට මෙම පහසුකම් සලසා දෙන ලෙස.

(ඇ) පැන නොනඟී.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා කියපු විධියටම ඒ ඒ විශ්වවිද්‍යාලවල ආබාධ සහිත විද්‍යාර්ථීන් ඉගෙනුම ලබනවා. අපි යෝජනාවක් සහ ප්‍රශ්නයක් විධියට ඉදිරිපත් කරන්න කැමැතියි, මේ කියන ආබාධ සහිත ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ වුවමනා ඉෂ්ට

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

කරන්න, ඒ කියන්නේ පරිවර්තන සේවා, නූතන තාක්ෂණය හඳුන්වා දීම වාගේ කාරණා සඳහා සෑම විශ්වවිද්‍යාලයකම විශේෂිත වූ ඒකක පිහිටුවා ඊට අවශ්‍ය විශේෂඥ දැනුම සහිත සේවක කණ්ඩායම් බඳවා ගනිමින් වැඩ පිළිවෙළක් දියත් කිරීමට හැකියාව තිබෙනවාද කියලා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය ඇසීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, උසස් අධ්‍යාපනයට සම්බන්ධ අනුකාරක සභාවේදී අපි මේ සම්බන්ධයෙන් දීර්ඝව සාකච්ඡා කර තිබෙනවා. එතැනදී ඉදිරිපත් කෙරුණු යෝජනාවකුත් තිබෙනවා, සියලු විශ්වවිද්‍යාලවල ආබාධ සහිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා මධ්‍යස්ථානයක් - centre එකක් - වෙන් කරන්න කියලා යෝජනාවක් ඉදිරිපත් වුණා. ඉදිරියේදී ආබාධ සහිත සිසුන් සඳහා වන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරද්දී මේ සම්බන්ධවත් කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ අතරතුර, අපි විශ්වවිද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රතිපත්ති සැලසුම් කමිටුවටත් මේ ක්‍රියාවලිය සඳහා නිර්දේශ සකස් කරමින් පවතිනවා.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා විශ්වාස කරන දේ තමයි ආබාධ සහිත ප්‍රජාව සම්බන්ධයෙන් වෛද්‍ය විද්‍යාත්මක දෘෂ්ටියකට වඩා සමාජමය දෘෂ්ටියකින් බැලිය යුතුයි කියන කාරණය. එය පදනම් කර ගනිමින් කටයුතු කළොත්, මේ ගෙන එන නව ප්‍රතිසංස්කරණ හරහා ආබාධ සහිත ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ වුවමනා ඉෂ්ට කර ගන්න හැකියාව ලැබෙයි කියා අපි විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශ්වවිද්‍යාලවලට ශිෂ්‍ය ප්‍රජාව බඳවා ගැනීමේදී, යම්කිසි නිශ්චිත අනුපාතයකට හෝ නිශ්චිත ක්‍රමවේදයකට ආබාධ සහිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළත් කර ගැනීමත් ප්‍රමාණාත්මකව පුළුල් කරන්න වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ඔව්. දැනට විශේෂ ප්‍රවේශය යටතේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සැලකිය යුතු ප්‍රමාණයක් ඇතුළත් වෙනවා. දැනට විශ්වවිද්‍යාලවල පාඨමාලා හතරකට පමණයි එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඇතුළත් වීමේ හැකියාව තිබෙන්නේ. නමුත් මේ මොහොත වන විට අප ගන්නා තීරණ අනුව ඒ ඒ ආබාධ සහිත ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ගැළපෙන පරිදි ඒ අවස්ථා සියලු පාඨමාලා සඳහා පුළුල් වෙනවා.

විශේෂයෙන්ම විද්‍යාව සහ වෛද්‍ය විද්‍යාව ඒකට ඇතුළත්. එතකොට සියලු ශිෂ්‍යයන්ට කලින් තිබුණ පාඨමලා හතරෙන් එහාට මේ අන්තර්කරණ අධ්‍යාපනය තුළ අවස්ථා ලැබෙනවා. ඒක එක අරමුණක්, ආබාධ සහිත ශිෂ්‍යයන් සඳහා ප්‍රතිපත්ති සැකසීමේදී. ඒ නිසා ඒ අවස්ථා පුළුල් වෙන බව අපි කියන්න කැමැතියි.

## ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින්: විස්තර
## இலங்கை அதிபர் சேவையிலுள்ள அலுவலர்கள்: விபரம்
## OFFICERS OF SRI LANKA PRINCIPALS' SERVICE: DETAILS

1348/2025

**5. ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I, II සහ III යන එක් එක් ශ්‍රේණියේ මේ වනවිට සේවය කරනු ලබන සංඛ්‍යාව සහ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2025.09.30 දින වනවිට වයස අවුරුදු 57 සම්පූර්ණ කරන ලද විදුහල්පතිවරු සංඛ්‍යාව ඉහත සඳහන් එක් එක් ශ්‍රේණිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට වැඩ ආවරණය කරනු ලබන ශ්‍රේණිධාරි නොවන විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන් සුදුසුකම් අනුව අදාළ ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

( அ) (i) இலங்கை அதிபர் சேவையின் I, II, III ஆகிய ஒவ்வொரு தரத்திலும் தற்போது பணியாற்றுபவர்களின் எண்ணிக்கை மற்றும் தற்போது நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

( ii) மேற்படி ஒவ்வொரு தரத்துக்கும் அமைவாக, 2025.09.30ஆம் திகதியாகும்போது 57 வயதைப் பூர்த்திசெய்துள்ள அதிபர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) தற்போது பதிற்கடமையாற்றும் அதிபர் தரம் கொண்டிராதவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அவர்களின் தகுதிகளுக்கேற்ப உரிய தரங்களுக்கு அவர்களை உள்ளீர்ப்பதற்காக ஏதேனும் வேலைத்திட்டம் தயாரிக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

( a) Will she inform this House -

(i) the number of principals currently serving in each grade of the Sri Lanka Principals' Service Grades I, II and III and the number of vacancies existing in each grade, separately;

(ii) the number of principals in each of the said grades who will be 57 years old as at 30.09.2025, separately;

(iii) the number of principals who are currently working on the basis of covering up duties but do not belong to the Principals' Service; and

(iv) whether a programme will be prepared to absorb them into the relevant grades based on their qualifications?

( b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා නිර්බාධක උසස්වීම් ක්‍රමයක් හඳුන්වා දී ඇති බැවින්, ශ්‍රේණි වශයෙන් පුරප්පාඩු ගණනය කිරීමක් සිදු කර නොමැති අතර, 2025.08.31 දිනට ශ්‍රේණි තුනෙහිම එකතුව වශයෙන් පුරප්පාඩු 3,152ක ප්‍රමාණයක් පවතින බව වාර්තා වී ඇත.

(ii) 2025.09.30 දින වන විට වයස අවුරුදු 57 සම්පූර්ණ කරන ලද විදුහල්පතිවරුන් සංඛ්‍යාව ඇමුණුමෙහි දක්වා ඇත.

*ඇමුණුම*

| පළාත | ශ්‍රේණිය | නිලධාරින් ප්‍රමාණය |
|---|---|---|
| බස්නාහිර | I | 176 |
| | II | 86 |
| | III | 36 |
| | | 298 |
| මධ්‍යම | I | 159 |
| | II | 80 |
| | III | 44 |
| | | 283 |
| දකුණ | I | 98 |
| | II | 54 |
| | III | 22 |
| | | 174 |
| උතුර | I | 97 |
| | II | 44 |
| | III | 14 |
| | | 155 |
| නැඟෙනහිර | I | 108 |
| | II | 73 |
| | III | 18 |
| | | 199 |
| වයඹ | I | 128 |
| | II | 50 |
| | III | 16 |
| | | 194 |
| උතුරු මැද | I | 59 |
| | II | 35 |
| | III | 13 |
| | | 107 |
| ඌව | I | 90 |
| | II | 43 |
| | III | 10 |
| | | 143 |
| සබරගමුව | I | 82 |
| | II | 30 |
| | III | 12 |
| | | 124 |
| එකතුව | | 1677 |

(iii) අවසන් ගණනය කිරීම 2024.04.30 දිනට සිදු කර ඇති අතර, පළාත් බලධාරින්ගේ තොරතුරු වාර්තා අනුව එම ප්‍රමාණය 2,494ක් බවට වාර්තා වී ඇත.

(iv) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව, බඳවා ගැනීමේ තරග විභාගයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු ප්‍රමාණය සඳහා බඳවා ගත යුතුය. ඉන් පරිබාහිරව බඳවා ගනු ලබන්නේ නම්, ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අවශ්‍ය වේ. මෙම නිලධාරින් අධිසේවක පදනම මත විදුහල්පති තනතුරට පත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලුවද, ඒ සඳහා එකඟත්වය ලබා දී නොමැත.

නව තරග විභාගයක් පවත්වා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අප්‍රමාදව කටයුතු කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුම් දී ඇත. ඒ අනුව, නව බඳවා ගැනීම් සඳහා වන ගැසට් නිවේදනය ඉදිරි සති දෙකක කාලය ඇතුළත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමට සියලු කටයුතු සූදානම් කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම ගැන ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා.

මගේ පළමු අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ රටේ පාසල් පද්ධතියේ 10,000කට අධික පාසල් සංඛ්‍යාවක් තිබෙනවා. පාසල් පද්ධතිය තුළ ඉන්න විදුහල්පතිවරු ගත්තොත්, I ශ්‍රේණියේ, II ශ්‍රේණියේ හා III ශ්‍රේණියේ විදුල්පතිවරු ඉන්නවා. පාසල් පද්ධතියේ විදුහල්පතිවරු හා නියෝජ්‍ය විදුහල්පතිවරු අඩුම තරමෙ 20,000ක් වාගේ ප්‍රමාණයක් ඉන්න ඕනෑ. නමුත්, ලබා දුන්

[ගරු උපුල් කිත්සිරි මහතා]

උත්තරය තුළම තිබෙනවා පුරප්පාඩු සංඛ්‍යාව 3,152ක් බව. ඒ වාගේම පිරිසක් විශ්‍රාම යන්නත් ඉන්නවා. වැඩ ආවරණය කරනු ලබන ශ්‍රේණිධාරි නොවන විදුහල්පතිවරුනුත් 2,500කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. ඒ විධියට ගත්තොත්, නැවත පුරප්පාඩු වනවා 5,600ක වාගේ ප්‍රමාණයක්.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගනිද්දි අවුරුදු 45, 50 වාගේ වයස්වල අයත් පත්වීම් භාර අරගෙන තිබෙනවා. ඒ අය II ශ්‍රේණියට ගිහිල්ලා, I ශ්‍රේණියට යන්නේ සමහර විට වයස අවුරුදු 56, 57, 58ක් වෙලා. එතකොට ඒ විදුහල්පතිවරුන්ට රාජකාරි කරන්න තිබෙන්නේ ඉතා අඩු සේවා කාලයක්. එම නිසා මම දැන ගන්න කැමැතියි, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේදී අඩු වයසකින් වැඩි ප්‍රමාණයක් බඳවා ගන්නත්, පුරප්පාඩු සංඛ්‍යාව කඩිනමින් පුරවන්නත් හැකියාව තිබෙනවාද කියලා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණාව පිළිබඳ අදහසක් තිබෙනවා. දැනට යෝජනා වෙලා තිබෙනවා අධ්‍යාපන කවුන්සලය පිහිටුවීමට. අධ්‍යාපනයට අදාළ සේවා 5ක් තිබෙනවා. මේ සේවා 5ට අදාළව බඳවා ගැනීම්, උසස් කිරීම් සහ අනෙකුත් කාරණා සම්බන්ධ නිර්දේශ නිකුත් කිරීම වගකීමක් විධියට අධ්‍යාපන කවුන්සලයට පැවරෙනවා. ඉදිරියේදී මේ සේවාව සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට අධ්‍යාපන කවුන්සලයට අවස්ථාව ලබා දීමට හැකියාව තිබෙනවා. ඉතාම ඉක්මනින් මේ කවුන්සලය බලාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විදුහල්පති සේවය ගත්තොත්, කාලයෙන් කාලයට සහ තවමත් ඒ විදුහල්පතිවරු අතර තිබෙන ගැටලුව මෙයයි. ඔවුන් I ශ්‍රේණියේ ගුරුවරයෙක්, එහෙම නැත්නම් II ශ්‍රේණියේ ගුරුවරයකු වශයෙන් කටයුතු කර විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගත්තාට පස්සේ ඔවුන්ගේ වැටුප අඩුවීම කියන කාරණාව ලොකු ගැටලුවක් විධියට තිබෙනවා. මේක වසර ගණනාවක් තිස්සේ දිගින් දිගටම එන ප්‍රශ්නයක්. අනෙකුත් සේවා හා බලද්දී මේ අයට ලැබෙන වැටුප පිළිබඳ යම් ගැටලුවක් තිබෙනවා. ඒ නිසා මේ විෂමතාව කඩිනමින් නිවැරදි කරන්නේ කවදාද? ඔවුන්ගේ වැටුප ගණනය කරන තුරු යම් සාධාරණ ගෙවීමක් කරන්න පුළුවන්ද සහ කඩිනමින් මේ ප්‍රශ්නය විසඳා දෙන්න පුළුවන්ද කියන එක ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු කාරණාව සම්බන්ධයෙන් ඇත්තටම සාකච්ඡා වට කිහිපයක්ම පවත්වා තිබෙනවා. විශේෂයෙන්ම විදුහල්පති වෘත්තීය සමිති සහ පොදුවේ විදුහල්පතිවරුන් එක්කත් සාකච්ඡා වට කිහිපයක්ම පවත්වා තිබෙනවා. පොදුවේ ගත්තොත්, මම කලින් කිව්වා වාගේ මේ සේවාවන් 5ට අදාළව වැටුප් ගණනය කිරීමේ ක්‍රියාවලිය ඇතුළත යම්කිසි overlap වීමක් සහ ඒ සම්බන්ධ කාරණා කිහිපයක්ම තිබෙනවා. පොදුවේ සියලු සේවාවන්ට මේක අදාළයි. එතකොට අපි කරපු සාකච්ඡාවලත් එකඟතාවක් එනවා. මේ සැලසුම් කිරීමට යෝජනා වෙන පොදු වැටුප් කොමිෂන් සභාවට විදුහල්පති වැටුප් සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කරන්න ඉදිරියේදී අපි බලාපොරොත්තු වෙනවා. එතකොට පොදුවේ වැටුප් සැලසුමට මේ යෝජනාවත් ගන්න හැකියාව තිබෙනවා. පසුගිය කාලයේ වෙලා තිබුණේ එහෙම නොවෙයි. එක එක සේවාවන් සහ ශ්‍රේණිවලට අදාළව වෙන වෙනම තීරණ ගත්තාට පස්සේ තමයි overlap වීම සිද්ධ වෙන්නේ. ඒ නිසා මේ පොදු තීරණයත් එක්ක යන එක තමයි වඩාත්ම සුදුසු. මේ සම්බන්ධයෙන් අපට එම තීරණය ගැනීමේ හැකියාව තිබෙනවා.

## ත්‍රිකුණාමලය NAITA දිස්ත්‍රික් කාර්යාලය සහ පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යන ගොඩනැඟිලි: බද්ද

திருகோணமலை மாவட்டத்திலுள்ள NAITA மாவட்ட அலுவலகம் மற்றும் பயிற்சி நிலையங்கள் இயங்கிவரும் கட்டிடங்கள்: வாடகை

BUILDINGS HOUSING NAITA DISTRICT OFFICE AND TRAINING CENTRES OF TRINCOMALEE: LEASE

1555/2025

6. **ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ - NAITA - ත්‍රිකුණාමල දිස්ත්‍රික් කාර්යාලය, ත්‍රිකුණාමල දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය සහ කින්නියා පුහුණු මධ්‍යස්ථානය පෞද්ගලික ගොඩනැඟිලිවල කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, එම ගොඩනැඟිලි සඳහා ගෙවනු ලබන මාසික කුලී මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම මධ්‍යස්ථානවල පවත්වනු ලබන පාඨමාලා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම මධ්‍යස්ථානවල පැවැත්වීමට නියමිතව තිබූ පාඨමාලා මේ වන විට ක්‍රියාත්මක නොවීමට හේතු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ `යුනිවර්සිටි කොලීජියක්" - University College - ස්ථාපිත කිරීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් අක්කර 13ක ඉඩමක් වෙන් කර, 2018 වර්ෂයේ අය වැයෙන් රු.මි. 50ක ප්‍රතිපාදන වෙන්කර ඉදිකර ඇති ගොඩනැඟිල්ල මේ වන විට අතහැර දමා ඇති බව දන්නේද;

(ii) ඉහත (අ)(i) හි සඳහන් කාර්යාලය සහ පුහුණු මධ්‍යස්ථාන මෙම ගොඩනැඟිල්ලේ ස්ථානගත කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய பயிலுநர் மற்றும் கைத்தொழிற் பயிற்சி அதிகாரசபையின் - NAITA - திருகோணமலை மாவட்ட அலுவலகம், திருகோணமலை மாவட்ட பயிற்சி நிலையம், கிண்ணியா பயிற்சி நிலையம் ஆகியன தனியார் கட்டிடங்களில் வாடகைக்கு இயங்கிவருவதை அவர் அறிவாரா?

(ii) ஆமெனின், மேற்படி கட்டிடங்களுக்குச் செலுத்தப்படும் மாதாந்த வாடகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) இந்தப் பயிற்சி நிலையங்களில் நடாத்தப்படும் கற்கைநெறிகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) மேற்படி பயிற்சி நிலையங்களில் நடாத்தப்படவிருந்த கற்கைநெறிகள் இன்றளவில் நடாத்தப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கிண்ணியா பிரதேச செயலாளர் பிரிவில் 'யுனிவர்சிட்டி கொலேஜ்' - University College - ஒன்றை நிறுவுவதற்காக காணிச் சீர்திருத்த ஆணைக்குழுவால் 13 ஏக்கர் காணி ஒதுக்கப்பட்டு, 2018ஆம் ஆண்டின் வரவு செலவுத்திட்டத்தில் 50 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீட்டில் நிர்மாணிக்கப்பட்ட கட்டிடம் தற்போது கைவிடப்பட்ட நிலையில் காணப்படுவதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி (அ) (i) இல் குறிப்பிடப்பட்ட அலுவலகம், பயிற்சி நிலையம் ஆகியவற்றை இக்கட்டிடத்தில் தாபிப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

To ask the Prime Minister and the Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether she is aware that the Trincomalee District Office, the Trincomalee District Training Centre and the Kinniya Training Centre of the National Apprentice and Industrial Training Authority - NAITA - are being operated in privately owned buildings on lease basis;

(ii) if so, the monthly lease amounts paid for each of such buildings, separately;

(iii) the courses offered at these centres, separately; and

(iv) the reasons as to why the courses that were previously scheduled to be offered at these centres are not being offered at present?

(b) Will she also inform this House -

(i) whether she is aware that the building constructed on a 13-acre land allotted by the Land Reform Commission for the establishment of a University College in the Kinniya Divisional Secretary's Division using a Rs. 50 million Budgetary Allocation in 2018 has been abandoned at present; and

(ii) whether measures will be taken to relocate the office and training centres referred to in (a) (i) above to the said building?

(c) If not, why?

**ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාර්යාලය හා කින්නියා පුහුණු මධ්‍යස්ථානය පෞද්ගලික ගොඩනැඟිලි දෙකක කුලී පදනම මත පවත්වාගෙන යයි.

(ii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාර්යාලයීය ගොඩනැඟිල්ල සඳහා මාසික කුලී මුදල රුපියල් 100,000කි. කින්නියා පුහුණු මධ්‍යස්ථාන ගොඩනැඟිල්ල සඳහා මාසික කුලී මුදල රුපියල් 44,000කි.

මේ NAITA එක 1990දී ආරම්භ කරන්නේ පනතකින්. 1991 ඉඳලාම කුලියට තමයි මේවා ලබාගෙන තිබෙන්නේ. තව අවුරුදු දෙකකින් විතර මේවා රජයේ ආයතනවලට ගන්න අපේක්ෂා කරනවා.

(iii) මෙම මධ්‍යස්ථානවල පවත්වනු ලබන පාඨමාලා වෙන් වෙන් වශයෙන් ඇමුණුමෙහි ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 01

| | Name of the Training Centre | Mode | Trade Name | Batch | Batch wise Intake | NAITA Annual Intake 2025 | Type of the Training |
|---|---|---|---|---|---|---|---|
| 1 | Apprentice Training Centre – Trincomalee (District Office Training Centre) | NVQ | ICTT | 1st Batch | 15 | 30 | CBT |
| | | | | 2nd Batch | 15 | | |
| | | NVQ | Beautician | 1st Batch | 28 | 28 | BT |
| | | NVQ | Care Giver | 1st Batch | 29 | 52 | BT |
| | | | | 2nd Batch | 23 | | |
| | | NVQ | Hotel Sector Programme | 1st Batch | 30 | 53 | BT |
| | | | | 2nd Batch | 23 | | |
| | | Non NVQ | SLCCL | 1st Batch | 30 | 98 | CBT |
| | | | | 2nd Batch | 28 | | |
| | | | | 3rd Batch | 20 | | |
| | | | | 4th Batch | 20 | | |
| | | Non NVQ | CELV | 1st Batch | 20 | 73 | CBT |
| | | | | 2nd Batch | 26 | | |
| | | | | 3rd Batch | 27 | | |
| Total Recruitment in CBT & Basic Training | | | | | | 334 | |

[ගරු නලින් හේවගේ මහතා]

| | Name of the Training Centre | Mode | Trade Name | Batch | Batch wise Intake | NAITA Annual Intake 2025 | Type of the Training |
|---|---|---|---|---|---|---|---|
| 2 | Apprentice Training Centre - Kinniya | NVQ | ICTT | 1st Batch | 15 | 30 | CBT |
| | | | | 2nd Batch | 15 | | |
| | | | Care Giver | 13 Years | 37 | 37 | BT |
| | | | Clerk (General) | Annual | 20 | 20 | BT |
| | | | Graphic Designer | Annual | 25 | 25 | BT |
| | | Non NVQ | SLCCL | Annual | 20 | 20 | CBT |
| Total Recruitment in Kinniya Apprentice Training Centre | | | | | | 132 | |

| Other Apprentice Training Centre Total Recruitment in Basic Training | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3 | Free Building Training Centre - Kantale | NVQ | Care Giver | 1st Batch | 32 | 57 | BT |
| | | | | 2nd Batch | 25 | | |
| | | | Hotel | 1st Batch | 16 | 55 | BT |
| | | | | 2nd Batch | 21 | | |
| | | | | 3rd Batch | 18 | | |
| | Free Building Training Centre - Mutur | NVQ | Care Giver | 1st Batch | 25 | 25 | BT |
| | | | Tailor | 1st Batch | 29 | 29 | |
| | Free Building Training Centre - Thoppur | NVQ | Tailor | 1st Batch | 40 | 40 | BT |
| Free Building Apprentice Trainning Centres Total recruitment in Basic Trainning | | | | | | 206 | |

| | | |
|---|---|---|
| Enterprise Based Training Recruitment (EBT) – Tricomalee District | 1072 | |

| | | |
|---|---|---|
| Total Recruitment in 2025 | 1744 | |

- CBT – Centre Based Training
- BT – Basic Training prior to EBT Apprenticeship
- EBT – Enterprise Based Training

(iv) කින්නියා පුහුණු මධ්‍යස්ථානයෙහි පරිගණක දෘඪාංග පාඨමාලාව උපකරණ හිඟය මත පාඨමාලා ප්‍රතිනනය නොවීම හේතුවෙන් තාවකාලිකව නැවතී ඇති අතර, 2026 වසර මුල එම පාඨමාලාව නැවත ආරම්භ කිරීමට සැලසුම්කොට ඇත.

(ආ) (i) අමප/25/2248/806/132 සහ 2025.12.10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කින්නියා විශ්වවිද්‍යාල විද්‍යායතනයේ, ඉදිකිරීම් සහ ඉඩම් සංචාරක අමාත්‍යාංශයට පැවරීමට කටයුතු කර ඇත.

(ii) මෙම කාර්ය මණ්ඩල නේවාසිකාගාරය පුහුණු මධ්‍යස්ථානයක් ලෙස භාවිත කිරීමට කිසිදු යෝග්‍යතාවක් නොමැත.

(ඇ) අදාළ නොවේ.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
*நன்றி, கௌரவ பிரதி அமைச்சர் அவர்களே!*

இந்த வினாவில் கேட்கப்பட்டுள்ள University College சம்பந்தமான விடயமானது, 2018ஆம் ஆண்டு 50 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீட்டின் மூலம் ஆரம்பிக்கப்பட்ட ஒரு செயற்பாடாகும். கௌரவ பிரதி அமைச்சர் அவர்கள் சொன்னது போன்று, இதற்குரிய இடத்தைச் சுற்றுலாத் துறைக்கு வழங்குவதற்கு 2025ஆம் ஆண்டு டிசம்பர் மாதம் 10ஆம் திகதி Cabinet தீர்மானம் எடுக்கப்பட்டுள்ளதாக எங்களுக்கு அறியக் கிடைத்துள்ளது. எங்களுடைய பிரதேசங்களில் பலர் NAITA, VTA போன்றவற்றில் கல்விச் செயற்பாடுகளை முன்னெடுக்கின்றார்கள். வாடகைக் கட்டிடங்களில் நடத்தப்படுகின்ற மேற்குறித்த நிறுவனங்களின் கல்விச் செயற்பாடுகளை ஏன் இதற்குரிய இடத்தில் மேற்கொள்ள முடியாது? என கௌரவ பிரதி அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன். அந்தப் பிரதேசத்தில் இன்னும் பல ஏக்கர் காணிகள் காணப்படுகின்றன. அங்கு சுற்றுலாத்துறை சம்பந்தமான விடயங்களை முன்னெடுக்க வேண்டுமாக இருந்தால், அவற்றை அந்தக் காணிகளில் மேற்கொள்ளலாம்.

எனவே, இந்த விடயத்தைக் கருத்திற்கொண்டு, மீண்டும் அந்த இடத்தில் NAITA, VTA போன்றவற்றின் கல்விச் செயற்பாடுகளை ஆரம்பிப்பதற்கான வாய்ப்புகள் இருக்கின்றதா? எனக் கேட்கின்றேன். ஏனென்றால், எங்களுடைய பிரதேசத்தில் பல்கலைக்கழகத்துக்குத் தெரிவாகாத மாணவர்கள் பலர் இருக்கின்றார்கள். இது அவர்களுடைய எதிர்பார்ப்பாகக் காணப்படுகின்ற ஒரு விடயமாகும். அரசாங்கம் என்ற வகையில், நீங்கள் இந்த விடயத்தில் எவ்வாறு கவனம் செலுத்தப் போகின்றீர்கள்? எனக் கேட்கின்றேன்.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්ව සංඛ්‍යාව වැරදියි, මිලියන 50ක් නොවෙයි. මේකට මුලින් වෙන් කරලා තිබෙනවා, මිලියන 434ක්. ඒ කියන්නේ, ලක්ෂ 4,300ක් වාගේ විශාල මුදලක් වෙන් කරලා තමයි මේක ආරම්භ කරලා තිබෙන්නේ. ඒ වාගේම 11,000,000ක ඉදිකිරීමක් කරලා තිබෙනවා. දේශපාලන වුවමනාවක් මත මේ සඳහා මෙතරම් මුදල් ප්‍රමාණයක් වෙන් කරලා, ඉඩම් ප්‍රමාණයක් වෙන් කරගෙන තිබෙනවා. මම හිතන විධියට, ඒකෙන් අල්ලා ගත්ත ඉඩමක කවුරු හරි ඥාතියෙක් පස් කපලාත් තිබෙනවා. මෙහි වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයක් හදන්න කිව්වාට, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පාලක සභාවම කියනවා මේ ස්ථානය ඒ සඳහා සුදුසු නැහැ කියලා. ඒ වාගේම වනජීවී සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව කියනවා, මේක අලි ගහන ප්‍රදේශයක් කියලා. අලි ගහනය ඇති ප්‍රදේශයක කිසිදුශක්‍යතා අධ්‍යයනයක් කරන්නේ නැතිව මේක හදන්න සැලසුම් කරලා, -අපේ ආණ්ඩුව නොවෙයි- ඔබතුමන්ලා ඒ ප්‍රදේශයේ මතයක් හදන්න හදනවා, "අපි වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයක් ගේන්න හැදුවා, ඒක ආණ්ඩුව නතර කළා" කියලා. මේ, අපේ ආණ්ඩුව නොවෙයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා ඇති, 2023.04.21 දින ඇමතිතුමා කමිටුවක් පත් කරලා ඒකෙන් ගිහින් බැලුවා, මේක ගැන; අපේ NIBM එක, DTET එක, NAITA එක, VTA එක එතැනට ගිහින් බැලුවා. මේ ප්‍රධාන ආයතන හතරම කිව්වා, ඒක අපට කිසිදු පාඨමාලාවක් ආරම්භ කරන්න සුදුසු තැනක් නොවෙයි කියලා. මේවා තීරණය කරන්න ඕනෑ

දේශපාලන අධිකාරිය නොවෙයි. දේශපාලන අධිකාරිය තීන්දු කරපු නිසා, රුපියල් 11,000,000ක් විනාශ වෙලා තිබෙනවා. මෙතැන කිසිදු ආයතනයකට සුදුසු නැහැ කියලා ඒ ආයතන කියනවා. ඒ නිසා අපිට භාර ගන්න වෙන්නේ, දේශපාලකයකු හැටියට ඔබතුමා කියන කාරණය නොවෙයි, ඒ ආයතන දෙන උත්තරය. මේක අපි නතර කරපු එකක් නොවෙයි, ඔබතුමන්ලා ආණ්ඩු කරන කාලයේ 2023 වර්ෂයේ නතර කරපු ව්‍යාපෘතියක්.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ பிரதி அமைச்சர் அவர்கள் சொல்வதுபோன்று, திருகோணமலையில் யானை வருகின்ற இடங்கள் என்று பார்த்தால், பல இடங்கள் இருக்கின்றன. திருகோணமலை பிரதேசத்தில் காணப்படுகின்ற பல கல்வி நிலையங்கள் யானை வருகின்ற பிரதேசங்களிலே அமைக்கப்பட்டு இருக்கின்றன. ஆகவே, இதை ஒரு காரணமாக எடுத்துக்கொள்ள முடியாது. கௌரவ பிரதி அமைச்சர் அவர்கள் சென்ற அரசாங்கத்தின்மீது குறைசொல்கின்ற ஒருவராக இருக்கின்றார். திடீரென கிண்ணியா பிரதேசத்தில் இருக்கின்ற இந்தக் காணியைச் சுற்றுலாத்துறைக்கு எடுத்துக்கொள்கின்ற காரணத்தாலும், கடந்த டிசம்பர் மாதத்துக்குப் பிறகு அந்த மாவட்டத்தைச் சேர்ந்த பிரதி அமைச்சர் அவர்கள் இஸ்ரேலுக்கான விஜயத்தை மேற்கொண்டிருந்ததாலும் இன்று எங்களுடைய பிரதேசத்தில் மக்கள் மத்தியில் ஒரு குழப்ப நிலை ஏற்பட்டிருக்கின்றது. அதாவது, எப்படி அருகம்பையில் இஸ்ரேலியர்களின் தாக்கம் இருக்கின்றதோ, அதேபோன்றதொரு தாக்கத்தை திருகோணமலையிலும் ஏற்படுத்தப் போகின்றார்களா? திருகோணமலையில் சுற்றுலாத்துறையை அபிவிருத்தி செய்து, இஸ்ரேலியர்களின் வருகையை அதிகரிக்கப் போகின்றார்களா? என்றதொரு சந்தேகம் இன்று மக்கள் மத்தியில் காணப்படுகின்றது. நாங்கள் அரசியல் செய்வதாக இருந்தால், இதை வைத்தும் அரசியல் செய்ய முடியும்.

எங்களுடைய பிரதேசங்களிலுள்ள மாணவர்கள் மிகவும் கஷ்ட நிலையிலே இருக்கின்றார்கள். திருகோணமலை மாவட்டத்தில் 80 சதவீதமான பிரதேசங்களில் யானைகளின் நடமாட்டம் காணப்படுகின்றன. இதற்கான தீர்வொன்றை நீங்கள் வழங்க வேண்டும். சென்ற அரசாங்கத்தில் பிழையொன்று நடந்திருந்தால், அதைச் சரிசெய்து, அங்கு கல்விச் செயற்பாடுகளை முன்னெடுப்பதற்கான சாத்தியக்கூறுகள் இருக்கின்றதா? என்றுதான் நாங்கள் கேட்கின்றோமே ஒழிய, வேறொன்றும் இல்லை. இந்த விடயத்தை வைத்து அரசியல் செய்யவேண்டிய தேவை எங்களுக்குக் கிடையாது.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)

දරුවන්ට අධ්‍යාපනය ලබා දීම අපි පිළිගන්නවා. ඒ වෙනුවෙන් අපි පළමුවැනි වතාවට ගම්පහ තාක්ෂණ විද්‍යාලයේ උදේ වරුව සහ සවස් වරුව කියන දෙකෙහිම පාඨමාලා පැවැත්වීමේ කටයුතු ආරම්භ කළා. ඒ ළමයින් ප්‍රමාණය දෙගුණයක් කරන්න. ඒක මේ කියන ප්‍රදේශවලටත් අපි අනිවාර්යයෙන් ව්‍යාප්ත කරන්න බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම වෘත්තීය අධ්‍යාපනය පාසල් විෂය නිර්දේශයට ගෙනෙන නිසා, මේ ප්‍රදේශවලත් වැඩි වැඩියෙන් මෙවැනි ආයතන බිහි කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් අපි 2029 වනකොට plan එකක් සහිතව කටයුතු කරමින් යනවා. හැබැයි, 2023දී හිටපු අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සඳහන් කරන ලද ප්‍රධාන ආයතන විසින්ම නිර්දේශ කරලා තිබෙනවා, මෙතැන කිසිදු ආකාරයකින් සුදුසු නැහැ, ඔවුන්ට මේක භාර ගන්න බැහැ කියලා. මේක අපේ ආණ්ඩුවෙන් නතර කරපු එකක් නොවෙයි, කලින් ආණ්ඩුවෙන් නතර කරපු එකක්. ඒ නිසා මේක පදනම් කරගෙන, ඒ ප්‍රදේශයේ දේශපාලනය කරන්න මේක අපි නවත්වනවා කියන එක කියන්න එපා. ඔබතුමා ගමට ගිහිල්ලා, 2023දී ඒ අමාත්‍යවරයා පත් කරපු කමිටුවේ වාර්තාව ප්‍රදේශයේ ජනතාවට දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

## ආයුර්වේද නිෂ්පාදන අළෙවි ප්‍රවාරණය: නියාමනය
## ஆயுர்வேத உற்பத்திகளின் விற்பனை ஊக்குவிப்பு: ஒழுங்குறுத்தல்
## SALES PROMOTION OF AYURVEDIC PRODUCTS: REGULATION

1701/2025

7. **ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය තුළ මේ වන විට ලියාපදිංචි වී ඇති ආයුර්වේද වෛද්‍ය නිෂ්පාදනාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ආයුර්වේද නිෂ්පාදන නියාමනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) ආයුර්වේද නිෂ්පාදන පිළිබඳ අළෙවි ප්‍රවාරණය සඳහා සමාජ මාධ්‍ය භාවිත කිරීම පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(v) එසේ නම්, එම ප්‍රතිපත්තිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) ආයුර්වේද නිෂ්පාදන ලියාපදිංචි කර ඇති බවට සමාජ මාධ්‍ය තුළ ප්‍රචාරණ සිදු කරන බවත්;

(ii) එම ප්‍රචාරණ මඟින් මහජනතාවගේ මුදල් වංචා කරන බවත්;

එතුමා දන්නේද?

(ඇ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஆயுர்வேத மருத்துவத் துறையில் இன்றளவில் பதிவு செய்யப்பட்டுள்ள ஆயுர்வேத மருத்துவ உற்பத்தி நிலையங்களின் எண்ணிக்கை யாது;

(ii) அவற்றின் பெயர்கள் யாவை;

(iii) ஆயுர்வேத உற்பத்திகளை ஒழுங்குமுறைப்படுத்துவதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

(iv) ஆயுர்வேத உற்பத்திகள் தொடர்பான சந்தைப்படுத்தல் விளம்பரங்களுக்குச் சமூக வலைத்தளங்களைப் பயன்படுத்துவது தொடர்பில் கொள்கை ரீதியான முடிவு எடுக்கப்பட்டுள்ளதா;

(v) ஆமெனில், அந்தக் கொள்கை யாது;

என்பதை அவர் குறிப்பிடுவாரா?

[ගරු ධර්මප්‍රිය දිසානායක මහතා]

(ஆ) (i) ஆயுர்வேத உற்பத்திகள் பதிவு செய்யப்பட்டுள்ளதாக சமூக வலைத்தளங்களில் விளம்பரப்படுத்தப்படுகின்றது என்பதையும்;

(ii) இந்த விளம்பரங்கள்மூலம் பொதுமக்களின் பணம் மோசடி செய்யப்படுகின்றது என்பதையும்;

அவர் அறிவாரா?

(இ) ஆமெனில், இது தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he state -

(i) the number of Ayurvedic medicine manufacturing plants currently registered in the Ayurvedic medicine sector;

(ii) the names of those;

(iii) the steps that have been taken to regulate the Ayurvedic products;

(iv) whether any policy decision has been taken with regard to the use of social media networks for the marketing of Ayurveda products; and

(v) if so, the details of such policy?

(b) Is he aware that -

(i) advertisements are being circulated on social media networks claiming that certain Ayurvedic products have been registered; and

(ii) public money is being defrauded by such advertisements?

(c) Will he inform this House, if so, the action that will be taken in this regard?

(d) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ලියාපදිංචි වී ඇති ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර සංඛ්‍යාව 908කි.

(ii) ඇමුණුම මගින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iii) 2024.04.08 දිනැති අංක 2379/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් නියෝග (ආයතන සංග්‍රහය) අනුව ආයුර්වේද නිෂ්පාදන නියාමනය සිදු කරනු ලබයි.

(iv) අළෙවි ප්‍රචාරණ කටයුතු නියාමනය සඳහා ආයුර්වේද පනතේ විධිවිධාන පනවා ඇත.

(v) ආයුර්වේද සංග්‍රහයේ (2024) 13(ඔ) වගන්තිය පරිදි විවෘත වෙළෙඳ පොළේ විකිණීමට ඇති ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධවල මිනිස් පරිභෝජනයට අවශ්‍ය නිරූපද්‍රිත ක්‍රියාකාරිත්වය, තත්ත්වය සහ ස්ථාවරත්වය පිළිබඳව විමසීමට පියවර ගැනීමෙන් පසු, ආයුර්වේද නිෂ්පාදනාගාර, ගබඩා සහ වෙළෙඳ පොළ විමර්ශන කමිටුව විසින් කරන ලද නිර්දේශයන්ට අනුකූලව මහජන සෞඛ්‍ය සහතික කිරීම සහ එවැනි ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් සම්බන්ධයෙන් පළ කරනු ලබන යම් වෙළෙඳ දැන්වීම් සඳහා පූර්ව ලිඛිත අනුමැතිය ලබා දීමට කටයුතු සලස්වා ඇත.

(ආ) (i) සමාජ මාධ්‍ය ඔස්සේ ආයුර්වේද නිෂ්පාදන සම්බන්ධයෙන් ප්‍රචාරණයන් සිදු වන බව නිරීක්ෂණය වී ඇත.

(ii) එම ප්‍රචාරණ මඟින් මහජනතාවගේ මුදල් වංචා කරන බවට පැමිණිලි වාර්තා වී නොමැත.

(ඇ) සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණය වන දැන්වීම් සම්බන්ධයෙන් වන යම්කිසි පැමිණිල්ලක් ලද පසු ආයුර්වේද ඖෂධ සහ නිෂ්පාදන නියාමන සභාව මඟින් ස්ථාපිත විමර්ශන කමිටු මඟින් සුදුසු විමර්ශනයක් සිදු කර, ලැබෙන නිර්දේශ අනුව එම නිෂ්පාදනයන්ට අදාළ වෙළෙඳ ප්‍රචාරණ දැන්වීම් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ආයුර්වේද සංග්‍රහයේ (2024) 13(ඔ) වගන්තිය පරිදි සිදු කරනු ලබයි.

(ඈ) පැන නොනඟී.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)
ගරු ඇමතිතුමනි, මෙම ප්‍රචාරක වැඩ පිළිවෙළ බොහෝ විට සිදු වන්නේ, සමාජ මාධ්‍ය ඔස්සේ. ඒ පිළිබඳව ඔබතුමා පිළිතුරක් ලබා දුන්නා. නමුත්, මේ වන විට සමාජ මාධ්‍ය විශාල ප්‍රමාණයක් මේ රටේ විකෘති දැන්වීම් ඇති කිරීම සඳහා බොහෝ විට ඉවහල් වනවා. විවිධ ක්ෂේත්‍ර ඔස්සේත් මේ වග පැහැදිලි වනවා. මෙම විකෘති සමාජ මාධ්‍යවල ප්‍රවෘත්ති, දැන්වීම් එක්ක මහජනතාවත් බොහෝ විට විකෘති තත්ත්වයට යොමු වෙච්ච අවස්ථා තිබෙනවා. ඒ වාගේම බෙහෙත් වර්ග යැයි හඳුන්වා දෙනු ලබන සමහර ද්‍රව්‍ය පරිහරණය කිරීමේදී ඔවුන් අපහසුතාවට පත්වෙච්ච අවස්ථා ද දැනගන්න ලැබී තිබෙනවා. මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ගවලට නොයන්නේ සමහර කරුණු කාරණා හෙළිදරව් කිරීමට ඒ පුද්ගලයින් අකැමැති නිසා බවද දැනගන්න ලැබී තිබෙනවා. මේක සමාජය තුළ ඉතාම ලොකු කථාවක් බවට පත් වෙලා තිබෙනවා. ඔබතුමා ජනමාධ්‍ය ඇමතිතුමා ලෙසත් කටයුතු කරන නිසා මේ කටයුතු නියාමනය කිරීම වෙනුවෙන් මොකක් හෝ ක්‍රියාමාර්ගයක් ගත හැකිදැයි මම ඔබතුමාගෙන් විමසා සිටිනවා, පළමුවැනි අතුරු ප්‍රශ්නය වශයෙන්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ආයුර්වේද නිෂ්පාදන සහ යම් ප්‍රතිකාර ක්‍රම සම්බන්ධයෙන් සමාජ මාධ්‍යවල සිදුවන ප්‍රචාරණය, නියාමනය සඳහා එහෙම නැත්නම් ඒවායේදී ලැබුණු පැමිණිලි විමර්ශනයෙන් අනතුරුව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහාත් දැනට පවතින නීතිය අනුව කටයුතු කරන්න පුළුවන්.

නමුත් මම පිළිගන්නවා, ජනතාව පීඩාවට පත් වන සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සමාජ මාධ්‍ය නියාමනය සඳහා අවශ්‍ය

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කරන නීතියක් තවමත් අපේ රටේ නැහැ කියලා. ඒ සඳහා වූ නීති සම්පාදනය කළ යුතුයි. ඒවායෙන් තමයි මේ බොහෝ දේවල් ආවරණය කරගන්න පුළුවන්කම ලැබෙන්නේ. කෙසේ වෙතත්, පැමිණිලි ලැබුණොත් දැනට පවතින නීතිය අනුව කටයුතු කරනවා.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)
ගරු ඇමතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම මහජනතාවට සමහර අවස්ථාවලදී ඇති වන විශේෂ අවශ්‍යතා නිසා ඖෂධ යැයි හඳුන්වා දෙන සමහර ඖෂධ වර්ග පාවිච්චි කරනු ලබනවා. විශේෂයෙන්ම ශරීරයේ ඇති වන විවිධ දුෂ්කරතා, එහෙම නැත්නම් අපහසුතාවලට තමයි බෙහෙත් යැයි හඳුන්වා දෙන මෙම ද්‍රව්‍ය පාවිච්චි කරනු ලබන්නේ. අපි දකිනවා, මේ ද්‍රව්‍ය පාවිච්චිය තුළින් බොහෝ පිරිසක් අපහසුතාවට පත් වන බව. මේ සම්බන්ධයෙන් නීතිමය රැකවරණයක්, ආවරණයක් නැහැ. මෙම බෙහෙත් ද්‍රව්‍ය බොහෝ අවස්ථාවලදී කුරියර් සේවය හරහා තමයි ලබා දීමට කටයුතු කරන්නේ. අපි අසා දැනගත් පරිදි, එලෙස කටයුතු කිරීමේදීත් මෙම ද්‍රව්‍ය, නිසි ද්‍රව්‍ය විධියට නොවෙයි, ඒ කියන්නේ ඉල්ලපු ද්‍රව්‍ය නොවෙයි, වෙනත් ද්‍රව්‍ය ලැබෙන අවස්ථා තිබෙනවා. අපට පෙනෙන විධියට මේවාට නියාමනයක් නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා යටතේ ඇති ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව මේ පිළිබඳව යම් නියාමනයක් කර මෙහි නියම තත්ත්වය පැහැදිලි කරනවාද? මහජනතාව මේ නිසා දැවැන්ත අපහසුතාවලට පත් වන අවස්ථා අපට අසන්න දකින්න ලැබෙනවා. මේ පිළිබඳව අමාත්‍යාංශයක් විධියට ගන්නා වූ පියවර කුමක්ද කියන එක තමයි දෙවන අතුරු ප්‍රශ්නය විධියට මම ඔබතුමාගෙන් අහන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මේ අවශ්‍යතාව එක පැත්තකින් අධිකරණය මඟිනුත් මීට වසර කිහිපයකට කලින් පෙන්වා දීමෙන් අනතුරුව 2024.04.08 දිනැති මම කලින් සඳහන් කරපු 2379/02 කියන අති විශේෂ ගැසට් පත්‍රය මේ සම්බන්ධව නිකුත් කළා. ඒ, ආයුර්වේද සංග්‍රහය සහ එය බලාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන නියාමන සභාවට අදාළව. නමුත් මේ ගැසට් නිවේදනය පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව මඟින් යම් කරුණු කිහිපයක් දක්වා තිබෙනවා. ඒ අනුව මීට අදාළව කළ යුතු සංශෝධන සම්බන්ධයෙන් වූ කටයුතු අපි දැන් ආරම්භ කරලා තිබෙන්නේ. ඒ අනුව එම නව ගැසට් නිවේදනය නිකුත් කරන තෙක් අන්තර්කාලීනව මේ නියාමනය සහ ලියාපදිංචිය සඳහා අවශ්‍ය කරන නෛතික කටයුතුවලට අවශ්‍ය පියවර අපි ගනිමින් ඉන්නවා.

ඒ නිසා එතුමා මතු කරන කාරණය නිවැරදියි, ගරු කථානායකතුමනි. එහෙම මුකුත් නියාමනයක් නොතිබුණු තැනක ආපු නීති රීතිවලත් යම් ගැටලු සහගත බවක් තිබෙන නිසා එය නිවැරදි කරමින් තමයි පවතින්නේ.

## කජු සංස්ථාව: විස්තර
மரமுந்திரிகைக் கூட்டுத்தாபனம்: விபரம்
CASHEW CORPORATION: DETAILS

1737/2025

**8. ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කජු සංස්ථාව ආරම්භ කරන ලද වර්ෂය කවරේද;
(ii) එය ආරම්භ කිරීමේ පරමාර්ථ කවරේද;
(iii) ශ්‍රී ලංකාවේ කජු වගා කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) 2020 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික -
(i) කජු අස්වැන්න සහ අවශ්‍යතාව;
(ii) අපනයනය කරන ලද කජු ප්‍රමාණය සහ එමඟින් උපයන ලද විදේශ විනිමය ප්‍රමාණය;
(iii) ආනයනය කරන ලද කජු ප්‍රමාණය සහ ඒ සඳහා වැය කරන ලද විදේශ විනිමය ප්‍රමාණය;

කොපමණද යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ශ්‍රී ලංකාවට කජු ආනයනය කරනු ලබන පෞද්ගලික ආයතන කවරේද;
(ii) දේශීය කජු නිෂ්පාදකයා සහ ව්‍යාපාරිකයා ආරක්ෂා කිරීමට අමාත්‍යාංශය මඟින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மரமுந்திரிகைக் கூட்டுத்தாபனம் ஆரம்பிக்கப்பட்ட ஆண்டு யாது என்பதையும்;
(ii) அது ஆரம்பிக்கப்பட்டதன் நோக்கங்கள் யாவை என்பதையும்;
(iii) இலங்கையில் மரமுந்திரிகை பயிரிடப்பட்டுள்ள நிலப்பரப்பின் அளவு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2020ஆம் ஆண்டு தொடக்கம் தற்போது வரையில் வருடாந்த -
(i) மரமுந்திரிகை அறுவடை மற்றும் தேவைப்பாடு எவ்வளவு என்பதையும்;
(ii) ஏற்றுமதி செய்யப்பட்ட மரமுந்திரிகையின் அளவு மற்றும் அதன்மூலம் ஈட்டப்பட்ட அந்நியச் செலாவணி எவ்வளவு என்பதையும்;
(iii) இறக்குமதி செய்யப்பட்ட மரமுந்திரிகையின் அளவு மற்றும் அதற்காகச் செலவிடப்பட்ட அந்நியச் செலாவணி எவ்வளவு என்பதையும்;

வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இலங்கைக்கு மரமுந்திரிகையை இறக்குமதி செய்யும் தனியார் நிறுவனங்கள் யாவை என்பதையும்;
(ii) உள்நாட்டு மரமுந்திரிகை உற்பத்தியாளர்களையும் வர்த்தகர்களையும் பாதுகாப்பதற்கு அமைச்சினூடாக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

மேலும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House the -
(i) year in which the Cashew Corporation was established;

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා]

(ii) objective of its establishment; and

(iii) extent of land under cashew cultivation in Sri Lanka?

(b) Will he also inform this House, separately in relation to each year during the period from the year 2020 up to now, the -

(i) cashew harvest and requirement;

(ii) quantity of cashew exported and the amount of foreign exchange earned therefrom; and

(iii) quantity of cashew imported and the amount of foreign exchange spent thereon?

(c) Will he further inform this House the-

(i) private institutions which import cashew into Sri Lanka; and

(ii) measures that have been taken by the Ministry to protect the local cashew producer and businessman?

(d) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වර්ෂ 1973.

(ii) කජු සංස්ථාව පිහිටුවීමේ පොදු පරමාර්ථ:

- වගාව ව්‍යාප්ත කිරීම මඟින් අස්වැන්න ඉහළ නැංවීම.
- කජු පිරිසැකසුම් කර්මාන්තයේ හා වතුයායන්වල ඵලදායීතාව ඉහළ නැංවීම.
- ශ්‍රී ලංකාවේ කජු සඳහා ගෝලීයව පිළිගත් වෙළෙඳ නාමයක් ඇති කිරීම.
- අගය එකතු කිරීම හා නව නිෂ්පාදන සංවර්ධනය.
- කජු අපනයනය දිරිගැන්වීම.
- ශ්‍රී ලංකාව කජු නිෂ්පාදනයේ ප්‍රමුඛයා බවට පත් කිරීම.
- ලාභ ඉපැයීම මඟින් ස්වයංපෝෂිත රාජ්‍ය සංස්ථාවක් බවට පත් කිරීම.

රාජ්‍ය කෘෂි කාර්මික සංස්ථා පනතේ පළමුවන උපලේඛනය අනුව කජු සංස්ථාව පිහිටුවීමේ පරමාර්ථයන්:

(අ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම, කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම සම්බන්ධ සැලසුම් පිළියෙළ කිරීම හා ක්‍රියාත්මක කිරීම ගැන අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ආ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම, කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ කටයුතු භාර ගැනීම;

(ඇ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම, කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම දියුණු කිරීමේ පරමාර්ථයෙන් විමර්ශන හා පර්යේෂණ කටයුතු භාර ගැනීම;

(ඈ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම, කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ තාක්ෂණික, අලෙවි හා වෙනත් තොරතුරු රැස් කිරීම, පිළියෙළ කිරීම, ප්‍රසිද්ධ කිරීම, බෙදා හැරීම භාර ගැනීම සහ ඒ කටයුතුවලදී අන් අය සමඟ එක්ව ක්‍රියා කිරීම;

(ඉ) කජු සහ කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා පිහිටුවනු ලබන කර්මාන්තශාලා පිහිටුවිය යුතු ස්ථාන, ඒවායේ ප්‍රමාණය හා තාක්ෂණික ප්‍රමිති නිශ්චය කිරීම සහ අලුත් කර්මාන්තශාලා පිහිටුවීමත් අවශ්‍ය අවස්ථාවලදී එවකට පවතින කර්මාන්තශාලා ක්‍රියා කරවීමත්;

(ඊ) කජු සහ කජු නිෂ්පාදන මිලට ගැනීම, බෙදා හැරීම, විකිණීම සහ අපනයනය කිරීම;

(උ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම, කජු නිෂ්පාදනය, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම පිළිබඳ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම පිණිස පහසුකම් සැපයීම;

(ඌ) කජු වගාවන්, පිරිසැකසුම් කිරීමේ පහසුකම් සහ අලෙවි කිරීම දියුණු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය මූලික සංවිධානය පිහිටුවීම සහ එම සංවිධාන පිහිටුවීමට ආධාර දීම; සහ

(එ) කජු නිෂ්පාදන ප්‍රචාරය කිරීම හා විකිණීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන පියවර ගැනීම, ලෝකයේ වෙළෙඳ පොළවල්වල ඒ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම සහ ඒ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ ආනුෂංගික කාර්යයන් සඳහා ප්‍රචාරක කටයුතුවලට මුදල් යෙදවීම, ඒ කටයුතු අනුපාලනය කිරීම සහ ඒ කටයුතුවලට ආධාර දීම ආරම්භ කොට ඊට අනුග්‍රහය දැක්වීම.

(iii) 2024 වර්ෂය වනවිට අක්කර 38,895කි.

(ආ) (i)

| වර්ෂය | කජු අස්වැන්න (මෙට්‍රික් ටොන්) | අවශ්‍යතාව |
|---|---|---|
| 2020 | 26,784 | ඇස්තමේන්තුගත වාර්ෂික ලෙලි කජු අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 25,000කි. |
| 2021 | 8,225 | |
| 2022 | 14,730 | |
| 2023 | 13,014 | |
| 2024 | 14,007 | |
| 2025 | දත්ත තවම ලැබී නොමැත. | |

(ii)

| වර්ෂය | කජු මද ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | විදේශ විනිමය (රුපියල් මිලියන) |
|---|---|---|
| 2020 | 34.31 | 81.13 |
| 2021 | 26.26 | 89.07 |
| 2022 | 58.20 | 212.83 |
| 2023 | 68.34 | 311.08 |
| 2024 | 104.79 | 303.12 |
| 2025 | දත්ත තවම ලැබී නොමැත | දත්ත තවම ලැබී නොමැත |

(iii) ඔව්.

| වර්ෂය | ලෙලි කජු ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | විදේශ විනිමය (රුපියල් මිලියන) |
|---|---|---|
| 2020 | 549.20 | 139.88 |
| 2021 | 0.05 | 0.01 |
| 2022 | 207.57 | 86.07 |
| 2023 | - | - |
| 2024 | 3,192.98 | 1134.93 |
| 2025 | දත්ත තවම ලැබී නොමැත | දත්ත තවම ලැබී නොමැත |

(ඇ) (i)

| අනු. අංකය | ආනයනකරුගේ නම |
|---|---|
| 01 | Achiev Fast Products( Pvt) Ltd |
| 02 | Fruits & Nuts Exports ( Pvt) Ltd |
| 03 | Commercial Export Syndicate |
| 04 | Ananda Stores |
| 05 | Janashakthi Cashew Nut Processors Welfare Association |
| 06 | ES Trading |
| 07 | Fair Ceylon Export ( Pvt) Ltd |
| 08 | Apex Ventures ( Pvt) Ltd |
| 09 | Trust Lanka Suppliers ( Pvt) Ltd |
| 10 | Gajaba Foods |
| 11 | Forbes & Walker Fine Foods( Pvt) Ltd |
| 12 | Green Supper Agriculture ( Pvt) Ltd |
| 13 | Kandy Trade Centre ( Pvt) Ltd. |
| 14 | R & G Cashew Nuts |
| 15 | Jayasri Cashew |
| 16 | Ran Osas |
| 17 | Barakath Cashew Nuts Industries |
| 18 | B.M.Chaminda Foods (Pvt)Ltd |
| 19 | N.E.Traders |
| 20 | Global Traders |
| 21 | ABC Importers & Exporters (Pvt)Ltd |
| 22 | MCM Holdings (Pvt)Ltd |
| 23 | සී/ස මාතර විවිධ සේවා සමුපකාර සමිතිය |
| 24 | සතුට කජු ව්‍යාපාරය |
| 25 | G.K.Cashew |
| 26 | Shiroshi Group (Pvt)Ltd |
| 27 | Prime Infinity Trading (Pvt)Ltd |
| 28 | ARK Foods |
| 29 | Jetleaf Holdings (Pvt)Ltd |
| 30 | Royal Agro (Pvt)Ltd |

ඉහත ලැයිස්තුවේ නම් සඳහන් ආනයනකරුවන්ගෙන් කිහිප දෙනෙකුට අමතරව පහත නම් සඳහන් ආනයනකරුවන් වෙතද 2025 වර්ෂයේදී ලෙලි කජු ආනයනය කිරීම සඳහා වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය මඟින් අනුමැති ලිපි නිකුත් කරන ලදී.

| අනු අංක | ආනයනකරුගේ නම |
|---|---|
| 01 | Varnisa Imports (Pvt.) Ltd. |
| 02 | Ivory Cashew Products (Pvt.) Ltd. |
| 03 | Wilpotha Agri Business (Pvt.) Ltd. |
| 04 | Wijaya Kaju Mada Nishpadanaya |
| 05 | New Peoples Cashew Nuts |
| 06 | Lanka Guardian Commodities Exports (Pvt.) Ltd. |
| 07 | S F Agro International (Pvt.) Ltd. |
| 08 | නෙත් කජු මද නිෂ්පාදන |
| 09 | S&U Special Cashew Nuts |
| 10 | උදය කජු ආයතනය |
| 11 | සමාධි කජු නිෂ්පාදන |
| 12 | යසංස කජු ව්‍යාපාරය |
| 13 | Lanka Organic Foods Exports Imports (Pvt.) Ltd. |
| 14 | Ingredient House (Pvt.) Ltd. |

(ii) ඔව්.

i. කජු වගාව ව්‍යාප්ත කිරීම සඳහා කජු පොකුරු ගම්මාන ව්‍යාපෘතිය මඟින් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දෙමින් කජු නිෂ්පාදකයා කජු වගාව සඳහා දිරිගැන්වීම.

ii. දේශීයව ලෙලි කජු හා කජු මද හිඟ අවස්ථාවලදී පමණක් කජු ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා දීම මඟින් දේශීය කජු නිෂ්පාදකයා සහ ව්‍යාපාරිකයා ආරක්ෂා කිරීමට පියවර ගැනීම.

(ඇ) අදාළ නොවේ.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. ගරු කථානායකතුමනි, ඇත්තටම ගරු අමාත්‍යතුමා දුන්නු පිළිතුර අනුවත් ඒ කාරණය පැහැදිලි වනවා. විශේෂයෙන්ම වර්තමානයේදී අපේ දේශීය කජු ව්‍යාපාරිකයාත්, කජු ගොවියාත් මුහුණ දෙන ප්‍රධාන ගැටලුව තමයි, වෙළෙඳ පොළේ අඩු මිලට කජු මද අලෙවි කිරීමට ඇති ප්‍රශ්නය. ඒ කියන්නේ, නීති විරෝධී ආකාරයෙන් ලංකාවට ආනයනය කරලා, ඉතා අඩු මිලකට කජු මද අලෙවි කරනවා. ඒ නිසා අපේ දේශීය ගොවියා සහ ව්‍යාපාරිකයා ඉතා අපහසුතාවට පත් වෙලා ඉන්නවා.

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා]

කුලියාපිටිය ආසනයේ කජු ව්‍යාපාරිකයන්ගේ එකමුතුවේ සාමාජිකයින් පිරිසක් මගේ මැදිහත්වීම මත මෑතකදී පාර්ලිමේන්තුවට ගෙන්වලා, ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමාටත් මුණගස්වලා, ඔවුන්ගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දුන්නා. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අපි සාමාන්‍යයෙන් අවධානය යොමු කළ යුතුයි කියලා මම හිතනවා.

ගරු අමාත්‍යතුමාගෙන් මම අහන පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. විවිධ ක්‍රම හරහා නීති විරෝධී ආකාරයට අපේ රටට ගෙන්වා අළෙවි කරන කජු මද -අවන් කරන කජු මද- වෙළෙඳ පොළේ තිබෙනවා කියන එක ගැන පැහැදිලිවම පැමිණිලි කරලා තිබෙනවා. ඒ කජු මද ලංකාවට ගෙනැල්ලා අළෙවි කරන එක නවත්වන්න අමාත්‍යාංශය වශයෙන් ඔබතුමා යම්කිසි පියවරක් අරගෙන තිබෙනවාද, ගරු ඇමතිතුමනි?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මම පිළිතුරේදීත් පැහැදිලි කළා, ලංකාවට සාමාන්‍යයෙන් ලෙලි කජු මෙට්‍රික් ටොන් 25,000ක් විතර වාර්ෂිකව අවශ්‍යයි කියන එක. නමුත්, අපේ රටේ ඒ ප්‍රමාණය නිෂ්පාදනය වන්නේ නැහැ. සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය වෙමින් තිබෙන නිසා විශේෂයෙන් කජු අවශ්‍යතාව ටිකක් වැඩිපුර තිබෙනවා. 2025 අවුරුද්දේත් මෙට්‍රික් ටොන් 25,000ක අස්වැන්නක් එන්නේ නැහැ කියලා අපි ගණනය කරලා තිබුණා. 2025 අවුරුද්දේ අපේ තක්සේරුව හැටියට තිබුණේ මෙට්‍රික් ටොන් 15,000ක පමණ අස්වැන්නක්. මෙට්‍රික් ටොන් 25,000ක් අවශ්‍ය වුණත් අපි දේශීය ගොවියා ආරක්ෂා කර ගන්නත් අවශ්‍යයි. ඒ වාගේම කජු ආශ්‍රිත කර්මාන්ත විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවායේ සේවකයෝ ඉන්නවා. ඔවුන්ගේ වෘත්තීන් ආරක්ෂා වෙන්නත් ඕනෑ නිසා අපි කජු මෙට්‍රික් ටොන් 5,000ක් ආනයනය කරන්න අවසර දෙනු ලැබුවා. නමුත්, ඊයේ වෙනකොටත් අපට වාර්තා වුණේ ඒකෙන් මෙට්‍රික් ටොන් 3,000ක් විතර ආනයනය කරන්න තමයි බලපත්‍ර ලබා ගෙන තිබෙන්නේ කියලායි. ඒ නිසා අපි උපරිම මහන්සි ගන්නවා, දේශීය කජු ගොවියා ප්‍රවර්ධනය කරමින් රටේ කජු අවශ්‍යතාව සම්පූර්ණ කර ගන්න. නමුත්, රටේ වෙළෙඳ පොළ අවශ්‍යතාව බලලා, අපට මදි ප්‍රමාණය ආනයනය කරන්න සිදු වෙනවා. ඔබතුමා අහන්නේ නුසුදුසු මට්ටමේ කජු එන එක වළක්වා ගන්නේ කොහොමද කියලා නේ. හොඳ කජු කියලා අපි සලකන්නේ ටැන්සානියාවෙන්, අප්‍රිකාවෙන් ගෙනෙන කජු. ඒවා ගෙනෙන්න කියලා තමයි අපි ව්‍යාපාරිකයෝ පෙලඹුවේ. ඒ අතරේ කලවම් වුණු කජු ප්‍රමාණයකුත් රටට එනවා. ඒවා අපේ රටට එන එක වැළැක්වීමේ වගකීම තිබෙන්නේ අපේ අමාත්‍යාංශයට වඩා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වාගේ ආයතනවලට. අපි ඒ සඳහා අවධානය යොමු කරවන්න සූදානම්.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. ගරු කථානායකතුමනි, ගරු අමාත්‍යතුමා කියපු ආකාරයට ඇත්තටම විශාල කජු අවශ්‍යතාවක් තිබෙනවා. මම නියෝජනය කරන කුලියාපිටිය ආසනයේ පමණක් කජු ව්‍යාපාරිකයන්ගේ කජු අවශ්‍යතාව සාමාන්‍යයෙන් වාරයකට ලෙලි කජු කිලෝ ලක්ෂ තුනකට අධික ප්‍රමාණයක් වනවා. ගොඩක් වෙලාවට මේ ප්‍රශ්නය පැන නඟිනවා, කජු අවාරයේදී, එහෙම නැත්නම් කජු අස්වැන්න අඩු කාල සීමාවේදී. ඒ කජු අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා යැමේදී ගරු අමාත්‍යතුමා කියපු ආකාරයට බලපත්‍ර සහිත කජු ව්‍යාපාරිකයෝ කිහිප දෙනෙක් ලෙලි කජු ගෙන්වලා අළෙවි කිරීම් කටයුතු කරනවා.

නමුත්, මෙතැන ගැටලුවක් පැන නැඟිලා තිබෙනවා කියලා මට වාර්තා වෙලා තිබෙනවා. අවාරයේදී, එහෙම නැත්නම් කජු අස්වැන්න අඩු කාල සීමාවේදී ව්‍යාපාරිකයන් කජු අළෙවි කරන්නේ වැඩි මිලකට. වැඩි මිලකට අළෙවි කරනකොට ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාර කටයුතු කරගෙන යෑමේ දුෂ්කරතාවක් ඇති වෙලා තිබෙනවා. මම ගරු අමාත්‍යතුමාට යොමු කරන දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ දුෂ්කරතාව මඟ හරවා ගන්නට, විශේෂයෙන්ම ඒ ප්‍රදේශවල නිෂ්පාදකයන්ගේ ධාරිතාව පිළිබඳ සැලකිල්ලක් දක්වලා ඒවා ගෙන්වා ගැනීමට ඔවුන්ට, එහෙම නැත්නම් සමුපකාර සමිතියකට හෝ බලපත්‍රයක් ලබා දීමට, - ඔබතුමා කියපු කාරණය නිවැරදියි. ටැන්සානියාව තමයි තත්ත්වයෙන් උසස් ලෙලි කජු මිලදී ගැනීමට තිබෙන්නේ- අමාත්‍යාංශය වශයෙන් ඔබතුමන්ලාට ක්‍රමවේදයක් සකස් කරන්න පුළුවන්ද?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න කළා වාගේ දේශීය කජු ගොවියා ආරක්ෂා කරන අරමුණෙන් තමයි අපි කටයුතු කරන්නේ. මම කලින් පැහැදිලි කළා වාගේ අපට කජු මෙට්‍රික්ටොන් 25,000ක් අවශ්‍යයි. පසුගිය අවුරුද්දේ අපට මෙට්‍රික්ටොන් 15,000ක් එනවා කියලා තක්සේරු කරලා තිබුණා. නමුත්, අපි 10,000ක් ගෙන්වන්න ඉඩ දුන්නේ නැහැ. අපි ඉඩ දුන්නේ 5,000ක් ගෙන්වන්නයි. ඒවා වැඩිපුර ගෙනැල්ලා ගබඩා - stock- කරගෙන කජු අස්වැන්න නෙළන කාලයේ එළියට දැම්මොත් සමහර විට දේශීය කජු ගොවියාගේ කජු මිල පහළ බහින්න පුළුවන්. ඒ හින්දායි අපි මෙට්‍රික්ටොන් 5,000ක් ගෙන්වන්න අවසර දුන්නේ. පසුගිය අවුරුද්දේ තත්ත්වයන් බලා බලා දෙපාරකට තමයි කජු ආනයනය සඳහා අවසර දුන්නේ. ඒ තත්ත්වයන් බලලා තමයි එහෙම කළේ.

ඊළඟට, සුළු පරිමාණ නිෂ්පාදකයාට කජු ගේන්න අවසර දෙන්න අපට බැරිකමක් නැහැ. නමුත්, ඒ සඳහා වැය වන මුදල් කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට එකතු කර ගන්න බැරි වීම නිසා, ඒ තරම් පිරිවැයක් දරා ගන්න බැරි නිසා ඔවුන්ට සිද්ධ වෙලා තිබෙනවා, මහ පරිමාණ ලෙස කජු ආනයනය කරන අයගෙන් ලංකාවේදි ටිකක් වැඩි මිලකට කජු මිලදී ගන්න. එහෙම තමයි කෙරෙන්නේ. අමාත්‍යාංශය විධියට අපට ඒ කටයුත්ත කරන්න ටිකක් අපහසුයි. එහෙම වුණොත් අපට වෙළෙඳ අමාත්‍යාංශයත් එක්ක තමයි ඒ ගැන සාකච්ඡා කරන්න වෙන්නේ. ඒ අය එක්ක සාකච්ඡාවකට යොමු වෙමුයි කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

## "ලොනැක් ඩේරි" සත්ව ගොවිපළේ කටයුතු: පාරිසරික නිර්දේශවලට අනුගත වීම

## "லொனக் டேரி" கால்நடைப் பண்ணையின் தொழிற்பாடுகள்: சுற்றாடல் தேவைப்பாடுகளுடன் இணங்கிச் செல்லல்

OPERATIONS OF LONACH DAIRY FARM: CONFORMITY TO ENVIRONMENTAL REQUIREMENTS

1759/2025

**9.** **ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) "ලොනැක් ඩේරි ෆාම්" (Lonach Dairy Farm) සත්ව ගොවිපළ ආරම්භ කිරීමේදී සපුරාලිය යුතු පාරිසරික නෛතික අවශ්‍යතාවන් සම්පූර්ණ කර තිබේද;

(ii) එම ගොවිපළෙහි එකතුවන දෛනික සත්ව අපද්‍රව්‍ය බැහැර කරන ක්‍රමවේදය කවරේද;

(iii) 2020 වර්ෂයේ සිට මේ දක්වා ගොවිපළ සඳහා අදාළ වාර්ෂික පාරිසරික බලපත්‍ර ලබාගෙන තිබේද;

(iv) එම ගොවිපළ අදාළ පාරිසරික නිර්දේශ මත ක්‍රියාත්මක වන්නේද;

(v) ගොවිපළේ කළමනාකාරිත්වය අදාළ පාරිසරික නිර්දේශ උල්ලංඝනය කර ඇති අවස්ථා තිබේද;

(vi) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "லொனக் டேரி பாம்" (Lonach Dairy Farm) கால்நடைப் பண்ணையை ஆரம்பிக்கும்போது, சுற்றாடல் சார்ந்த சட்டத் தேவைப்பாடுகள் பூர்த்தி செய்யப்பட்டனவா என்பதையும்;

(ii) மேற்படி பண்ணையில் நாளாந்தம் ஒன்றுசேரும் கால்நடைக் கழிவுகளை வெளியேற்றும் வழிமுறை யாது என்பதையும்;

(iii) மேற்படி பண்ணை, 2020ஆம் ஆண்டு தொடக்கம் தற்போது வரை சம்பந்தப்பட்ட வருடாந்த சுற்றாடல் அனுமதிப்பத்திரங்களைப் பெற்றுக்கொண்டுள்ளதா என்பதையும்;

(iv) மேற்படி பண்ணை சுற்றாடல் பரிந்துரைகளுக்கமைவாக தொழிற்படுகின்றதா என்பதையும்;

(v) மேற்படி பண்ணையின் முகாமைத்துவம் ஏற்புடைய சுற்றாடல் பரிந்துரைகளை மீறிச் செயற்பட்ட சந்தர்ப்பங்கள் காணப்படுகின்றனவா என்பதையும்;

(vi) ஆமெனில், அது தொடர்பாக மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) whether the relevant environmental legal requirements have been fulfilled when starting the "Lonach Dairy Farm";

(ii) the methodology of disposing the daily animal waste collected in the said farm;

(iii) whether the farm has obtained the relevant annual environmental licences from the year 2020 to date;

(iv) whether said farm is operating in accordance with the relevant environmental recommendations;

(v) whether there are any instances in which the management of the farm has violated the relevant environmental recommendations; and

(vi) if so, the actions that were taken in that regard?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සත්ව ගොවිපළ ආරම්භ කිරීම සඳහා මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය (IEE) හරහා අංක CEA/CPO/NW/OTHER/125/16 දරන 2016.11.16 දිනැතිව මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා දී ඇත.

අංක 2265/18 දරන ගැසට් නිවේදනයට අනුව මෙම ගොවිපළ සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගත යුතු ක්‍රියාකාරකමක් වේ. මෙම ගොවිපළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ පවතින බැවින්, ඒ සඳහා පරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවට අනුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සිදු කරනු ලබයි.

(ii) එම ගොවිපළ සඳහා IEE අනුමැතිය ලබා දීමේදී පහත කොන්දේසිවලට යටත්ව අනුමැතිය ලබා දී ඇත.

<u>අපජලය</u>

අපජලය (දියරමය සත්ව අපදියර හා ගව මුත්‍රා) ජීවවායු ඒකකයක් වෙත යොමු කිරීමටත්, ජීවවායු ඒකකයෙන් ජනනය වන අපවහන දියර (effluent) අපජල ප්‍රතිකර්ම පද්ධතියක් හරහා පිරිපහදු කිරීම සහ සතුන් සේදීමේදී හා නැහැවීමේදී නිකුත් වන අපජල උරා ගැනීමේ වළක් වෙත යොමු කිරීම.

<u>ඝන අපදියර</u>

කොම්පෝස්ට්කරණය මඟින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.

(iii) මධ්‍යම පරිසර අධිකාරියේ අංක CE/NW/PAW/08/BOI/80/2021 දරන 2022.01.31 දිනැති එකඟතා (concurrence) ලිපිය අනුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මඟින් අංක CE/NW/PAW/B 22/LE-1991/23 දරන 2023.02.03 දිනැති 2023.01.31 දින සිට 2024.01.30 දින දක්වා වලංගු පාරිසරික ආරක්ෂණ බලපත්‍රය - EPL - අවසන් වරට නිකුත් කර ඇත. මේ වන විට අපජලය හා ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධ ගැටලුකාරී තත්ත්වය හේතුවෙන් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත එකඟතාව ලබා දී නොමැති බැවින්, පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කර නොමැත.

(iv) මෙම ගොවිපළ සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් පසු විපරම් කිරීම සහ අවශ්‍ය උපදෙස් ලබා දීම සිදු කරයි.

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

(v) එනම්, මෙම ගොවිපළේ අපජලය කෙසෙල්ගමු ඔයට මුසු වන බවට සඳහන් 2024.01.08 දිනැති පුවත් පත් දැන්වීම අනුව, මධ්‍යම පරිසර අධිකාරියේ නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාල නිලධාරින් විසින් 2024.01.18 දින සිදු කරනු ලැබ ඇති ක්ෂේත්‍ර පරීක්ෂණයේ නිරීක්ෂණ අනුව අපජලය බාහිර පරිසරයට මුසු වීමේ හැකියාවක් පවතින බව නිරීක්ෂණය කරනු ලැබ ඇත.

(vi) ඉහත v හි නිරීක්ෂණ අනුව මේ බව මධ්‍යම පරිසර අධිකාරියේ මධ්‍යම පළාත් කාර්යාලය මඟින් අංක CE/NW/PAW/08/BOI/80/2021 දරන 2024.01.31 දිනැති ලිපිය මඟින් BOI වෙත දන්වා ඇත.

තවද, මෙම ගොවිපළට අදාළව ලැබී ඇති පැමිණිලි සම්බන්ධයෙන්, BoI හි ඉහළ කළමනාකාරිත්වය සමඟ 2026.01.08 දින සාකච්ඡාවක් පවත්වන ලදී. ඒ අනුව, මෙම ගොවිපළෙන් සිදුවන පාරිසරික දූෂණ තත්ත්වය පාලනය කිරීම සඳහා පහත තීරණ ගන්නා ලදී.

1. ආයෝජන මණ්ඩලය විසින් අදාළ පාරිසරික දූෂණ පාලනය සඳහා උපදෙස් ලබා දීම.

2. ආයෝජන මණ්ඩලය මඟින්, විධිමත් පසුවිපරම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ක්‍රියාකාරි සැලැස්මක් ගොවිපළ කළමනාකාරිත්වය වෙතින් ලබා ගැනීම සහ ඒ අනුව කටයුතු කිරීම.

3. කෙසෙල්ගමු ඔය ආශ්‍රිතව ගොවිපළවල් පවතින බැවින්, ඒ සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ ආයෝජන මණ්ඩලය සහ මධ්‍යම පරිසර අධිකාරිය ඒකාබද්ධව සිදුකොට ජල සාම්පල ලබා ගැනීම සහ පවතින පාරිසරික දූෂණ තත්ත්වය පාලනය කිරීම සඳහා පියවර ගැනීම.

4. ඉහත අංක 2 හි සඳහන් ක්‍රියාකාරි සැලැස්මට අනුව ක්‍රියාත්මක නොවන්නේ නම් ඒ සඳහා නීතිමය පියවර ගැනීමට ක්‍රියාත්මක වීම ආයෝජන මණ්ඩලය විසින් සිදු කිරීම.

(ආ) අදාළ නොවේ.

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට ලබා දුන් පිළිතුර සම්බන්ධයෙන් සෑහීමකට පත්වෙන්න බැහැ. ඒ නිසා පොඩි පැහැදිලි කිරීමක් එක්ක මට අතුරු ප්‍රශ්න දෙකක් අහන්න තිබෙනවා.

මොකද, මේක බිමේ තිබෙන ප්‍රශ්නයක් නිසා සහ මෙතැන කථා කරන ප්‍රශ්නය ඊට අදාළ නොවන නිසා. විශේෂයෙන්ම ලොනැක් ෆාම් එක 2017 සිටම පරිසර විරෝධී වාගේම මහජන පීඩාවක් ඇති කරමින් තමයි පවත්වා ගෙන යන්නේ. 2017 දී තහනම් නියෝගයකුත් නිකුත් කර තිබෙනවා, එක්කෝ මේ ෆාම් එක නවත්වන්න, නැත්නම් පරිසර හිතකාමී විධියට මේක කරගෙන යන්න කියලා. මේක මේ විධියට හැම අවුරුද්දකම මහවැලි ගඟටත්, කැලණි ගඟටත් අදාළ පෝෂක ඇළ මාර්ගවලට දිනකට දියර ලීටර් 50,000ක් වාගේ, ඒ කියන්නේ මුත්‍රා සමඟ සත්ව අපද්‍රව්‍ය එකතු කරමින් ඉන්නවා. ඒ වාගේම කඳු මුදුන්වල තිබෙන තණකොළ වගාවට මේ දියර මුසුකරමින් පහත් බිම්වල ඇළදොළ, ගංගාවලට මේවා එකතු කරමින් ඉන්නවා. ඒ නිසා දිනපතා පොලීසියට පැමිණිලි ලැබෙමින් තිබෙනවා.

අනෙක් කාල පරාසයන් අත් හැරලා, මේ මහජන පීඩාව සම්බන්ධයෙන් මහජන නියෝජිතයන් ලෙස අපටත්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවටත් එන ජනතාවගේ පැමිණිලි, දුක්ගැනවිලි අමතක කරලා, 2025 සහ 2026 වර්ෂවලට අදාළව ගත්තොත්; ආසන්නව මෑත කාලය ගත්තොත් ජනතාව ගැන තැකීමකින් තොරව කටයුතු කරන නිසා 2025.06.20 දිනත් පොලීසිය විසින් ඒ අය අධිකරණයට ඉදිරිපත් කරලා දඬුවම් දීලා තිබෙනවා; දඩ ගහලා තිබෙනවා. ඒකෙනුත් සෑහීමකට පත් නොවී 2025.10.08වැනි දාත් නැවත ගිහිල්ලා බවුසර්වලින් කැලණි ගඟට එකී අපද්‍රව්‍ය මුදා හැර තිබෙනවා.

මට අහන්න තිබෙන ප්‍රශ්නය තමයි, මෙවන් පරිසර ප්‍රශ්නයක් ඇති කරද්දී, මහජන පීඩාවක් කරද්දී මීට අදාළ ආයතන විධියට තිබෙන ප්‍රාදේශීය සභාවේ, මධ්‍යම පරිසර අධිකාරියේ, පරිසර අමාත්‍යාංශයේ නිලධාරින් අදාළ අනුමැතියන් ලබා දෙමින්, ජනතාව රවටමින් යන්නේ කොහොමද කියන එක. ඒකට අදාළව ගරු ඇමතිතුමාගේ පැත්තෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගන්නවාද කියන එක තමයි මහජනතාව වෙනුවෙන් දැනගන්න තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරවීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ සම්බන්ධයෙන් ගත්තොත්, අපි දැනටමත් මේකට පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා දීම අත්හිටුවලායි තිබෙන්නේ. ඊට පස්සේ අපි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට දැනුම් දී තිබෙනවා, ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්න කියලා. ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වගකීමක් හැටියට තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඔබතුමා ඉදිරිපත් කරපු කාරණය ගැන මම සැලකිලිමත් වෙන්නම්. නැවත වතාවක් කඩිනමින් ඒකට කරන්න පුළුවන් දේ මොකක්ද කියන කාරණයට මා මැදිහත් වෙන්නම්.

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ හා සමානවම තවත් සත්ව ගොවිපළවල් විශාල ප්‍රමාණයක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිබෙනවා. ඒවාත් මේ හා සමාන විධියටම පරිසරයට හානි වන අන්දමින් සහ මහජන පීඩා ඇති කරමින් කටයුතු කරමින් තිබෙනවා. මම ඒ සම්බන්ධයෙන් උදාහරණ නම් වශයෙන් කියන්න අවශ්‍ය නැහැ. ඒ නිසා පරිසර අමාත්‍යාංශය විධියට මේ පිළිබඳවත් දැඩි සැලකිල්ලක් යොමු කරමින් කාල රාමුවක් සහිතව ක්‍රියාමාර්ග ගන්නේ කවදාද කියා දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, ඒ නිශ්චිත සත්ත්ව ගොවිපළවල් මොනවාද යන්නත්, ඒවායෙන් සිදු වන පරිසර දූෂණය සම්බන්ධයෙනුත් අපට තොරතුරු ලබා දුන්නොත් අපට පුළුවන් ඒ සඳහා මැදිහත් වෙන්න. අපි ඉක්මනින් ඒ සඳහාත් මැදිහත් වෙලා ක්‍රියාමාර්ග ගන්නම්.

## NHDA විසින් ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘති: අනුරාධපුර දිස්ත්‍රික්කය

NHDAஇனால் நடைமுறைப்படுத்தப்பட்ட வீடமைப்புக் கருத்திட்டங்கள்: அநுராதபுர மாவட்டம்

HOUSING PROJECTS IMPLEMENTED BY NHDA: ANURADHAPURA DISTRICT

1760/2025

**10.** ගරු තිළිණ සමරකෝන් මහතා
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1);

(අ) (i) 2015 වර්ෂයේ සිට 2019 දක්වා කාල සීමාව තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ආධාර සහ ණය ලෙස ලබා දුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ව්‍යාපෘති සඳහා තෝරාගනු ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ ඔවුන් තෝරා ගනු ලැබූ ක්‍රමවේදය කවරේද;

(iv) එම ව්‍යාපෘති මඟින් ඉදි කිරීමට අපේක්ෂා කරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත නිවාස අතරින් මේ වන විට ඉදි කිරීම් අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) නිවාස ඉදි කර අවසන්ව නොමැති නම්, ඊට හේතු කවරේද;

(vii) නිවාස ව්‍යාපෘති සඳහා යොදාගත් ඉඩම් සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் அநுராதபுரம் மாவட்டத்தில் தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையால் நடைமுறைப்படுத்தப்பட்ட வீடமைப்புக் கருத்திட்டங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டங்களுக்காக தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையால் உதவித் தொகையாக மற்றும் கடனாக வழங்கப் பட்ட பணத்தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டங்களுக்குத் தெரிவுசெய்யப் பட்ட பயனாளிகளின் எண்ணிக்கை மற்றும் அவர்கள் தெரிவுசெய்யப்பட்ட வழிமுறை யாது என்பதையும்;

(iv) மேற்படி கருத்திட்டங்கள்மூலம் நிர்மாணிப்பதற்கு உத்தேசித்த வீடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) மேற்குறிப்பிட்ட வீடுகளுள் ஏற்கெனவே நிர்மாணப் பணிகள் நிறைவு செய்யப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை ஒவ்வொரு கருத்திட்டம் வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(vi) வீடமைப்புப் பணிகள் நிறைவு செய்யப் படவில்லை எனின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(vii) வீடமைப்புக் கருத்திட்டங்களுக்காகப் பயன் படுத்திய காணிகள் தொடர்பாக எழுந்துள்ள சிக்கல்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House the -

(i) number of housing projects implemented by the National Housing Development Authority in the Anuradhapura District during the period from 2015 to 2019;

(ii) amount of money provided by the National Housing Development Authority as aids and loans for the said projects, separately;

(iii) number of beneficiaries selected for those projects and the methodology used in selecting them;

(iv) number of houses expected to be constructed through the said projects;

(v) number of houses that have been completed by now, out of the above houses, separately as per each project;

(vi) reasons for the failure to complete the constructions, if constructions have not been completed yet; and

(vii) issues that have arisen regarding the lands used for the housing projects?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නිවාස ව්‍යාපෘති - ණය යටතේ : 51

මුදල් ආධාර යටතේ : 13

(ii) ණය: රුපියල් මිලියන 470.74

ආධාර: රුපියල් මිලියන 82.40

(iii) අදාළ බල ප්‍රදේශය භාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයක් මඟින් ප්‍රතිලාභීන් තෝරා ගන්නා ලදී.

ණය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් : 1,277

ආධාර වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් : 332

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

(iv) නිවාස සංඛ්‍යාව 1,556කි. (ණය යටතේ 1,277 + ආධාර යටතේ 279)

(v) ඉහත නිවාස අතරින් මේ වන විට ඉදි කිරීම් අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් පහත වගුවෙහි දැක්වේ.

| අනු අංකය | ණය/ ආධාර | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ව්‍යාපෘතියේ නම | වැඩ අවසන් නිවාස ගණන |
|---|---|---|---|---|
| 1 | ණය | තිරප්පනේ | දෙමටැගම | 24 |
| 2 | | තලාව | දෙවනපෑතිස්ගම | 26 |
| 3 | | කහටගස්දිගිලිය | ධර්මාභිවන්දනාගම | 56 |
| 4 | | රාජාංගනය | යාය 06, (අසේල නිරිදුගම) | 25 |
| 5 | | පලුගස්වැව | නවතිස් සමරුගම | 25 |
| 6 | | මැදවච්චිය | තුරුණුගම | 16 |
| 7 | | නැගෙනහිර නුවරගම් පළාත | ශ්‍රී විභූතිගම | 29 |
| 8 | | නැගෙනහිර නුවරගම් පළාත | ජන්ම සමරුගම | 33 |
| 9 | | නැගෙනහිර නුවරගම් පළාත | ජන්ම අභිමානිගම | 39 |
| 10 | | නැගෙනහිර නුවරගම් පළාත | සලදිනුගම | 25 |
| 11 | | කැබිතිගොල්ලෑව | ජයන්තුගම | 18 |
| 12 | | ඉපලෝගම | මානෑව | 25 |
| 13 | | තලාව | දේවානම්පියතිස්සගම | 26 |
| 14 | | තලාව | ගිරාඹේ ආනන්දගම | 27 |
| 15 | | තලාව | මොරගොඩ | 24 |
| 16 | | පලාගල | කරුණායාභරනගම | 27 |
| 17 | | පලාගල | නෙල්ලිගම | 33 |
| 18 | | පලාගල | උරුලෑව | 22 |
| 19 | | රඹෑව | වනමල්ගොල්ලෑව | 48 |
| 20 | | රඹෑව | වනමල්ගොල්ලෑව | 20 |
| 21 | | රඹෑව | වනමල්ගොල්ලෑව | 40 |
| 22 | | රඹෑව | පණ්ඩුකාභයපුර | 27 |
| 23 | | නොච්චියාගම | කොකුන්නෑව | 16 |
| 24 | | නොච්චියාගම | කුසුම්පුර | 21 |
| 25 | | නොච්චියාගම | කුසුම්පුර | 31 |
| 26 | | නැගෙනහිර නුවරගම් පළාත | අභයරාජගම | 23 |
| 27 | | කැකිරාව | හිරුකිරණගම | 25 |
| 28 | | කැකිරාව | දිවිදිනුගම | 25 |
| 29 | | පදවිය | අලුත්හල්මිල්ලෑව | 26 |
| 30 | | පදවිය | රන්මලී | 27 |
| 31 | | ගල්නෑව | අඹගම්මානය | 22 |
| 32 | | තඹුත්තේගම | මකුලෑව | 19 |
| එකතුව | | | | 870 |
| 1 | ආධාර | ගල්නෑව | අලිවංගුව | 28 |
| 2 | | කහටගස්දිගිලිය | රත්මල්ගහවැව | 25 |
| 3 | | කැබිතිගොල්ලෑව | ඩී.එම්. අමරතුංගගම | 25 |
| 4 | | මධ්‍යම නුවරගම් පළාත | ප්‍රභාෂණගම | 25 |
| එකතුව | | | | 103 |

ඒ අනුව නිවාස 1,556න් නිවාස 973ක වැඩ අවසන් කර තිබෙනවා. නිවාස 583ක වැඩ අවසන් වෙලා නැහැ.

(vi) මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම සහ රජය වෙනස්වීම මත දේශපාලන නායකත්වයේ ප්‍රතිපත්ති වෙනස්වීම හා තෝරා ගත් ප්‍රතිලාභීන්ගේ ගැටලු ආදි කාරණා නිසා එම නිවාස ඉදිකිරීම් කටයුතු අවසන් කරන්න බැරි වුණු බව තමයි නිවාස සංවර්ධන අධිකාරියෙන් වාර්තා කර තිබෙන්නේ.

(vii)
- ඇතැම් නිවාස ව්‍යාපෘති වනජීවී, වන සංරක්ෂණ කලාප තුළ පිහිටීම නිසා අදාළ අනුමැතිය ලබා ගැනීමට තවමත් නොහැකි වීම
- යෝජිත ව්‍යාපෘති බොහොමයක් සඳහා මාර්ග, ජලය සහ විදුලිය වැනි පොදු පහසුකම් නොමැති වීම ගැටලුවක් වී තිබීම

(ආ) අදාළ නැත.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

ගරු කථානායකතුමනි, මම මගේ අතුරු ප්‍රශ්න දෙක අහනවා. ගරු ඇමතිතුමනි, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒවා ක්‍රියාත්මක වීමත් එක්ක විශේෂයෙන්ම කැකිරාව, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ස්වස්ථිගම, හිරුකිරණගම, දිවිදිනුගම, කඩියන්ගල්ල නිවාස ව්‍යාපෘතිවල නිවාස ලබා දීම සඳහා තෝරා ගන්නා නිර්ණායක පිළිබඳව ඔබතුමාට යම් අදහසක් දෙන්න පුළුවන්ද?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ඒක තමයි ප්‍රශ්නය, ගරු කථානායකතුමනි. නිර්ණායකය ලෙස "අඩු ආදායම්ලාභීන්" යන්න තමයි තිබෙන්නේ. නමුත් ඒ නිවාස ව්‍යාපෘතිවලට ගිහිල්ලා, ඇත්තටම තෝරා ගත්තේ කොහොමද කියලා, කාටද හම්බ වෙලා තිබෙන්නේ කියලා බැලුවාම පෙනෙනවා, ඒ පැත්තේ හිටපු මන්ත්‍රීතුමාගේ හිතවතුන්ට, නෑදෑයන්ට, උදව් කරපු කට්ටියට, canvassing ගිය කට්ටියට තමයි ඒවා හම්බ වෙලා තිබෙන්නේ කියලා. නිර්ණායකය තිබෙන්නේ "අඩු ආදායම්ලාභීන්" කියලා. නමුත්, ඇත්තටම ලැබී තිබෙන්නේ, අර මා කියපු කණ්ඩායමට. එතැන ප්‍රශ්නයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, දැන් ඔබතුමා කියපු ආකාරයටම ඒ නිවාස ව්‍යාපෘතිවලට තෝරා ගැනීම විනිවිදභාවයකින් සිදු වෙලා නැති බව ප්‍රදේශවාසී ජනතාවත් මේ වන විට පවසනවා. සුදුසුම පුද්ගලයන් තෝරාගෙන නැති බැවින්, එම නිවාස විශාල ප්‍රමාණයක් මේ වන විට වසා තිබෙනවා. ඒ කියන්නේ, සුදුසුම පුද්ගලයන් තෝරාගෙන නැති නිසා ගෙවල් වසා දමා තිබෙනවා. රටේ නිවාස ප්‍රශ්නයක් තිබෙන මොහොතක එම නිවාස නැවත පවරාගෙන සුදුසු පුද්ගලයන් වෙත ලබා දීමේ ක්‍රමවේදයක් සැකසීමට හැකියාවක් තිබේද? උදාහරණයක් හැටියට කියනවා නම්, ණය මුදල් ලබා දීලා තිබෙනවා, සමහර නිවාස ව්‍යාපෘති සඳහා. ඒ ලබා දුන් ණය මුදල් නැවත රජයේ පාර්ශ්වයෙන් ඒ අදාළ පුද්ගලයන්ට ලබා දීලා හෝ ඒ නිවාස නැවත පවරා ගැනීමට හැකියාවක් තිබෙනවාද කියා මම ඔබතුමාගෙන් අහනවා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

මේ පිළිතුරේ සඳහන් වෙලා තිබුණු විධියටම අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිවාස 1,556ක් හදන්න ආරම්භ කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. නමුත් වැඩ අවසන් කරලා තිබෙන්නේ නිවාස 973කයි. වැඩ අවසන් කළා කියන නිවාස 973හිත් මිනිස්සු පදිංචි නැහැ. ඒවායේ වැඩ අවසන් කරලා තිබෙනවා; පදිංචි නැහැ. ඒකට හේතු ගොඩක් තිබෙනවා. එකක් තමයි ඒ සමහර ගම්මාන සම්පූර්ණයෙන්ම තිබෙන්නේ අලි කොරිඩෝවල. සමහර ගම්මාන තිබෙන්නේ තවමත් කැලේ. සමහර ඉඩම් ප්‍රශ්න නිසාත් ඒවාට මිනිස්සු ඇවිල්ලා නැහැ. ඇත්තටම ගෙයක් හදන්න ණයක් දුන්නාට පස්සේ, ඉඩමකුයි ආධාරයකුයි දුන්නාට පස්සේ ඒ ණය හෝ ආධාර ලැබූ පුද්ගලයාට ගෙයක් නැත්නම්, ඔහු ඇවිල්ලා ඒ ඉඩමේ පොල් අතු පැලක් හරි හදාගෙන පදිංචි වෙනවා. නමුත් ගෙයකුත් හදලා තිබියදී පදිංචි වෙන්නේ නැත්තේ ඇයි? ඔහුට නිවසක් තිබෙන නිසා. ඒ නිසා තමයි මේ තෝරා ගැනීමේ ප්‍රශ්න තිබෙනවා කියන්නේ. ඒ ප්‍රශ්නය අනුරාධපුර දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, රට පුරා තිබෙනවා. මම පසුගිය දවස්වල හම්බන්තොටට ගියා. හම්බන්තොට නිවාස ව්‍යාපෘති 323ක් ආරම්භ කර තිබෙනවා. වැඩ නිම කරපු නැති නිවාස ව්‍යාපෘතියක් මට පෙන්වන්න කිව්වාම, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරින් මාව එක්කරගෙන ගියේ, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් තුන්දෙනෙකුත් සමඟයි.

අලි වැටෙන් පැනලා, කැලේ කපාගෙන ගිහින් තමයි නිවාස ව්‍යාපෘති පෙන්වූයේ. ගම්මාන දෙකක් සම්පූර්ණයෙන්ම කැලේ තිබෙන්නේ.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

ඒවා හදපු අයත් මේ ඉස්සරහා ඉන්නවා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ඔව්, ඒ අය විපක්ෂයේ ඉදිරි පෙළේ ඉන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඇත්තෙන්ම අහන්න පුළුවන්, කොහොමද ඒ තෝරා ගැනීම කළේ කියලා. ඇත්තටම රට පුරා මහා විනාශයක් කරලායි තිබෙන්නේ. අපි දැන් නිවාස සංවර්ධන අධිකාරියෙන් ඒ තොරතුරු ඉල්ලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, විශේෂ කමිටුවක් පත් කරන්න. මොකද, මේ ගැටලු ටික නිරාකරණය කරන්න ඕනෑ. ඉඩම් ගැටලු තිබෙනවා. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති ඉඩම් පවරාගෙනත් නැහැ. ඒ වාගේම තෝරා ගැනීම් පිළිබඳ ගැටලු ද තිබෙනවා. ඊළඟට, දුන්නු ණය නැවත අය කර ගන්න ගියාමත් ප්‍රශ්න. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සම්පූර්ණයෙන් බංකොලොත් වෙලා තිබෙනවා, ඒ නිවාස ණය අය කර ගන්න බැරිව. මේක ලොකු ප්‍රශ්නයක්.

ගරු මන්ත්‍රීතුමනි, මට අනුරාධපුර දිස්ත්‍රික්කයට විතරක් අදාළව උත්තරයක් දෙන්න බැහැ. මේ ප්‍රශ්නයට අපි ජාතික වශයෙන් පිළිතුරක් සොයන්න බලාපොරොත්තු වෙනවා. ඒ හදපු නිවාස පවා සුදුසුම මිනිසුන්ට දෙන්නේ කොහොමද කියන ප්‍රශ්නයටත් උත්තර සොයන්න වෙලා තිබෙනවා. ඒ බෙදපු ඉඩම් පවා ඉඩම් අවශ්‍යම අයට දෙන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් නිර්දේශ ලබා ගන්න අවශ්‍යයි. ඒ සඳහා අමාත්‍යාංශය විධියට අපි කමිටුවක් පත් කරන්න බලාපොරොත්තු වෙනවා. එම කමිටුවෙන් තමයි අපට නිර්දේශ ලබා ගන්න වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## කිලිනොච්චි නගරයේ සතොස වෙළඳසැල පිහිටි ගොඩනැඟිල්ල ඉදිකිරීම: විස්තර
## கிளிநொச்சி நகரிலுள்ள சதொச விற்பனை நிலையத்தின் நிர்மாணம்: விபரம்
## CONSTRUCTION OF BUILDING HOUSING SATHOSA STORE IN KILINOCHCHI TOWN: DETAILS

1180/2025

**2. ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) කිලිනොච්චි නගර මධ්‍යයේ සතොස වෙළෙඳසැල පිහිටුවා ඇති ගොඩනැඟිල්ල නිසි අනුමතියකින් තොරව ඉදි කර ඇති බව දන්නේද;

(ii) ඉදි කිරීම් සඳහා අදාළ අනුමතිය කරෙයිච්චි ප්‍රාදේශීය සභාවෙන් නිසි පරිදි ලබා ගෙන තිබේද;

(iii) එම ගොඩනැඟිල්ල ඉදි කිරීම සඳහා රජයේ මුදල් වැය කර තිබේ නම්, ඒ සඳහා මිල ගණන් කැඳවන ලද විස්තර කවරේද;

(iv) ඉදි කිරීම් සඳහා වැය කර ඇති මුදල රුපියල් මිලියනවලින් කොපමණද;

(v) ඉහත ගොඩනැඟිල්ලේ වර්තමාන හිමිකරු කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත ගොඩනැඟිල්ල පිහිටුවා ඇති භූමියේ හිමිකාරිත්වය සතු ආයතනය කවරේද;

(ii) එම ඉඩම දීර්ඝ කාලීන බදු පදනම මත යම් පාර්ශ්වයකට ලබා දී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிளிநொச்சி நகர மத்தியில் சதொச விற்பனை நிலையம் அமைந்துள்ள கட்டடம் உரிய அங்கீகாரமின்றி நிர்மாணிக்கப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) நிர்மாணப் பணிகளுக்குரிய அங்கீகாரம் கரைச்சி பிரதேச சபையிடமிருந்து உரிய முறையில் பெறப்பட்டுள்ளதா என்பதையும்;

(iii) மேற்படி கட்டடத்தை நிர்மாணிப்பதற்கு அரச நிதி செலவிடப்பட்டு இருக்குமானால், அதன் பொருட்டு மேற்கொள்ளப்பட்ட விலைமனுக் கோரல் பற்றிய விபரங்கள் யாவை என்பதையும்;

(iv) நிர்மாணப் பணிகளுக்குச் செலவிடப்பட்ட தொகை எத்தனை மில்லியன் ரூபாய் என்பதையும்;

(v) மேற்படி கட்டடத்தின் தற்போதைய உரிமையாளர் யார் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி கட்டடம் அமைந்துள்ள காணியின் உரித்தைக் கொண்டுள்ள நிறுவனம் யாது என்பதையும்;

(ii) மேற்படி காணி நீண்ட காலக் குத்தகைக்கு யாதேனுமொரு தரப்புக்கு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) whether he is aware that the building which houses the Sathosa store in the centre of Kilinochchi Town was constructed without proper approval;

(ii) whether relevant approval for the construction has been duly obtained from the Karaichchi Pradeshiya Sabha;

(iii) the details of the quotations called for it, if public funds have been spent on the construction of the building;

(iv) the amount spent on the construction, in millions of rupees; and

(v) the current owner of the aforesaid building?

(b) Will he also inform this House -

(i) the institution that owns the land on which the building is located; and

(ii) whether the land concerned has been given to any party on long-term lease basis?

(c) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අදාළ සියලු අනුමැතීන් සහිතව ගොඩනැඟිල්ල ඉදි කර ඇත.

[ඇමුණුම I (a)]** - සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය විසින් 2013.06.18 දිනැතිව නිකුත් කර ඇති ලංකා සතොස සමාගම වෙත ඉඩම පැවරීමේ ලිපියේ පිටපතක්

[ඇමුණුම I (b)]** - ඉඩම් පාලන දෙපාර්තමේන්තුව - උතුරු පළාත විසින් 2013.06.12 දිනැතිව නිකුත් කර ඇති සමුපකාර හා අභ්‍යහන්තර වෙළෙඳ අමාත්‍යාංශය වෙත ඉඩම පැවරීමේ ලිපියේ පිටපතක්.

[ඇමුණුම I (c)]** - ඉඩම් කොමසාරිස් ජෙනරාල් විසින් සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය වෙත ඉඩම නිදහස් කිරීමට අදාළව කරච්චි ප්‍රාදේශීය ලේකම් වෙත 2014.08.11 දිනැතිව නිකුත් කර ඇති ලිපියේ පිටපතක්.

[ඇමුණුම I (d)]** - නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2014.05.07 දිනැතිව නිකුත් කර ඇති ගොඩනැඟිලි සංවර්ධන බලපත්‍රයෙහි පිටපතක්,

(ii) එම ගොඩනැඟිල්ල එනම්, ලංකා සතොස සුපිරි වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීම සඳහා කරච්චි ප්‍රාදේශීය සභාවේ නිසි අනුමැතිය ලබාගෙන තිබේ.

[ඇමුණුම II (a)]**- කිලිනොච්චිය දිස්ත්‍රික් මහලේකම් කාර්යාලය විසින් පිටපත් සහිතව සහකාර දිස්ත්‍රික් ලේකම් - Assit. Govt Agent- කරච්චි අරෙයිනගර් කිලිනොච්චිය තුළ ලංකා සතොස ආයතනයක් ඉදි කිරීමට 2012.03.26 දිනැතිව නිකුත් කර ඇති ලිපියේ පිටපතක්.

[ඇමුණුම II (b)]** - කරච්චි ප්‍රාදේශීය ලේකම් විසින් ලංකා සතොස සුපිරි වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම වෙනුවෙන් ඉඩමට අදාළ අයිතිය නීත්‍යනුකූල වශයෙන් එවකට සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය වෙත පවරන ලද පැවරුම් සහතිකයේ පිටපතක්,

(iii) ලංකා සතොස සුපිරි වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලංකා සතොස ආයතනයේ මුදල් වැය කර ඇත.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සටහනෙහි;

- මෙම ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවට (සතොස) පවරන ලද අතර මෙහි ඉදිකිරීම් කටයුතු සංස්ථාවට අනුබද්ධිත සතොස ඉංජිනේරු හා ඉදිකිරීම් සමාගම විසින් සිදු කරන ලද බව සඳහන් කර ඇත.
- මූලික ඇස්තමේන්තුගත මුදල රු. 257,758,462.50 ලෙස සඳහන් වී ඇති අතර
- මූලික ඇස්තමේන්තුගත මුදලට වඩා රු. 49,634,237.50ක මුදලක් බදු සහිතව අමතර වැඩ සඳහා උප කොන්ත්‍රාත්කරුට සතොස විසින් ගෙවිය යුතු බව ද එහි වැඩිදුරටත්සඳහන්ව ඇත.

[ඇමුණුම III (a)]**

- 2018.01.15 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශයෙහි මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ නිරීක්ෂණ යටතේ;කිලිනොච්චි ලංකා සතොස සුපිරි වෙළඳ

**** * පුස්තකාලයේ තබා ඇත.***
** * நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

සංකීර්ණයේ ඉදිකිරීම් කළ උප කොන්ත්‍රාත්කරුට ගෙවීමට ඇති හිඟ මුදල වන රඳවා ගත් ගාස්තු සහ බදු සහිතව රු. 49,634,237.50ක මුදල, 2018 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් ලංකා සතොස අලෙවිසැල් පුළුල් කිරීම සඳහා ලබා දී ඇති මුදලින් සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (සතොස) හරහා ගෙවීමට අනුමැතිය ඉල්ලා ඇති අතර, එම යෝජනාවට එකඟ වී ඇත.

- තවද, ප්‍රසම්පාදන කටයුතු සිදු වන අවස්ථාවේ දෝෂ සිදු වී තිබේ නම් ඒවා නිවැරැදි කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතු බව අවධාරණය කර ඇත.

[ඇමුණුම III (b)]**

- තවද, 2018 ජනවාරි මස 31වන දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මඟින්;රු. 49,634,237.50ක හිඟ මුදල, මහා භාණ්ඩාගාරය මත මූල්‍ය බරක් ඇති නොවන පරිදි ලංකා සතොස සමාගම විසින් උපයනු ලබන ආදායම මඟින් පියවීම පිණිස අනුමැතිය ලබා දීමට තීරණය කර ඇත.

[ඇමුණුම III (c)]**

- දැනට ලංකා සතොස ආයතනය තුළ මූල්‍ය අංශය තුළ පවතින මූල්‍ය දත්තවලට අනුව ලංකා සතොස ලිමිටඩ් ආයතනය විසින් මෙම ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා CWE කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉංජිනියරින් ආයතනයට, නාගරික සංවර්ධන අධිකාරියට හා Soft Logic retail (pvt) Ltd ආයතනවලට රු. මිලියන 272,721,536.71ක් වැය කර ඇත.

[ඇමුණුම III (d)]**

(iv) ලංකා සතොස මූල්‍ය ආයතනය තුළ දැනට පවතින මූල්‍ය දත්ත හා ලේඛනවලට අනුව මෙම ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා රු. මිලියන 272.72 - රු. 272,721,536.71- මුදලක් වැය කර ඇත.

[ඇමුණුම III (d)]**

තවද, ඉදිකිරීම් සඳහා උප කොන්ත්‍රාත්කරු වෙත රු. මිලියන 49,634,237.50ක මුදලක් ලංකා සතොස සමාගම විසින් උපයනු ලබන ආදායම මඟින් පියවීමට අනුමැතිය ලබා දී ඇත.

[ඇමුණුම III (c)]**

(v) දැනට ලංකා සතොස ආයතනයේ මූල්‍ය අංශය සතුව පවතින දත්ත හා ලේඛනවලට අනුව ඉහත ගොඩනැඟිල්ල ඉදිකිරීමට රු. මිලියන 272.72 ලංකා සතොස ආයතනය විසින් වියදම් කර ඇත.

[ඇමුණුම III (d)]**

- 2015.07.28වන දින කිලිනොච්චි ලංකා සතොස සුපිරි වෙළෙඳ සංකීර්ණයක් ආරම්භ කර ඇත.

[ඇමුණුම IV (a)]**

(ආ) (i) ගොඩනැඟිල්ල පිහිටා ඇති ලොට් අංකය 577 වන අතර, එහි අයිතිය කරච්චි ප්‍රාදේශීය ලේකම් විසින් ලංකා සතොස සුපිරි වෙළෙඳ සංකීර්ණයක් ඉදිකිරීම සඳහ සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයට ලබා දී ඇත.

[ඇමුණුම II (b)]**

- වාහන නැවතුම්පළට -Parking Area- අයත් ලොට් අංකය 618 වන අතර එහි අයිතිය 2023 මාර්තු 01 වන දිනැති ලිපිය මඟින් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය විසින් ලංකා සතොස ලිමිටඩ් ආයතනය දීර්ඝ කාලීනව භුක්ති විඳිනු ලබන හෙයින් එහි අයිතිය ලංකා සතොස ආයතනයට නීත්‍යානුකූලව පවරා දීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ විරුද්ධත්වයක් නොමැති බව ප්‍රකාශ කර ඇත.

[ඇමුණුම V]**

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** *Placed in the Library.*

(ii) ඔච්. ලංකා සතොස ආයතනය විසින් ඒ 9 කම්ප්ලේක්ස් සමාගමට 2024.01.10වන දින සිට අවුරුදු 10කට බදු දී ඇත.

(ඇ) අදාළ නොවේ.

<u>අතිරේක කරුණු</u>

මෙම ප්‍රශ්නයම 2020 වසරේ ද සිවඥානම් ශ්‍රීතරන් මහතා විසින් එවකට සිටි වෙළෙඳ අමාත්‍යවරයාගෙන් අසා ඇති අතර එම ප්‍රශ්නය සහ පිළිතුර [ඇමුණුම VI]* ලෙස මේ සමඟ අමුණා ඇත.

## මධ්‍යම පාන්තිකයන්ට ඉඩම් ලබා දීමේ වැඩසටහන: වවුනියාව දිස්ත්‍රික්කය

## நடுத்தர வகுப்பினருக்குக் காணிகளை வழங்கும் நிகழ்ச்சித்திட்டம்: வவுனியா மாவட்டம்

## PROGRAMME FOR PROVIDING LANDS TO MIDDLE-CLASS CITIZENS: VAVUNIYA DISTRICT

1317/2025

**3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු කේ. කාදර් මස්තාන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு கே. காதர் மஸ்தான் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. K. Kader Masthan)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරේ ජීවත් වන මධ්‍යම පාන්තිකයන් සඳහා ඉඩම් ලබා දීමේ වැඩසටහන යටතේ මේ වන විට ලබා දී ඇති මුළු ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ඉඩම් ප්‍රමාණය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් අක්කරවලින් කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් ඉඩම් අතරින් දෙවන පාර්ශ්වයන්ට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iv) එම එක් එක් ඉඩම ලබා දී ඇති දෙවන පාර්ශ්වයේ නම, ඉඩම අයත් වන ග්‍රාම නිලධාරි වසම සහ ඉඩම ලබා දෙන ලද පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) දෙවන පාර්ශ්වයන්ට ලබා දෙන ලද ඉහත ඉඩම්වල පසුගිය කාලයේදී රජයේ නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කර තිබෙන බව දන්නේද;

(ii) එම නිවාස ඉදි කර ඇති ඉඩම් නිසි පරිදි අදාළ ප්‍රතිලාභීන්ට ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඊට අදාළ ලියකියවිලි මේ වනතෙක් ඔවුන්ට ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வவுனியா மாவட்டத்திலுள்ள நான்கு பிரதேச செயலாளர் பிரிவுகளில் வாழ்கின்ற நடுத்தர வகுப்பினருக்குக் காணிகளை வழங்கும் நிகழ்ச்சித்திட்டத்தின்கீழ் இற்றைவரையில் வழங்கப்பட்டுள்ள காணிகளின் மொத்த அளவு ஏக்கர்களில் எவ்வளவு என்பதையும்;

(ii) இக்காணிகளின் அளவு ஒவ்வொரு கிராம அலுவலர் பிரிவு அடிப்படையில் ஏக்கர்களில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி (i) இல் குறிப்பிடப்பட்ட காணிகளில் இரண்டாம் தரப்பினருக்கு வழங்கப்பட்டுள்ள காணிகளின் அளவு ஏக்கர்களில் எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி ஒவ்வொரு காணியும் வழங்கப்பட்டுள்ள இரண்டாம் தரப்பினரின் பெயர், காணி அமைந்துள்ள கிராம அலுவலர் பிரிவு மற்றும் காணி வழங்கப்பட்ட அடிப்படை முதலிய விபரங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இரண்டாம் தரப்பினருக்கு வழங்கப்பட்ட மேற்படி காணிகளில் கடந்த அரசாங்கத்தின் ஆட்சிக் காலத்தில் வீடமைப்புத் திட்டங்கள் நடைமுறைப்படுத்தப்பட்டதை அறிவாரா என்பதையும்;

(ii) இவ்வீடுகள் நிர்மாணிக்கப்பட்டுள்ள காணிகள் உரிய வகையில் குறிப்பிட்ட பயனாளிகளுக்கு வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iii) ஆமெனில், இதற்குரிய ஆவணங்கள் இற்றைவரையில் பயனாளிகளுக்கு வழங்கப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) total area of land, in acres, provided under the programme of providing lands for middle-class people living in the four Divisional Secretaries' Divisions of the Vavuniya District to date;

(ii) area of the said land, in acres, separately for each Grama Niladhari Division;

(iii) area of land provided to second parties, out of the lands mentioned in (i) above, in acres; and

(iv) names of the second parties to whom each of those lands have been provided, the Grama Niladhari Division to which the said land belongs and the basis on which the said land was provided, separately?

(b) Will he also inform this House -

(i) whether he is aware that the government housing schemes have previously been implemented on the above lands, which were given to second parties;

(ii) whether the lands on which the said houses have been constructed were properly given to the relevant beneficiaries; and

(iii) if so, the reasons for not providing the relevant documents so far?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය -
අක්කර: 879 රූඩ්: 02 පර්චස්: 38

වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය -
අක්කර: 1,144 රූඩ්: 04 පර්චස්: 24

වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය -
අක්කර: 106

වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය -
අක්කර: 3,859

දිස්ත්‍රික්කයට අදාළව මුළු එකතුව -
අක්කර: 5,989 රූඩ්: 03 පර්චස්: 22

(ii) වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| | | අක්කර | රූඩ් | පර්චස් |
| 01. | අලගල්ල | 10 | - | - |
| 02. | මාමඩුව | 55 | - | - |
| 03. | ඊරට්ටිපෙරියකුලම් | 167 | 06 | 54 |
| 04. | අක්කර 400 | 19 | - | - |
| 05. | මරදන්මඩුව | 19 | - | - |
| 06. | මහකච්චකොඩිය | 10 | - | - |
| 07. | පූමඩුව | 20 | - | - |
| 08. | පෙරියඋළුක්කුලම | 30 | - | - |
| 09. | රංකෙත්ගම | 10 | - | - |
| 10. | මඩුකන්ද | 511 | 03 | 24 |

වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

| අනු අංක | ග්‍රාම නිලධාරි වසම | ප්‍රමාණය (අක්කර) |
|---|---|---|
| 01. | කුරුක්කල්පුදුකුලම් | අක්කර: 37 රූඩ්: 02 පර්චස්: 04 |
| 02. | පිරමනාලාන්කුලම් | අක්කර: 80 |
| 03. | පෙරියකට්ටු | අක්කර: 55 |
| 04. | ක්‍රිෂ්තෝකුලම් | අක්කර: 972 රූඩ්: 01 පර්චස්: 20 |

වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | ප්‍රමාණය (අක්කර) |
|---|---|---|
| 01. | වේලර්සින්නකුලම් 220 සී | 195 |
| 02. | පන්රිකෙයිතකුලම් 01 සී | 95 |
| 03. | ඕමන්දෛයි 220 ඕ | 150 |
| 04. | නෙලුක්කුලම් 218 | 640 |
| 05. | පාලමෝට්ටෙයි 219 ඒ | 85 |
| 06. | තච්චන්කුලම් 214 ජී | 975 |
| 07. | පුදුකුලම් 216 | 130 |
| 08. | නොච්චිමෝට්ටෙයි 215 | 142 |

වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

| අනු අංක | ග්‍රාම නිලධාරි වසම | ප්‍රමාණය (අක්කර) |
|---|---|---|
| 01. | වන්නිකුලම් | අක්කර: 48 (යුද හමුදා) |
| 02. | පුනියන්කුලම් උතුර | අක්කර: 10 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ලබා දී ඇත. |
| 03. | නයිනමඩු | අක්කර: 48 - දීර්ඝ කාලීන බදු යටතේ Vanni Sugar Company වෙත ලබා දී ඇත. |

(iii) වෙංගලචෙට්ටිකුලම් - අක්කර: 1,144 රූඩ්: 04 පර්චස්: 22

වවුනියා උතුර - අක්කර 106

(iv) වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

| අනු අංක | ග්‍රාම නිලධාරි වසම | ප්‍රමාණය (අක්කර) |
|---|---|---|
| 01. | කුරුක්කල්පුදුකුලම් | අක්කර 02ක් ඉඩම් කොමසාරිස් ජෙනරාල්ගේ අංක 2022/6 චක්‍රලේඛය අනුව රජයේ ඉඩම් වගා කිරීම සඳහා අනුමැතිය ලබා දීමේ ප්‍රතිපාදන මත වාර්ෂික බලපත්‍ර ලබා දී ඇත. |
| 02. | ක්‍රිෂ්තෝකුලම් | අක්කර: 972 රූඩ්: 01 පර්චස්: 20 හිමිකරුවන් විසින් සංවර්ධනය නොකරන නිසා බලපත්‍ර හිමිකරු විසින් තමන්ගේ ඉඩම් නැවත ඉල්ලා සිටින විට එම අයට එම ඉඩම් නැවත ලබා දීමට හැකි වන පරිදි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ තාවකාලික බදු පදනමින් භෝග මාරු ක්‍රමය යටතේ ගොවිතැන් කටයුතු සඳහා ලබා දී ඇත. |

- අනෙකුත් ඉඩම් ලේඛන මගින් දෙවන පාර්ශ්වයේ කිසිවෙකුට බැහැර කර නොමැත.

වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

| අනු අංකග්‍රාම නිලධාරි වසමප්‍රමාණය (අක්කර) | | |
|---|---|---|
| 01. | වන්නිකුලම් | අක්කර: 48 (යුද හමුදා) |
| 02. | පුනියන්කුලම් උතුර | අක්කර: 10 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ලබා දී ඇත. |
| 03. | නයිනමඩු | අක්කර 48 - දීර්ඝ කාලීන බදු යටතේ Vanni Sugar Company වෙත ලබා දී ඇත. |

(ආ) (i) නැත.
(ii) අදාළ නොවේ.
(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## සේවක අර්ථසාධක අරමුදලේ පාරිතෝෂිකය විශ්‍රාම වැටුප් ක්‍රමයකට පරිවර්තනය කිරීම පිළිබඳ පුවත් වාර්තා
## ஊழியர் சேமலாப நிதியத்தின் பணிக்கொடையை ஓய்வூதியத் திட்டத்துக்கு மாற்றுதல் தொடர்பான செய்தி அறிக்கைகள்
## NEWS REPORTS ON CONVERSION OF EMPLOYEES' PROVIDENT FUND GRATUITY INTO A PENSION SCHEME

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය අමාත්‍යවරයෙකු විසින් 2026.01.07 දින ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන ලද පරිදි, සේවක

[ගරු රවි කරුණානායක මහතා]

අර්ථසාධක අරමුදල - EPF - යටතේ පවතින එක්වර ලබා ගන්නා පාරිතෝෂික මුදල්, මාසික විශ්‍රාම වැටුප් ක්‍රමයකට පරිවර්තනය කිරීමට යෝජිත පියවර සම්බන්ධයෙන් රජයෙන් හදිසි ප්‍රකාශයක් අපේක්ෂාවෙන් ස්ථාවර නියෝග 27(2) යටතේ මම අද දින මෙම ප්‍රශ්නය නහමි.

මෙම නිවේදනය සේවකයන්, විශ්‍රාමිකයන් සහ වෘත්තීය සමිති අතර දැඩි නොසන්සුන්තාවක් ඇති කර තිබේ. මෙය 2011 වසරේදී රොෂේන් චානකගේ අවාසනාවන්ත මරණයට තුඩු දුන් සහ රට පුරා ඇති වූ නොසන්සුන්තාව හමුවේ හකුළා ගැනීමට සිදු වූ සංවේදී ප්‍රතිපත්තිමය විවාදය නැවත කරළියට ගෙන ඒමකි.

අද වන විට සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල - ETF - සතු ඒකාබද්ධ වත්කම් ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 6.2 ඉක්මවා ඇත. Colombo Stock Exchange එකටත් වඩා ප්‍රමාණයක් මෙතැන තිබෙනවා.

විනිවිදභාවයකින් තොරව හෝ පාර්ශ්වකරුවන්ගේ එකඟතාවකින් තොරව සිදු කරන මෙවැනි ඒකපාර්ශ්වික ව්‍යුහාත්මක වෙනස්කම් මඟින් පුද්ගල දේපළ අයිතිවාසිකම් මෙන්ම මෙරට මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ද අනතුරේ හෙළයි.

මම ගරු මුදල් අමාත්‍යවරයාගෙන් පහත ප්‍රශ්න විමසමි.

1. මෙම හදිසි ප්‍රතිපත්තිමය වෙනස සඳහා බලපෑ නිශ්චිත සමාජ-ආර්ථික සාධක මොනවාද? ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ - IMF - වැඩසටහන යටතේ ඇති එකඟතා මෙයට බලපා තිබේද?
2. 2025 අග භාගයේ සිට මෙම යෝජනාව සම්බන්ධයෙන් සිදු කරන ලද රක්ෂණ ගණිතමය - actuarial - අධ්‍යයන හෝ කැබිනට් මට්ටමේ සාකච්ඡා මොනවාද? ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද?
3. ජීවිත කාලය පුරා ලැබෙන විශ්‍රාම වැටුපක් සහ 2023 වසරේ ලැබූ සියයට 13ක ප්‍රතිලාභය සහිත වත්මන් ක්‍රමය අතර සංසන්දනාත්මක විශ්ලේෂණයක් රජය විසින් සිදු කර තිබේද?

   ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා මේ රටේ බංකොලොත්භාවය පාර්ලිමේන්තුවේ අවසර නැතිව ප්‍රකාශ කිරීම නිසා මේ සේවක අර්ථසාධක අරමුදලේ රුපියල් බිලියන 2කට, 3කට වඩා ප්‍රමාණයක් ඒගොල්ලන්ට වන්දි ගෙවන්න වුණු බව, ඒකපාර්ශ්විකව මහ බැංකුව ගත් තීන්දුවක් නිසා. ඉතින්, ඒවා තුළින් මෙවැනි දේවල් නැවත ප්‍රශ්නයකට ගෙනයනවාද?
4. මෙම ප්‍රතිසංස්කරණවලට එරෙහිව රජය මීට පෙර දැක්වූ විරෝධය දැන් සමනය කරන්නේ කෙසේද? 2011දී ඇති වූ සිදුවීම් නැවත ඇති නොවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?
5. දේශපාලනික නොවන පාලක මණ්ඩලයක් මඟින් පාලනය වන ස්වාධීන ඒකාබද්ධ අරමුදලක් ලෙස EPF සහ ETF ඒකාබද්ධ කිරීමට ප්‍රමුඛතාව ලබා නොදෙන්නේ ඇයි?
6. මෙම රුපියල් ට්‍රිලියන 6.2ක වත්කම් පදනම, රජයේ ණය හෝ හිඟ මුදල් පියවා ගැනීමට යොදා නොගන්නා බවට ඇති නීතිමය සහතිකය කුමක්ද?

   නිකම් අර කතරගම දේවාලයේ රත්තරන් විකුණන්න හදනවා වාගේ දෙයක් ද මේ කරන්න හදන්නේ. මොකද, ඒක අනවශ්‍ය දෙයක්.
7. නිවාස හා වෛද්‍ය අවශ්‍යතා සඳහා දැනට පවතින සියයට 30ක පූර්ව විශ්‍රාමික ආපසු ගැනීමේ පහසුකම එලෙසම පවතින්නේද?
8. ඕනෑම කෙටුම්පතක් ගැසට් කිරීමට පෙර, වෘත්තීය සමිති සහ වෘත්තීය සමිති සන්ධාන සමඟ විනිවිදභාවයෙන් යුතු, කාලානුරූපී උපදේශන ක්‍රියාවලියකට රජය එකඟ වන්නේද?

   ගරු කථානායකතුමනි, මම හිතන විධියට මේ ගරු සභාවේ සිටින වසන්ත සමරසිංහ, බිමල් රත්නායක, නලින්ද ජයතිස්ස, සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇතුළු අය කවදාවත් මේ වාගේ ක්‍රමයකට එකතු වෙන්නේ නැහැ. එහෙම නම් ඇයි මෙවැනි ප්‍රකාශය කළේ?

මේ ප්‍රශ්නවලට අපට සෘජු උත්තරයක් අද ලැබේවා යි කියා ප්‍රාර්ථනා කරනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද එම ප්‍රශ්නයට පිළිතුර ඊළඟ සතිය වාරයේදී ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස අමාත්‍යතුමා.

## මුලතිව්-සිලාවත්ත ප්‍රදේශයේ කුගනේෂන් ඩිනෝජා දැරියගේ මරණය: සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## முல்லைத்தீவு, சிலாவத்தைப் பகுதியைச் சேர்ந்த குகனேசன் டினோஜா என்ற சிறுமியின் இறப்பு: சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று
## DEATH OF GIRL NAMED KUGANESHAN DINOJA FROM SILAWATTA, MULLAITIVU: STATEMENT BY HON. MINISTER OF HEALTH AND MASS MEDIA

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා විසින් 2026.01.09 වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. 2025.12.21 දින පස්වරු 7.20ට.
2. වෛද්‍ය විජේසූරිය ආරච්චිගේ දූෂානි තත්සරණි තාරුකා.

   දරුවා ළමා රෝග වාට්ටුවට මාරු කර නොමැති අතර, ඇයව සෘජුවම හදිසි ප්‍රතිකාර ඒකකයට මාරු කරන ලදී. ඒ වේලාව පස්වරු 7.25ට. ඒ කියන්නේ, විනාඩි 5ක් තුළදී ඒ පරීක්ෂා කිරීම් කර තිබෙනවා.
3. ඔව්. වැඩ බලන විශේෂඥ වෛද්‍ය නිලධාරි ආචාර්ය වී. අරුනාත්.

4. ළමා රෝග ආශ්‍රිත සේවා සඳහා වැඩ බලන විශේෂඥ වෛද්‍ය නිලධාරියෙක් සිටී.
5. දිස්ත්‍රික් මහ රෝහල් කාණ්ඩයට. එහි අධ්‍යක්ෂ වෛද්‍ය සංජීව නලින් බණ්ඩාර ප්‍රේමදාස. පදිංචිය අනුරාධපුරය.
6. එදින ඔහු නිවාඩු අරගෙන තිබුණි.
7. මෙම දැරිය සෘජුවම හදිසි ප්‍රතිකාර ඒකකයට ඇතුළත් කරන ලද අතර, ඇමතුමක් මත ළමා රෝග වාට්ටුවේ වෛද්‍ය නිලධාරියා හදිසි ප්‍රතිකාර ඒකකයට - ETU එකට - ඇවිල්ලා එම දැරිය පරීක්ෂා කර තිබෙනවා.
8. ඔව්. ආහාර අසාත්මිකතා රෝග ලක්ෂණ තිබූ අතර, ළමා රෝග වාට්ටුවේ වෛද්‍ය නිලධාරියා විසින් නියම කරන ලද ප්‍රතිකාර ලබා දෙන ලදී.
9. ඔව්.
10. දරුවාට ලබා දුන් ඖෂධය පිළිබඳව දෙමාපියන් සමඟ කළ සන්නිවේදනය ඇඳ ඉහ ටිකට් පතේ ලේඛනගත කර නොමැත.
11. ඔව්.
12. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 31:1:12 වගන්තියේ II වන වෙළුමේ XLVIII පරිච්ඡේදයට අනුව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු නීතිමය පියවර ගැනීම නිර්දේශ කෙරේ.
13. උතුරු පළාතේ සෞඛ්‍ය සේවා කාර්යාලය විසින් විමර්ශන සිදු කරනු ලබන අතර, අතුරු වාර්තා ලැබී ඇත. අවසාන වාර්තාව ලැබීමෙන් පසු සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබේ.
14. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද විමර්ශනයේදී අතුරු වාර්තාවේ නිර්දේශ කර ඇති පරිදි පියවර ගෙන ඇත.
15. මෙම සිසුවියගේ මරණය සම්බන්ධයෙන් පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදු කෙරුණා. එම පශ්චාත් මරණ පරීක්ෂණයේ සාම්පල වැඩිදුර පරීක්ෂණ සඳහා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට යවා තිබෙනවා. වාර්තාව ලද පසු තවදුරටත් කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්, ගරු කථානායකතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Good morning to you, Sir!

Thank you for the Answer, Hon. Minister of Health and the next President.

ගරු කථානායකතුමනි, நான் தமிழில் கேட்கிறேன்; let me ask this in Tamil.

அந்த வைத்தியசாலையில் அச்சிறுமி பி.ப. 7.25 மணிக்கு அனுமதிக்கப்பட்டு இருக்கிறார் - 7:25 p.m. admission time. அதன் பிறகு, அந்தச் சிறுமிக்கு four vials of adrenaline ஏற்றப்பட்டு இருக்கின்றதெனச் சொல்லப்படுகின்றது. இவ்விடயம் தொடர்பாக வழக்குகூட பதியப்பட்டு இருக்கின்றது. அந்த வழக்கு சனவரி மாதம் 29ஆம் திகதி விசாரணைக்கு எடுக்கப்பட இருக்கின்றது. அந்தச் சிறுமியின் பிரேதப் பரிசோதனை அறிக்கையில் - postmortem reportஇல் - cause of death எழுதப்பட்டு இருக்கின்றது, under investigation என்று. அதாவது, சிறுமியின் உடலைக் கொடுத்து அவர்கள் புதைத்த பிறகு, postmortem reportஇல் எழுதப்பட்டிருக்கின்றது, under investigation என்று. இவ்வாறானதொரு பிரேதப் பரிசோதனை அறிக்கையை வழங்க முடியுமா? எனக் கேட்கின்றேன். இது முற்றிலும் தவறானது. இதனை நாங்கள் நீதிமன்றத்தில் பார்த்துக் கொள்வோம். இது மிகவும் கவலையான விடயம் என்பதால், இது குறித்து தகுந்த நடவடிக்கை எடுக்குமாறு உங்களை அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සේවාවටත් අවශ්‍ය මෙවැනි ආකාරයේ ජීවිත අහිමි වීම් වළක්වා ගන්නයි. මම කලිනුත් කිව්වා, මේ ක්‍රියාවලිය තුළ යම් අඩුපාඩුවක් සිදු වෙලා තිබෙනවා නම් ඒකට අවශ්‍ය විනය සහ නීතිමය ක්‍රියාමාර්ග අපි ගන්නවා කියලා. මේ කාරණය අධිකරණයේ විභාග වෙමින් පවතින නිසා අධිකරණයට අවශ්‍ය සියලු සහයෝගය රෝහල, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ පැත්තෙන් ලබා දෙනවා. ඒ අදාළ ලියකියවිලි යොමු කරනවා. මට ඒ ගැන සහතික කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු රියාස් ෆාරුක් මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

***මතු පළ වන යෝජනාව න්‍යාය පත්‍රයෙහි තිබිණ:***
*ஒழுங்குப்பத்திரத்தில் பின்வரும் பிரேரணை இருந்தது:*
*The following Motion stood on the Order Paper:*

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඉහත යෝජනාවේ සඳහන් "පූ.භා. 11.30" යන්න "පූ.භා. 10.55" වශයෙන් සංශෝධනය විය යුතුයි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද යෝජනා, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### මාධ්‍ය තුළ ව්‍යාජ ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීම
### ஊடகங்களில் உண்மைக்குப் புறம்பான செய்திகளைப் பரப்புதல்
### DISSEMINATION OF FAKE NEWS ON MEDIA

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අර්චුනාදන් අධෛක්කලනාදන් මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 නොවැම්බර් 13 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### යූඑන්වී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### யூஎன்வி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### UNV FOUNDATION (INCORPORATION) BILL

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
Hon. Speaker, I move,

"That leave be granted to introduce a Bill to incorporate the UnV Foundation."

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6) இன்படி கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Rural Development, Social Security and Community Empowerment for report.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

## පූර්ණ අධ්‍යාපන පරිවර්තනීය ක්‍රියාවලිය සඳහා සහාය

## விரிவான கல்வி மறுசீரமைப்புச் செயன்முறைக்கான ஆதரவு

## SUPPORT FOR COMPREHENSIVE EDUCATIONAL TRANSFORMATION PROCESS

[අ.භා. 10.58]

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අධ්‍යාපනය යනු, ඓතිහාසික විකාශයේ පැවැති හා පවතින සියලු සමාජ අවධීන් විසින් නිර්මාණය කරන ලද දැනුම අත්පත් කර ගනිමින් සහ නව දැනුම් නිෂ්පාදනය කරමින් ඒවා බෙදා ගැනීමේ සංස්කෘතික ක්‍රියාවලියකි.

වගකීම් සහගත සහ ශිෂ්ට සම්පන්න පුරවැසි සමාජයක් බිහිවීම රඳා පවතින්නේ අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මකභාවය සහ එම ක්‍රියාවලියට ඇති සම ප්‍රවේශයයි. ගතිකත්වයෙන් යුත් ජාතික, සමාජ හා ආර්ථික සංවර්ධන අවශ්‍යතා අනුව යමින් එවැනි ගුණාත්මක අධ්‍යාපන ක්‍රියාවලියක් පවත්වා ගැනීමට නම් එම ක්‍රියාවලිය වරින්වර යාවත්කාලීන විය යුතුය.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රියාවලිය වසර ගණනාවකින් යාවත්කාලීන වී නොමැතිවා පමණක් නොව එය ජාතික, සමාජ හා ආර්ථික අවශ්‍යතාවයන්ට නොගැළපෙන බවට තියුණු විවේචනයක් පවතී.

විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය දරුවා මත විශාල පීඩනයක් ඇති කිරීම, අධ්‍යාපන ක්‍රියාවලියට ඇතුළත් වන දරුවන් සැලකිය යුතු පිරිසක් වසර 13ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ නොකිරීම, පාසල් අතර ඇති මානව සහ භෞතික සම්පත්වල විෂමතාව එම සමාජ විවේචනය තවත් තීව්‍ර කරයි.

මේ සියල්ල සැලකිල්ලට ගෙන අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනස යන මැයෙන් වසර 2026 සිට ක්‍රියාත්මක වන පරිදි යෝජනාවලියක් ඉදිරිපත් කොට ඇත.

මෙම පරිවර්තනීය යෝජනාවලිය පිළිබඳ සමාජයේ විවිධ පාර්ශ්ව සාධනීය අදහස් හා විවේචනයන් ඉදිරිපත් කරමින් සිටින අතර, ඇතැම් කොටස් එහි අන්තර්ගතය හා අරමුණු පිළිබඳ අනවබෝධයෙන් මත ඉදිරිපත් කරයි. තවත් සුළු පිරිසක් සිය පෞද්ගලික අභිමතාර්ථයන් මත පිහිටා විවේචනය කරති.

මේ හේතුවෙන් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින පූර්ණ අධ්‍යාපන පරිවර්තනීය ක්‍රියාවලිය පිළිබඳ පවතින දුර්මත හා සාවද්‍ය ප්‍රකාශය නිවැරදි කරමින් පාර්ලිමේන්තුවේ පක්ෂ, විපක්ෂ සියලුදෙනා සිය අදහස් ඉදිරිපත් කරමින් ඊට සහයෝගය ලබා දිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු කථානායකතුමනි, අධ්‍යාපනය කියන්නේ ශ්‍රී ලංකාවේ සමාජය කියන මහා පද්ධතියේ එක් උප පද්ධතියක් පමණයි. අපි දන්නවා සෞඛ්‍ය වෙන්න පුළුවන්; සන්නිවේදනය වෙන්න පුළුවන්; ප්‍රවාහනය වෙන්න පුළුවන්, මේ ආදී විවිධ උප පද්ධති එක්ක එකට යන උප පද්ධතියක් තමයි අධ්‍යාපන පද්ධතිය කියන්නේ. නමුත්, මේ අධ්‍යාපන පද්ධතියේ සිදු වන වෙනස්කම් හෝ නොගැළපීම් සෙසු සියලු පද්ධතිවල කාර්යක්ෂමතාවට, ඒ වාගේම ඒවායේ බිඳවැටීම්වලට සුවිශේෂීව බලපානවා. එවැනි පද්ධති දිනෙන් දින ලෝකයේ විවිධ ක්ෂේත්‍ර එක්ක ගැළපෙමින් වෙනස් වෙනකොට, අධ්‍යාපනය විතරක් වෙනස් නොවී පැවැතියොත්, එහෙමත් නැත්නම් අනෙකුත් පද්ධති වෙනස් වන වේගයෙන් අධ්‍යාපන පද්ධතිය වෙනස් නොවුණොත්, අපිට එය මහා විශාල ප්‍රශ්න ඇති කරන්න පුළුවන් බව අපි දන්නවා.

ඒ පිළිබඳව අපට සෑහීමකට පත් වෙන්න බැහැ. අධ්‍යාපනයෙන් සමාජයේ ඇති වන ගැටලු විසඳා ගැනීමට තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. එහෙත්, අධ්‍යාපනය අපේ සමාජ ගැටලු විසඳා ගැනීමට සහාය වෙනවා වෙනුවට සමාජයට අලුත් ගැටලු නිර්මාණය කරන සංස්ථාවක් බවට දැනටමත් පත් වෙලා තිබෙනවා.

මේ පිළිබඳව කථා කරනකොට, 1640 දී **භාවිත** වූ මැකියාවෙලීගේ දර්ශනයේ කොටසක් මම ඉදිරිපත් කරන්න කැමැතියි. ඒ තමයි, "කාලය හා කාර්යයන් වෙනස් වෙද්දී හුරු පුරුදු මඟ ගමන් කරන තැනැත්තා විනාශ මුඛයට යයි. කාලය හා වෙනස් වන කටයුතුවලට අනුගතවෙමින් තම හැසිරීම වෙනස් කරගන්නේ නම් ඔහුගේ අනාගතය යහපත් වන්නා සේම වාසනාවන්තයෙක්ද වෙයි" කියන කාරණය. මෙන්න මේ මඟ පෙන්වීමත් එක්ක ගත්තොත් අධ්‍යාපනයටද තෝරා ගත හැකි; තෝරා ගත යුතු එකම විකල්පය විධියට අපි දකින්න ඕනෑ, සෙසු පද්ධතිවල වෙනස්කම් අනුව අධ්‍යාපනයද වෙනස් කිරීමයි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් කියන්නේ, අධ්‍යාපනය වෙනස්වීමේ එහෙම නැතිනම් අධ්‍යාපනය වෙනස් කිරීමේ උපකරණයක් විධියට අපි දකින්න ඕනෑ. අපි ප්‍රතිසංස්කරණය කියලා කියන්නේ මොකක්ද? ප්‍රතිසංස්කරණය කියන්නේ, පවත්නා දේ නැවත සකස් කිරීමක්. මේ ප්‍රතිසංස්කරණවල කාර්යභාරය විය යුත්තේ, වර්තමාන ක්‍රියාකාරකම් කාලයට අනුකූලව -කාලානුරූපව- අලුත් කිරීමයි. අධ්‍යාපන ප්‍රතිංසංස්කරණ පිළිබඳව මයිකල් ආම්ස්ට්‍රෝන්ග් කියන සමාජ විද්‍යාඥයාගේ ගෙන හැර දැක්වීමක් තිබෙනවා, "පවත්නා ක්‍රමය හොඳම ක්‍රමය යැයි සිතීම තරම් සංවිධානයක් විනාශ මුඛයට පත් කරන තවත් සාධකයක් නැත. යල්පැන ගිය පෞරාණික ක්‍රම යුගයේ අවශ්‍යතාවට ගැළපෙන ලෙස වෙනස් කිරීම ප්‍රතිසංස්කරණවලින් සිදු වේ" කියලා.

ගරු කථානායකතුමනි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට කිසිම රටක අධ්‍යාපන ක්‍රමය එකවර උඩු යටිකුරු කරන්න පුළුවන්කමක් නැහැ. අපට කරන්න පුළුවන් වෙන්නේ පවත්නා ව්‍යවහාරයන්, පවත්නා භාවිතයන් අවශ්‍ය යැයි පෙන්නුම් කරන වෙනස්කම් ඇති කරමින් වැඩි දියුණු කිරීමක් විතරයි. අන්න ඒ නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අරමුණු, අභිප්‍රායයන් විය යුත්තේ පාසලෙන් හා සෙසු අධ්‍යාපන ආයතනවලින් ලබා දෙන ඉගෙනුම් අත්දැකීම්වල හා එම ඉගෙනුම් අත්දැකීම් ලබා දෙන ක්‍රමවේදවල තත්ත්වය ප්‍රවර්ධනය කිරීමයි. ළමුන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා අපි විශාල පිරිවැයක් දරනවා. හැබැයි ඒ පිරිවැයෙන් ළමයින්ට අයිති පංගුව ඔවුන්ට ලබා දෙනවාද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. අන්න ඒ නිසා මේ ප්‍රතිසංස්කරණවලින් අධ්‍යාපනයට දරන වියදමෙන් -අධ්‍යාපනයට දරන පිරිවැයෙන්- ඒ පද්ධතියේ සිටින දරුවන්ට හිමි පංගුව ලබා දීම, මේ සාධාරණත්වය ළඟා කර දීම අපි කළ යුතු වෙනවා. ඒ වාගේම තමයි ඕනෑම රටකට තමන්ගේම කියලා අධ්‍යාපන අභිමතාර්ථ, අධ්‍යාපන අරමුණු තිබෙනවා. අන්න ඒවා වඩා හොඳින් සාක්ෂාත් කර ගැනීමට අපට මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍ය වනවා.

අන්න ඒ නිසා යම් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් සිද්ධ වනවා නම්, ඒ සඳහා අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. ඉන් පළමුවැන්න තමයි, විෂය මාලා සංවර්ධනය. ඒ කියන්නේ ඉගෙනීමේ හා ඉගැන්වීමේ අන්තර්ගතය වෙනස් කිරීම. මේ දවස්වල දැඩි කථා බහට ලක් වෙලා තිබෙනවා, මේ විෂය මාලා සංවර්ධනය පිළිබඳව.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේදී අධ්‍යාපන තාක්ෂණය ද සංවර්ධනය කරන්න ඕනෑ. ඒ කියන්නේ, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ භාවිත වන ක්‍රමවේද වෙනස් කරන එක. එපමණක්

[ගරු සුනිල් රාජපක්ෂ මහතා]

මදි. අධ්‍යාපනය සම්බන්ධයෙන් වන භෞතික හා මානව සම්පත් අපි සංවර්ධනය කරන්න ඕනෑ. මෙම ක්‍රියාවලියේ යෙදෙන මානව සම්පත්, ඒ කියන්නේ ගුරුවරයා වෙන්න පුළුවන්, ගුරු උපදේශකවරයා වෙන්න පුළුවන්, විදුහල්පතිවරයා වෙන්න පුළුවන්, ගුරු අධ්‍යාපනඥ සේවයේ කෙනෙක් වෙන්න පුළුවන්, අධ්‍යාපන පරිපාලන සේවයේ කෙනෙක් වෙන්න පුළුවන්, ඒ කවුරු හෝ මීට බලපානවා නම්, අන්න ඒ අයගේ තත්ත්වය දියුණු කිරීමත් මෙහිදී වැදගත් වනවා. ඒ වාගේම පාසලේ සහ මේ අධ්‍යාපන පද්ධතියේ තිබෙන භෞතික සම්පත්වල තත්ත්වය වැඩිදියුණු කිරීමත් මෙයින් අනිවාර්යයෙන් සිද්ධ වන්න ඕනෑ. එපමණක් නොවෙයි. අධ්‍යාපනයට සම්බන්ධ වන කළමනාකරණ ව්‍යුහයන්ගේ, ඒ කියන්නේ අභ්‍යන්තර කළමනාකරුවන් වෙන්න පුළුවන්, ඔවුන් අනුගමනය කරන ක්‍රමවේද වෙන්න පුළුවන්, ශෛලීන් වෙන්න පුළුවන්, ඒවායේත් කාලානුරූපව අවශ්‍ය වෙනස්කම් කරන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි, අද ලොකු කතිකාවක් තිබෙනවා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සම්පත් බෙදී යෑම පිළිබඳව සහ පාසල් පද්ධතිය සකස් වෙලා තිබෙන විධිය පිළිබඳව. අපට මතකයි, 1980 ගණන්වල තමයි කියන්න පටන් ගත්තේ, "කොළඹට කිරි-අපට කැකිරි" කියන එක. අන්න ඒ නිසා ළමයින්ට වඩා හොඳ ඉගෙනුමක් ලබා දෙන්න පුළුවන් විධියට, ආයෝජනයෙන් තමන්ගේ පංගුව ලබා ගන්න පුළුවන් විධියට, උපරිම ප්‍රයෝජන ගන්න පුළුවන් විධියට මේ පාසල් ව්‍යුහය වෙනස් කිරීමත් අපි අනිවාර්යයෙන් කළ යුතුව තිබෙනවා.

ඒ වාගේම අධ්‍යාපන ක්‍රමය හසුරුවන පාලන යන්ත්‍රණය නැවත සකස් කිරීම, එහෙම නැත්නම් අධ්‍යාපන පරිපාලන ව්‍යුහය ප්‍රතිනිර්මාණය කිරීම අපට අවශ්‍ය වනවා. ඒ විතරක් නොවෙයි. අධ්‍යාපන ක්‍රියාවලියට සම්බන්ධ වන දෙමව්පියන්, සමාජ සංවිධාන, ජනමාධ්‍ය ආදී ප්‍රජාව සහභාගි කරවාගෙන අවශ්‍ය ක්‍රමෝපාය සම්බන්ධ කරගෙන මේ ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමත් අවශ්‍යයි. මෙහිදී සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමත් අතිශය වැදගත් කරුණක්. ඒ විතරක් නොවෙයි. අපි නිතර දෙවේලේ කථා වෙනවා, අධ්‍යාපන පද්ධතියේ ඇගැයීම් ක්‍රමය යල්පැන ගිහිල්ලා කියලා. අන්න ඒ නිසා ඒ සම්බන්ධවත් විශේෂයෙන් අවධානයක් යොමු විය යුතුයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is up.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු කථානායකතුමනි, තව විනාඩියක කාලයක් මම ඉල්ලා සිටිනවා.

මේ ක්ෂේත්‍රයට විශේෂයෙන් වැදගත් වන කාරණයක් තමයි, ඇගැයීම් ක්‍රම භාවිතය. ළමුන් තරග කිරීම සඳහා විතරක් පාවිච්චි කරන මේ ඇගැයීම් ක්‍රමය වෙනස් කළ යුතුමයි. ඒ නිසා අපි ළමුන් තරග කරන ක්‍රමයක් වෙනුවට ළමුන් සංවර්ධනය කරන ක්‍රමයක් ඇති කළ යුතුයි. නිපුණතා සංවර්ධනය කරලා ඒ තුළින් දරුවන් තක්සේරු කරලා ඔවුන්ගේ ප්‍රවීණතා ඉහළට ගන්නා වූ ක්‍රමයකට අපි යා යුතුයි. පාසල් පද්ධතිය විතරක් නොවෙයි, පාසල තක්සේරු කරන, අධ්‍යාපන ක්‍රියාවලියේ කාර්ය සාධනය තක්සේරු කරන ඒ ක්‍රම ද වෙනස් කර ගත යුතුයි.

ගරු කථානායකතුමනි, ඒ නිසා අපි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රධාන කුලුනු 5ක් ඔස්සේ සූදානම් කරගෙන තිබෙනවා. මම මගේ කථාව අවසන් කරන්නට මත්තෙන් අපේ යෝජිත අධ්‍යාපන පරිවර්තනයේ දැක්ම ගැන සඳහන් කරමින් අන්න, ඒ දැක්මට කාටත් එකතු වෙන්න කියා ආරාධනා කරනවා. අපේ යෝජිත අධ්‍යාපන දැක්ම වන්නේ, සමානාත්මතාව සමාජයීය වශයෙන් ඇතුළත් කිරීම, සාමය, සමෘද්ධිය, යුක්තිය, තිරසාරත්වය සහ ගෝලීය පුරවැසිභාවය උදෙසා වෙර දරන සදාචාරාත්මක සමාජ වගකීම සහිත නව්‍යකරණයට නැඹුරු වූ, ජීවිත කාලය පුරා ඉගෙන ගන්නන් පෝෂණය කිරීම සඳහා අධ්‍යාපනය පරිවර්තනය කිරීමයි. එවැනි උදාර අරමුණක් වෙනුවෙන්, දැක්මක් වෙනුවෙන් මේ සභාවේ සියලුදෙනාගේ එක්වීම බලාපොරොත්තු වෙමින් මම නිහඬ වනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතියි, කාලය ලබා දුන්නාට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනාව ස්ථිර කිරීමට, the Hon. (Mrs.) Samanmali Gunasingha. You have 12 minutes.

[පූ.භා. 11.13]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ගරු කථානායකතුමනි, අද දවසේ අපේ සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ඉතාම කාලෝචිත යෝජනාවක් සභාව කල් තබන අවස්ථාවේ ගෙනාවා. ඒ යෝජනාව ස්ථිර කරමින් අදහස් කිහිපයක් දක්වන්න මම කැමැතියි.

අපේ මන්ත්‍රීතුමා සඳහන් කළා, මොකටද මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අපට අවශ්‍ය වන්නේ කියලා. ඒ වාගේම අපේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවලිය ක්‍රියාවට නංවද්දි ඒ තුළ තිබෙන ප්‍රධාන කුලුනු 5ක් ගැන කථා කළා. ඒ කුලුනු 5න් එක් කුලුනක් වන විෂය මාලා සංවර්ධනය ගැන හැමෝම කථා කරන නිසා මම හිතුවා, මානව සංවර්ධනය ගැන කථා කරන්න. අධ්‍යාපනය ගැන කථා කරද්දි ඔබට මතක ඇති, ජාතික ජන බලවේගය විධියට අපි අවුරුදු ගණනාවකට කලින් තමයි අධ්‍යාපනය පිළිබඳ සංවාදය ගත්තේ කියන එක. ඒ සංවාදය අපි විවිධ තල ඔස්සේ අරගෙන ගියා. ග්‍රාමීය වශයෙන් ජනතාවත් එක්ක සංවාද කළා. ඒ වාගේම වෘත්තීය සමිති මට්ටමින් සංවාද කළා. අධ්‍යාපනවේදීන්, විවිධ ක්ෂේත්‍රවල නිපුණතා ඇති අයත් එක්ක, ඒ වාගේම විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, මහාචාර්යවරුන් එක්ක සාකච්ඡා කළා. ගුරුවරුන්, දෙමව්පියන් එක්ක සාකච්ඡා කළා. අවුරුදු ගණනාවක් අරගෙන ගිය සංවාදයේ ප්‍රතිඵලයක් විධියට තමයි, "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළට මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙන්න ඕනෑ, අපේ අධ්‍යාපනය ප්‍රමිතිගත කරන්න ඕනෑ කියන සාකච්ඡා ඇති වුණේ. එහිදී අපට ඇත්තටම සතුටුයි, සියලු බාධා මැද නව ප්‍රතිසංස්කරණ මේ අවුරුද්දේ ආරම්භ කරන්න අපට -නව රජයට- පුළුවන් වීම ගැන.

හැබැයි, මේ ක්‍රියාවලිය ආරම්භ කළේ මීට අවුරුදු ගණනාවකට පෙර. මේ ක්‍රියාවලිය තවමත් කෙරෙමින් යන එකක්. මේ ක්‍රියාවලිය යෝජනා, අදහස්, අඩු පාඩු සහ විවිධ කුලුනු 5ක් මත තිබෙන එකක් නිසා යාවත්කාලීන වෙන්න ඕනෑ බව අපි දකිනවා. ඒකට තමයි සබුද්ධික සංවාදයක් අවශ්‍ය වන්නේ. ගරු

කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් සබුද්ධික සංවාදයක් ඇති කර ගන්නේ කවුද? සබුද්ධික සංවාදයක් පුංචි දරුවන්ට කර ගන්න බැහැ නේ. සබුද්ධික සංවාදය කුලුනු 5 මත ඉඳලා, අධ්‍යාපන මූලධර්ම මත ඉඳලා කර ගන්න ඕනෑ. කවුද ඒක කරගන්න ඕනෑ? පුරවැසියා. එ වාගේම මේකට වග කිව යුතු අය. ඒ වාගේම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයින්; මේකට සම්බන්ධ විවිධ විද්වතුන්, මේකට සම්බන්ධ වෘත්තීය සමිති මේ සබුද්ධික සංවාදය ඇති කර ගන්න ඕනෑ. මොකද, මෙය අයිති අනාගතයට; මෙය අයිති දරුවන්ට. අපි මෙය ගෙනාවේ අපේ රටේ ලස්සන ජීවිත දකින්න ඕනෑ නිසා. දරුවන්ගේ ජීවිත, රටේ ජීවිත ලස්සන කිරීමේ අරමුණින් තමයි අපි මෙය ගෙනාවේ.

මේ අවස්ථාවේදී මම කියන්න කැමැතියි, යූරි බ්‍රොන්ෆෙන්බ්‍රෙනර් කියන අධ්‍යාපන විද්‍යාඥයාගේ අදහසක්. ඔහු කියා තිබෙනවා, "සැබෑ ප්‍රගතියක් ඇති වන්නේ සමාජයේ සෑම තරාතිරමකම අය දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වගකීම භාර ගත් විටයි" කියලා. සෑම තරාතිරමකම අය සමාජයක් විධියට අධ්‍යාපනයේ වගකීම භාර ගත්තොත් විතරයි දරුවන්ගේ අධ්‍යාපන ක්‍රියාවලිය සාර්ථක කර ගන්න පුළුවන් වන්නේ කියන එක අපි කියපු දෙයක් නොවෙයි.

පසුගිය කාලයේ හිටපු අය මේ වගකීම මොන විධියට ද භාර ගත්තේ කියලා අපි බැලුවොත්, ඒ පිළිබඳව ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. මේ ප්‍රශ්නයට අවධානය යොමු කරන්න කලින් නැවතත් මම යොමු වෙනවා, අර කියපු කුලුනු පහෙන් එක කුලුනක් ගැන කථා කරන්න. ඒ කුලුන තමයි, මානව සංවර්ධනය. දරුවන්ට උගන්වන්නේ කවුද? දරුවන්ට උගන්වන්නේ පාසල් පද්ධතියේ ඉන්න ගුරු අධ්‍යාපනවේදීන්. ඔවුන්ට අනුව සකස් කරපු විෂය මාලාව උගන්වන්නේ ගුරුවරුන්. නමුත්, අවුරුදු 16කින් ගුරුවරුන්ට අදාළ විෂය නිර්දේශය වෙනස් වෙලා නැහැ, වෙනස් කරලා නැහැ. දරුවන්ට උගන්වන විද්‍යා පීඨවල ඉන්න ගුරුවරුන්ගේ විෂය නිර්දේශය අවුරුදු 16කින් වෙනස් වෙලා නැහැ. මේවා වෙනස් කරන්න ඕනෑ නැද්ද? මේ පිළිබඳව සබුද්ධික කථාවක් ඇති වෙන්න ඕනෑ නැද්ද?

අපි මේ කථා කරන කුලුනු පහ ඇතුළේ තිබෙන දෙවැනි කුලුන තමයි, මානව සංවර්ධනය. ගුරුවරුන් සඳහා මේ මානව සංවර්ධනය අදාළ කර ගන්නේ කොහොමද කියලා මම ඔබට කියන්නම්. මගේ ළඟ මේ තිබෙන්නේ අමාත්‍යාංශ අනුව ප්‍රධාන වියදම් සංරචක ඇතුළත් "අය වැය ඇස්තමේන්තුව 2026". එම අය වැය ඇස්තමේන්තුවේ තිබෙනවා, ගුණාත්මක අධ්‍යාපනය සඳහා ගුරු සංවර්ධනය යටතේ ගුරු විද්‍යාල හා මධ්‍යස්ථාන සහ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පුනරුත්ථාපනය කිරීම සහ අවශ්‍ය උපකරණ ලබා දීමට රුපියල් මිලියන 728ක්, තාක්ෂණ විෂය ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය පිහිටුවීම සඳහා රුපියල් මිලියන 768ක්, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 2,000ක්, ගුරු විද්‍යාල සහ මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 99ක්, ධාරිතා වර්ධනය සඳහා රුපියල් මිලියන 96ක් ආදී වශයෙන්. මේ, අපි කථා කරන කුලුනු පහ ඇතුළේ තිබෙන දෙවැනි කුලුන වන මානව සංවර්ධනය වෙනුවෙන් ගෙන ඇති පියවර.

මම කලිනුත් කිව්වා වාගේම අවුරුදු 16ක් තිස්සේ ගුරුවරුන්ගේ විෂය නිර්දේශය වෙනස් වෙලා නැත්නම් අලුත් විෂය කරුණු එකතු වෙලා නැත්නම් අපි මේ අධ්‍යාපන ප්‍රතිපත්තිය ගුරුවරුත් එක්ක කරන්නේ කොහොමද? ඒ වාගේම ගුරුවරුන්ට ඩිජිටල්කරණය ගැන, ස්මාර්ට් බෝර්ඩ් ගැන තාක්ෂණ පුහුණුවක් නැත්නම් අලුත් ආදර්ශ පන්ති කාමර තුළ ගුරුවරුන්ට පුහුණුවක් දීලා නැත්නම් හොඳ දරුවෙක් අපි නිර්මාණය කරන්නේ කොහොමද? ඒ වාගේම අවුරුදු ගණනක් තුළ නේවාසිකාගාරවල යටිතල පහසුකම් සංවර්ධනය වෙලා නැත්නම් අපි මේ පුනරුදය ගෙනෙන්නේ කොහොමද? ඒ වාගේම නවාතැන් පහසුකම්, ඔවුන්ට බලපාන මානසික හිංසනයන් සඳහා වැඩ පිළිවෙළවල් හදලා නැත්නම් අපි මේ පුනරුදය ගෙනෙන්නේ කොහොමද? අපි මේ ගෙනැල්ලා තිබෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා මුදල් වෙන් කරලා තිබෙන්නේ විශාල සංවාදයක් කරලා. මම ඒකයි කිව්වේ අපිට සබුද්ධික සංවාදයක් ඕනෑ කියලා. මානව සංවර්ධනය, ගුරුවරු සංවර්ධනය කිරීම හා ඒ සංවර්ධනයට අවශ්‍ය සියලු යටිතල පහසුකම් සංවර්ධනය කරන්න ඕනෑ කියන එක දැන් අපි පටන් අරගෙනයි තිබෙන්නේ. ඒක තමයි මම කිව්වේ අපි ඒ අවශ්‍ය තැන්වලට බර තියලා තමයි මේ වැඩය පටන් ගත්තේ කියලා.

ගරු කථානායකතුමනි, ඊළඟට මම කියන්න කැමතියි, මේ සබුද්ධික සංවාදය වෙනුවට පසුගිය කාලයේ මොකක්ද වුණේ කියලා. මම මේ ගැන පොඩි අධ්‍යයනයක් කරද්දී මට ඊසොප්ගේ උපමා කථා තිබෙන පොතක් හමු වුණා. ගරු කථානායකතුමනි, ඒ පොතේ තිබෙනවා, "සපතේරුවෝ බොරුකාරයෝය" කියලා කථාවක්. ඊසොප්ගේ මේ උපමා කථාවේ "සියුස්" කියලා දෙවියෙක් ඉන්නවා. ඒ, ග්‍රීක දෙවි රජ්ජුරුවෝ අපි හඳුන්වන්නේ "සියුස්" කියලා. ඒ දෙවි රජ්ජුරුවන්ගේ පුතා තමයි, "හර්මියුස්". දවසක් මේ සියුස් රජ්ජුරුවෝ තම පුතා වන හර්මියුස් අමතා කියනවා, මේ කර්මාන්ත ශිල්පීන්ට බොරුව ස්වල්පය මහින් බෙදා දෙන්න ඕනෑ, හැමෝටම බොරුව ටික ටික දෙන්න ඕනෑය කියලා. කොහොමද, මේ බොරුව දුන්නේ? අපි දන්නවා නේ, ඉස්සර බෙහෙත් ටිකෙන් ටික වංගෙඩියට දාලා කොටලා තමයි දුන්නේ කියන එක. දැන් මේ සියුස් කියන රජතුමා තමන්ගේ පුතා හරහා මේ බොරුව ටික ටික බෙදා දුන්නා. සියලු කර්මාන්තකරුවන්ට බොරුව බෙදා දුන්නාට පස්සේ ඒ වංගෙඩියේ වැඩිපුර ටිකක් ඉතුරු වුණා. මේ වැඩිපුර ඉතුරු වුණු ටිකට මොකද කළේ? මේක හදන්න කියපු කෙනා ඉතුරු වුණු ඔක්කෝම ටික බිව්වා. මේ කථාව කියාගෙන යද්දී මට මතක් වුණා, තමන්ගේ පුරවැසි වගකීම, මහජන වගකීම හා දරුවන් බලාපොරොත්තු වන වෙනස සබුද්ධිකව ඉටු කරනවා වෙනුවට මඩ ගහමින්, කාන්තාවන්ට හිංසා කරමින්, ආගම් වාදය, වෛරය වපුරමින් පසුගිය කාලයේ කරපු දේවල් ටිකක්. ඒක, මේ සියුස් කියන දෙවියා ඒ කර්මාන්තකරුවන්ට බොරු කොටලා කොටලා පොවලා අන්තිමට ඉතුරු ටික තමන් බිව්වා වාගේයි. පසුගිය කාලයේ වංගෙඩියට දැම්මේ මොනවාද?

අපේ අගමැතිතුමිය, අධ්‍යාපන ඇමතිතුමිය විධියට අතිවිශාල වගකීමක් දරමින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙන්න මහන්සි වුණා. මම මුලින්ම කිව්වේ ඒකයි, ඒ ක්‍රියාවලිය ඇතුළේ විශාල ප්‍රමාණයකගේ මහන්සිය තමයි මේ තිබෙන්නේ කියලා. ඒ වාගේම අවුරුදු ගණනාවක් මේ වෙනුවෙන් මහන්සි වුණු, ඒ ගැන අධ්‍යයනය කරපු අධ්‍යාපනවේදීන් හිටියා. හැබැයි, නව රජය මහින් මේ අධ්‍යාපන වෙනස කරන්න එතුමිය විශාල නායකත්වයක් දුන්නාය කියන එක අපි දන්නවා. 2025 අවුරුද්දේ ඉඳලා යටිතල පහසුකම් සංවර්ධනය කරලා, පටන් ගත්ත වැඩේ කරගෙන යද්දී ඒකට රිදෙන පිරිසකුත් ඉන්නවා නේ. නව සමාජයක් හැදෙනවාට ඇත්තටම අකැමැති පිරිසකුත් ඉන්නවා. මෙහෙම ගියොත් කවදාවත් බලයට එන්න බැහැ, දරුවෝ ලෝකය දකිනවා කියලා හිතන අයත් ඉන්නවා. ඒ වාගේම දරුවෝ ඉගෙන ගන්නවා කියලා දැනෙද්දී හද කම්පා වෙන පිරිසකුත් ඉන්නවා. ඒ පිරිස තමයි, මම කලින් කිව්ව විධියට බොරුවේ බෙහෙත් බීලා ඉන්න පිරිස. ඒ හද කම්පා වෙන පිරිස මොකක්ද කළේ? ඒ අය වංගෙඩියට දාලා කෙටුවේ මොනවාද? දරුවන්ගේ අධ්‍යාපනය වංගෙඩියට දාලා විනාශ කළා; බොරුව වැපුරුවා. ඒකට දැම්මා, කාන්තාවන්ට හිංසා කිරීම. ගරුත්වය කැලයට දැම්මා. මේ වගකිව යුතු තැනදී ඉතාම පහත් විධියට ඒ අය හැසිරුණා. ඒ විධියට තමන්ගේ පහත්කම

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය]

ලෝකයටම ප්‍රදර්ශනය කළා. අඩුපාඩුකම් තිබෙනවා නම් ඒවා පෙන්වා දෙන්න. මම ඒකයි කිව්වේ, සබුද්ධිකව ප්‍රශ්න දිහා බලන්න ඕනෑ කියලා. යම් මොඩියුලයක ප්‍රශ්නයක් තිබුණා නම් ඒ ප්‍රශ්න ගැන කථා කරන විධිය දන්නේ නැද්ද?

අපි පුංචි දරුවෝ විධියට සිටියදී අපේ අම්මලා, තාත්තලා ගෙදරදී ප්‍රශ්න ගැන කථා කළේ කොහොමද කියලා අප දන්නවා. වැඩිහිටියෝ කථා බහ කරලා ඒ ප්‍රශ්නයට නිවැරදි උත්තරය අපට කිව්වා. එහෙමයි වැඩිහිටි පරම්පරාව වැඩ කටයුතු කරන්නේ. නමුත්, මේගොල්ලන් වැඩිහිටි පරම්පරාවටත් නොගැළපෙන විධියට තමන්ගේ කැත, නින්දිතභාවය ප්‍රකාශ කළා. මම කලින් කිව්ව කථාවට අනුව නම් වැඩිපුරම බොරුවේ බෙහෙත බීපු කෙනා බවට විපක්ෂ නායකතුමා පත් වෙලා, තමන්ගේ කට්ටියට මේ බොරුව කියන බෙහෙත බොන්න කියලා දුන්නා. ඒ නිසා සිදු වුණු දේ මොකක්ද? දරුවෝ බලාපොරොත්තුවෙන් හිටපු, ආසාවෙන් හිටපු ඒ වෙනස කරන්න ප්‍රමාද වුණා.

මම ඔබතුමාට මේ කාරණයත් කියන්නම්, ගරු කථානායකතුමනි. 6 ශ්‍රේණිය විද්‍යාව පොත අරගෙන පුංචි දරුවෝ තමන්ට පුළුවන්, පුළුවන් විධියට ගෙදරදී විද්‍යාගාර හදා ගත්තා. එහි අලුත්ම වෙනසක් තිබුණා. අම්මලා විධියට අපි දන්නවා, අධ්‍යාපනයේ බර, අකැමැත්ත දරුවෝ තුළ වාගේම දෙමව්පියන් තුළ කොච්චර තිබෙනවාද කියලා. එම නිසා ඒ සංවාදය සබුද්ධිකව ගන්නවා වෙනුවට කැත විධියට සමාජයේ වෛරය වපුරන්න මේ අය කටයුතු කළා. අගමැතිතුමිය - අධ්‍යාපන ඇමතිතුමිය - ඉතාම පහත් තත්ත්වයට පත් කරලා, එතුමියට විවිධ විධියේ නම් ආරෝපණය කරලා, මේ සමාජය තුළ ඇති කරන්න හදපු වෛරය කොච්චරද කියන එක අපි දැක්කා. අද මේ අය ඒක දිගටම කර තියාගෙන යනවා. නමුත්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කියන්නේ ඒකට නොවෙයි. අපේ දරුවන්ට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙන්න කලින් ඒවා ගෙනෙන්න තිබුණේ මේ ප්‍රශ්නය නිවැරදිව හඳුනා ගත්තේ නැති බොරු පෙලඹවීම් කරපු ඒ කණ්ඩායමට කියන එක මම මතක් කරනවා. සමාජය ඉදිරියට යන එක වළක්වන්න බැහැ. අපි අඩුපාඩුකම් හදා ගනිමින් ඉතාම ශක්තිමත්ව මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරනවා. ඒ සඳහා සියලු දෙනාගෙන්ම අපි උදවු ඉල්ලනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The next speaker is the Hon. Mujibur Rahuman.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman. You have 14 minutes.

[පූ.භා. 11.27]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධව පවත්වන මේ විවාදයේදී මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කරන කාල සීමාවක් තිබෙන බව අපි දන්නවා. සාමාන්‍යයෙන් අපේ රටේ අධ්‍යාපනය සම්බන්ධව තිබෙන නෛතික රාමුව තුළ විෂයමාලා ප්‍රතිසංස්කරණය අවුරුදු අටෙන් අටට වෙන්න ඕනෑ කියලා තිබෙනවා. මේක 2023 වර්ෂයේ කරන්න තිබුණු විෂයමාලා ප්‍රතිසංස්කරණයක්. නමුත්, 2023 වර්ෂයේ රටේ තිබුණු තත්ත්වයත් එක්ක ඒක සිදු වුණේ නැහැ. අලුත් ආණ්ඩුව බලයට පත් වුණාට පසුව ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉස්සරහට ගෙනැල්ලා තිබෙනවා. විශේෂයෙන්ම මේ ප්‍රතිසංස්කරණ කරන්න ඕනෑ කියන මතයේ තමයි සමගි ජන බලවේගය ඉන්නේ. දැනුම මත පදනම් වුණු අධ්‍යාපන ක්‍රමයක් හදන්න ඕනෑ, අලුත් තාක්ෂණය එක්ක අධ්‍යාපනයට ඇතුළත් වෙන්න ඕනෑ, ළමයා දවස ගානේ update වෙන්න ඕනෑ කියන මතයේ අපි සියලුදෙනාම ඉන්නවා. අපි කවුරුවත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධ නැහැ. ඒ හින්දා ආණ්ඩුව පැත්තේ ඉඳගෙන විපක්ෂය විරුද්ධයි කියලා විපක්ෂයට චෝදනා කරන එක කිසි තේරුමක් නැති දෙයක්. විපක්ෂයේ විවිධ මත දරන අය ඉන්නවා. හැම එක්කෙනාම සමගි ජන බලවේගයේ මතයේ නොවෙයි ඉන්නේ. වෙන වෙන මත දරන අය ඉන්නවා. නමුත්, සමගි ජන බලවේගය විශේෂයෙන්ම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටින දේශපාලන ව්‍යාපාරයක්; දේශපාලන පක්ෂයක්. අපි අතීතයේ සිට ඒ වෙනස් කිරීම් කරලා තිබෙනවා.

1980 වසරේ ධවල පත්‍රිකාව ගෙනෙනකොට විරුද්ධ වුණේ කවුද? 1980 ධවල පත්‍රිකාව ගෙනෙනකොට ඒකට විරුද්ධව විශ්වවිද්‍යාල සිසුන් පාරට ගෙනැල්ලා ඒක නැවැත්තුවේ කවුද? 1980දී ඒක ගෙනාවා නම් අද වනකොට අවුරුදු 40ක් වෙනවා. දකුණු කොරියාව අපට පසුව තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කළේ. අවුරුදු 40කට කලින් අපි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරලා තිබුණා නම්, අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ දකුණු කොරියාවටත් වඩා ඉස්සරහින් යන්න තිබුණා. නමුත්, ඒක කරන්න දුන්නේ නැහැ. ඒක කරන්න දුන්නේ නැති අය තමයි අද බලයේ ඉන්නේ. ඒකට තමයි දෛවයේ සරදම කියන්නේ. දැන් තමුන්නාන්සේලාට ඇවිල්ලා මේක කරගහගෙන යන්න සිද්ධ වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කවුරුත් මේ කටයුත්තට එකඟයි. අපි කවුරුත් විරුද්ධ නැහැ.

අපි දන්නවා, දැන් රට පුරාම උද්ඝෝෂණය කරනවා, මේ ප්‍රතිසංස්කරණය කරන්න කියලා. කවුද, මේ උද්ඝෝෂණය කරන්නේ? ඒ ගැන හොයලා බැලුවාම ආණ්ඩුවට සම්බන්ධ පිරිස් ඉන්නවා, ඒක ඇතුළේ නායකත්වය අරගෙන. කවුද, මේක නැවැත්තුවේ? මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නැවැත්තුවේ කවුද? හයවැනි ශ්‍රේණියේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්න එපා කියලා නැවැත්තුවේ කවුද? ජනාධිපතිතුමා ජනවාරි 13වැනි දා ගුරු වෘත්තීය සමිති එක්ක තිබුණු සාකච්ඡාවෙන් පසුව ප්‍රකාශ කළා, පළමුවැනි ශ්‍රේණියේ එක විතරක් ක්‍රියාත්මක වෙනවා, හයවැනි ශ්‍රේණියේ මොඩියුලය සකස් කිරීමේදී ගැටලු ඇති වෙලා තිබෙනවා, ඊළඟට ගුරුවරු පුහුණු කිරීමේ ප්‍රමාදය තිබෙනවා, ඊළඟට තාක්ෂණික ගැටලු තිබෙනවා කියලා. එම නිසා ජනාධිපතිතුමා 2027ට ඒක කල් දැම්මා. ඒක කල් දැම්මේ අපිද? අපි නොවෙයි කල් දැම්මේ. ජනාධිපතිතුමායි කල් දැම්මේ. තමුන්නාන්සේලා විපක්ෂය, විපක්ෂය කියලා කියනවා. එහෙම

නම් ජනාධිපතිතුමාත් ඉන්නේ විපක්ෂයේ. මොකද, ජනාධිපතිතුමානේ කල් දැම්මේ. එහෙම නම් අපියි, ජනාධිපතිතුමායි ඔක්කෝම එකට ඉන්නේ. ඔබතුමන්ලා අපට නේ චෝදනා කරන්නේ. එක්කෝ ඔය ගොල්ලන්ට ජනාධිපතිතුමාට කෙළින් චෝදනා කරන්න බැරි හින්දා අපට චෝදනා කරනවා.

මේක නැවැත්වීමට හේතුව ජනාධිපතිතුමා පැහැදිලිව කියනවා; කරුණු තුනක් පෙන්වා දී තිබෙනවා. පළමුවැනි එක විධියට කියනවා, මොඩියුල සකස් කිරීමේදී ගැටලු ඇති වෙලා තිබෙනවා කියලා. මොකක්ද, ගැටලුව? ගැටලු තිබෙනවා. ඒක තමයි හයවැනි ශ්‍රේණියේ ඉංග්‍රීසි මොඩියුලය තුළ සමලිංගික website එකක් දාපු එක. ඒක දැම්මේ අපි නොවෙයි. තමුන්නාන්සේලාගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කමිටුව තමයි ඒක ඇතුළත් කළේ. ඊළඟට, සමහර මොඩියුල පොත්වල තිබෙන QR code එක වැඩ කරන්නේ නැහැ. ඒ වාගේම නොයෙකුත් පෞද්ගලික ආයතනවල web links දාලා තිබෙනවා. ඒවා දැන් පිළිගන්නවා නේ. අධ්‍යාපන ඇමතිතුමිය කිව්වා නේ, ඒ ඔක්කෝම web links අයින් කරනවා කියලා. ඒවා තමයි මොඩියුල සකස් කිරීමේදී ඇති වූ ගැටලු විධියට ජනාධිපතිතුමා හඳුනා ගත්තේ. ඒක එක හේතුවක්, ජනාධිපතිතුමා මේක නවත්වන්න.

ඊළඟ එක මොකක්ද? ගුරුවරුන් පුහුණු කිරීමේ ප්‍රමාදය. ඔව්, තමුන්නාන්සේලා මේක ක්‍රියාත්මක කරන්න මාස තුනකට; පළමුවැනි වාරය සඳහා විතරයි ගුරුවරු පුහුණු කළේ. තවම ගුරුවරුන්ට Teachers' Guide එක දීලා නැහැ; තවම ඒක print කරලා නැහැ. ඒ වාගේම මේ රටේ 43,000ක ගුරු හිඟයක් තිබෙනවා. අධ්‍යාපන ඇමතිතුමිය එදා මේ සභාවට දැන්වූවා, 43,000ක ගුරු හිඟයක් තිබෙනවා කියලා. එතකොට මෙවැනි ගුරු හිඟයක් එක්ක තමයි ජනාධිපතිතුමා කිව්වේ ගුරුවරු පුහුණු කිරීමේ ප්‍රමාදය ගැන. දෙවැනි වාරය පටන් ගත්තාම ඒ සඳහා ගුරුවරුන් පුහුණු කරලා තිබෙනවාද? නැහැ. ගුරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි වාරයේ අප්‍රේල් නිවාඩුව සති දෙකයි. එතකොට පළමුවැනි වාරයට විතරයි ගුරුවරුන් පුහුණු කරලා තිබෙන්නේ. දෙවැනි වාරය සඳහා ගුරුවරුන් පුහුණු කරන්න සති දෙකකින් - නිවාඩු කාලයේ - පුළුවන්ද? අප්‍රේල් මාසයේ සති දෙකයි නිවාඩුව තිබෙන්නේ. ඒ තුළ විශාල අර්බුදයක් පැන නැඟිලා තිබෙනවා.

ඊළඟට තුන්වැනි කාරණාව විධියට ජනාධිපතිතුමා කියනවා, තාක්ෂණික ගැටලු ගැන. හරියටම හරි. දැන් මේ ප්‍රතිසංස්කරණ පටන් ගන්නකොට හැම පන්ති කාමරයකටම smart board එකක් තිබෙන්න ඕනෑ. ඒවා ලබා දීලා තිබෙනවාද? ජනවාරි 29වැනි දා පළමුවැනි ශ්‍රේණිය පටන් ගන්නවා. හැම ඉස්කෝලයකම පළමුවැනි ශ්‍රේණියේ දරුවන්ගේ දෙමව්පියන්ගෙන් smart board එකක් ගන්න මුදල් එකතු කරනවා. තමුන්නාන්සේලා smart boards ලබා දීලා තිබෙනවාද? නැහැ, smart boards නැහැ. හයවැනි ශ්‍රේණියේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පටන් ගන්නවා නම් smart boards දෙන්නේ කවුද? දෙමව්පියෝ ඒ වෙනුවෙන් මුදල් එකතු කරලා දෙන්න ඕනෑ.

ඊළඟට, මේ module system ක්‍රමයට ඉගෙන ගන්න ළමයින්ට devices අවශ්‍යයි. කවුද, ඒ devices දෙන්නේ? ළමයින්ට අවශ්‍ය devices දීලා තිබෙනවාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අන්තර්ජාල පහසුකම් තිබෙන්න ඕනෑ. ලංකාවේ තිබෙන හැම ඉස්කෝලෙකටම අන්තර්ජාල පහසුකම් - Internet facilities - තිබෙනවාද? අපි දන්නවා, කොළඹ නගරයේ සහ ලංකාවේ අනෙකුත් ප්‍රදේශවල සුපිරි පාසල් ටිකක් තිබෙනවා. මූල්‍යමය අවශ්‍යතා නැති පාසල් තිබෙනවා. එවැනි පාසල් අතේ ඇඟිලිවලින් ගණන් කරන්න පුළුවන්. එවැනි පාසල් තුන්සිය ගණනක් විතර ඇති. නමුත්, පාසල් 10,000ක ප්‍රමාණය ගත්තොත්, දුෂ්කර පළාත්වල පාසල් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් එන පාසල් කොළඹ නගරයේත් තිබෙනවා. නමුත්, මේ module system එක පටන් ගන්න ඒ පාසල්වලට ස්මාර්ට් පන්ති කාමර තිබෙනවාද? ඒ පාසල්වලට Internet facilities තිබෙනවාද? අන්න, ජනාධිපතිතුමා කියන තාක්ෂණ ගැටලු මේවා තමයි. මේවා තමයි ජනාධිපතිතුමා කියන්නේ. මේ අඩු පාඩුත් එක්ක මේක කොහොමද පටන් ගන්නේ කියලායි අහන්නේ. ඒ දුෂ්කර පාසල්වල ඉන්නේ අඩු ආදායම්ලාභී පවුල්වල ළමයි. ඒ ළමයි ඉගෙන ගන්න පන්ති කාමරවල module system එක පටන් ගන්න අවශ්‍ය භෞතික සම්පත් ටික ලබා දෙන්නේ කොහොමද? තමුන්නාන්සේලා ඒ සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළාද? ක්‍රියාත්මක කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අගමැතිතුමිය පවත්වපු ප්‍රවෘත්ති සාකච්ඡාවේදී එතුමිය පැහැදිලිව කිව්වා, ඒ අවශ්‍ය උපකරණ ලබා දෙන්නේ මාර්තු මාසයේ කියලා. එතකොට, මාර්තු මාසය වෙනකල් ළමයි ඉගෙන ගන්නේ කොහොමද? මේ, පළමු වාරය. ලොකු ඉස්කෝලවලට ඒක ප්‍රශ්නයක් නැහැ. ඉහළ සුපිරි පාසල්වලට ප්‍රශ්නයක් නැහැ. මම මේ කථා කරන්නේ දුප්පත් අම්මලා, තාත්තලාගේ ළමයි එන පාසල් ගැන. ඒ පාසල්වල ස්මාර්ට් පන්ති කාමර තිබෙනවාද? ඒ පාසල්වල ළමයින්ට devices තිබෙනවාද? ඒ පාසල්වලට එන ළමයින්ට අන්තර්ජාල පහසුකම් තිබෙනවාද? නැහැ. තමුන්නාන්සේලා මේ ක්‍රමවේදය පටන් ගන්න කලින් ඒ භෞතික සම්පත් ටික ලබා දෙන්න තිබුණා. මහා භාණ්ඩාගාරය පිරී ගිහිල්ලා කියලා කියනවානේ. එහෙම නම්, ඒ සඳහා මුදල් වෙන් කරලා මේක කලින් පටන් ගත්තේ නැත්තේ ඇයි? නමුත්, මේක පටන් ගන්න බැරි වුණා. දැන් මේක තුළින් අධ්‍යාපනය තුළ තිබෙන විෂමතා තව වැඩි වෙනවා.

ඒ හින්දා තමයි අපි නිතරම කිව්වේ, මේ මූලික ප්‍රශ්න ටික විසඳාගෙන මේක කරන්න කියලා. අපි මේකට විරුද්ධ වුණේ නැහැ. නමුත් අපි දැක්කා, තමුන්නාන්සේලාගේ මේ වැඩ පිළිවෙළ තුළ අර්බුදයක් නිර්මාණය වෙනවා. ඒ අර්බුදය නිසා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සමබරතාව නැති වෙනවා, විෂමතා තව තවත් වැඩි වෙනවා. ඒ වැඩි වීම නිසා සමාජය තුළ නොයෙකුත් ගැටලු හා ප්‍රශ්න මතු කරනවා. ඒකයි අපි කිව්වේ, මේක තේරුම් අරගෙන මේ module system එක ගේන්න කියලා. නමුත්, තමුන්නාන්සේලාට ඒ වැඩේ හරියට කර ගන්න බැරි වුණා.

දැන් කට්ටිය යවලා බොරුවට උද්ඝෝෂණය කරනවා. ඒ කට්ටිය අධ්‍යාපන අමාත්‍යාංශය ළඟට යවන්න එපා. පැලවත්තෙන් සංවිධානය කරන කට්ටිය ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහට යවන්න. මොකද, ජනාධිපතිතුමානේ මේක කල් දැම්මේ. අපි කවුරුවත් කල් දැම්මේ නැහැනේ. විපක්ෂ නායකතුමා නොවෙයිනේ කල් දැම්මේ. එම නිසා ඒ කට්ටිය ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහට යවන්න. පැලවත්තේ ඉඳලා ජනාධිපති ලේකම් කාර්යාලයට රොකට් එකක් යවන්න. එහෙම නැතුව අධ්‍යාපන අමාත්‍යාංශය ඉස්සරහට ගිහිල්ලා "දියව්, දියව්, කරව්, කරව්" කියලා වැඩක් නැහැ. දැන් අපට පෙනෙන්න තිබෙන දේ තමයි තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමා කල් දැමූ එකට ඔබතුමන්ලා අපට බණිනවා. අපියැ කල් දැම්මේ? කල් දැම්මේ ජනාධිපතිතුමා. ඉතින්, ජනාධිපතිතුමා එක්ක ඒ ප්‍රශ්නය විසඳාගන්න.

ජනාධිපතිතුමා දැන් පැලවත්තට එන්නේ නැහැ. අපි දන්නවා, එතුමා දැන් ඉන්නේ ඩඩ්ලි සිරිසේනත් එක්ක, ධම්මික පෙරේරාත් එක්ක, ඉෂාර නානායක්කාරත් එක්ක, හාන්ස් විජේසූරියත් එක්ක. ඒක අපි දන්නවා. ලාල් කාන්ත ඊයේ ලෙනින් ගැන කථා කරන්න පටන් ගත්තා. මම බලාගෙන සිටියා, එතුමා මොකක්ද කියන්නේ

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

කියලා. වී.අයි. ලෙනින් කිව්ව දේවල් නම් ලාල් කාන්ත කිව්වේ නැහැ. හැබැයි, ලෙනින් මොරායස් කිව්ව දේවල් නම් කිව්වා. දැන් එක පාරටම ලෙනින් මතක් වෙලා තිබෙනවා. මොකද, දැන් ජනාධිපතිතුමා ඉන්නේ වෙන සෙට් එකක් එක්කනේ. ඒ නිසා පහළ ඉන්න අය දැන් අහනවා, "සහෝදරයා, මොකද වෙන්නේ" කියලා. අපි දැන් IMF එකත් එක්ක යනවා, ලෝක බැංකුවත් එක්ක යනවා, ජූලි චන්ග් එක්ක ඉන්නවා, දැන් අපට ලෙනින් නැහැ, කාල් මාක්ස් නැහැ, ෆෙඩ්රික් එංගල්ස් නැහැ කියලා දැන් ලාල් කාන්ත ඇමතිතුමා එක පාරටම, "ලෙනින් කියවමු" කියලා ආයේ පටන් ගන්නවා. මේ බොරුව කරන්න එපා. දැන් ඇන්දුවා ඇති. කාඩර් එකත් අන්දන්න එපා. රටේ ජනතාවත් අන්දලා කාඩර් එකත් අන්දන වැඩ කරන්න එපා කියලා අපි ලාල් කාන්ත ඇමතිතුමාට කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මතක තියාගන්න, තමුන්නාන්සේලා 6වැනි ශ්‍රේණිය සඳහා වන module system එක මේ අවුරුද්දේ නිකම් හරි පටන් අරගෙන තිබුණා නම්, ඒක කරන්න වෙන්නේ අපේ විපක්ෂ නායකතුමා ලබා දුන් ස්මාර්ට් පන්ති කාමරවලින්. සජිත් ප්‍රේමදාස මැතිතුමා පාසල් 386කට ස්මාර්ට් පන්ති කාමර ලබා දුන්නා. අන්න ඒ පන්ති කාමරවල තමයි තමුන්නාන්සේලාට මේ module system එක පටන් ගන්න තිබුණේ. එතුමා විපක්ෂයේ ඉඳගෙන පාසල් 386කට ස්මාර්ට් පන්ති කාමර ලබා දුන්නා. එක පාසලකට ලක්ෂ 10කට වඩා වියදම් කළා. තමුන්නාන්සේලා ඒ කාලයේ හිනා වුණා, මේවා අවශ්‍ය නැහැයි කියලා කිව්වා. තමුන්නාන්සේලා කිව්වා, ඉස්කෝල ඇතුළට ගිහිල්ලා දේශපාලනය කරනවා කියලා. එහෙම කියලා බලය ගත්තු තමුන්නාන්සේලාට අද වනකල් එක ඉස්කෝලයකටවත් smart classroom එකක් පටන් ගන්න TV එකක්වත් දෙන්න බැරි වුණා. TV එකක්වත් දෙන්න බැරි වුණා! එතුමා විපක්ෂයේ හිටියත් පාසල් 386කට smart classrooms දුන්නා. මොකද, එතුමා ඒ ඉදිරිය දැක්කා. මේ ඩිජිටල් ලෝකයත් එක්ක, මේ තාක්ෂණයත් එක්ක ඉදිරියට යන්න ඕනෑ කියන එක එතුමා දැක්කා. ඒ හින්දා තමයි එතුමා විපක්ෂයේ ඉඳගෙන මේ වැඩ පිළිවෙළ පටන් ගත්තේ. තමුන්නාන්සේලා ඒකට අකුල් හෙළුවා; ඒක සමච්චලයට ලක් කළා; ඒකට හිනා වුණා. නමුත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඇවිල්ලාත් අද වෙනකොට ඉස්කෝලෙකට TV එකක්වත් දීගන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වෙනුවෙන් රුපියල් ලක්ෂ 5,000ක් වියදම් කරලා තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් කෝටි 50ක් පාඩු වෙලා තිබෙනවා. කවුද ඒ රුපියල් ලක්ෂ 5,000 වගකීම භාර ගන්නේ? ඒ වගකීම කැබිනට් මණ්ඩලය භාර ගන්නවාද? ඒ සඳහා කැබිනට් අනුමැතිය දීලා තිබෙනවා. ඒ වියදම් කරපු රුපියල් ලක්ෂ 5,000 පාඩු වෙලා තිබෙනවා.

තමුන්නාන්සේලා පිළිගන්න, තමුන්නාන්සේලාගේ නොහැකියාව හින්දා තමයි මේ වැඩ පිළිවෙළ ප්‍රමාද වුණේ කියලා. තමුන්නාන්සේලාට වැරදුණා. මේක සැලසුම් සහගතව පටන් ගත්තේ නැහැ. මේක සැලසුම්සහගතව පටන් ගත්තේ නැහැ කියලා කියන්නේ කවුද? එහෙම කියන්නේ මම නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මගේ ළඟ තිබෙනවා, 2025 නොවැම්බර් 04වැනි දින ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවපු වාර්තාව. කවුද මේ වාර්තාව යවන්නේ? විගණකාධිපති යවන්නේ. "අහිතකර මතය" කියලායි එතුමා මේ වාර්තාව පටන් ගන්නේ. මේ වැඩ පිළිවෙළේ තිබෙන අඩු පාඩු 8ක් එතුමා නම් කරලා තිබෙනවා. මෙහි තිබෙන එක් ප්‍රධාන අඩු පාඩුවක් මම කියවන්නම්, තමුන්නාන්සේට තේරුම් ගන්න. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධව 2025 නොවැම්බර් මාසයේ 04වැනි දින විගණකාධිපති කාර්යාලය විසින් නිකුත් කරපු මේ වාර්තාව මම **සභාගත*** කරනවා.

මේ වාර්තාවේ 9වැනි පිටුවේ (ඇ) ඡේදයේ මෙසේ සඳහන් වෙනවා:

> "2026 වර්ෂයේදී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ නව වැඩපිළිවෙළට අදාල මාර්ග සිතියම -road map- 2025 මාර්තු 26 දින වන විට ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකස් කිරීමේ කටයුතුවල, අවසන් අදියරේ පවතින බව අමාත්‍යාංශයේ විගණන කමිටු රැස්වීමේදී ආයතනයේ කළමනාකාරිත්වය දැනුම් දුන් නමුත් 2025 සැප්තැම්බර් 25 දින වන විටත් මාර්ග සිතියම සකස් කර නොතිබුණි."

මාර්ග සිතියම හදලා තිබුණේ නැහැ, සැප්තැම්බර් මාසය වනකල්. එහෙම නම් එච්චර කාලයක් මොකක්ද කළේ? මේක නොහැකියාව. මේ නොහැකියාව නිසා තමයි මේ වැඩ පිළිවෙළ අසාර්ථක වුණේ. එසේ අසාර්ථක වෙන්න හේතු වූ කරුණු 8ක් ඇතුළත් වාර්තාවක් ජාතික විගණන කාර්යාලය ජාතික අධ්‍යාපන ආයතනයට භාර දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් කවුද මේකට වග කියන්න ඕනෑ? අගමැතිතුමියගේ යෙහෙළිය මහාචාර්ය මංජුලාට අයින් වෙන්න කියලා කිව්වා. ජාතික අධ්‍යාපන ආයතනයේ සිටි එතුමිය ඉල්ලා අස් වුණා. එතුමිය නොවෙයි ඉල්ලා අස් වෙන්න ඕනෑ. ඉල්ලා අස් වෙන්න ඕනෑ, අධ්‍යාපන ඇමතිතුමිය. අධ්‍යාපන ඇමතිතුමියයි ඉල්ලා අස් වෙන්න ඕනෑ. නමුත් එතුමිය ඉල්ලා අස් වුණේ නැහැ. වැඩ තහනම් කිරීමකුත් කරලා තිබෙනවා. කාගේද වැඩ තහනම් කළේ? සමරවීර මහත්මයාව අනිවාර්ය නිවාඩු යැව්වා. එයාගේ යටතේ ඉන්න දෙදෙනාගේ වැඩ තහනම් කළා. ඇයි සමරවීර මහත්මයාව අනිවාර්ය නිවාඩු යැව්වේ? ඔහු ගෙදර ඉඳන් පඩි ගන්නවා. ඇයි? NPP අධ්‍යාපන කමිටුවේ සාමාජිකයෙක් හින්දද, සමරවීර මහත්මයාව අනිවාර්ය නිවාඩු යැව්වේ? ඔහුයි ප්‍රධානියා. ඔහුට තමයි වගකීම තිබෙන්නේ. ඔහු තමයි ඉංග්‍රීසි මොඩියුලය ඉදිරිපත් කළේ. එය ඉදිරිපත් කළ කෙනාව අනිවාර්ය නිවාඩු යවලා ඔහු යටතේ වැඩ කරපු දෙදෙනාගේ වැඩ තහනම් කළා. එහෙම කොහොමද වෙන්නේ? එහෙම වෙන්න විධියක් නැහැ. ඒ කියන්නේ තමන්ගේ පාක්ෂිකයාව ආරක්ෂා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය අඟහරුවාදා නලින්ද ජයතිස්ස ඇමතිතුමා මෙහිදී නැඟිටලා කිව්වා, අධ්‍යාපන ඇමති සම්බන්ධව අපි විවාද කරමු කියලා. කවුද කිව්වේ? නලින්ද ජයතිස්ස ඇමතිතුමා. එතුමා කිව්වා, ඒ විවාදය පටන් ගනිමු කියලා. විවාදය පටන් ගන්න, චූදිතයා නැහැ නේ. ඒ කියන්නේ "මඟුල් ගේ ගමු" කියලා කියනවා, මනමාලි නැතිව. මනමාලි ඉන්න එපායැ මඟුල් ගේ ගන්න. මනමාලිව ස්විට්සර්ලන්තයට යවලා මේ ගොල්ලන් කියනවා, "මඟුල ගමු" කියලා. නමුත් මඟුල ගන්න බැහැ. අන්තිමට මඟුල ගන්න වෙන්නේ මටයි, නලින්දටයි තමයි. ඉතින් ඒක කරන්න බැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, ඒ විෂයේ අපි නැති හින්දා. ඒ හින්දා අගමැතිතුමිය ඉන්න ඕනෑ, විවාදය ගන්න. මේ ගොල්ලන් බලන්නේ අගමැතිතුමිය නැති වෙලාවේ විවාදය අරගෙන අගමැතිතුමියට උත්තර දෙන්න තිබෙන වෙලාව නැති කරලා, අගමැතිතුමියට හෙමින් ෂොට් එක දෙන්න. ඒවාට අපි අහුවෙන්නේ නැහැ. ඒ නිසා ඔයගොල්ලන් ගෙනාපු අගමැතිතුමිය ඔයගොල්ලන්ම උස්සාගෙන යන්න; අපේ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කරේ තියලා යවන්න එන්න එපා. එතුමිය නැති වෙලාවේ විවාද කරන්නේ මොකටද? එතුමිය ආවාම ගේන්නම්. ඉස්සෙල්ලා මනමාලිව ගේන්න. මනමාලි ගෙනාවාම මඟුල ගනිමු. ඒකේ ප්‍රශ්නයක් නැහැ. ආයේ නැකැත් වෙලාවක් බලන්න තිබෙනවා, පොරොන්දම් බලන්න තිබෙනවා. මොකද, මඟුල කැඩුණා නේ. ඒ කැඩිච්ච මඟුල ආයේ fit කරන්න පොරොන්දම් බලන්න ඕනෑ. එහෙම නේද? චාරිත්‍ර-වාරිත්‍ර ඉටු කරන්න තිබෙනවා. ඒවා කරලා අපි ආයේ ඒක ගේන්නම්. මේ මඟුල ගන්නවාට අපි විරුද්ධ නැහැ. නමුත් තමුන්නාන්සේලා මනමාලිව ස්විට්සර්ලන්තයට යවලා කියනවා, "අපි මඟුල ගනිමු" කියලා. අපි ඒවාට අහුවෙන්නේ නැහැ කියන එක මතක තියාගන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have exhausted your time.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කථාව අවසාන කරන්නම්. මට තව විනාඩියක කාලයක් දෙන්න.

ඇති වෙලා තිබෙන මේ තත්ත්වයත් එක්ක, අපි විශේෂයෙන්ම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටිනවා. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරන්න ඕනෑ කියලා අපි කියනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරන ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය අනුගමනය කරන්න. ඒ වාගේම, ඒ ළමයින්ට අවශ්‍ය යටිතල පහසුකම් ටික ලබා දෙන්න. ඒක ඉතා ඉක්මනින් කරන්න. ඒවා කරලා මේ මොඩියුල ක්‍රියාත්මක කරන්න. ඉස්සර කියමනක් තිබුණා, "කොළඹට කිරි - ගමට කැකිරි" කියලා. තමුන්නාන්සේලා මේ යන ක්‍රමවේදයේ ගියොත්, ගමට කැකිරි නොවෙයි, තුඹ කරවිලවත් ලැබෙන්නේ නැහැ කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. R.M. Samantha Ranasinghe. You have ten minutes.

[පූ.භා. 11.44]

**ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. අධ්‍යාපනය පිළිබඳව කථා කරන මේ මොහොතේ ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට මටත් අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. අපේ ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය කිව්වා, "අපි අධ්‍යාපනය පිළිබඳව හොඳ සබුද්ධික සංවාදයක් කරමු" කියලා. දීර්ඝ ඉතිහාසයක් තිස්සේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළිලා හිටපු මිනිස්සු, අපි. හොඳ සබුද්ධික සංවාදයක් කරන්න අප ලැහැස්ති වෙනකොට වළං කඩේට පැනපු ගොනා වාගේ ඇනගෙන, ඇනගෙන, ඇනගෙන යනවා. ඉතින් දැන් ඒවාට උත්තර දුන්නේ නැත්නම් එහෙම, අපේ සමාජයේ මිනිස්සු හිතනවා, ඒවා ඇත්ත කියලා. ටයි දාලා, කෝට් දාලා ඉංග්‍රීසියෙන් කථා කළාටම ඒවා ඇත්ත නොවෙයි. බොරුව ඇට, ලේ, මස් නහරවලටම කා වැදිලා තිබෙනවා. ඒ අය බොරුව සමාජගත කරලා තිබෙනවා. ඒ අය දේශපාලනය කරලා තිබෙන්නේ බොරුව, වංචාව සමාජගත කරලා. ඒ නිසා ඒවාටත් උත්තර දෙන්න ඕනෑ.

අපේ රටේ අධ්‍යාපනය, දීර්ඝ කාලයක් තිස්සේ එන අඛණ්ඩ ක්‍රියාවලියක්. ඇත්තටම මේ පාර්ලිමේන්තුවේ සාතිශය බහුතරයක් රටේ විවිධ ඉහළ තනතුරු දරපු, සමාජයේ ඉහළ තැන්වලට ආපු අය. මමත් එහෙමයි. අප එහෙම සමාජයේ ඉහළට ආවේ අපේ රටේ අධ්‍යාපනයේ තිබුණු හොඳ ගතිගුණ නිසා; හොඳ ලක්ෂණ නිසා. විශේෂයෙන්ම නිදහස් අධ්‍යාපන පනත ක්‍රියාත්මක වුණු නිසා තමයි ඈත පිටිසර බොහෝ ගම්මානවල හිටපු අඩු ආදායම්ලාභී දෙමව්පියන්ගේ දරුවන්ට සමාජයේ ඉහළ තැන්වලට එන්න පුළුවන් වුණේ. අපි ඒක නිහතමානීව පිළිගන්නවා. මේ අධ්‍යාපනය නවීකරණය කරන්න මේ රටේ හිටපු පාලක පෙළැන්තිය අසමත් වුණා. අසමත් වුණා විතරක් නොවෙයි, නිදහස් අධ්‍යාපන පනත; ඒ සංකල්පය වැරැදි පාරක අරගෙන යන්න තමයි ඒ අය හැදුවේ. මෙතැන ඉන්න අපේ ආණ්ඩු පක්ෂයේ සාතිශය බහුතරයක් අරගළ කරලා, ජීවිත පරිත්‍යාග කරලා තමයි ඒ වැරැදි පාර නිවැරැදි කළේ, අපේ රටේ අධ්‍යාපනය මේ දක්වා හෝ රැකගත්තේ. අද අපේ රටේ අධ්‍යාපනයේ පාර්ශ්ව කණ්ඩායම් වන දරුවෝ පන්ති කාමරය තුළ විශාල පීඩාවකට පත් වෙලා සිටිනවා, මේ අධ්‍යාපනය නිසා. ඒ වාගේම තමයි ගුරුවරු, විදුහල්පතිවරු, අධ්‍යාපන පරිපාලන ක්ෂේත්‍රයේ අය විශාල පීඩනයකට පත් වෙලා සිටිනවා, මේ පවතින අධ්‍යාපනය නවීකරණය නොකිරීම නිසා. ඒ වාගේම තමයි අම්මා තාත්තාට අද තමන්ගේ ආර්ථික ඉපැයීම්, රස්සාවට යන එක පැත්තක තියලා දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් විශාල කාලයක්, ධනයක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේ සියලුදෙනා විශාල පීඩනයකින් තමයි හිටියේ.

ඒ නිසා දශක ගණනාවක් ආණ්ඩු කරපු පාලකයන්ට අපි විවිධ ආකාරයේ බලපෑම් කළා, මේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කරන්න කියලා. නමුත් ඒ ගොල්ලෝ එය වෙනස් කළේ ගුරුවරුන්ට, දරුවන්ට සහ සමාජ කණ්ඩායම්වලට වුවමනා විධියට නොවෙයි, ඊට විරුද්ධ විධියට. අපි ආණ්ඩුවක් පිහිටුවා අවුරුද්දක් තුළ ඒ සාධනීය පරිවර්තන සිදු කරන්න, අවශ්‍ය වෙනස් කිරීම් කරන්න ඔක්කෝම ලැහැස්ති කරලා ඒවා කරමිනුයි යන්නේ. අපි කොතැනකදීවත් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නවත්වලා නැහැ; නවත්වන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ කණ්ඩායම් මුලින්ම කථාව ආරම්භ කරනවා, "අපි මේවාට විරුද්ධ නැහැ" කියලා. ඒ මුළු කථාවෙන්ම ඒ වාක්‍යය විතරයි අපට ගන්න තිබෙන්නේ. ඒගොල්ලන් කියන්නේ මොකක්ද? ගුරු පුහුණුව නැහැ කියනවා, devices නැහැ කියනවා, smart classrooms නැහැ කියනවා, භෞතික සම්පත් නැහැ කියනවා, අධ්‍යාපනයේ විෂමතාව වැඩි කරනවාලු මේ ආණ්ඩුව ඇවිල්ලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අවුරුදු 25ක් පමණ විවිධ දුෂ්කර ප්‍රදේශවල ගුරුවරයකු හැටියටත්, වැඩබලන විදුහල්පතිවරකු හැටියටත් වැඩ කරලා සේවයෙන් ඉල්ලා අස්වෙලා තමයි මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ආවේ. අපේ රටේ පාසල් 10,000ක් තිබෙනවා. එම පාසල් 10,000න් සාතිශය බහුතරයක් පාසල් අතිශය දුප්පත්. ඒවාට අවශ්‍ය භෞතික පහසුකම් හදලා නැහැ. ඒවාට අවශ්‍ය යටිතල පහසුකම් හදලා නැහැ. ඒවාට කුඩම්මාගේ සැලකිලි තිබෙන්නේ. අතිශය බේදවාචකයක් තමයි ඒ පාසල්වල ඉගෙනුම ලබන දරුවන්ගේ අධ්‍යාපනය පැත්තෙන් ගත්තාම තිබෙන්නේ. ඒ දරුවන්ගේ අම්මලා, තාත්තලාගෙන් සල්ලි එකතු කරලා ඒ සල්ලිවලින් පන්ති කාමර හදන්න, ඩෙස්-පුටු ගන්න, කොම්පියුටර් ගන්න හදපු මහත්වරු අද ඇවිත් කියනවා, මේ ආණ්ඩුවෙන් අධ්‍යාපනයේ

[ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා]

විෂමතාවක් හදනවා කියලා. මම කියන්නේ ඒ අයට පව් කියලායි. ඔයගොල්ලන්ට ආණ්ඩුවක් හදා ගන්න ඕනෑ නම්, මීට වඩා වෙනස් මාවතක් තෝරා ගන්න. බොරුව සමාජගත කරලා, අර අහිංසක දූවා දරුවන්ගේ අධ්‍යාපනයට වැට බැඳලා, ඒ කටයුතු කඩාකප්පල් කරලා මේ සමාජය තුළ ආණ්ඩුවක් හදාගන්න ඔයගොල්ලන් උත්සාහ කරනවා නම්, තව ශත වර්ෂයක් ගියත් ඔයගොල්ලන්ට ඒක කරන්න බැහැ මහත්තයෝ. මම ඒකත් මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

සමාජ වුවමනාවක් නියෝජනය කරමින්, සමාජයේ සංවර්ධනය ඉස්සරහට ගෙනයමින් පරිවර්තනීය වෙනසක් කරන්න තමයි මේ ආණ්ඩුව -අපි- ලෑස්ති වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම අපේ රටේ අධ්‍යාපනයට තිබුණු ප්‍රබල විවේචනය තමයි අපේ රටේ ආර්ථිකය එක පීල්ලක යනවා, අධ්‍යාපනය තව පීල්ලක යනවා කියන එක. අධ්‍යාපනයයි, ආර්ථිකයයි ගැළපුණේ නැහැ. ඒ නිසා උගතුන්, බුද්ධිමතුන් බිහි වුණාට මේ රට ඉස්සරහට ගෙනියගන්න බැරි වුණා. ඒ සම්බන්ධයෙන් විශාල විවේචනයක් තිබුණා. ඒ වාගේම තමයි නවීන තාක්ෂණය භාවිත කරමින් ලෝකයේ අනෙක් රටවල අධ්‍යාපනය යන මාවතට අපේ රටට අවතීර්ණ වෙන්න බැරි වුණා. ඒ නිසා විශාල විවේචනයක් තිබුණා, මේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කරගන්න ඕනෑ කියලා.

දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන කණ්ඩායම් 5ක් ඉන්නවා. ඒ තමයි ගුරුවරු, විදුහල්පතිවරු, අධ්‍යාපනඥ සේවය, ගුරු උපදේශක, අධ්‍යාපන පරිපාලන සේවය. මේගොල්ලන්ගේ ගැටලු විශාල ප්‍රමාණයක් පසුගිය දශක 2-3 පුරාම මේ රට තුළ දකින්න තිබුණා. ඒ නිසා විටෙක ගුරුවරු උද්ඝෝෂණය කළා. තවත් විටෙක විදුහල්පතිවරුන් උද්ඝෝෂණය කළා. තවත් විටෙක ගුරු උපදේශකවරු උද්ඝෝෂණය කළා, අධ්‍යාපන පරිපාලන සේවයේ අය මහ පාරට ආවා. මේ අංශ පහම විවිධ තැන්වලදී අඩන්තේට්ටම්වලට ලක් කරමින්, වැටුප් විෂමතා ඇති කළා. ඔවුන්ට උසස්වීම් තිබුණේ නැහැ. ඒ වාගේම ඒගොල්ලන් ජීවිත අකාර්යක්ෂම කර තිබුණා; ඔවුන්ගේ රැකියාවේ තෘප්තියක් නැති කර තිබුණා. නමුත් මේ අංශ පහම එකතු කරලා ලෝකයේ නවීන සේවාවක් හැටියට ස්ථාපිත කරන්න අපි කටයුතු කරනවා. ඒ සඳහා ගෙනෙන ගුරු සභාවේ වැඩ කටයුතු දැනට සියයට 80ක් පමණ අවසන් කර තිබෙනවා, වෘත්තිකයන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම සඳහා. අධ්‍යාපන පරිවර්තනය නවත්වනු කියන මේ මහත්වරුන්ට අපි ඒ ගැනත් කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කලින් සඳහන් කළ ආකාරයට අපේ රටේ පාසල් 10,000ක් තිබෙනවා. එම පාසල් පිළිබඳව නැවත සමාලෝචනයක් කරලා ළමයින් අඩුවෙන්ම සිටින පාසල්, භෞතික පහසුකම් නැති පාසල් සහ දිට්වා සුළි කුණාටුව වැනි ස්වාභාවික ආපදාවලට ලක් වුණු ගම්මානවල තිබෙන පාසල් ගැන අපි සලකා බලනවා. ආපදාවට ලක් වුණු ගම්මානවල තිබෙන පාසල් සම්බන්ධව නැවත සමාලෝචනය කරමින් පවතින්නේ. ඒ වාගේම මේගොල්ලන් කිව්වා පාසලකට ටීවී එකක්වත් දුන්නේ නැහැ කියලා. මම නැවතත් කියන්නේ එහෙම කියන අය පව් කියලායි. ඔයගොල්ලන් හැම දාම සිරිකොතටම වෙලා, කොළඹ 05ටම වෙලා ඉන්න එපා. එන්න, රට වටේ තිබෙන පාසල් පද්ධතියට අපි විපක්ෂයේ සිටි කාලයේදී කරපු දේවල් පෙන්වන්න. වසා තිබුණු ඉස්කෝල ගොඩනගා, ඒවා මේ රටේ දීප්තිමත් පාසල් බවට පත් කරපු පුරවැසියන් මෙතැන ඉන්නවා. මමත් එහෙම කෙනෙක්. ඒ වුණාට කියන්නේ, TV එකක්වත් දුන්නේ නැහැ කියලායි.

ඊළඟට, මේ අය අගමැතිතුමිය ගැන කියනවා. මම හිතන විදියට අපේ රටේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන විශිෂ්ටතම අධ්‍යාපන ඇමතිවරිය තමයි මේ කටයුත්තට නායකත්වය දෙන්නේ. එතුමිය අධ්‍යාපන ඇමතිවරිය විතරක් නොවෙයි, මේ රටේ අධ්‍යාපනය පිළිබඳව විශේෂඥ දැනුමක් තිබෙන කෙනෙක්. ඒ වාගේම පසුගිය දශක ගණනාව තුළ මේ රටේ අධ්‍යාපනය පිළිබඳ විශාල කතිකාවක් ඇති කරපු විශිෂ්ට චරිතයක්. එතුමියත් එක්ක පැටලිලා, කැත නාම හදලා විපක්ෂය මේ කරන කටයුත්ත හරියට නිකම් අලකොළයකට වතුර දමනවා වාගේ වැඩක්. ඔයගොල්ලන් ඇති තරම් ඒ දේ කරන්න. නමුත් ඔයගොල්ලන් සමාජයෙන් ප්‍රතික්ෂේප වෙනවා. අධ්‍යාපනය වෙනුවෙන් පෙනී සිටින අපේ රටේ දෙමව්පියන්ගේ වාගේම, ගුරුවරුන්, විදුහල්පතිවරුන් වාගේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින නිලධාරින්ගේත්, සුවහසක් දූවා දරුවන්ගේත්, වෘත්තිකයන්ගේත් පැතුම තමයි අපි මේ ඉෂ්ට කරන්නේ. ඒ නිසා මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එක දශමයකින්වත් නවත්වලාත් නැහැ, නවත්වන්නේත් නැහැ. අඩුපාඩු ටිකක් තිබෙනවා. ඒවා නිවැරදි කර ගනිමින් අපි ඉස්සරහට යනවා. මේ රට ආර්ථික වශයෙන් ගොඩනඟනවා නම්, අලුත් පුනරුද යුගයකට යනවා නම්, පළමුවෙන්ම අධ්‍යාපනයේ පුනරුදය ඇති කළ යුතුයි. ඒ සඳහා අපි පෙනී සිටින බව කියමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි, සියලුදෙනාටම.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Sajith Premadasa. You have an allocation of fifteen minutes.

[පූ.භා. 11.53]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙස්ට්මින්ස්ටර් ක්‍රමය තුළ ප්‍රතිපත්ති සම්පාදනය ක්‍රියාත්මක වන විට Green Paper එකක් සකස් වෙනවා, සාකච්ඡාමය ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන්න. එය ඊට පස්සේ ඉදිරියට යනවා, White Paper එකක් හැටියට. ඒ White Paper එකේ නිගමන තුළ තමයි ඒ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය ශක්තිමත්ව ඉදිරියට ක්‍රියාත්මක වන්නේ. අද අපේ රටේ අධ්‍යාපනය සීමා වෙලා තිබෙන්නේ මොකකටද? ඒ PowerPoint presentation එකකට. ඒකට Green Paper එකකුත් නැහැ, White Paper එකකුත් නැහැ. ඒවා ගැන කථා කරනකොට කියනවා, orange පාටින් paper එකක් දෙන්නම්, blue පාටින් දෙන්නම්, red පාටින් දෙන්නම් කියලා. White Paper එකේයි Green Paper එකේයි අර්ථය දන්නේ නැති කට්ටිය තමයි දැන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කරන්නේ. අපි ප්‍රතිපත්ති සම්පාදකයන් හැටියට ඉස්සර වෙලාම මේ කාරණාව පිළිබඳ නිවැරදි දැක්මක් තියා ගන්න ඕනෑ.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු විය යුත්තේ ඇයි? අපේ රටේ තිබෙන්නේ යල් පැනගිය, ගිරා පෝතක, කට පාඩම්, විභාග ක්‍රමයකට පමණක් සීමා වූ අධ්‍යාපන ක්‍රමයක්. විශිෂ්ටතම අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය වන්නට නම් එය, ජාත්‍යන්තර වෙළෙඳ පොළේ, ශ්‍රම වෙළෙඳ පොළේ ඉල්ලුමට, අවශ්‍යතාවට සරිලන පරිදි නිපුණතාවෙන්, කුසලතාවෙන් පිරි ශ්‍රම බලකායක් නිර්මාණය වන අධ්‍යාපන ක්‍රමයක් විය යුතුයි. අන්න ඒ නිසා තමයි ධවල පත්‍රිකාවක් අවශ්‍ය වෙන්නේ විධිමත් සාකච්ඡාවක් තුළ ඉදිරියට යන්න. මොනවාද පෙන්වා තිබෙන්නේ, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අරමුණු වශයෙන්? ප්‍රීතිමත් හා නිරෝගී මනුෂ්‍යයෙක්; ඵලදායී මානුෂීය පුද්ගලයෙක්; ප්‍රගතිශීලී ඉගෙනුම

ලබන්නෙක්; ගෞරවනීය හා විශ්වාසවන්ත පුද්ගලයෙක්; නම්‍යශීලී පුද්ගලයෙක්; සංස්කෘතික මූල්‍යයන් සහිත තානාපතිවරයෙක්; ප්‍රත්‍යාවර්ති ඉගෙනුම ලබන්නෙක්; දේශප්‍රේමී පුරවැසියෙක්. එතකොට අධ්‍යාපන ක්‍රමය තුළ තිබෙන වර්තමාන අඩුපාඩුකම්, ඌනතා, විෂමතා තුළ මේ අරමුණු කරා යන්න පුළුවන්ද? අද පැහැදිලි, විධිමත් නිගමනයක් නැහැ, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ. පහේ ශිෂ්‍යත්ව විභාගය, සාමාන්‍ය පෙළ විභාගය, උසස් පෙළ විභාගය, ජාතික පාසල්වලට ඇති තරගය, ළමුන් පාසල්වලට නොපැමිණීම, නාස්තිය, ගුරු පුහුණුව, ගුරුවරුන්ට ඉගැන්වීම් සඳහා අවශ්‍ය පහසුකම්, ගුරුවරු සහ විදුහල්පති හිඟය, අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනධ්‍යයන, ගුරු, විදුහල්පති, ගුරු උපදේශක, ගුරු අධ්‍යාපනඥ, අධ්‍යාපන පරිපාලන යන ක්ෂේත්‍රවල තිබෙන සම්පත් හිඟය කියන ඒවා කිසිවකට පිළිතුරක් නැහැ, විසඳුමක් නැහැ, උත්තරයක් නැහැ. ඒවා තමයි අපට තිබෙන ප්‍රශ්න.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. හැබැයි එවා ක්‍රියාත්මක වනකොට, ප්‍රභූ පාසල්වලට යන දූවා දරුවන්ට එම අඩුපාඩු නැති වනවා සේම, ගම්බද ප්‍රදේශවල, දුෂ්කර ප්‍රදේශවල, පහසුකම් නැති ප්‍රදේශවල තිබෙන පාසල්වල දූ දරුවන්ටත් එම අභියෝගවලට මුහුණ දෙන්න ඉඩ තබන්න හොඳ නැහැ. නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිලාභ ලබන ලක්ෂ 41ටම අඩුපාඩු නිර්මාණය වෙන්න හොඳ නැහැ. අද අපේ රටේ නිදහස් අධ්‍යාපනයේ බෙදීමක් තිබෙනවා. සමස්ත අධ්‍යාපන ක්‍රමයේ බෙදීමක් තිබෙනවා. එම බෙදීම, එම ඌනතාව, එම විෂමතාව මඟ හරවා ගන්නට කිසිදු විසඳුමක් නැහැ. PowerPoint presentation එකක් පමණයි ඉදිරිපත් කරලා තිබෙන්නේ.

විශේෂයෙන්ම මේ ගරු සභාවේදී කියැවුණා, සබුද්ධික සාකච්ඡාවකට අපි ප්‍රවේශ වන්නට ඕනෑ කියලා. අපි එය සම්පූර්ණයෙන්ම පිළිගන්නවා. එම නිසා මම විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණු රජයේ සාමාජිකයන්ගෙන් අහන්න කැමැතියි, Grade 6 English Language Module එකේ - මම මේක කියන්න යන්නේ නැහැ. මොකද, එය අසභ්‍ය නිසා - 51 වන පිටුව බලන්න; 52 වන පිටුව බලන්න. අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධ වුණේ නැහැ. ඒ අසභ්‍ය වෙබ් අඩවිය ඇතුළු කළ එකටයි අපි විරුද්ධ වුණේ. දැන් ඔබතුමන්ලා මොකක්ද කරලා තිබෙන්නේ? ඒ අසභ්‍ය කාරණාව ඇතුළුවීම ගැන වරද පිළිගෙන ඊට පිළියම් යොදන්නේ නැතුව, "විපක්ෂය නිසා ප්‍රතිසංස්කරණ නතර වුණා" කියලා ඒක කරකවලා කියනවා. කවුද, ප්‍රතිසංස්කරණ නතර කළේ? මෙන්න ජනාධිපතිතුමාගේ post එක. එතුමාම කියනවා, "මොඩියුල සකස් කිරීමේ පවතින ගැටලු තිබෙනවා" කියලා. ඒ කියන්නේ, ප්‍රතිසංස්කරණ පටන් අරගෙන තිබෙන්නෙත් මේ ගැටලුත් එක්ක. ඊළඟට, "ගුරු පුහුණු කිරීමේ ප්‍රමාදය තිබෙනවා" ලු. එතකොට ප්‍රතිසංස්කරණ පටන් අරගෙන තිබෙන්නේ ගුරු පුහුණු ප්‍රමාදයත් එක්ක. "තාක්ෂණික ගැටලු තිබෙනවා" ලු. එතකොට ප්‍රතිසංස්කරණ පටන් අරගෙන තිබෙන්නේ තාක්ෂණික ගැටලුත් එක්ක. ජනාධිපතිතුමාම කියනවා, "අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ගැටලු තිබෙන නිසා Grade 6 English Language Module එක, ඒ අලුත් ප්‍රතිසංස්කරණ ක්‍රමවේදය 2027දී ක්‍රියාත්මක කරනවා" කියලා. ඉතින්, ජනාධිපතිතුමාම කියනවා අධ්‍යාපන විෂය භාර ඇමතිතුමිය සහ අගමැතිතුමියගේ ගැටලුව. අපට කිසිසේත්ම වුවමනාවක් නැහැ, අග්‍රාමාත්‍යතුමියට අසභ්‍ය ලෙස බැණ වදින්න; එතුමියගේ චරිතය ඝාතනය කරන්න; එතුමියගේ පෞද්ගලික ජීවිතය ගැන කථා කරන්න. එහෙම කරන කොටසක් ඇති. නමුත්, ඒ අපි නොවෙයි. අපි කථා කළේ, ප්‍රතිසංස්කරණයේ නාමයෙන් අධ්‍යාපනය අසභ්‍යකරණය කරන්නට ඔබ කටයුතු කිරීම පිළිබඳව. ඉතින්, ඇත්ත වශයෙන්ම සබුද්ධිකභාවය ගැන කථා කළාට, කරලා තිබෙන්නේ අබුද්ධික දෙයක්. කරලා තිබෙන්නේ, අපේ රටේ පාසල් දූ දරුවන් ලක්ෂ 41ක් අනතුරට ලක් කරන දෙයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බලන්න, මේ තිබෙන්නේ ඒ අසභ්‍ය වෙබ් අඩවිය අඩංගු මොඩියුලය. රජයේ අයට මම ආරාධනා කරනවා, මේක බලන්න කියලා. සාමාන්‍යයෙන් මෙය ස්ථාන ගණනාවකදී පරීක්ෂාවට ලක් වනවා; check වනවා. විෂය නිර්දේශය ලියන writers' panel එකෙන්, සෝදුපත් පරීක්ෂාවේදී editorial board එකෙන් සහ Academic Affairs Board එකෙන් පරීක්ෂා කරනවා. ඒකේ ඉන්නවා විෂය අධ්‍යක්ෂවරු. ඊළඟට, ජාතික අධ්‍යාපන ආයතනයේ කවුන්සලයෙන් පරීක්ෂා කරනවා. මුද්‍රණය කරන තැන check වනවා. එතැනත් සෝදුපත් බලනවා. ඒ වාගේම අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසිනුත් පරීක්ෂා කරනවා.

පිටපත් 5ක්, 6ක් විතර ගහලා ආපසු අමාත්‍යාංශයට ගෙන්වලා check කරනවා. එහෙම කරලා තමයි කෝටි ගණනක් වියදම් කරලා මේක මුද්‍රණය කරලා තිබෙන්නේ. ඉතින්, මේ ක්‍රියාව අපේ රටේ නිදහස් අධ්‍යාපනයට කරපු යුතුකමක් ද, හානියක් ද? ඒකට උත්තර සපයන්න.

දැන් ඔබතුමන්ලා මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන ලොකුවට කථා කරනවා. මම අහන්න කැමැතියි, ඔබතුමන්ලාගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ artificial intelligenceවලට ප්‍රමුඛත්වය දීලා තිබෙන්නේ කොතැනද කියලා. Generative artificial intelligence, adaptive learning and personalized educational systems, augmented reality, virtual reality and extended reality තිබෙනවාද, අපේ අධ්‍යාපන ක්‍රමය තුළ? ඔබ අනාගතවාදීව මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරනවා නම්, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල Cloud-based online learning platforms, mobile and ubiquitous learning, data analytics, learning analytics, cybersecurity and digital safety, blockchain for education, remote and virtual laboratories, automation and intelligent administration tools, metaliteracy and digital citizenship skills අඩංගු ද? ඇත්ත වශයෙන්ම නැහැ. ඇයි? විධිමත් Green Paper එකක්, White Paper එකක්, discussion document එකක් නැති නිසා.

බලන්න, මේ තමයි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මොඩියුලය. කොයි ශ්‍රේණියෙන්ද මේ මොඩියුලය පටන් ගන්නේ? 6 ශ්‍රේණියෙන්. හැබැයි, ලෝකයේ පිළිගත් ක්‍රමවේදය මොකක්ද? K-12 - Kindergarten to the 12th Grade. ලෝකය K-12 කියන ක්‍රමවේදය තොරතුරු තාක්ෂණ අධ්‍යාපනයට යොදවනකොට මේගොල්ලන් ඒකෙන් පාඩමක් ඉගෙන ගෙන නැහැ. අඩුම ගණනේ තොරතුරු තාක්ෂණය Grade 1වලින්වත් පටන් ගන්නේ නැහැ, 6වන ශ්‍රේණියෙන් පටන් ගන්නේ. මෙන්න, ප්‍රතිසංස්කරණවල තිබෙන අඩුපාඩුකම්. මොනවාද, මේවාට දෙන උත්තර? මේ මොඩියුලයේ මොනවාද තිබෙන්නේ? පරිගණකයක් නිසි ලෙස ක්‍රියාත්මක කර වසා දැමීම. ඕක කරන්න පුළුවන්ද පරිගණක හිඟයත් එක්ක? කරන්න පුළුවන්ද? පාට සංස්කරණ මෘදුකාංග විවෘත කර නව ලේඛන නිර්මාණය කිරීම. Computers නැතුව, software නැතුව මේවා කරන්න පුළුවන්ද? සම්බන්ධතාව - connectivity - නැතුව මේවා කරන්න පුළුවන්ද? Digital labs නැතුව මේවා කරන්න පුළුවන්ද? Computer labs නැතුව මේවා කරන්න පුළුවන්ද? TV screens, smart boards නැතුව මේවා කරන්න පුළුවන්ද? දෙන්නකෝ උත්තර. ලජ්ජා නැතුව නිදහස් අධ්‍යාපනය ගැන මහ ලොකුවට කථා කරලා, දැන් දෙමවුපියන්ට කියනවා, "TV sets දෙන්න රජයට බැහැ, ඔයගොල්ලන් ගන්න. Smart boards ගන්න, ඔයගොල්ලන් computers ගන්න" කියලා. නැහැයි කියලා කියනවාද? කවුරු හරි කියනවාද, නැහැයි කියලා? අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අවශ්‍ය උපකරණ ටික සපයන්න රජයට බැහැ. ඒ ටික දීගන්න බැරිව කථා කරනවා, සබුද්ධික විවාදයකට එන්න කියලා. අපට රිදිලා ලු, තිබෙන්නේ. අපට

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

නොවෙයි රිදිලා තිබෙන්නේ, නිදහස් අධ්‍යාපනයේ යෙදෙන 4,100,000ක් පමණ දූ දරුවන්ට. ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයින් ඉන්නවා, මේ රටේ පෞද්ගලික අධ්‍යාපන වරම් බලාපොරොත්තුවෙන් ඉන්න දූ දරුවන්ට ඒ වරමත් අහිමි කරන. අපි කියනවා, නිදහස් අධ්‍යාපනය මානව අයිතියක් බව; මූලික අයිතියක් බව. එය සුරක්ෂා කරන්නට ඕනෑ. හැබැයි, අපේ රටේ දරුවන් විදේශ රටවලට ගිහිල්ලා, අපේ විදේශ විනිමය සංචිතවලට සෘණාත්මක බලපෑමක් ඇති කරලා පිට රට ඉගෙන ගන්නවාට වඩා අපේ රටේ ඉගෙන ගැනීම සඳහා වන ඒ පෞද්ගලික පාසල් පද්ධතිය ක්‍රියාත්මක වෙන්න දෙන්නේත් නැහැ. හැබැයි, ඔබගේ දූවා දරුවන් පෞද්ගලික විශ්වවිද්‍යාලවලට ගිහිල්ලා හොඳට සහතික ලබනකොට, වේදිකාවට ගිහිල්ලා බොහොම ආඩම්බරයෙන් ඒ දූවා දරුවන් එක්ක රූපරාමුවලට පෙනී සිටිනවා. මේ දෙබිඩි රංගනය මොකක්ද? ජනතා විමුක්ති පෙරමුණේ ඒ ඔබගේ දූවා දරුවන් පෞද්ගලික අධ්‍යාපනය වේවා, නිදහස් අධ්‍යාපනය වේවා, ඒ හැම අවස්ථාවකදීම අධ්‍යාපනයේ ඉහළම තලයට ගිහිල්ලා විශිෂ්ටයින් බවට පත් වනකොට අපි සතුටු වනවා. ඔබ සූදානම්, පෞද්ගලික අධ්‍යාපනයට ඔබගේ දූවා දරුවන් යවන්න. හැබැයි, ඒ අවස්ථාව රටේ අධ්‍යාපන වරම් අහිමි වන දූ දරුවන්ට ක්‍රියාත්මක කරන්න ඔබ සූදානම් නැහැ. ඒ අයට මේවා හොඳ නැහැ. ඒ අයට මේවා අකැපයි.

දැන් කිව්වා නේ කථාවක්, බොරුව කොටලා, කොටලා, කොටලා ව්‍යාප්ත කරනවා කියලා. අනේ දෙවියනේ! බොරුව කොටලා, කොටලා, ව්‍යාප්ත කරලා බලයට ආවේ ඔබ නේ. විධායක ජනාධිපති වෙන්නට, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකකට වැඩි බලයක් ගන්නට, පළාත් පාලන මැතිවරණයේදී ආයතන වැඩි ප්‍රමාණයක බලය ගන්නට බොරුව කෙටුවේත් ඔබයි; බොරුව ව්‍යාප්ත කළේත් ඔබයි; බොරුව ගිල්ලුවේත් ඔබයි. තමුන්නාන්සේලා ටොන් පව කැප්ටන්ලා. දැන් ටොන් පව කොච්චර කියනවා ද කිව්වොත්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධ සජබය ලු; අපි ලු, විරුද්ධ. අපි smart boards දෙනකොට විරුද්ධ වුණේ කවුද? අපි computers දෙනකොට විරුද්ධ වුණේ කවුද? දූ දරුවන්ගේ ඉංග්‍රීසි භාෂා කුසලතාව ප්‍රවර්ධනය කර ගන්න කියලා අපි කියනකොට විහිළු කළේ කවුද? කවුද, "ha-ha" දැම්මේ? ඒවා නිදහස් අධ්‍යාපනයේ දූ දරුවන්ට කරනවාට ඔබ විරුද්ධයි. ඒ, කුහකකම නිසා, ඊර්ෂ්‍යාව නිසා, වෛරය නිසා. ගමේ දූවා දරුවාට ඒක හොඳ නැහැ. හැබැයි, තමන්ගේ දූවා දරුවන්ට ඉංග්‍රීසි හොඳයි. තමන්ගේ දූවා දරුවන්ට ජපන් ඉගෙන ගන්න එක හොඳයි. තමන්ගේ දූවා දරුවන්ට හින්දි භාෂාව, චීන භාෂාව ඉගෙන ගන්න එක හොඳයි. තමන්ගේ දූවා දරුවන්ට ටැබ් එක හොඳයි. තමන්ගේ දූවා දරුවන්ට personal computer එක හොඳයි. තමන්ගේ දූවා දරුවන්ට ඒවා හොඳයි. රටේ ඉන්න ගොවියාගේ, ධීවරයාගේ, කම්කරුවාගේ, දුප්පතාගේ, සාමාන්‍ය ජනතාවගේ දූවා දරුවන්ට ඒවා හොඳ නැහැ. මේ කුහකත්වයෙන් ඉවත් වන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, you have exhausted the time allotted to you.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ කුහකත්වයෙන් ඉවත් වෙලා අඩුම තරමේ මේ රටේ නිදහස් අධ්‍යාපනය මානව අයිතියක්, මූලික අයිතියක් බවට පත් කරන සමගි ජන බලවේගයේ ප්‍රතිපත්තියට ඔබත් අත් ඔසවන්න. අඩුම ගාණේ අපි එතැනින් මේ කාර්යය පටන් ගනිමු. මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය නවෝත්පාදනයට, නූතනවාදයට, ලෝකය යන ආකාරයට ඉදිරියට ගිහිල්ලා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ලෝකයේ විශිෂ්ටතම රට බවට අපේ ශ්‍රී ලංකාව පත් කරන්නට අපි හැමෝම එක්ව කටයුතු කරමු.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ruwan Wijeweera. You have 10 minutes.

[අ.භා. 12.10]

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මාගේ ගෞරවනීය ස්තුතිය ඔබතුමාට පුද කර සිටිනවා.

ජාතික සංවර්ධනයට යන ගමනේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉෂ්ට කරනු ලබන්නේ එරටේ අධ්‍යාපනයයි කියන එක අපි කවුරුත් දන්නවා. ඒ නිසා ඕනෑම රටක අධ්‍යාපනයට ප්‍රබල ස්ථානයක් හිමිවෙලා තිබෙනවා.

අපේ රටේ අධ්‍යාපනය පිළිබඳව, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව කථා කරද්දී, අවුරුදු 15කට වැඩි කාලයක් ලංකාවේ ප්‍රදේශ කිහිපයක ගුරුවරයෙක් සහ විදුහල්පතිවරයෙක් විධියට කටයුතු කරපු පුද්ගලයෙක් ලෙස අද දවසේ සිදු කරන මේ විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම ගැන මම මුලින්ම සතුටු වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටට අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් එන්න ඕනෑ ඇයි කියන කාරණාව සම්බන්ධව කාලයක් තිස්සේ පුළුල් සාකච්ඡාවක් තිබුණා. ඒ සාකච්ඡාව ඇතුළේ මෙන්න මෙවැනි කාරණාත් තිබුණා. අපේ රටේ පවතින අධ්‍යාපන ක්‍රමය ගත්තාම, ඒ අධ්‍යාපන ක්‍රමය විභාග කේන්ද්‍රීය වෙච්ච අධ්‍යාපන ක්‍රමයක්; ගුරුවරයා මත කේන්ද්‍ර වෙච්ච අධ්‍යාපන ක්‍රමයක්. ගුරුවරයා පන්තියට ගිහිල්ලා කියන දේ අහගෙන ශිෂ්‍යයින් විසින් note down කරන අධ්‍යාපන ක්‍රමයක් තමයි මෙතෙක් අපට තිබුණේ. ඒ වාගේම තමයි, ගෝලීය අවශ්‍යතාවන්ට අනුව විෂය මාලා යාවත්කාලීන නොවුණු, අපේ රටේ තිබෙන සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පවතින විභාග ක්‍රමය මත concentrate වුණු, ඒ මත පාදක වුණු අධ්‍යාපන ක්‍රමයක් අපේ රටේ තිබෙනවා කියන එක සම්බන්ධයෙන් බරපතළ විවේචනයක් තිබුණා, අදටත් ඒක තිබෙනවා. එම නිසා ගෝලීය වශයෙන් තිබෙන අවශ්‍යතා සහ ගෝලීය වශයෙන් තිබෙන්නා වූ පරිසරයට අනුව අපේ රටේ අධ්‍යාපන ක්‍රමයත් වෙනස් විය යුතුයි කියන මතවාදය කාලයක් තිස්සේ ගොඩනැඟෙමින් තිබුණා. විශේෂයෙන් අධ්‍යාපන පද්ධතිය සහ ඉන් පරිබාහිර කොට්ඨාස ඇතුළත. ඒ අනුව විවිධ තැන්වල සාකච්ඡාවට භාජන වුණා, අපි අධ්‍යාපන පද්ධතිය ඇතුළේ නිර්මාණය කරන ශිෂ්‍යයා 21වෙනි සියවසට අදාළ කුසලතා අත්පත් කර ගත් global citizen කෙනෙක් විය යුතුයි කියලා. So, that is the purpose of education, to create a global citizen who has acquired 21st-Century skills and more; that is the duty and the responsibility of education. ඕක තමයි සාකච්ඡා වෙමින් තිබුණේ.

21වන සියවසේ අපේ රටේ තිබෙන්නේ "3R" අධ්‍යාපන ක්‍රමයක්. '"3R" කියන්නේ, Writing, Reading and Arithmetic plus theory. ඔන්න ඔය ටික තමයි අපේ අධ්‍යාපන ක්‍රමයේ ප්‍රධාන වශයෙන් තිබෙන්නේ. ඒ කියන්නේ කියවීම, ලිවීම, ගණිතය සහ

සිද්ධාන්ත මත පදනම් වූ අධ්‍යාපන ක්‍රමයක්. මේ අධ්‍යාපන ක්‍රමය වෙනස් වන්න ඕනෑ. ඒ අධ්‍යාපන ක්‍රමය "21වෙනි ශතවර්ෂයේ කුසලතා" සහිත දරුවෙක් බිහි කිරීම කියන තැනට වෙනස් වෙන්න ඕනෑ කියන සාකච්ඡාව ආවා. 21වෙනි සියවසේ කුසලතා සහිත අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කරලා, ඊට අදාළ සාකච්ඡාව හදලා, ඊට අදාළ ප්‍රවේශය හදලා, ඒක ගේන්න හදනකොට, ඒ අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක කරන්න යනකොට, ගෝලීය වශයෙන් ලංකාව කොතැනද place කරන්න ඕනෑ කියන එක තීරණය කරන්න යනකොට ඒක අසැබිකරණය වූ අධ්‍යාපන ක්‍රමයක් කියලා දැවැන්ත මතවාදයක් හදන්න ගත්තා, ඔය සබුද්ධික මතවාදය ඉදිරිපත් කරන කණ්ඩායම.

මම කැමැතියි, 21වෙනි සියවසේ කුසලතා සම්බන්ධයෙන් පොඩි පැහැදිලි කිරීමක් කරන්න. ඒකේ තිබෙනවා, "3L" කියලා concept එකක්. "3L" කියන්නේ, Learning Skills, Literacy Skills and Life Skills. මේ "21st Century Skills" යටතේ how today's students can stay competitive in a changing job market කියලා සඳහන් කරනවා. 21වෙනි සියවසේ කුසලතා මොනවාද, competitive job market එකත් එක්ක ශිෂ්‍යයකුට රැඳී ඉන්න ඒවා කොහොමද වැදගත් වන්නේ කියලා මේ තුළ කියනවා. Learning skills ගත්තොත්, ඒ යටතේ තිබෙනවා, Critical thinking, Creativity, Collaboration and Communication. ඒකට අධ්‍යාපනයේදී "4C" කියලා කියනවා. අපි හදන දරුවා ළඟ ඒවා තිබෙන්න ඕනෑ. එනම්, critical thinking තිබෙන්න ඕනෑ, creativity තිබෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. ඒ දරුවාට අනෙක් අයත් එක්ක සහයෝගයෙන් වැඩ කරන්න පුළුවන් හැකියාව - collaboration - තිබෙන්න ඕනෑ. ඊට සමපාත වන අධ්‍යාපන ක්‍රමයක් තමයි, 6 වසරට තිබෙන modules ටික බැලුවාම තිබෙන්නේ. 6-9ට අපි හඳුන්වා දී තිබෙන modules ටික බැලුවාම ඒක ඇතුළේ කොහොමද මේ ටික integrate කරන්නේ කියන එක සාකච්ඡා කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ඊළඟ "L" එක, literacy skills. සාක්ෂර කුසලතා - literacy skills - මෙන්න මේ දක්වා විහිදිලා යනවා. මේකේ තිබෙනවා, තොරතුරු පිළිබඳ සාක්ෂරතාවක් - information literacy - 21වෙනි සියවසේ දරුවා ළඟ තිබෙන්න ඕනෑ කියලා. ඒ වාගේම මාධ්‍ය පිළිබඳ සාක්ෂරතාව - media literacy- සහ තාක්ෂණය පිළිබඳ සාක්ෂරතාව - technology literacy - තිබෙන්න ඕනෑ. මෙන්න මේ සාක්ෂරතා සහිත දරුවෙක් තමයි අපි හදන්න ඕනෑ. ඒක තමයි අපි propose කරලා තිබෙන්නේ. ඊට පස්සේ තිබෙනවා, Life skills. ඒ දරුවා ළඟ තිබෙන්න ඕනෑ, ලෝකයත් එක්ක ගැළපෙන්න පුළුවන් හැකියාව, ඒ දරුවාට තිබෙන්න ඕනෑ, තමන් ඉගෙන ගත් දේ භාවිතයට ගන්න පුළුවන් හැකියාව. Life skills යටතේ තිබෙනවා, flexibility, leadership, initiative, productivity and social skills. දැන් ළමයෙකුට flexible වෙන්න පුළුවන් වෙන්න ඕනෑ, decision-makingවලදී. තමන්ට පුළුවන්කම තිබෙන්න ඕනෑ, තමන් ගන්නා තීරණ නම්‍යශීලී විධියට, ලෝකයත් එක්ක සමපාත වන විධියට ගන්න. ඒ වාගේම ළමයෙකු තුළ මුලපිරීමේ හැකියාව, ඵලදායීතාව වාගේ සමාජ කුසලතා තිබෙන්නත් ඕනෑ. ඒකට තවත් දෙකක් එකතු කරලා තිබෙනවා, "2C" කියලා. ඒවා ඔක්කෝම එකට එකතු කරලා තමයි අපි හඳුන්වා දී තිබෙන මේ අධ්‍යාපන ක්‍රමය හදලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. "2C" කියන එකේ එකක් තමයි, character; අනෙක් එක තමයි, citizenship education. අපි හඳුන්වා දුන් module ක්‍රමය මත පදනම් වූ අධ්‍යාපන ක්‍රමය තුළින් ඔය සියල්ල ආවරණය වනවා.

උදාහරණයක් විධියට, 6-9 අධ්‍යාපන ක්‍රමයට හඳුන්වා දී තිබෙන Education Curriculum Reform එක මම පොඩ්ඩක් සාකච්ඡා කරන්න කැමැතියි. විපක්ෂ නායකතුමා පොඩි ප්‍රශ්නයකුත් ඇහුවා, මේකේ AI, ඒ වාගේම data analysis සහ ITවලට සම්බන්ධ විෂය ධාරා නැහැ කියලා. 6 ශ්‍රේණියේ ඉඳලා සිසුන්ට ඉගෙන ගන්න තිබෙන විෂය මාලාව ගත්තොත්, credits 35ක් ඇතුළේ ඔවුන්ට ඉගෙන ගන්න තිබෙනවා. ඒ credits 35 ගත්තොත්, ප්‍රධාන වශයෙන්ම කනිෂ්ඨ ද්විතීයික මට්ටමේ 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා විෂය ධාරාව ඇතුළේ ප්‍රධාන modules 14ක් කරන්න තිබෙනවා. මව් භාෂාව, ඉංග්‍රීසි භාෂාව, දෙවන ජාතික භාෂාව ඇතුළු විෂයයන් 14ක් මෙහි තිබෙනවා. ඒකට නව විෂයයක් විධියට 6 ශ්‍රේණියේ සිට ඉගෙන ගන්න හඳුන්වා දීලා තිබෙනවා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය 6 ශ්‍රේණියට හඳුන්වා දුන්නාම, ඒ සිසුන් 6 ශ්‍රේණියේ ඉඳලා 7 ශ්‍රේණියට යනකොට, 7 ශ්‍රේණියේ ඉඳලා 8 ශ්‍රේණියට යනකොට, ඒ ආදී වශයෙන් 10, 11 ශ්‍රේණිවලට යනකොට, ඒක ඇතුළේ හැදෙන topics පිළිබඳව තමයි, විපක්ෂ නායකතුමාගේ කථාවේදී කිව්වේ. එතුමා ලොකු බර වචන දාලා තමයි ඒක ඇතුළේ තිබෙන topics ගැන කිව්වේ. උදාහරණයක් විධියට කිව්වොත්, AI - artificial intelligence - කියන එක ඇතුළේ data analysis කියන එක තිබෙනවා. Subject එකක් divide කරන topics ඔක්කොම දාලා modules හදන්න බැහැ. හැබැයි, main module එක දීලා තිබෙනවා, information literacy කියලා.

ඒ වාගේම ඊළඟ විෂයය තමයි, ජීවිතය සඳහා තාක්ෂණය. How to use technology in life has been included in this subject. නමුත්, ඒවා දැක්කේ නැහැ. දැක්කේ අසැබිකරණය විතරයි. අසැබිකරණයට අදාළ වෙබ් අඩවිය අපි ඉවත් කළා. අපි කිව්වා, වැරැද්දක් වෙලා තිබෙනවා කියලා. ඒ අනුව ආණ්ඩුවක් විධියට වැරැද්දක් වෙලා තිබෙනවා කියලා පැහැදිලිවම ඒ වැරැද්ද අපි භාර ගත්තා. ඒ වැරැද්ද භාර ගන්න තරම් අපට කොන්දක් තිබුණා. ඒ වැරැද්ද භාර ගෙන අපි ඒ වෙබ් අඩවිය ඉවත් කරලා මොකක්ද කළේ? අධ්‍යාපනය ඉතා ගුණාත්මකව පවත්වා ගෙන යෑමට අවශ්‍ය කරන ප්‍රවේශ ටික අපි හැදුවා. ඒවා ඔක්කොම අපි පිළිගෙන තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වැරැද්ද අපි නිවැරැදි කරලා තිබෙනවා. ඒක නිවැරැදි කරලා තිබියදීත්, you are making that complaint continuously, again and again. So, that is the mistake being made by the Opposition. ඒක නිසා එය වැරැදියි.

ඒ වාගේම මෙහි සඳහන් කරලා තිබෙන ආකාරයට Grade 6-9 content එකට තව subject එකක් ඇතුළත් වෙනවා. ඒ තමයි, ව්‍යවසායකත්වය සහ මූල්‍ය සාක්ෂරතාව. ඒවා විපක්ෂ නායකතුමා හොඳට, හඬ නඟා ඉංග්‍රීසියෙන් කියනවා. ඉංග්‍රීසියෙන් එතුමා කියනවා, "entrepreneurship and financial literacy" කියලා. That has been included. So, what do the students lack in studying that subject?

ඒ වාගේම තමයි, විපක්ෂ නායකතුමා කියපු අනෙක් විෂයනුත්. 6 ශ්‍රේණියේ සිට මෙතෙක් කල් ශිෂ්‍යයින්ට තිබුණේ නැති අයිතීන්, ශිෂ්‍යයින්ට තිබුණේ නැති පෙනෙන්නේ නැති මානයන්, 21වැනි සියවසේ කුසලතා කියන ඔක්කොම මෙහි ඇතුළත් කරලා තිබෙනවා. මෙහි තිබෙනවා, essential subjectsවලට අමතරව තවදුරටත් ශිෂ්‍යයාගේ කැමැත්ත පරිදි කරන්න පුළුවන් modules තුනක්. ඒ කියන්නේ, මේ modules 14න්, 3ක් ශිෂ්‍යයාගේ කැමැත්ත පරිදි, ශිෂ්‍යයාට further learning විධියට ඉගෙන ගන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි, transversal skills මේකේ ඇතුළත් කරලා තිබෙනවා. Transversal skillsවල තිබෙන subjects ටික බලන්න. ඒ subjects ටික මොනවාද කියලා බැලුවේ නැහැ. සබුද්ධික අය කරපු ඒවා වන ගල් කර්මාන්ත ගැන කථා කළේ.

[ගරු රුවන් විජේවීර මහතා]

සබුද්ධික සංවාද ගොඩනැඟුවේ ගල් කර්මාන්ත ගැන කථා කරලා. තමන් කථා කරනකොට තමන් එක්ක වටේ ඉන්න කණ්ඩායම දැක්කා නම්, හරියට තේරුම් ගන්න පුළුවන් කොහොමද මේ සබුද්ධික සංවාද ගොඩනැඟුවේ කියලා. බොරු මිථ්‍යාවක් ගොඩනඟන්න හැදුවා. ඉස්සෙල්ලාම කිව්වා, ඉතිහාසයයි, සෞන්දර්යයි නැහැ කියලා. මේ සභාව පෙරළන්න හැදුවා. කෝ, ඒ සබුද්ධික සංවාදය? ඒක නිසා intellectual discussion is needed. But, it was not done by the Opposition; it was not done.

ඊට පස්සේ, මෙහි transversal skillsවල තිබෙන subjects කිහිපයක් ගැන මම කියන්නම්. මෙහි තිබෙනවා, appreciation of literature. 6 ශ්‍රේණියේ ඉඳලා දරුවාට සාහිත්‍ය රස විඳින්න පුළුවන්. ඒ විතරක් නොවෙයි, media studies තිබෙනවා, service sector studies තිබෙනවා, global studies තිබෙනවා. දැන් මේවා එපා කියලා නේ කියන්නේ. මේවා එපා කියලා තමයි, තැන් තැන්වල කුඩා කුඩා කුප්පි හදලා, කුඩා කුඩා කට්ටි හදලා, කට්ටිය campaign කළේ. ඒක නිසා බරපතළ ආපදාවකින් රට පීඩා විඳිද්දී, විපක්ෂය කරපු කාර්යභාරය ගැන විදුහල්පතිවරයෙක් සහ ගුරුවරයෙක් විධියට හිටපු මට බරපතළ කනගාටුවක් ඇති වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up. Please wind up now.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
Hon. Deputy Speaker, please give me one more minute.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමතියි. I would like to quote what the Hon. Prime Minister states in "The Island" of 20th January, 2026. අපේ රටේ ඉතිහාසයේ බිහි වුණු විශිෂ්ටතම අධ්‍යාපන ඇමතිවරියක් විධියට ගරු අග්‍රාමාත්‍යතුමිය මේ කාර්යභාරය නිම කරනවා නියතයි, නිශ්චිතයි කියලා මම හිතනවා. එතුමිය "The Island" පුවත් පතට කරපු ප්‍රකාශයක් උපුටා ගනිමින් මගේ කථාව අවසන් කරනවා. එතුමිය මෙසේ කියනවා:

> "....... the reforms aim to create 'intelligent, civil-minded citizens' in order to build a country where people live in a civilized manner, work happily, uphold democratic principles, and live dignified lives."

මේ ප්‍රතිසංස්කරණවල අරමුණ වන්නේ මිනිස්සු ශිෂ්ට සම්පන්නව ජීවත් වන, සතුටින් වැඩ කරන, ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තිවලට ගරු කරන සහ ගෞරවනීය ජීවිත ගත කරන රටක් නිර්මාණය කිරීමයි.

Thank you very much.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Hesha Withanage Ankumbura Arachchi. You have 14 minutes.

Hon. Member, I might have to interrupt you for the lunch break and you may use your remaining minutes after lunch.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
මට නියමිත වෙලාවේ ඉතිරි කාලය ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමියට මම ලබා දෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, we will do it that way.

[අ.භා. 12.21]

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ රටේ සමස්ත ජනතාව බලාගෙන ඉන්නවා, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා වත්මන් ආණ්ඩුව අපේ රටේ දරුවන්ට ලබා දෙන්න යන්නේ මොන ආකාරයේ ප්‍රතිසංස්කරණද කියන එක. අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයා මමයි. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන අපේ රටේ ජනතාව දැනුවත් වන ප්‍රමාණය කොච්චරද කිව්වොත්, අඩුම තරමින් මේ ආංශික අධීක්ෂණ කාරක සභාවටවත් මේ කාරණය ඉදිරිපත් වෙලා නැහැ.

මෙතුමන්ලා කුලුනු 5ක් ගැන කථා කරනවා. ඒ කුලුනු 5 තමයි, විෂය මාලා සංශෝධනය, මානව සම්පත් සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය හා අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණය, ඇගැයීම හා තක්සේරුකරණය, ප්‍රජාව දැනුවත් කිරීම හා ප්‍රවර්ධනය. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල පස්වන කුලුන විධියට සඳහන් වෙලා තිබෙන්නේ, ප්‍රජාව දැනුවත් කිරීම හා ප්‍රවර්ධනය කියන කාරණාවයි. නමුත්, මේ සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම හා ප්‍රවර්ධනය කොච්චර කරලාද කියන එක ගැන හිතා ගන්න පුළුවන් මම මේ කියන කාරණයෙන්. අඩුම තරමින් නීති සම්පාදනය කරන තැන වන පාර්ලිමේන්තුවේ තිබෙන මේ ආංශික අධීක්ෂණ කාරක සභාවවත් දන්නේ නැහැ, මොකක්ද මේ වෙන්නේ කියන කාරණාව. එහෙම නම් මේ රටේ ජනතාවට ඒ ගැන තිබෙන අවබෝධය මොකක්ද? මේ රටේ ජනතාවට මේ සම්බන්ධයෙන් ලබා දෙන විශ්වාසය මොකක්ද? අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරන්න මේක ඉතාම අවශ්‍ය කාරණාවක් වනවා. පාර්ලිමේන්තුවේ ඉන්න 225දෙනාගෙන් කවුරුවත් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මේ රටට අවශ්‍ය නැහැ කියලා කියන්නේ නැහැ. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වෙන්න ඕනෑ. හැබැයි, ඒක ක්‍රියාත්මක වන ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. මෙය, විනිවිදභාවයකින්, මේ පිළිබඳ ප්‍රාමාණික විද්වතුන් එකතු කරගෙන කරන්න ඕනෑ.

මීට ඉස්සෙල්ලා කථා කරපු මන්ත්‍රීතුමා මේ සිද්ධි දාමය වෙන්නේ මොකක් නිසාද කියලාවත් අවබෝධයකින් කථා කළාද කියන්න මම දන්නේ නැහැ. එතුමා කිව්වා, critical thinking, problem-solving, collaboration කියන ඒ ඔක්කොම මේ ප්‍රතිසංස්කරණවල තිබුණාය කියලා. ඒ ඔක්කොම ටික මේ ප්‍රතිසංස්කරණවල තිබුණා නම් ඔබේ ජනාධිපතිතුමා මෙහෙම ෆේස්බුක් සටහනක් දමන්නේ ඇයි? මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල තිබෙන දෝෂ ගැන වාගේම මේක කල් දමන්න ඕනෑ, මේක කරන්න කාලය ගන්න ඕනෑය කියලා එහෙනම් එතුමා කියන්නේ ඇයි? එක්කෝ, ඒ මන්ත්‍රීතුමා ඒ ගැන දන්නේ නැහැ. එහෙම නැත්නම්, ඒ මන්ත්‍රීතුමා නැති සභාවක වෙන්න ඇති මේ ගැන සාකච්ඡා වෙන්න ඇත්තේ. නමුත්, අපි එක දෙයක් කියනවා. පාර්ලිමේන්තුවේ අවුරුදු ගණනක් හිටපු, පනත් සංශෝධනය වෙන විධිය ගැන අවබෝධයක් තිබෙන කෙනෙක්

විධියට ජනාධිපතිතුමාට මේ කාරණය තේරිලා තිබෙනවා. දැන් මේ කථා කරන මන්ත්‍රීතුමන්ලා හිතාගෙන ඉන්නේ මරණාධාර සමිතියක යම් යම් දේවල් සංශෝධනය කරනවා වාගේ මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණත් ගෙනෙන්න පුළුවන් කියායි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙනකොට මොකක්ද කරන්න ඕනෑ කියන කාරණාව ගැන ඔබ හිර වෙලා තිබෙන ප්‍රශ්නයට මේක උත්තරයක්. 6 ශ්‍රේණිය ඉංග්‍රීසි මොඩියුලය සම්බන්ධ මේ සිද්ධිය සරල විධියට බැහැර කරන්න ඔබතුමන්ලා උත්සාහ කරන්න එපා. එහෙම කරන්න උත්සාහ කිරීම ඔබට ඡන්දය දීපු මිනිස්සුන්ට ඔබ කරන විශාල අගතියක් වනවා. මේකෙන් හානියට පත් වෙන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සජබයට ඡන්දය දීපු මේ රටේ අම්මලාගේ දරුවන් ටික විතරක් නොවෙයි. මේ රටේ මෙතෙක් කාලයක් පන්ති භේදයක් තිබුණා, ඒ පන්ති භේදය හරහා අහිංසක, දුප්පත් මිනිස්සුන්ගේ පන්තිය නියෝජනය කරන්න පාර්ශ්වයක් නැහැ කියාගෙන ආපු මේ වත්මන් ආණ්ඩුව පත් කරන්න ඡන්දය දීපු බහුතරයක් අම්මලා, තාත්තලාගේ දරුවන් තමයි වැරදි පාරක මේ ගෙනියන්න හදන්නේ.

ඔබ කවුරු හරි කියනවාද, 6 ශ්‍රේණිය ඉංග්‍රීසි මොඩියුලයට නුසුදුසු වෙබ් අඩවියක නමක් අහම්බෙන් වැටුණා කියලා? ආණ්ඩුවට මම කියනවා, මේක හිතාමතාම දමපු එකක් කියලා. විපක්ෂ නායකතුමා අද කිව්වා, මේක කී තැනකින් check වෙලා එනවාද කියලා. එහෙම නම්, මේක හිතාමතා දමන්න තිබෙන අවශ්‍යතාව මොකක්ද? මේ වාගේ වෙබ් අඩවියක් බලන්න ළමයින්ව උනන්දු කරන්න තිබෙන වුවමනාව මොකක්ද? රිසි විධියට, තමන්ගේ රුචි අරුචිකම් පිළිබඳව තමන්ට ඕනෑ දෙයක් කර ගන්න පුළුවන්. හැබැයි, මේ රටේ අහිංසක දරුවා ඒකට පාවිච්චි කරන එකටයි විපක්ෂයේ විරෝධතාව තිබෙන්නේ. ඒ දරුවන් ගොඩේ මේ ආණ්ඩු පත් කරන්න ඡන්දය දීපු අම්මලා, තාත්තලාගේ දරුවනුත් ඉන්නවා. ඒ අහිංසක අම්මලා, තාත්තලාගේ දරුවන්ගේ බලාපොරොත්තුව මේ වාගේ තැනකට මේ රට අරගෙන යන්න නොවෙයි. මීට වඩා සබුද්ධික ආකාරයට මේ ගැන හිතන්න වනවා. ඔබතුමන්ලාම යෝජනා කරන ආකාරයෙන්, මේ රටේ අහිංසක දෙමව්පියන්ගේ බලාපොරොත්තු ඉහළ නංවන්න පුළුවන් වන විධියේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තමයි ඔවුන් ඉල්ලන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ විශ්වවිද්‍යාල උපාධිධාරින් පාරට බහින්න හේතුව ඇයි? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ විශ්වවිද්‍යාල තුළට එන්නේ ඔය ඈත දුර ගම්මානවල දරුවෝ. සාමාන්‍ය පෙළ විභාගයේ සියලු විෂයන්වලට "ඒ" සාමර්ථ ලබා ගත්තත්, ඒ දරුවාට උසස් පෙළට විද්‍යා විෂයන් හදාරන්න, ගණිත විෂයන් හදාරන්න පහසුකම් ටික නැහැ. විද්‍යාගාර පහසුකම් නැහැ. ඒ නිසා ඒ දරුවා කලා විෂයන් තෝරා ගන්නවා. කලා විෂයන් තෝරා ගෙන උපාධියක් ගත්තාට පසුව, කලා උපාධියකට අපේ රටේ රැකියාවල විශාල හිඟයක් තිබෙනවා. අපේ රටට අවශ්‍ය වෘත්තිකයන් නිර්මාණය වෙන්නේ නැහැ. ඒ, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු නොවීම, යල් පැන යාම තුළ නිර්මාණය වෙච්ච කාරණා. ඒ නිසා මේක වෙන්න ඕනෑ දෙයක්.

හැබැයි, මේක වෙනවා කියලා තමන් වෙන පාරක මේ රටේ දරුවන්ගේ මනස අරගෙන යන්න උත්සාහ කරනවා නම්, ඒ පාප කර්මයට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවදාවත් මේ සමාජයෙන් සමාවක් හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා මේක සරලව බැහැර කරන්න බැහැ. අනේ, මේ 6 ශ්‍රේණියේ මොඩියුලයේ ඕක තිබුණා; ඕක මොකක්ද කියලා අතහරින්න බැහැ. මේක, මේ රටේ අධ්‍යාපනය ලබන ලක්ෂ 41ක් දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා ඒක සරල කරලා කථා කරන්න අධ්‍යාපනයේ මේ රාමුව තුළ ගුරුවරු විධියට, විදුහල්පතිවරු විධියට හිටපු කට්ටියට පුළුවන් නම්, එයාලාට විලි ලජ්ජාවක් නැහැ කියලා තමයි මට කියන්න තිබෙන්නේ. මම දැක්කා, මේ වැරැද්ද වැරැද්දක් විධියට දැකලා, නජිත් මන්ත්‍රීතුමා රූපවාහිනී වැඩසටහනක, කොන්ද කෙළින් තියාගෙන කිව්වා, මේ වැරැද්ද බරපතළ එකක් බව. ඒක ඇත්ත නේ. මේ නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගත්ත මනුෂ්‍යයෙකුට හරියට feel වෙනවා නම්, ඒක ඇත්ත. හැබැයි, එහෙම නැතුව මේ වෙච්ච වැරැද්ද නිවැරදි කරනවා නම්, එයාලා මේ රටේ ජනතාව මේ දීපු ඡන්දයට, මේ බලයට කරන මහා අගතියක් කියන එක අපි විශේෂයෙන් මතක් කරලා දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මොහොත දේශපාලනය කරන වේලාවක් නොවෙයි. අපි දැක්කා, ඉස්සරහ පේළියේ ඉන්න සමහර ඇමතිවරු කියනවා, විපක්ෂයක් අපට ඕනෑ; පණ තිබෙන විපක්ෂයක් අපට ඕනෑ; කොන්ද තිබෙන විපක්ෂයක් අපට ඕනෑ කියලා. බලාගෙන ඉන්න. කොන්ද තිබෙන, පණ තිබෙන විපක්ෂයක් හෙට අනිද්දා මිනිස්සු නිර්මාණය කරලා දෙයි. ඔය පැත්තේ අය මේ පැත්තේ වාඩි කරවන්න මිනිස්සු බලාගෙනයි ඉන්නේ. ඒ නිසා තමන්ගේ ඔළුව ඉදිමිච්ච, ඒ කුහකකමින් ඈත් වෙන්න කියලා අපි ඒ අයට කියනවා. විපක්ෂයෙන් සාධනීය යෝජනා ගේනවා නම්, ඒක මේ රටේ දරු පරපුර වෙනුවෙන් පිළිගන්න. දැන් අද වන විට "දිට්වා" ඇවිල්ලා මේ මොහොතේදී මේ තිබෙන ප්‍රශ්නයට උත්තර හොයන්නෙත් කුහක විධියට, ඉතාම උද්ධච්ච විධියට. හැබැයි, හරි සාධනීය මැදිහත්වීමක් කරලා ආණ්ඩුව එක මේසයකට ආවා නම්, මේ ප්‍රශ්නය විසඳන්න උත්සාහ කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබ ඉතිහාසය දෙස බලන්න. මේ රටේ නිවැරදි දෙයක් කරන්න හදනකොට උද්ඝෝෂණ කරලා, වැඩිපුරම විරෝධතා දක්වපු කණ්ඩායම තමයි මේ ඉස්සරහ ඉන්නේ. මම උදාහරණයක් කියන්නම්. ඔබ සද්භාවයෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කරනවා. පසුගිය පාර්ලිමේන්තුවේ SOC එකේ නැත්නම් ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකාවක් තමයි අපේ හරිනි අමරසූරිය අගමැතිතුමිය. එදා ඒ ගෙනාව සංශෝධන එකකටවත්,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, I will have to suspend the Sittings in a minute.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

මම ඉක්මනින් අවසන් කරනවා.

අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ ගරු රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා සභාපතිවරයා හැටියට හිටපු වෙලාවේ ගෙනාපු ඒ ප්‍රතිසංස්කරණ එකකටවත් අඩුම ගාණේ අත්සනක් ගහන්න, මේ සංශෝධන ගේන්න කියලා අත්සනක් ගහන්න කැමැත්තක් පළ කරපු නැති අමාත්‍යවරිය ගැන දැන් ආයේ කථා කරන්න එපා, මේක සද්භාවයෙන් කරනවා කියලා. ඔබ මේ සංශෝධනය ගේන්න ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. ඔබට ගේන්න සිද්ධ වෙලා තිබෙනවා. නමුත් අපේ රටේ අහිංසක දුවා දරුවන්ගේ ඒ අවශ්‍යතාව වෙනුවෙන් නොවෙයි, ඔබේ තිබෙන වෙන හිතලු වෙනුවෙන් මේ සංශෝධනය ඉස්සරහට ඇවිල්ලා තිබෙන බව පෙනෙනවා. අපි කියනවා, ආංශික අධීක්ෂණ කාරක සභාවට අඩුම තරමේ දැනුම්දීමක් කළා නම්, මේ වෙන වැරැද්ද ගැන අපට කියන්න තිබුණා.

අවසාන වශයෙන් කියනවා, නිවැරදි ගමනක රට ගෙනියනවා කියන මහා බලාපොරොත්තුවක් එක්ක ආපු රටේ ජනතාවට විහිළු

[ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

සපයන්න එපා කියලා. හරි විධියට යන්න. මට දැන් මේ වෙනකොට ඇවිල්ලා තිබෙනවා, ඔබේ මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට මේ රටේ තිබෙන විරෝධය කොච්චරද කියලා. ආංශික අධීක්ෂණ කාරක සභාවේ අපි බලාපොරොත්තු වනවා සද්භාවයෙන් මේ රටේ අධ්‍යාපනයේ ඊළඟ පියවර තියන්න අවශ්‍ය ශක්තිය ලබා දෙන්න. අපේ කුහකකමක් නැහැ. අප කාටත් අයිති, පක්ෂ පාට නැති මේ රටේ අධ්‍යාපනය සම්බන්ධව නිවැරදි ප්‍රතිපත්තියක් හදන්න; එතැන විපක්ෂය ඉන්නවා කියන එක ආණ්ඩුවට අපි හොඳට මතක් කරලා දෙන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Debate on the Adjournment Motion shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ (ගරු හේමාලි වීරසේකර මහත්මිය) සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව අද දින පැවැත්වෙන මේ සභාව කල් තබන අවස්ථාවේ විවාදයේදී මම විශේෂ කාරණයක් මතක් කරන්න කැමැතියි. අපේ ගරු අගමැතිතුමිය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව මීට පෙර මේ උත්තරීතර සභාව තුළම අදහස් දක්වන කොට කියපු කාරණාවක් මේ අවස්ථාවේ මතක් කිරීම ඉතා වැදගත් කියා මම විශ්වාස කරනවා. එතුමිය සඳහන් කරනවා, අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිසංස්කරණය ජාතික ජන බලවේගය පටන් ගත්තු දෙයක් නොවෙයි කියන එක. අපි හැමෝමත් ඒක පිළිගන්නවා. මේක අවුරුදු ගණනාවක් තිස්සේ කථා වෙච්ච විෂයක්. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ තිබෙන තාක්ෂණික කාරණා, විශේෂයෙන් විෂය මාලා පිළිබඳව කරන කථා තුළත් අඩංගු සංකල්ප ජාතික ජන බලවේගය ආණ්ඩු සංකල්ප නොවන වග පැහැදිලිව එතුමිය සඳහන් කර තිබෙනවා.

අද මේ විවාදය තුළ විපක්ෂය විවිධ කරුණු කාරණා මතු කළා. ඒ කරුණු කාරණා පිළිබඳව පැහැදිලි කිරීම, කරුණු කීම අපේ වගකීමක් යැයි අපි විශ්වාස කරනවා. දෙමව්පියන් ද ඇතුළුව මේ ක්ෂේත්‍රයට අදාළ සියලුදෙනා, අප හැම කෙනාම පිළිගන්නා දෙයක් තමයි, මේ පවතින අධ්‍යාපනය දරුවන්ට විශාල බරක් කියන කාරණය. මේ අධ්‍යාපනය වෙනස් විය යුතුය කියන තැන හැමකෙනාම ඉන්නවා. හැබැයි, අද සභාව තුළ මතු වෙච්ච කාරණා අනුව විපක්ෂය දෙකට බෙදිලාද කියන ප්‍රශ්නාර්ථය තිබෙනවා. සමගි ජන බලවේගය, සෑම අතින්ම තමන් නිවැරැදි තැනක ඉන්න බවත්, සමගි ජන බලවේගයේ නොවන විපක්ෂයේ අනෙකුත් පක්ෂ ටික ඉන්නේ වැරැදි තැනක බවත් තමන්ගේ කථාවන් තුළ ඉතා පැහැදිලිව සඳහන් කළා. ඒ වාගේම සබුද්ධික සහ අබුද්ධික කාරණා පිළිබඳවත් සාකච්ඡා වුණා. සමහර වෙලාවට ඒ කථා කරපු කාරණා අනුව ඒවා මන්දබුද්ධිකද කියන ප්‍රශ්නාර්ථයකුත් ඇති වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පාසල්වල පහසුකම් පිළිබඳව විපක්ෂ නායකතුමා ඉතාම දැඩි ලෙස කරුණු කාරණා පැහැදිලි කළා. එම නිසා මම මේ කාරණය මතක් කරන්න කැමැතියි. අපට නිදහස ලැබුණු කාලවකවානුවට පෙර නමුත්, ඊට ආසන්නයේ තමයි ඉන්දියාවට නිදහස ලැබුණේ. හැබැයි, නිදහස ලැබීමෙන් පසු තමන්ගේ සියලු ක්ෂේත්‍ර පිළිබඳ සැලසුමක් සහිත ඉදිරි ගමනක් ඉන්දියාවට තිබුණු වග අපි හැමදෙනාටම පිළිගන්න වෙනවා. අධ්‍යාපනය තුළත් අපට ඒක හොඳාකාරවම දකින්න පුළුවන්. අද වනකොටත් ඉන්දියාව අභ්‍යවකාශය තරණය කරන තැනකට ඔවුන්ගේ අධ්‍යාපනය දියුණු කරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, දේශීයත්වය රකිමින් ගෝලීයත්වය තුළ අද ලෝකයේ ප්‍රධාන තැනකට පත් වන තරමට ඔවුන් අධ්‍යාපනය ඉතා ඉහළ මට්ටමකට යොමු කරගෙන තිබෙනවා. ඉන්දියාව හා සමකාලය තුළම නිදහස ලබපු, අවුරුදු 400 ගණනක යටත් විජිත යුගයකින් පසුව නිදහස ලබපු රටක් වන අපේ රටේ අධ්‍යාපනය අද කොතැනද තිබෙන්නේ කියන කාරණය පිළිබඳව අපි නැවත හැරී බැලිය යුතුයි. නිදහසින් පසුව මාරුවෙන් මාරුවට අපේ රටේ බලය හොබවපු, පාලනය කරපු ඒ සියලු පාර්ශ්ව අද එක මිටට එක පැත්තකට වෙලා ඉන්නවා; විපක්ෂයට වෙලා ඉන්නවා.

අද ඒ ගොල්ලන් අධ්‍යාපනයේ පහසුකම් පිළිබඳව කථා කරනවා. මම ඊයේ දිනයේදී රූපවාහිනී නාළිකාවක ප්‍රවෘත්ති අතරතුර යන විශේෂ වැඩසටහනක මේ කාරණාව දැක්කා. එය, අපේ රටේ ජනතාව දැනුවත් කරන සුවිශේෂී වැඩසටහනක්. එයින් කියැවුණේ, විශේෂයෙන්ම අපේ රට තුළ තිබෙන අධ්‍යාපන අසාධාරණත්වය පිළිබඳවයි. අධ්‍යාපන අසාධාරණත්වය පිළිබඳ කාරණාව ඉතා හොඳින් එහි පැහැදිලි කර තිබුණා. පාසල්වල පහසුකම් පිළිබඳව, පාසල්වල තිබෙන තත්ත්වයන් පිළිබඳව සාකච්ඡා කරන උදවිය, තමන් දේශපාලන බලය හොබවන විට පාසල්වලට ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා - හොඳ පාසල්වලට දරුවන් ඇතුළත් කර ගැනීම සඳහා - දේශපාලන මෙවලම පාවිච්චි කරපු උදවිය අද ගමේ පාසල්වල තිබෙන අඩු පාඩුකම් පිළිබඳව කථා කරන තැනකට පත්වීම විහිළු සහගත දෙයක්. අපි පැහැදිලිව විශ්වාස කරනවා, අපේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් සිද්ධ විය යුතුවාක් මෙන්ම ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සිදු වන අතරතුර පාසල් අතර තිබෙන පරතරය ද අප අනිවාර්යයෙන්ම අඩු කළ යුතුයි කියලා. අප අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රැගෙන යා යුත්තේ එකී පරතරය අඩු කරමින්ය කියන තැන තමයි ජාතික ජන බලවේගය පැහැදිලිව ඉන්නේ. ඒ කාරණාව මම පැහැදිලිව කියන්න කැමතියි.

ගරු විපක්ෂ නායකතුමා අදහස් කිරීමට උත්සාහ දැරුවා, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කිසිදු සූදානමකින් තොරව වර්තමාන

ආණ්ඩුව ඔහේ පටන් ගත්තු එකක් බව කියන්න. හැබැයි, අපි දන්නවා ඊට අදාළව විශේෂයෙන් සංකල්ප පත්‍රිකා ජනගත කළ බව. ඒ විතරක් නොවෙයි, මේ පාර්ලිමේන්තුව තුළ ඉන්න මන්ත්‍රීවරුන් මේ අලුත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය පරිසරය මේ උත්තරීතර සභාව තුළත් අපි ඇති කළා කියන කාරණාව මම මතක් කරන්න කැමතියි. ඉන්දියාව අද වන විට අධ්‍යාපනය අතින් සුවිශේෂී තැනක ඉන්න බව, ඔවුන් තමන්ගේ අධ්‍යාපනය ගොඩනැඟීම හරහා සුවිශේෂී ගෝලීය ආයතනවලත් ඉහළම තනතුරු දරන තත්ත්වයක් අත් කරගෙන තිබෙන බව අපි දන්නවා. හැබැයි, අද අපේ රටේ අධ්‍යාපනය ලබන දරුවන්ට අත් වී තිබෙන ඉරණම, අපේ රටේ අධ්‍යාපනයට අත් වී තිබෙන ඉරණම විශේෂයෙන් නැවත සලකා බැලිය යුතු කාරණාවක් බවට පත් වෙලා තිබෙනවා. වත්මන් විපක්ෂයේ අය අවුරුදු 76ක් තුළ අධ්‍යාපනය දෙස මෙතරම් දුරට පුළුල් ලෙස බලා තිබුණා නම්, ඒ අයට දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ මෙතරම් දුරට කැක්කුමක් තිබුණා නම්, ආදරයක් තිබුණා නම් තමන්ට බලය ලැබිච්ච ඒ හැම මොහොතකම ඒ දියුණු අධ්‍යාපනය කරා යන්න ඔවුන්ට හැකියාව නොලැබුණේ මන්ද කියන ප්‍රශ්නය අපි අහනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙහිදී මට සරල උදාහරණයක් කියන්න පුළුවන්. මාතර, හක්මන, ඉතාම ගම්බද මීඇල්ල කියන ගමේ මාර/අල්මිනා කියන පාසලේ ද්‍රවිඩ භාෂාවෙන් ඉගෙන ගන්නා දරුවෙක් අපේ තාත්තාගේ පරම්පරාවේත්, අපේ පරම්පරාවේත්, අපේ දරුවන්ගේ පරම්පරාවේත් ඉතා හොඳින් සමත් වුණා නම්, එම දරුවා විද්‍යා විෂය ධාරාව ඉගෙනීම සඳහා කිලෝමීටර් 180ක, 200ක විශාල දුරක් ගෙවාගෙන ගිහින් තමයි තමන්ගේ උසස් අධ්‍යාපනය ලබා ගත යුතුව තිබුණේ. හැබැයි, අපි දන්නවා ඒ ගම්වල සමහර දක්ෂ දරුවෝ මේ අධ්‍යාපන ක්‍රමවේදය නිසා තමන්ගේ උසස් අධ්‍යාපනයෙන් ඒ ක්ෂේත්‍රවලට නොයා සමහර විට කඩවල කුලියට වැඩ කරන තත්ත්වයට පත් වුණු බව. එවැනි අධ්‍යාපන රටාවක් තමයි තිබෙන්නේ. ඒ තත්ත්වයන් සියල්ල වෙනස් වෙන්න ඕනෑ. මා හිතන විධියට, එවිට තමයි අපට පුළුවන් වෙන්නේ, හැම කෙනාටම සාධාරණ අධ්‍යාපන වරමක් ලබා දෙන්න.

මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව කථා කරන අපි විශේෂයෙන් මතක් කළ යුතු තවත් කාරණාවක් තමයි දූ දරුවන් පාසල් හැර යෑම. 2019 වර්ෂය තුළ විතරක් පාසල් හැර යෑම 16,673ක් වනවා. 2022දී පාසල හැර යෑම 20,759ක් වනවා. 2024දී පාසල් හැර යෑම 20,755ක් වනවා. දරුවන් එසේ අධ්‍යාපනය හැර යන්නේ ඇයි? මොනවාද ඒ සඳහා බලපාන්නා වූ හේතු? ඒ පිළිබඳව සොයා බලන විට අපිට තේරුම් ගන්න පුළුවන්, මේ අධ්‍යාපනය තුළ ප්‍රතිසංස්කරණයක් විය යුතුයි කියලා.

අද විපක්ෂය කියනවා, තමන් මේකට විරුද්ධ වුණේ නැහැ කියලා. හැබැයි, විරුද්ධ නොවුණත් ඒ ගොල්ලන් ගරු අගමැතිතුමියට එරෙහිව විශ්වාසභංගයක් රැගෙන එන්න හැදුවේ මොන පදනමකින්ද, මොන හේතුව මතද? මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මුල් කරගෙන තමයි ඒ තනතුරෙන් ගරු අගමැතිතුමියට ඉල්ලා අස් වෙන්න කියන සටන් පාඨයත් එක්ක මේ ප්‍රතිසංස්කරණය එපා කියන තර්කය ගොඩනැඟුවේ. ඒ වෙනුවෙන් ආපු අය මේ මොහොතේ කියනවා, "අපි මේ ප්‍රතිසංස්කරණයට කැමතියි" කියලා. ඒ අය ඒ උත්තරය ලබා දෙන තත්ත්වයකට දැන් පත් වෙලා ඉන්නවා. තමන්ගේ හෘදය සාක්ෂිය දන්නවා, මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ප්‍රතිසංස්කරණයක් විය යුතුයි කියලා. කිසිම අඩුපාඩුවකින් තොර -සර්ව සම්පූර්ණ- ගොඩනැඟිච්ච අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විතරක් නොවෙයි, වෙනත් යම් ප්‍රතිසංස්කරණ පවා අපට ලෝකයේ හොයා ගන්න බැහැ. ප්‍රතිසංස්කරණ ප්‍රායෝගික ක්‍රියාවට නංවන විට ඒවායේ අඩුපාඩු නිවැරැදි කරගෙන ඉදිරියට යා යුතුයි. හැබැයි, අවාසනාවකට මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සමාජගත කරනකොට, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රැගෙන එනකොට ඒවාට විරුද්ධව පාරට බැහැපු අය පිළිබඳව හොයා බැලුවා නම් රටේ ජනතාව තේරුම් ගන්නවා, ඒ ගොල්ලන් කවුද කියන එක.

ඇයි මේ ගොල්ලන් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට විරුද්ධ? ඒ ගොල්ලන්ට වුවමනායි, ඒ ගොල්ලන් නඩත්තු කරගෙන ආපු ඒ දූෂිත දේශපාලන සංස්කෘතිය තවදුරටත් අනුමත කරන, රටක්, ලෝකයක් ගැන හිතන්නේ නැති, ඒ දේශපාලන සංස්කෘතියට යටත් වෙච්ච පිරිසක් බවට මේ රටේ දරුවන් පත් කරන්න. ඒ හරහා හැම දාමත් තමන් සුවසේ ජීවත් වෙමින් මේ රටේ ආදරණීය දුප්පත් ජනතාව හැම දාමත් පීඩාවට පත් වෙන්න ඕනෑ කියන පරමාර්ථයෙන් තමයි හොඳ අධ්‍යාපන ක්‍රමයක් ඇති වෙනකොට ඒකට විරුද්ධ වෙලා ඒකට එරෙහිව කටයුතු කරන තත්ත්වයට විපක්ෂය පත් වෙලා තිබෙන්නේ. අද රටේ ජනතාව දන්නවා, අද දෙමව්පියන් හොඳාකාරව දන්නවා ඇයි විපක්ෂය මේ විධියට කටයුතු කරන්නේ කියලා.

මේ රටේ අධ්‍යාපනය තුළ වෙනසක් විය යුතුයි. ඒ අධ්‍යාපනය ලැබීමේදී දරුවන්ට සිදුවන අසාධාරණය රජය වගකීමක් ලෙස අරගෙන, අසාධාරණයට පත් වෙලා ඉන්න දරුවන්ට සාධාරණය ඉටු කරන්න, ඒ පාසල්වල යටිතල පහසුකම් දියුණු කරමින්, ඔවුන්ටත් ලෝකය දකින්න, තාක්ෂණයත් එක්ක අධ්‍යාපනය ලබා ගන්න අවශ්‍ය ඉඩකඩ, පරිසරය හදන්න රජය වෙර දරනවා. පසුගිය සතියේ මම දැක්කා, "laptop.lk" වාගේ ආයතන තාක්ෂණ මෙවලම් පුත්තලම දිස්ත්‍රික්කයට ලබා දීලා ඒ සඳහා සහයෝගය දෙනවා.

අවසාන වශයෙන් මේ කථාව අහන්න කියලා ආරාධනා කරනවා. නබිතුමන් මේ විධියේ හරි ලස්සන පණිවුඩයක් දුන්නා, අධ්‍යාපනය පිළිබඳව.

"පළමුවැනි එක, ඔබ ඉගෙන ගන්න. දෙවැනි එක, එහෙම නැත්නම් ඔබ උගන්වන්න. තුන්වැනි එක, ඒ දෙකම කර ගන්න බැරි නම් අධ්‍යාපනයට සහාය වන්න. අධ්‍යාපනය ලබන අය සඳහා ඔබ සහයෝගය ලබා දෙන්න. හතරවන පාර්ශ්වකරු බවට පත් වෙන්න එපා."

එතුමා එහෙම කිව්වා. අධ්‍යාපනය කඩාකප්පල් නොකර, දරුවන්ගේ අධ්‍යාපනය නඟා සිටුවන්න, ඔවුන්ට ලෝකය දකින්න ඉදිරියට යන්න අවශ්‍ය මංපෙත් විවෘත වන විට පටු දේශපාලනය වෙනුවෙන්, පටු දේශපාලන අරමුණු වෙනුවෙන් කටයුතු කරන්න එපා. එහෙම කරලා අපේ දරුවන් කොතැනටද තල්ලු කරන්න හදන්නේ? ඉන්දියාව ඉදිරියට යන කොට, ඒ දරුවන් අභ්‍යවකාශය තරණය කරන කොට අපේ රටේ දරුවන්ගේ ඉරණම පිළිබඳව කල්පනා කර බලලා අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සහාය වෙන්න. කවුද අධාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධව පාරට බැහැලා ඉන්නේ? හැම විටම මේ රටේ ජනතාව අවුස්සපු, ඒ වාගේම වැරැදි දේවල් සමාජගත කරමින් කටයුතු කරපු අය තමයි අද මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ගැන කථා කරන්නේ. ඒක නිසා හතරවන පාර්ශ්වයක් නොවී අපි සියලුදෙනාම මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය ගොඩනඟමු. ඒ වෙනුවෙන් කටයුතු කරමු කියන ආරාධනා කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජී. ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.14]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற கல்வி மறுசீரமைப்பு பற்றிய ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகின்றேன். கல்வி மறுசீரமைப்பு என்பது நாட்டுக்குத் தேவையானதாக இருந்தாலும்கூட, ஆய்வு செய்யப்படாமல் அவசரமாக இதனைச் செய்யும்போது தவறுகள் ஏற்படுவதற்கு வாய்ப்பிருக்கின்றது. எமது நாட்டைப் பொறுத்தமட்டில், வரலாற்று ரீதியாகப் பல தவறுகள் இடம்பெற்று வந்திருக்கின்றன. இலங்கை சுதந்திரமடைந்ததன் பின்னர், 1956ஆம் ஆண்டு கொண்டுவரப்பட்ட தனிச் சிங்களச் சட்டமானது தமிழ் மொழிமூலம் கல்வி கற்ற மாணவர்களுக்குப் பாதிப்புகளை ஏற்படுத்தியிருந்தது உங்களுக்குத் தெரியும்! அதேபோல், 1971இல் பின்பற்றிய பல்கலைக்கழக அனுமதியில் தரப்படுத்தல் என்ற விடயமும் பாதிப்பை ஏற்படுத்தியிருந்தது. மேலும், 1972ஆம் ஆண்டு கொண்டுவரப்பட்ட முதலாம் குடியரசு அரசியல் யாப்பிலும்கூட, சிங்கள மொழிமூலம் கற்கின்றவர்களுக்கும் தமிழ் மொழிமூலம் கற்கின்றவர்களுக்கும் இடையில் கல்வி ரீதியாகப் பாரபட்சமான ஒரு நிலைமை காணப்பட்டது. 1981ஆம் ஆண்டு யாழ். பொது நூலகம் எரிக்கப்பட்டதையும் கல்விக்கு விழுந்த ஓர் அடியாகத்தான் நாம் பார்க்கின்றோம். எனவே, எமது கல்வி வரலாறானது பல பாரபட்சமான, சில பக்கச்சார்பான நடைமுறைகளைப் பின்பற்றி வந்திருக்கின்றது என்பது வரலாற்றை நோக்கும்போது தெரிகின்றது. கல்வியை மறுசீரமைப்புச் செய்ய வேண்டும். அந்த மறுசீரமைப்பானது, சிங்கள மொழிமூலம் கற்கின்றவர்களுக்கும் தமிழ் மொழிமூலம் கற்கின்றவர்களுக்கும் சமவாய்ப்பை ஏற்படுத்தக்கூடிய விதத்தில் அமைந்தால் வரவேற்கத்தக்கதாக இருக்கும்.

நாங்கள் சில விடயங்களை ஆராய்ந்து பார்க்கின்றபோது, மதம் சம்பந்தமான விடயம் நமது நாட்டை அதிகமாகப் பாதித்திருப்பது தெரிய வருகின்றது. குறிப்பாகச் சொல்லப்போனால், மதம் சம்பந்தமான அடிப்படைவாத சிந்தனையானது இந்த நாட்டின் வரலாற்றை மிக மோசமாகப் பாதித்திருக்கின்றது. அரசியல்வாதிகளின் ஆலோசகர்களாக இருந்தவர்கள் இந்து சமயம் சார்ந்த விடயத்திலும் ஆலோசகர்களாக நியமிக்கப்பட்டு இருக்கிறார்கள். சைவசித்தாந்த சபை, சைவ பரிபாலன சபை, விவேகானந்த சபை, ஆறுமுகநாவலர் சபை, இந்து மாமன்றம் என்றெல்லாம் இந்து சமயம் பற்றிய அறிவு ரீதியான ஆலோசனைகளை வழங்கக்கூடிய சபைகள் இருக்கின்றன. இவை எதுவும் இதில் உள்வாங்கப்படாமல் இருப்பது ஒரு குறைபாடாக இருக்கின்றது. அது மாத்திரமன்றி, கடந்த அரசாங்க காலத்தில் அரசியல்வாதிகளின் ஆலோசகர்களாக இருந்த சில பூசகர்கள் இந்து சமயம் சார்ந்த விடயத்தில் ஆலோசனை வழங்கக்கூடியவர்களாக இருப்பதும் குறைபாடாக இருக்கின்றது. இந்து மதம் சம்பந்தமான ஆழமான அறிவுடைய, புலமை பெற்றவராக பேராசிரியர் பத்மநாதன் அவர்கள் இருக்கிறார். அவருடைய ஆலோசனைகள் பெற்றுக் கொள்ளப்பட்டதாக எனக்குத் தெரியவில்லை.

இந்த விடயத்தை அவசர அவசரமாக மேற்கொள்ளும்போது, குறைபாடுகள் ஏற்படுவதற்கு வாய்ப்பு இருக்கின்றது என்பதைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். கல்வி மறுசீரமைப்பு என்பது நாட்டுக்குத் தேவையானது. இதன்மூலம் நாட்டில் அபிவிருத்தி ஏற்பட வேண்டும், தேசிய ஐக்கியம் ஏற்பட வேண்டும், சகலருக்கும் சமத்துவமான கல்வி கிடைக்க வேண்டும் என்ற விடயத்துடன் நாங்கள் உடன்படுகின்றோம்.

NIE என்று சொல்லப்படுகின்ற தேசிய கல்வி நிறுவகத்தில் சிங்கள மொழி சார்ந்த அதிகாரிகளும் தமிழ் மொழி சார்ந்த அதிகாரிகளும் இருக்கின்றார்கள். எனினும், கடந்த காலத்திலிருந்து குறிப்பிட்ட துறைகளில் மொழி ரீதியாக - சிங்கள, தமிழ் - பல குறைபாடுகள் இடம்பெற்று வந்திருக்கின்றன என்பது எங்களுக்குத் தெரியும்! தேசிய கல்வி நிறுவகத்தில் வரலாறு, drama and theatre, விஞ்ஞானம், கணிதம் எனப் பல்வேறு பாடத்துறைகள் காணப்படுகின்றன. இந்தப் பாடத்துறைகளில் தமிழ் மொழி சார்ந்து ஆலோசனை வழங்கக்கூடிய கல்விப் புலமை வாய்ந்தவர்கள் எத்தனை பேர் இருக்கின்றார்கள் என்பதையும் நாங்கள் சிந்தித்துப் பார்க்க வேண்டும். கல்விப் புலமை வாய்ந்தவர்களிடமிருந்து ஆலோசனைகளைப் பெறுவதைவிடுத்து, பூசகர்களாக இருக்கின்ற சமயத் தலைவர்களிடம் ஆலோசனைகளைப் பெறுகின்றோம். இவர்கள் சம்பிரதாயபூர்வமான விடயங்களுக்கு அதிதிகளாக அழைக்கப்பட்டு இருப்பார்களே ஒழிய, அந்த விடயதானத்தில் ஆழமான அறிவைக் கொண்டிருப்பதற்கு வாய்ப்புகள் இல்லை. இப்படியானவர்களின் ஆலோசனைகளைப் பெற்றுக்கொண்டு, மதம் சம்பந்தமான விடயங்களில் மாற்றங்களை ஏற்படுத்தும்போது குறைபாடுகள் ஏற்படுவதற்கு வாய்ப்பு இருக்கின்றது.

தமிழ் மொழி சார்ந்த நூல்களை அச்சிடும்போது, அவற்றைச் செவ்வை பார்ப்பதற்குத் தமிழில் புலமை வாய்ந்தவர்கள் சம்பந்தப்பட்ட நிறுவனங்களில் போதியளவு இருக்கின்றார்களா என்ற விடயத்தையும் நாங்கள் கவனத்திற்கொள்ள வேண்டும். ஏனென்றால், நாங்கள் அச்சடிக்கின்ற புத்தகங்கள் மற்றும் வடிவமைக்கின்ற நூல்களில் குறைபாடுகள் இருக்குமாக இருந்தால், அது பாரிய பிரச்சினையாக மாறக்கூடும். இப்போது தரம் 6 ஆங்கில பாடப் புத்தகத்தில் ஏற்பட்டதொரு குறைபாடு பேசுபொருளாக மாறி, நாடு முழுவதும் பெரியதொரு பிரச்சினையாக இருந்துகொண்டு இருப்பது உங்களுக்குத் தெரியும்! எனவே, முறையாக அவதானித்து, குறைகளையும் பிழைகளையும் முன்கூட்டியே கண்டறிந்து அகற்றி, சரியான முறையில் நூல்கள் அச்சிடப்படுமாக இருந்தால், பல பிரச்சினைகளை முன்கூட்டியே தீர்த்துக்கொள்ள முடியும்.

நிறைய விடயங்களைச் சொல்லவேண்டி இருந்தாலும், நேரம் போதாமல் இருக்கின்றது. எமது கல்வி நடவடிக்கையானது முன்பள்ளியிலிருந்து - preschoolஇலிருந்து - ஆரம்பமாகி பல்கலைக்கழகம் வரைக்கும் இருக்கின்றது. Preschool என்று சொல்லப்படுகின்ற முன்பள்ளியானது பாடசாலைக் கட்டமைப்புக்கு அப்பால் இருந்தாலும், அதனை அரசாங்கம் முழுமையாகப் பொறுப்பேற்று, அதற்குரிய ஆசிரியர் நியமனம், அவர்களுக்கான பயிற்சி, கற்றல்-கற்பித்தல் செயற்பாடுகளை மேற்பார்வை செய்தல் என்பவற்றை மேற்கொள்ள வேண்டும். அதனூடாக மாணவர்களை விருத்தி செய்யக்கூடிய விதத்தில் கற்றல்-கற்பித்தல் செயற்பாடுகள் நடைபெறுகின்றனவா என்பதை அவதானிக்கவேண்டிய தேவை இருக்கின்றது. நாங்கள் preschoolஐ வேண்டா வெறுப்பாக விடுகின்றபோது, மாணவர்களின் அடிப்படைக் கல்வி பாதிக்கப்படுவதற்கு வாய்ப்பு இருக்கின்றது. எனவே, முன்பள்ளி ஆசிரியர்களை அரசு பொறுப்பேற்று, அவர்களுக்குப் பயிற்சிகளை வழங்கி, தரமான ஆசிரியர்களாக மாற்றியமைக்க வேண்டும்.

மக்டூகலின் கொள்கையில் ஆய்வூக்கல், திரட்டூக்கல் என்று இருக்கின்றது. மாணவர்கள் சிறு வயதிலிருந்தே ஆராய்ச்சிகளில் ஈடுபடக்கூடிய விதத்தில் அறிவியற் கல்வி, விஞ்ஞானக் கல்வி, தொழில்நுட்பக் கல்வி ஊடாக வழிகாட்டப்பட வேண்டும். அவ்வாறு வழிகாட்டினால்தான் எதிர்காலத்தில் எமது நாட்டில் விஞ்ஞானிகளை உருவாக்க முடியும். வெளிநாட்டவர்களால் உற்பத்தி செய்யப்படுகின்ற சாதனங்களை இறக்குமதி செய்கின்ற நாடாக இருப்பதால், நாங்கள் அதிகமான டொலர்களை இழந்துகொண்டு இருக்கின்றோம். குறிப்பாக, அந்நியச் செலாவணியை இழந்துகொண்டு இருக்கின்றோம். எனவேதான் நான் சொல்கின்றேன், ஆய்வுக் கல்வி, விஞ்ஞானக் கல்வி, தொழில்நுட்பக் கல்வி, தகவல் தொழில்நுட்பக் கல்வி, கணிதக் கல்வி என்பனவற்றுக்கு மிக முக்கியத்துவம் அளித்து அவை பாடசாலைகளில் வளர்த்தெடுக்கப்பட வேண்டும் என்று.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Please, give me one more minute, Madam.

மலையகப் பாடசாலைகள் உட்பட அநேகமான கஷ்டப் பிரதேச பாடசாலைகளில் ஆய்வுக் கல்வி, தொழில்நுட்பக் கல்வி, தொழிலைப் பெறுவதற்கான கல்வி என்பன பேதியளவு வழங்கப்படுவது இல்லை. மாணவர்கள் பாடசாலைக் கல்வியை முடித்து - Advance Level சித்தியடைந்து - வெளியேறும்போது, அவர்கள் தொழில்வாய்ப்பைப் பெறக்கூடிய விதத்தில் எமது கல்வித் திட்டம் அமையவில்லை. எனவே, அவர்களுக்கு அறிவு சார்ந்த கல்வியை மாத்திரமல்லாமல், மனப்பாங்கில் மாற்றத்தை ஏற்படுத்தக்கூடிய, திறனில் மாற்றத்தை ஏற்படுத்தக்கூடிய கல்வியை நாங்கள் வழங்க வேண்டும். KASP எனப்படுகின்ற knowledge, attitude, skill, practice ஆகிய நான்கு கூறுகளையும் கல்வியானது நிறைவேற்ற வேண்டும். அவ்வாறான கல்வியையே நாங்கள் விருத்தி செய்ய வேண்டும். எமது நாடு அறிவுசார்ந்த கல்வியை விருத்தி செய்திருக்கின்ற போதிலும், மனப்பாங்கில் மாற்றத்தை ஏற்படுத்தவில்லை; திறனில் மாற்றத்தை ஏற்படுத்தவில்லை; பிரயோகத்தில் மாற்றத்தை ஏற்படுத்தவில்லை. நாங்கள் கல்வித் திட்டத்தில் அவசர அவசரமாக மாற்றத்தை ஏற்படுத்தும்போது, குறைபாடுகள் ஏற்படுவதற்கு வாய்ப்பு அதிகமாக இருக்கின்றபடியால், குறைபாடுகள் இல்லாத நிறைவான கல்வி மறுசீரமைப்பைச் செய்ய வேண்டும். அதனை நாங்களும் ஏற்றுக் கொள்வோம்; மாணவர்களும் ஏற்றுக் கொள்வார்கள்; ஆசிரியர்களும் ஏற்றுக் கொள்வார்கள்; உலகமும் ஏற்றுக் கொள்ளும். எனவே, அவசரமின்றி சரியான முறையில் கல்வி மறுசீரமைப்பைச் செய்ய வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.23]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ ඉතාම තීරණාත්මක සහ වැදගත් මාතෘකාවක් වන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව තමයි අපි විවාදයට ගනිමින් ඉන්නේ. විශේෂයෙන්ම 2015න් පසුව; කාලයක් තිස්සේ අපේ රටේ අධ්‍යාපනයේ, එහෙම නැත්නම් විෂය මාලාවල ප්‍රතිසංස්කරණයක් සිදු වෙලා නැහැ කියන එක අපි දන්නවා. අපේ රටට අත්‍යවශ්‍ය දෙයක් තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ. ඇත්තටම ඒක ප්‍රතිසංස්කරණයකට වඩා අධ්‍යාපන පරිවර්තනයක්. මෙතෙක් කල් අධ්‍යාපනය තුළ සිදු වුණේ විෂය මාලා ප්‍රතිසංස්කරණ. හැබැයි, අපේ ආණ්ඩුව සිදු කරන්න උත්සාහ කරමින් තිබෙන්නේ, නැත්නම් අපි මුල පුරලා තිබෙන්නේ අධ්‍යාපන පරිවර්තනයක් වෙනුවෙන්. එම නිසා තමයි අපි නිරන්තරයෙන් මේ පරිවර්තනය කුළුණු පහක් මත පදනම් වූ පරිවර්තනයක් ලෙස දිගින් දිගටම අවධාරණය කරමින් තිබෙන්නේ. අපි කුළුණු පහ ගැන නිරන්තරයෙන් කථා කළා. අධ්‍යාපන පරිවර්තනය ඒ මත පදනම් වෙලා තිබෙන්නේ ඇයි? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එකක් තමයි ලෝකයේ දැනුම වේගයෙන් සංවර්ධනය වීම. දැන් කියන්නේ වසර දෙකෙන් දෙකට ලෝකයේ දැනුම දෙගුණ වෙනවා කියලායි. එම නිසා ඒ දැනුමත් එක්ක යන්න පුළුවන්, ලෝකය සමඟ ඉදිරියට යන්න පුළුවන් අධ්‍යාපනයක් අපේ රටටත් අවශ්‍ය වෙලා තිබෙනවා.

ඒ වාගේම අපි දරුවෙක් හදන්න ඕනෑ කට පාඩම් කරන දරුවෙක් නොවෙයි, අලුත් දේ ඉගෙන ගැනීමට ඉගෙන ගන්න දරුවෙක්, a child who learns how to learn. එහෙම දරුවෙක් තමයි අපට ඕනෑ. ඒ වෙනුවෙන් තමයි මේ අධ්‍යාපන විප්ලවය, එහෙම නැත්නම් අධ්‍යාපන පරිවර්තනය සිදු කරන්න අපි සූදානම් වෙලා ඉන්නේ. ඒ විතරක් නොවෙයි, අපේ රටේ පවතින - මා කියන්නේ නැහැ, වර්තමාන අධ්‍යාපන ක්‍රමය සහමුලින්ම අර සියඹලා ගෙනාපු කථාව වගේ කියලා. එහෙම එකක් නොවෙයි. නමුත් අද අපි දකිනවා, මේ අධ්‍යාපනය යම් ප්‍රමාණයකට යල් පැන ගිහිල්ලා තිබෙනවා කියලා. එම නිසා ඒක අලුත් වෙන්න ඕනෑ. අධ්‍යාපනයත්, ප්‍රායෝගික භාවිතයත් අතරේ විශාල gap එකක් තිබෙනවා; skills gap එකක් තිබෙනවා. එම නිසා දරුවාගේ සහතික පත්‍රයේ දක්ෂතාවට වඩා ප්‍රායෝගිකත්වය ඉහළින් අගයන අධ්‍යාපනයක් අද රටට ඕනෑ වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපි දරුවෝ හදන්න ඕනෑ අපේ රටේ දරුවන් සමඟ තරග කරන දරුවෝ නොවෙයි. ලෝකයේ දරුවන් සමඟ තරග කරන දරුවෝ අපි හදන්න ඕනෑ. සිංගප්පූරුවේ, ඉන්දියාවේ, ඇමෙරිකාවේ, අපි නිරන්තරයෙන් කථා කරන ස්කැන්ඩිනේවියානු රටවල ඉන්න දරුවෝ සමඟ තරග කරන්න පුළුවන් දරුවෙක් නිර්මාණය කරන්න ඕනෑ. අන්න, ඒ වෙනුවෙන් තමයි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, එහෙම නැත්නම් මේ අධ්‍යාපන පරිවර්තනය අපි සිදු කරමින් තිබෙන්නේ. විවේචනාත්මක චින්තනය - critical thinking, ගැටලු විසඳීම - problem solving - ආදී හැකියාවන් සහිත දරුවෙක් අපි හදන්න ඕනෑකම තිබෙනවා. ඒ වෙනුවෙන් තමයි අපි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගොඩ නඟලා තිබෙන්නේ.

ඒක හරි පැහැදිලිව කුළුණු පහක් ඔස්සේ දිවෙන අධ්‍යාපන පරිවර්තනයක්. බොහෝ දෙනෙක් උත්සාහ කරමින් තිබෙනවා, "නැහැ, මේ අධ්‍යාපන පරිවර්තනය පරණ එක" කියලා කියන්න. සජබයටයි, යූඑන්පී එකටයි, මාලිමාවටයි කියලා විෂය මාලා වෙන් වෙන්නේ නැහැ කියලා අපි දන්නවා. එහෙම එකක් නැහැ. මොන

[ගරු මහින්ද ජයසිංහ මහතා]

ආණ්ඩුව, කවුරු විෂය මාලා ගෙනාවත් එකම විෂය මාලාව තමයි ගෙන එන්න ඕනෑකම තිබෙන්නේ. නමුත්, මේ ප්‍රතිසංස්කරණ තුළින් අපි අධ්‍යාපනයේ ව්‍යුහාත්මක වෙනස්කම් කරන්න උත්සාහ කරලා තිබෙනවා. පරණ එකත් එක්ක බලනකොට අන්න ඒවායින් තමයි මේක වෙනස් වෙන්නේ. පැරණි අධ්‍යාපන ක්‍රමය වෙනස් විය යුතු තැන් කිහිපයක් තිබෙනවා. ඒ අතරින් ප්‍රධාන තැනක් තමයි නවය ශ්‍රේණිය අවසානයේ පවත්වන ජාතික කුසලතා තක්සේරුව. පැරණි අධ්‍යාපන ක්‍රමය තුළ ඒක තිබුණේ නැහැ. අපි 9 වසර අවසානයේදී ජාතික කුසලතා තක්සේරුවක් කරලා ඒ දරුවාගේ හැකියාව, දක්ෂතාව කොයි පැත්තටද තිබෙන්නේ කියලා හඳුනා ගන්නවා. අද රටට ඕනෑ වෙලා තිබෙන්නේ හැකියාව, දක්ෂතාව, විභවතාව මත ඉදිරියට යන අධ්‍යාපනයක් මිස කට පාඩම් කරන අධ්‍යාපනයක් නොවෙයි. අපි නිරන්තරයෙන් කියනවා වාගේ මාළුවාටත් ගස් නඟින්න උගන්වන, එහෙම නැත්නම් මාළුවා ගස් නැග්ගාම ලකුණු දෙන අධ්‍යාපනයක් නොවෙයි. ඒ ක්‍රමයෙන් මිදෙන්න ඕනෑකම තිබෙනවා. අන්න, ඒ වෙනුවෙන් තමයි අපි 9 ශ්‍රේණිය අවසානයේ ජාතික කුසලතා තක්සේරු විභාගයක් පවත්වන්නේ.

ඊළඟට, Transversal Skills මනින්න අපේ අලුත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළේ අපි තීරණය කරලා තිබෙනවා. මේක කලින් තිබුණේ නැහැ. ඒ වාගේම ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය තුළ සැලකිය යුතු ව්‍යුහාත්මක වෙනස්කම් අපේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළේ සිදු කරලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, අපි කියන ශාස්ත්‍රීය අධ්‍යාපනයට පමණක් සීමා වෙලා තිබුණු අපේ රටේ අධ්‍යාපනය කුසලතා පැත්තට - skills පැත්තට - යොමු වුණු විෂය ධාරා තෝරා ගැනීමට මේ තුළින් අවස්ථාව හදලා තිබෙනවා. මේවා තමයි, මෙතෙක් පැවැති එහෙම නැත්නම් 2018 වර්ෂයේ සිට ආ ප්‍රතිසංස්කරණවලින් අපි බිඳෙන තීරණාත්මක තැන.

මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පදනම් කරගෙන පසුගිය දිනවලත්, ඒ වාගේම අදත් මේ පාර්ලිමේන්තුව ඇතුළේ විවිධ විවේචන ගොඩනඟමින් තිබෙනවා. සමහර අය එළියේත් විවේචන ගොඩනඟමින් ඉන්නවා. හැමෝම නොවෙයි. සමහරුන්ගේ විවේචන සාධනීයයි. වෘත්තීය සමිතිවල විවේචන තිබෙනවා, ඒවා සාධනීය කරුණු. අපි ඒවා භාරගන්න සූදානම්. ඔවුන් පෙන්වා දෙන අඩු පාඩු භාරගන්න අපි සූදානම්. මීට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා පෙන්වා දුන් කරුණු සාධනීය ලෙස පෙන්වා දුන්නා. එවැනි අඩු පාඩු සිදුවෙලා තිබෙනවා නම් ඒවා ගැන සොයා බලා ආණ්ඩුවක් ලෙස ඒවාට ප්‍රතිකර්ම යොදන්න අපි සූදානම්. ඒ නිසාම තමයි, විශේෂයෙන්ම 6 ශ්‍රේණියට අදාළ විෂය මාලා ප්‍රතිසංස්කරණය අපි ලබන වර්ෂය දක්වා කල් දමන්න තීරණය කළේ.

පසුගිය ජනවාරි මාසයේ 12 තමයි අපි මේ තීරණය ගත්තේ. කැබිනට් මණ්ඩලය 12වැනි දා මේ තීරණය අරගෙන, 13වැනි දා තමයි ප්‍රකාශයට පත් කළේ. පසුගිය දෙසැම්බර් 30, 31 ඉඳලා සති දෙකක් තිස්සේ මොකක්ද මේ විනාශකාරී විපක්ෂය ගොඩනඟපු දේ? මොකක්ද, මේගොල්ලන් රට තුළ අවුළුවපු දේ? ගරු විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහත්මයා මේකට අලුත් වචනයකුත් පටබැන්දා, "අසභ්‍යකරණය" කරන්න යනවා කියලා. මම විපක්ෂ නායකතුමාට පෙන්වා දෙන්නම්, අසභ්‍යකරණය පටන් ගත්තේ කවදාද, කොතැනදීද කියලා.

මා සතුව තිබෙනවා, 2015දී ආ "Information and Communication Technology - Grade 11, Education Publications Department" ලෙස සඳහන් ICT textbook එක. අසභ්‍යකරණය ගැන කථා කරන විපක්ෂයේ නෝනලා, මහත්වරුන් හැමෝටම මම කියනවා, ගිහිල්ලා මේ පොත අරගෙන බලන්න කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පොතේ 77වැනි පිටුවේ තිබෙනවා, “Sending instant messages. Two persons can exchange short messages very fast (chat) over the Internet using chat facility" කියලා. එහි විවිධ links ගණනාවක් සඳහන් කරලා තිබෙනවා; links 14ක්, 15ක් විතර ඇතුළත් කරලා තිබෙනවා. එහි එක තැනක "buddy" කියලා තිබෙනවා. ඔබතුමන්ලා අසභ්‍යකරණය කියලා හඳුන්වා දුන් "buddy". අපි දන්නවා, Internet එකේ "buddy" කියලා ගැහුවාම - buddy.net කියලා තිබුණාද, නැද්ද කියන එක අදාළ නැහැ - ඔක්කෝම දේවල් එන බව. හැබැයි, මේ මහත්වරුන්ට ඒක search කරන්න අමතක වෙලා තිබෙනවා. 2015 ඉඳලා 2023 දක්වා 9 වතාවක් මේ පොත මුද්‍රණය කරලා තිබෙනවා. 2023දී තමයි අවසන් මුද්‍රණය තිබෙන්නේ. ඒ, කාගේ කාලයේද? මෛත්‍රී, රනිල්, සජිත්ගේ ආණ්ඩුව කාලයේ. ඒ සජිත් ප්‍රේමදාස හෝ මේ විපක්ෂයේ අනෙකුත් නෝනලා මහත්වරුන් කවුරුවත් එදා ඒක දැක්කේ නැහැ. අද වෙනකල් -අවුරුදු 11ක් වෙනකල්- පාවිච්චි කරන්නේ මේ පොත. එතෙක් මේ දේ දැකලා නැහැ. මේ පොතේ සඳහන් කර තිබෙන දේ search කරලා ගියාම ඒක අසභ්‍යකරණය නොවෙයිද? ඒක අපි අහනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා අපි සහමුලින් සමරිසි අධ්‍යාපනය ගේන්න හදනවා කියලා වරනඟන්න ඔබතුමන්ලා උත්සාහ කළා. අගමැතිතුමියට ඇති තරම් අපහාස කළා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මට තව පොඩි කාලයක් ලබා දෙන්න. මට කියන්න තව කරුණු කිහිපයක් තිබෙනවා.

විශේෂයෙන්ම එක් වෘත්තීය සමිති නායකයෙක් එළියේ ඉඳගෙන කිව්වේ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලායි. එහෙම තමයි කිව්වේ.

ඒ, එක් විදුහල්පති සංගමයක වෘත්තීය සමිති නායකයෙක්. මම නම් කියන්නේ නැහැ. කැතයි; හිරිකිතයි. මේ පුද්ගලයාට උඩහමුල්ල පැත්තේ ඉස්කෝලයක් භාර දෙනකොට හිටියේ ළමයි 226යි. ඔහු ඒගොල්ලන්ගේ වෘත්තීය සමිතියේ ජයවර්ධනපුර කලාපයේ මාරු මණ්ඩල නියෝජිතයා වශයෙන් හිටියා, 2019 වෙනකම්. දැන් ඒ ඉස්කෝලේ ළමයි 50ටත් අඩුයි. ඔන්න, ප්‍රතිසංස්කරණ ගැන විවේචනය කරන අය ඉස්කෝල හදපු විදිය. තව එක්කෙනෙක් හිටියා, වෘත්තීය සමිති නායකයෙක්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩි තුනක් වැඩිපුර ලැබිලා තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
Thank you.

ඒ, ස්වාමීන් වහන්සේනමක්. උන්වහන්සේත් 2015දී ගහපු මේ "buddy" කියන එක දැකලා නැහැ. අපේ ආණ්ඩුවේ 6 ශ්‍රේණියේ විෂය මාලා සංවර්ධනයේ English module එකේ තිබෙන "buddy" කියන එක තමයි දැක්කේ. කලින් එක දැක්කේ නැහැ. ඒ පොතේ තිබෙන "buddy" කියන එක නොදැක්කේ ඇයි? 2015 සිට 2019 වෙනකම් මෛත්‍රී, රනිල්, සජිත්ගේ ආණ්ඩුවෙන් ඇති පදම් වරදාන ගත්තා. ජපානයේත් ගියා. කිසි ගාණක් නැතිව රජයේ අරමුදල්වලින් ජපන් සංචාර ගියා. ගිහින් මොනවාද කළේ කියලා අපි දන්නේ නැහැ. ඒක උන්වහන්සේලා දන්නවා ඇති. මේ ගැන බොහොම පැහැදිලිව විවේචන ගොඩනැඟුවා. ගොඩනඟලා රට තුළ වැරදි මතයක් හැදුවා.

ඒ නිසා තමයි අපි විපක්ෂයට කියන්නේ, 6 ශ්‍රේණියේ විෂය මාලා ප්‍රතිසංස්කරණය කල් දමන තැනට රට තුළ වැඩ හැදුවේ ඔයගොල්ලන් කියලා. ඒකෙන් ගැලවෙන්න බැහැ. මේක ඇතුළේ කියනවා, අපට ඕනෑ, අපට ඕනෑ කියලා. මම දැක්කා, පෙරේදා හර්ෂ ද සිල්වා ගරු මන්ත්‍රීතුමාත් කියනවා, "අපි විරුද්ධ නැහැ, මේක ඕනෑ" කියලා. එතුමා මේක ඇතුළේ ඕනෑ කියද්දී එළියේ හෝමාගම ප්‍රාදේශීය සභාවේ ඒගොල්ලන්ගේ ගෝලයෝ ටික අමු තිත්ත කුණුහරුප බෝඩ් අල්ලාගෙන හිටියා. මා ළඟ ඒ වීඩියෝ එකක් තිබෙනවා. මේක එපා කියලා කුණුහරුප කිය කියා සමාජයේ දරුවන්ට බලන්න බැරි වන විධියේ අසභ්‍ය වචන පාවිච්චි කරමින් බෝඩ් අල්ලාගෙන විරෝධතා දැක්වූවා, හෝමාගම ප්‍රාදේශීය සභාවේ ඉන්න සජබ, පොහොට්ටු, UNP මන්ත්‍රීලා ඔක්කෝම ටික. හරිද? මේ ආසයි, බයයි.

අපි පෙරේදාත් මේ ගැන කිව්වා. මේ විශ්වාස භංගය ගේන්නකෝ අප්පා. අපි හරි ආසාවෙන් හිටියේ, විශ්වාස භංගය ගෙනෙනකම්. ගේන්නකෝ. කෝ, තවම නැහැ නේ. ඒක අපි ගේන්නම් ලු. එහෙම කියන්න බැහැ, විපක්ෂයට. වගකිව යුතු විපක්ෂයක් නම්, අගමැතිතුමියට විරුද්ධව විශ්වාස භංගයක් අත්සන් කළා නම්, ඒක ගේන්න ඕනෑ. ඒක ෆයිල් අස්සේ දාලා හංගාගෙන ඉන්න නොවෙයි නේ, අත්සන් කළේ. ඒක ගේන්නේ නැහැ. අද මොකද වුණේ? මේ විශ්වාස භංගය ගෙනාවේ ඇයි? වෙන ප්‍රශ්නයකට නොවෙයි නේ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා රට අසභ්‍යකරණය කරනවා, මේ රට සමරිසි තැනකට ගෙනියනවා කියලා තමයි අගමැතිතුමියට එරෙහිව විශ්වාස භංගය ගෙනාවේ. හැබැයි, දැන් මොකද වෙලා තිබෙන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද රට වටේම ඒගොල්ලන්ට එරෙහිව ජනතාව විශ්වාස භංග අත්සන් කරමින් තිබෙනවා. දසදහස් ගණනින් පෙත්සම් අත්සන් කෙරෙනවා. රට වටේම උද්ඝෝෂණ තිබෙනවා. අර අපේ ආදරණීය වතු සේවකයින්ට රුපියල් 400කින් පඩි වැඩි කරනකොට මේගොල්ලන් ඒකට විරුද්ධව කටයුතු කළ වෙලාවේ පොල් ගැහුවා වාගේ තමයි අද. මේක පාරාවළල්ලක් වෙලා තිබෙනවා. ඒ නිසා අද පාර්ලිමේන්තුව ඇතුළේ එකක් කියනවා. එළියේ තව එකක් කරනවා.

ඒ විතරක් නොවෙයි. මම දැක්කා, අපේ නාමල් මහත්මයා මේක ඇතුළේ එක එක කථා කියනවා. දැන් එතුමා මේ ගරු සභාවේ හිටියා නම් හොඳයි. මගෙ අම්මේ, ආගම ගැන තිබෙන භක්තිය! කවුද මේ? දළදා මාළිගාව ඉදිරිපිට රේස් පැදපු මහත්වරු. අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේලා පහළ අසුන්වල වාඩි වෙලා ඉන්නකොට සිංහාසන වාගේ අසුන්වල තාත්තලා, බාප්පොච්චිලා වාඩිවෙලා හිටියා. එහෙම වාඩිවෙලා ආගමට අගෞරව කරපු මහත්වරු, අද එනවා අපට ආගම දහම ගැන කියලා දෙන්න. මේක ඇතුළේ ආගම විනාශ වෙනවාලු; රටේ සංස්කෘතිය විනාශ වෙනවාලු. කවුද මෙහෙම කියන්නේ? කටුනායක සේවිකාවක් ගෙනැත් අරලියගහ මන්දිරයේ තියාගෙන මේ රටේ බදු ගෙවන ජනතාවගේ මුදලින් රුපියල් ලක්ෂ ගණන් පඩි ගෙවලා, අසභ්‍යකරණය ගැන දැන් අපට කියාදෙන්න එනවා. මේ අය දැන් වැදි බණ කියනවා.

මේ වෙලාවේ මම තවත් කාරණයක් කියන්න ඕනෑ. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය අපි ගෙනැත් තිබෙන්නේ මේ රටේ දරුවන්ට අලුත් ලෝකයක් හදන්නයි. ඒ ලෝකය හදන වැඩේ අපි අත්හරින්නේ නැහැ, නෝනාවරුනි, මහත්වරුනි. ඔයගොල්ලන් මොන විවේචන කළත්, මේකට එරෙහිව මොන තරම් මඩ අවලාද නැඟුවත්, අපේ අගමැතිතුමිය අපහාසයට පත් කරමින් කටයුතු කළත්, අපි මේක අත්හරින්නේ නැහැ. විශේෂයෙන්ම අපේ අග්‍රාමාත්‍යතුමිය ඉතාම නිර්භීතව මේ හැම අපහාසයකටම එරෙහිව කටයුතු කළා. මම දැක්කා, එක දවසක් සමහර අය කාන්තාවන්ට අපහාස කරනවා කියලා මේක ඇතුළේ බෙරිහන් දුන් ආකාරය. හැබැයි, අගමැතිතුමියට අපහාස කරනකොට එක වචනයක්වත් කියන්නේ නැහැ.

මේ කාරණයත් මම කියන්න කැමතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ දවස්වල ගුරුවරු වැටුප් ගන්නවා. හෙට අනිද්දා වනකොට රාජ්‍ය සේවකයිනුත් වැටුප් ගන්නවා. අපේ ආණ්ඩුවේ දෙවැනි වැටුප් වැඩි කිරීම මේ ජනවාරි මාසයේ ඔවුන්ට ලැබෙනවා. ඒ අනුව ඉතා විශාල වැටුප් වැඩිවීමක් ලැබෙනවා, හැම රාජ්‍ය සේවකයෙකුටම. ගුරුවරුන්ටත් රුපියල් 3,900 සිට රුපියල් 15,000, රුපියල් 18,000 වාගේ ප්‍රමාණයකින් වැටුප් වැඩි වෙනවා. මේක ඒවා ගැන කියන්න වෙලාව නොවෙයි.

ඒ වාගේම, තව ගොඩක් අය ප්‍රශ්න කරන කාරණාවක් ගැනත් කියමින් මම කථාව අවසන් කරනවා. අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල තිබෙන කුලුනු පහෙන් එකක් තමයි, මානව සම්පත් සංවර්ධනය, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් අපි ආණ්ඩුවක් ලෙස කටයුතු කරමින් සිටිනවා. මා සතුව මේ තිබෙන්නේ අධ්‍යාපන සභාව ගොඩනැඟීමට අදාළ අවසන් වාර්තාව. ඒකේ English report එක විතරයි අපට තිබුණේ. අපි දැන් එය Tamil සහ Sinhalaවලට පරිවර්තනය කර තිබෙනවා. ලබන පාර්ලිමේන්තු සතියේ අපේ අනු කමිටුව කැඳවලා ඒකට අදාළ ඉදිරි ක්‍රියාමාර්ගත් ගන්නවා. ගොඩක් අය ගුරු වැටුප් විෂමතාවයේ ඉතුරු තුනෙන් දෙක ගැන අහනවා. ඒ ඉතුරු තුනෙන් දෙකත්, වැටුප් විෂමතාවත් විසඳන්න ඕනෑ කරන පියවර එකින් එක ගනිමින් ඉන්නවා කියන කාරණයත් අවධාරණය කරමින් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වෙනුවෙන් මුළුමහත් රටම එකට පෙළ ගස්වමින් එය ජයග්‍රහණය කරනවා, මේ රටේ දරුවන්ට අලුත් ලෝකයක් නිර්මාණය කරන්න මැදිහත් වෙනවාය කියමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.39]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

[ගරු චානක මාදුගොඩ මහතා]

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව කථා කරන මේ වෙලාවේදී අපි දෙපැත්තකට බෙදිලා විපක්ෂය හරිද, ආණ්ඩු පක්ෂය හරිද කියලා වාද කරනවාට වඩා, ඊළඟ වසරේදී ආරම්භ කරන්න කල් දමපු මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සාර්ථක කර ගන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව කථා කළොත් මේ විවාදය ඵලදායී වෙනවාය කියා මා විශ්වාස කරනවා.

ඒ වාගේම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විධියට, පක්ෂයක් විධියට අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ දැඩිව අවශ්‍යයි කියනවා වාගේම අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට දැඩිව පක්ෂයි කියන කාරණයත් මේ මොහොතේදී සිහිපත් කරන්න ඕනෑ. අපි එකඟ නැත්තේ මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ ඇතුළත් වුණු යම් යම් කාරණාවලටයි. තව වසරකින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කරනවා කියලා දීර්ඝ කරපු වෙලාවේ ඒ කියන කුලුනු 5 ශක්තිමත් කරලා, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය හැමෝටම එකඟ වෙන්න පුළුවන් තැනකට ගෙනැල්ලා ඉදිරිපත් කළොත් මේ රටේ අපි හැමෝගේම බලාපොරොත්තු වාගේම ජනතාවගේ අභිලාෂයන් ඉෂ්ට වෙයි කියාත් අප විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ කාරණය පිළිබඳවත් සිහිපත් කරමින් තව විනාඩි ගණනකින් මේ රටේ සිදු වන දැවැන්ත වංචාවක් පිළිබඳව මේ සභාවේ අවධානය යොමු කරවන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. තව සුළු වේලාවකින් ඒ වංචාව සිදු වෙනවා. අපිට පුළුවන්කම තිබෙනවා, ඒ වංචාව නතර කර ගන්න. එම නිසා ඒ වංචාව පිළිබඳව මේ මොහොතේදී අපි කථා කරන්න ඕනෑ. අපි දන්නවා, 2025 ජූනි මාසයේ 20වැනි දා ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවට වියළි ආහාර මිලදී ගැනීම සඳහා පුවත් පත්වල ටෙන්ඩර් දැන්වීම් පළ කළා කියලා. එසේ ටෙන්ඩර් දැන්වීම් පළ කළාට පසුව ඒ ටෙන්ඩර් පටිපාටිය අනුව යමින් නිවැරදි ක්‍රමවේදයට ලංසු 36ක් සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ Beston Enterprises කියන ආයතනය මුලින්ම ඒ ටෙන්ඩර් හිමිකාරිත්වය ලැබුවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ Beston Enterprises කියන ආයතනය තමයි අඩුම ලංසුවට ඒ ටෙන්ඩර් පත්‍රයට තමන්ගේ මිල ගණන් ඉදිරිපත් කළේ. බොහොම පැහැදිලිව ආහාර ද්‍රව්‍ය 36ක් සඳහා මේ ආයතනයට ටෙන්ඩරය හිමි වන බව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2025.11.13වන දින ලිපියකින් දැනුවත් කර තිබෙනවා. 2025.11.13 දිනැති එම ලිපිය මම මේ අවස්ථාවේදී සභාගත* කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එසේ දන්වා තිබියදීත් ස්ථාවර, උසස් මට්ටමේ ප්‍රසම්පාදන මණ්ඩලයයි, ලංසු ඇගැයීමේ කමිටුවයි කියන දෙකම නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරලා මේ ටෙන්ඩරය දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එවැනි මොහොතක මේ අවම ලංසුව ඉදිරිපත් කරපු ආයතනය ඉවත් කරලා වැඩි මිල ගණන් ඉදිරිපත් කරනු ලැබූ ආයතනයකට ඉතාම වංචනික ලෙස මේ ටෙන්ඩරය දීලා තිබෙනවා. එය ඉතාම වංචනික ලෙස තමයි දීලා තිබෙන්නේ. ඇයි, මම එහෙම කියන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වංචාව පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයේ ගණකාධිකාරිවරයාගේ අත්සනින් යුතු ප්‍රසම්පාදන වාර්තාවේ එතුමා පැහැදිලිව සඳහන් කර තිබෙනවා, මේ ක්‍රියාව නීති විරෝධීයි කියාත්, ප්‍රසම්පාදන පිළිබඳව මාර්ගෝපදේශ අනුගමනය කරලා නැහැ කියාත්. මේ ටෙන්ඩර් පටිපාටිවලින් වියදම් කරන්නේ මේ රටේ ජනතාවගේ බදු මුදල්. මේක විශාල වංචාවක්; දූෂණයක්; නොවිය යුත්තක්; නොකළ යුත්තක්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආණ්ඩුව අද මේ විනාශ කරන්නේ මේ රටේ මිනිසුන් තුළ තිබුණු විශ්වාසය. එම නිසා අපි ඒ පිළිබඳව මේ සභාවේ දැඩි අවධානය යොමු කරවන්න කැමැතියි.

ඒ වාගේම 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.7 අනුව අදාළ ආයතනවලින් අසා තිබෙනවා, මේ ටෙන්ඩර්කරුගේ ගැටලු මොනවාද කියලා. එහිදී ප්‍රසම්පාදන කොමිෂන් සභාව වාගේම ඊට අදාළ බැංකු මේ ටෙන්ඩරයට අදාළ ඇපකරවල කිසිදු ගැටලුවක් නැහැ කියන කාරණය සඳහන් කර තිබෙනවා. එසේ දන්වා තිබියදීත් වැඩි මිල ගණන් ඉදිරිපත් කරපු ටෙන්ඩර්කරුවන්ට අදෘශ්‍යමාන බලවේගයක් මත මේ අවස්ථාව දීලා තිබෙනවා. අපි අහන්න කැමැතියි, ඒ අදෘශ්‍යමාන බලවේගය කුමක්ද කියලා. මේක විශාල වංචාවක්. මේ වංචාව නිසා රටට සිදු වන පාඩුව රුපියල් මිලියන 100ක් -රුපියල් ලක්ෂ 1,000ක්-, බිලියනයක් වෙන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේක බරපතළ කරුණක්. අඩු මිල ගණන්වලට ටෙන්ඩරය ඉදිරිපත් කර තිබියදීත්, වැඩි මිල ගණනට ඉදිරිපත් කරපු ටෙන්ඩරයට මේ ඉදිරි පෙළේ ඉන්න ඇමතිවරුන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය දීලා තිබෙනවා. ඒ නිසා අපි අහන්න කැමැතියි, මේ වංචාව පිළිබඳව. එසේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය දීම සම්බන්ධයෙන් ඉහත කී ආයතනය විසින් ගරු ජනාධිපතිතුමාට ලිඛිතව දන්වා තිබෙනවා. එහි පිටපත් අගමැතිතුමියටත්, නියෝජ්‍ය ආරක්ෂක ඇමතිවරයාටත්, අමාත්‍ය මණ්ඩල ලේකම්වරයාටත්, ආරක්ෂක ලේකම්වරයාටත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිවරයාටත් යොමු කර තිබෙනවා. එම ලිපියත් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ වංචාව සම්බන්ධයෙන් සාධාරණයක් බලාපොරොත්තුවෙන් "ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවන්ට ආහාර මිලදී ගැනීමේ ටෙන්ඩරයේ සිදු වී ඇති වංචාව සම්බන්ධව" යන මාතෘකාවෙන් ජනාධිපති ලේකම්වරයාට ඉදිරිපත් කරපු ලිපිය, ජනාධිපති ලේකම්වරයා වෙනුවට මහජන සම්බන්ධතා අධ්‍යක්ෂතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්වරයාට යවා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම එම ලිපියත් මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

එම ලිපියේ සඳහන් කාරණා මඟිනුත් පැහැදිලි වෙනවා, මේක වංචාවක් බව.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තව විනාඩි ගණනකින් මේ වංචාව සිදු වෙනවා. රටට ආදරයක් තිබෙනවා නම්, මේ රටේ මුදල් වංචා කිරීමට විරුද්ධ නම් මේ ගිවිසුම නවත්වන්න කියා අපි මේ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. මෙම කාරණයට අදාළ අනිකුත් ලිපි ලේඛන සියල්ලත් මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

ඒ පිළිබඳව රටට හෙළිදරව් කරන ගමන් අපි අහන්න කැමැතියි, මේ පිටුපස ඉන්න දේශපාලන බලවේගය කවුද කියලා. ඒ ගැන මේ රට දැනගන්න කැමැතියි. ජනාධිපතිතුමා දැනුවත් කර තිබියදීත් නවත්වා ගන්න බැරි විධියට මේ තුළ කුමන බලවේගයක් ක්‍රියාත්මක වෙනවාද කියන කාරණය මේ සභාව හමුවේදී අපි දැනගන්න කැමැතියි කියන කාරණයත් මේ මොහොතේදී මම සිහිපත් කරනවා.

***** **පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

***** **පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කොරියාවට යන අපේ ශ්‍රමිකයින් සම්බන්ධව මතු වී තිබෙන ගැටලු ගණනාවක් පිළිබඳව අපි කථා කළා. අද වනවිට ඊශ්‍රායලයේ කෘෂිකර්මාන්තයට අදාළ රැකියා සම්බන්ධවත් එවැනිම ගැටලුවක් මතු වී තිබෙනවා. අපි ඒ ගැන මේ ගරු සභාවේදී දිගින් දිගටම ඇහුවා. ඊශ්‍රායලයේ කෘෂිකර්මාන්තයට අදාළ රැකියා සඳහා විදෙස්ගත වීමේ බලාපොරොත්තුවෙන් සියලු සුදුසුකම් සපුරන ලද තරුණ තරුණියන් විශාල පිරිසක් අවුරුදු 2කට වැඩි කාලයක් තිස්සේ බලාගෙන ඉන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. නමුත්, ඒ අයට නව ගිවිසුම් ලැබී නැහැ. නව ගිවිසුම් ගන්න, රාජ්‍ය තාන්ත්‍රික ගිවිසුම් මේ රටට ගෙනෙන්න ඒ අමාත්‍යවරුන් කටයුතු කරන්නේ නැහැ. ඒ රටත් එක්ක කථා කරලා, නව ගිවිසුම් ඇති කරගෙන ඊශ්‍රායලයේ කෘෂිකර්මාන්තයට අදාළ රැකියා සඳහා යන්න ඉන්න ඒ සියලු දෙනාටම අවකාශය ලබා දෙන්න ඕනෑ තරම් ඉඩකඩ තිබෙනවා. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, ඒ සඳහා රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පාවිච්චි කරන්න කියලා. ඒ පිරිස කරපු රැකියාවලින් ඉවත් වෙලා, ණය වෙලා අද වනවිට අවුරුදු 2ක් තිස්සේ බලාගෙන ඉන්නවා. ඒ වාගේම තමයි, ඊශ්‍රායලයේ වෙනත් රැකියා සඳහා අයදුම් කළ අයටත් ගැටලු ගණනාවක් තිබෙනවා. ඒ නිසා ඒවා විසඳන්න කියාත් විශේෂයෙන්ම අපි ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්නය කියන ගමන්, මම ඔබතුමියගෙන් විනාඩියක කාලයක් ඉල්ලනවා, තවත් කාරණයක් ගැන සඳහන් කිරීමට. අද අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැනයි කථා කරන්නේ. ඇල්පිටිය සරණංකර සෞභාග්‍යා පාසලේ විශාල ගැටලුවක් තිබෙනවා. අද වනවිට එම පාසලේ ළමයි 60දෙනෙකුට අවස්ථාව අහිමි වෙලා තිබෙනවා, ඇල්පිටිය ආනන්ද විද්‍යාලයට යන්න. 2012 වසරේ ඉඳලා සරණංකර පාසලේ සිසුන්ට ඇල්පිටිය ආනන්ද විද්‍යාලයට යන්න අවස්ථාව තිබුණා, විශේෂයෙන්ම පෝෂිත පාසල් සංකල්පය යටතේ. නමුත්, මේ අවුරුද්දේ සිට ඒ දරුවන්ට එම අවස්ථාව අහිමි කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපේ රටේ අධ්‍යාපනය ගැන කථා කරන මේ මොහොතේදී, ඇල්පිටිය සරණංකර සෞභාග්‍යා ප්‍රාථමික පාසලේ මේ කියන දරුවන් 60දෙනා සම්බන්ධවත් අපි විශේෂයෙන්ම සඳහන් කරනවා. ඇල්පිටිය ආනන්ද විද්‍යාලයට ඇතුළත් වීමට එම දරුවන්ට අවස්ථාව ලබා දීම වෙනුවෙන් අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටින ගමන්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අපි විරුද්ධ නැහැ කියන කාරණයත් මම සඳහන් කරන්න කැමැතියි. අපි ඒකට එකඟයි. හැමෝටම කැමති වෙන්න පුළුවන්, හැමෝටම එකඟ වෙන්න පුළුවන් හොඳ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් ගෙන එන්න අපි සියලුදෙනා එකතු වෙලා කටයුතු කරමුය කියන කාරණයත් සිහිපත් කරමින්, ඔබතුමියට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.48]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටට ඉතා වැදගත් මාතෘකාවක් වන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳවයි අද දවසේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා වෙන්නේ. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡාව අද ගැනෙන්නේම ඉතාම වැදගත් මොහොතකයි. විශේෂයෙන් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව මීට පෙර අපි මේ පාර්ලිමේන්තුවේ අවස්ථා ගණනාවකදී සාකච්ඡා කළා; සංවාද කළා. ඒ වාගේම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සඳහා කටයුතු කරන්න සූදානම් වෙච්ච පළමුවැනි මොහොතේ, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එක්ක අපේ රටේ අධ්‍යාපනය අවසන් වෙනවාය කියන කථා බහක් ඇති කරන්න විපක්ෂය උත්සාහ කළා. ඒක අධ්‍යාපනයෙන් නැවැත්වුවේ නැහැ; ඒක ආගමට ගෙනාවා. ආගමට ගෙනාවා විතරක් නොවෙයි, මිනිසුන්ගේ සංස්කෘතික විවිධත්වයන්, භෞතික විවිධත්වයන්, ජීව විද්‍යාත්මක විවිධත්වයන් පවා මේක ඇතුළේ විකෘති කරන්න පටන් ගත්තා. විකෘති කරන්න පටන් අරගෙන, ඒ එක වෙලාවක විපක්ෂයේ කණ්ඩායම් පොත්වල පාට පෙන්වලා කිව්වා, මේකේ පාට නිකම් සමරිසි කොඩියේ පාට වාගේ, මේක දැක්කාම සමරිසි වෙනවාය කියලා. මම දැක්කා, ඊයේ පෙරේදා විපක්ෂ නායකතුමාගේ office එකේ reception එකේ ඉන්න නෝනා කියනවා, "අනේ අපොයි! මගේ දුව තව දුවක් එක්කගෙන ඒව්ද දන්නේ නැහැ. ඒකට නම් මම කැමැති නැහැ" කියලා. මේ වාගේ ඉතා පහත් මට්ටමේ බොරු, අවලාද නඟමින්, අඩු ගණනේ ජීව විද්‍යාත්මක වෙනස්කම් පිළිබඳවවත් හිතා බලන්නේ නැතුව කථා කිරීම තුළ ඉතාම පැහැදිලි කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ ඉන්න අය මේ කියන කථා ගැන පුදුම වෙන්න ඕනෑ නැහැ, විපක්ෂ නායකතුමා කියන බොරු ගත්තාම. මම දැන් ඒ ගැන කියන්නයි යන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රටේ විපක්ෂ නායකතුමා කියන්නේ කවුද? දැන් අපි ආණ්ඩුව; අර පැත්ත විපක්ෂය. අපේ ආණ්ඩුව පරදින වෙලාවට විපක්ෂය ආණ්ඩුවට එනවා නම්, ආණ්ඩුව භාර ගන්න ඉන්න කෙනා තේ විපක්ෂ නායක කියන්නේ. එතකොට එතුමා යම් දෙයක් කියනකොට යම් ප්‍රමාණයක වගකීමක් වාගේම වගවීමක් යන දෙකම තිබෙන්න ඕනෑ. එතුමා පසුගිය දවස්වල 6 වසර බුද්ධ ධර්මය පොත අරගෙන පෙන්වලා පාර්ලිමේන්තුවේ කිව්වේ මොකක්ද? අපේ අගමැතිතුමියගෙන් ප්‍රශ්නයක් අහලා, ඒකට උත්තරයක් දීමේදී, පැහැදිලි කිරීමක් කර ගන්න ගමන් කිව්වා, බුද්ධ ධර්මය පොතේ ධර්ම චක්‍රයත් වෙනස් කරලාය කියලා. ධර්ම චක්‍රයත් වෙනස් කරලාය කිව්වා. එතුමා කොහොමද කිව්වේ? "ධර්ම චක්‍රය වෙනුවට අශෝක චක්‍රය ඇතුළත් කරලා තිබෙන්නේ. ඒක ඉතාම පැහැදිලියි" කිව්වා. විපක්ෂ නායකතුමා මේ කථාව කියන්න කලින් අඩුම ගණනේ හිතන්න තිබුණා. එදා තමන් කථා කරන්න එනවාය කියලා දන්නවා නේ. ආගම මෙහෙම මේ කාරණයට සම්බන්ධ කිරීම ඉතාම නිර්ලජ්ජිත, තුච්ඡ ක්‍රියාවක්. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හැකිළීම සඳහා ගෙන යන කුමන්ත්‍රණයේ කොටසක් ලෙස තමයි ඒකත් කළේ. මොකද, මේ ධර්ම චක්‍රය පාවිච්චි කරන්නේ අද ඊයේ ඉඳලා නොවෙයි. මේ පිළිබඳව අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේලාගෙන් සැදුම්ලත් ඒ ආගමික සංස්ථාව, නීත්‍යානුකූල තීරණ ගත යුතු අධිකාරින් ඒ පිළිබඳව තීරණ දීලා තිබෙනවා. සම්බුද්ධ ජයන්ති සැමරුම වෙනුවෙනුත් පාවිච්චි කරපු ධර්ම චක්‍රය මේක. එහෙම තිබෙද්දී විපක්ෂ නායකතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා බොරු කිව්වා. ඒ බොරුව

[ගරු වසන්ත සමරසිංහ මහතා]

තමයි මේ කට්ටිය වටේට ටික ටික අරගෙන ගියේ. මොකද, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කල් දැමීමේ විපක්ෂයේ දේශපාලන කුමන්ත්‍රණය ඒක. ඒක වෙනුවෙන් දැන් බොහෝ කරුණු කියන්න හදනවා. එදා පොත බලාගෙන බොරු කිව්වා. අදත් එතුමා කරුණු ටිකක්; ඒ වාගේම බොරු ටිකක් කිව්වා.

විපක්ෂ නායකතුමා මේ කරුණු කියද්දී මේවා ලෝකෙට යනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. "මේ, රටේ විපක්ෂ නායක නේ" කියලා බලනවා. එතකොට තමන් කියන කරුණුවල සත්‍ය අසත්‍යතාව පිළිබඳව එතුමා හිතන්න ඕනෑ. එතුමා අද කිව්වා, ලෝකයේ අනෙක් රටවල Grade 1 to 12 දක්වා ICT උගන්වනවා කියලා. තොරතුරු තාක්ෂණය - information communication technology - උගන්වන්නේ එහෙමයි කිව්වා. මම හිතුවා විපක්ෂ නායකතුමා ඒ ගැන ටිකක් බලලා, අධ්‍යයනය කරලා කියනවා වෙන්න ඇති කියලා. නමුත් දැන් එක දිගට බොරු කියනවා නේ. පාර්ලිමේන්තුව පාවිච්චි කරලා බොරු කීම කලාවක් කර ගත්ත විපක්ෂයක් අද තිබෙන්නේ. පාර්ලිමේන්තුව පාවිච්චි කරලා බොරු කීම කලාවක් කර ගත්ත විපක්ෂයක් ඉන්නේ, අද පාර්ලිමේන්තුවේ. එතුමා ඒ කථාව කිව්වා. ඒ වාගේම එතුමා කියනවා, White Paper එකක් තිබුණා නම් එතුමන්ලාටත් එකතු වෙලා කථා කරලා මේ ප්‍රතිසංස්කරණ ටික පටන් ගන්න තිබුණාය කියලා. ඒ White Paper එකට මේ බොරු දැම්මා නම් එහෙම, මේක අපට ලොවෙත් ක්‍රියාත්මක කර ගන්න හම්බ වෙන්නේ නැහැ. ඇයි, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තවත් බොරු කියනවා නේ. එතුමා විශ්වාස කරලා නම් අපට මේ වැඩේ කරන්න වෙන්නේ, අපට බොරු කියන්න වෙනවා.

මේ බුද්ධ ධර්මය පොතේ ධර්ම චක්‍රය පිළිබඳව කරුණු කිහිපයක් තිබෙනවා; එක තැනක නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ධර්ම චක්‍රය මොකක්ද කියලා මුලින්ම හඳුන්වා දී තිබෙනවා, ඉතාම පහසුවෙන් අපට හඳුනා ගැනීම සඳහා. හැබැයි, එහෙම හඳුන්වා දී තිබියදී ඒක බලාගෙන බොරු කිව්වා. මේ බලන්න, තැන් කිහිපයක තිබෙනවා. ඒවා බලාගෙන බොරු කියන විපක්ෂ නායකතුමා අද අපට කියනවා, White Paper එකක් තිබුණා නම් එකතු වෙලා අපට ඒ වැඩේ කරන්න තිබුණා, ඇයි නැත්තේ කියලා. එතුමාම කියනවා, මේ කටයුත්ත කරන්න නම් යටිතල පහසුකම් සපයන්න ඕනෑ, ගුරුවරු වැඩි කරන්න ඕනෑ, පහසුකම් හදන්න ඕනෑ කියලා. ඔව්, ආණ්ඩුවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රධාන පරමාර්ථ, ප්‍රධාන අරමුණු පහක් මතයි ක්‍රියාත්මක කරන්නේ. කුලුනු පහක් මත එය ක්‍රියාත්මක වනවා. ඒ කුලුනු පහෙන් එකක් තමයි, විෂය මාලා සංශෝධනය. දෙවැනි එක, යටිතල පහසුකම් සංවර්ධනය. තුන්වැනි එක, මානව සම්පත් සංවර්ධනය. හතරවැනි එක, පසුවිපරම. පස්වැනි එක, මහ ජනතාව දැනුවත් කිරීම. ඉතින් මේ විවාදය අත්‍යවශ්‍යයි කියලා මට හිතුණේ, විපක්ෂ නායකතුමා අදත් මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරලා බොරු කිව්වා නේ; ඒ නිසායි. මම එහෙම කියන්නේ නිකම් නොවෙයි. මම බැලුවා මේ පිළිබඳ තොරතුරු. එතුමා artificial intelligence ගැන කථා කරනවා. එතුමා අහනවා, ඇයි කෘත්‍රිම බුද්ධිය ගැන උගන්වන්නේ නැත්තේ, ඒ ගැන කොහේද උගන්වන්නේ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කෘත්‍රිම බුද්ධිය ගැන උගන්වන්නේ විෂය නිර්දේශය යටතේ නේ. හැබැයි, ඒ ගැන කථා කරන එතුමාම artificial intelligence දාලා බැලුවා නම් තමන් මේ කියන්නේ ඇත්තද කියලා, AIවලින්වත් කියයි, "ඕක කියන්න එපා බොරු, බං" කියලා. එය අඩුම ගණනේ AIවලින්වත් කියනවා.

විපක්ෂ නායකතුමා උදේ කිව්වා, ලෝකයේ රටවල 1 ශ්‍රේණියේ සිට 12 ශ්‍රේණිය දක්වා ICT විෂයය උගන්වනවා කියලා. මම බැලුවා ඒ කොහොමද උගන්වන්නේ කියලා. ලෝකයේ රටවල්වලින්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දියුණුම රටවල් ගත්තාම, විශාල ආර්ථික හැකියාවක් තිබෙන ඇමෙරිකා එක්සත් ජනපදයේ - ඒක depend වනවා State එක මත - Grade 1 to 3 දක්වා තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව උගන්වනවා. ඔවුන් එම ශ්‍රේණිවල දරුවන්ගේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවයි හදන්නේ. ඊට පස්සේ ඔවුන් 3වන ශ්‍රේණියෙන් පසුව තමයි commonly උගන්වන්නේ. ඊළඟට, UKවල ගත්තොත්, UKවල පටන් ගන්නේ 2014දී. සිංගප්පූරුව, Grade 3වල අයට - අවුරුදු 8, 10 අයට - පටන් ගන්නවා. ඊට පස්සේ ජපානය, Grade 5වල අයට පටන් අරගෙන තිබෙනවා 2020දී. මීට අවුරුදු 5කට කලින්. ඊට පස්සේ, ජර්මනිය. ඒගොල්ලෝ පටන් ගන්නවා Grade 5 to 7 දක්වා. අපි ආසියානු රටවල්. දකුණු ආසියානු රටවල් ගත්තාම, අල්ලපු රට වන ඉන්දියාව 6 ශ්‍රේණියේ සිට පටන් ගන්නවා. ඊට පස්සේ, බංග්ලාදේශයත් 6 ශ්‍රේණියේ සිට පටන් ගන්නවා. පාකිස්තානයත් 6 ශ්‍රේණියේ සිට පටන් ගන්නවා. අපිත් යෝජනා කළා, 6 ශ්‍රේණියේ සිට පටන් ගන්න. 6 ශ්‍රේණියේ සිට මේ යෝජනාව ඇවිල්ලා තිබෙන්නේ ඇයි? ඒ ඇවිල්ලා තිබෙන්නේ නිකම්ම නොවෙයි; ඒකට බලපෑ හේතු කිහිපයක් තිබෙනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළේ අපි මෙය ගෙනාවා වාගේම, 6 ශ්‍රේණියේ සිට තොරතුරු තාක්ෂණය කියන විෂයය උගන්වන්න ඕනෑ වෙලා තිබෙන්නේ නිකම්ම නොවෙයි. පොදුවේ ඒ දරුවෝ මේකට සුදුසු වෙන්න ඕනෑ. සම්පත් ටික කළමනාකරණය කර ගන්න පුළුවන් වෙන්න ඕනෑ. පියවරෙන් පියවර දරුවන්ට එම දැනුම දෙන්න ඕනෑ. එහෙම නැතුව artificial intelligence පිළිබඳව 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ලෝකයේ කිසිම රටක උගන්වන්නේ නැහැ. මේ අය අමූලික බොරු කියනවා. ආසියානු රටවල් ටික ගත්තත්, අපි වාගේ රටවල් ගත්තත්, ඒවායේ ආදර්ශ තිබෙනවා. ඒක පහළ ශ්‍රේණිවලට එහෙම උගන්වන්නේ නැත්තේ ඇයි කියලාත් කියනවා. ඒකට හේතු තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ හේතු නිකම් නොවෙයි කියන්නේ. තාර්කික අනුපිළිවෙළ අනුව, තේරුම් ගැනීමේ පහසුව හදන්නයි 6 ශ්‍රේණියේ සිට උගන්වන්නේ. ඒක තමයි 6 ශ්‍රේණියේ සිට පටන් ගන්න හේතුව.

Primary educationවලදී focus කරන්නේ, 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා. 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා උගන්වන දේවල් ටිකක් තිබෙනවා. ගණිතය ටිකක් උගන්වනවා. කියවීම උගන්වනවා. ලියන්න උගන්වනවා. මව් භාෂාව උගන්වනවා. තව second language එකක් උගන්වනවා. ලෝකයේ ද්විතීයික අධ්‍යාපනය - secondary education - පටන් ගන්නේ 6 ශ්‍රේණියේ සිට. 6 ශ්‍රේණියේ සිට තමයි ICT වාගේ විෂයයන් උගන්වන්නේ. එතකොට science laboratory පහසුකම් අත්‍යවශ්‍ය වනවා. ලෝකයේ රටවල් 6 ශ්‍රේණියෙන් උඩට එම විෂයය උගන්වන්නේ ඒ නිසා.

ඒ විතරක්මත් නොවෙයි. යටිතල පහසුකම්වල වර්ධනය පිළිබඳ කරුණ අපට බරපතළයි. අපට ඇමෙරිකාවට වාගේ යටිතල පහසුකම් නැහැ; එංගලන්තයට වාගේ නැහැ; ජපානයට වාගේ නැහැ. ජපානයේ පටන් අරගෙන තිබෙන්නේ 2020දී. අපරාදේ, විපක්ෂ නායකතුමන්ලා 2015දි බලයේ හිටියා නේ. රටේ ආණ්ඩුවේ කොටස්කාරයෝ වෙලා හිටියා නේ. පටන් ගන්න ටිකක් try කරන්න තිබුණා නේ. පටන් ගත්තාද? තිබුණු ඒවාත් විකුණා දැම්මා. එහෙමයි කළේ. එතකොට සද්ද නැතුව දන්නේ නැහැ වාගේ හිටියා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මහපොළ ශිෂ්‍යත්ව භාරකාර අරමුදල යටතේ තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙනුයි SLIIT එක හැදුවේ. 2015 වනකොට මහපොළ ශිෂ්‍යත්ව භාරකාර අරමුදලෙන් හදපු SLIIT එකේ හිටපු භාරකාර මණ්ඩලයේ ගිණුම්වල තිබුණා මිලියන 1,085ක්. 2015 පෙබරවාරි මාසයෙන් පස්සේ මහ බැංකුව බින්දා වාගේම මැයි

මාසය වෙනකොට ඒ පැවැති ආණ්ඩුව SLIIT එකේ සල්ලිවලින්ම SLIIT එක විකුණුවා. ඒවා ඒගොල්ලන් ක්‍රියාත්මක කරපු අලුත් logic. ඕන්න ගරු විපක්ෂ නායකතුමනි, ඒ කාලයේ කරපු දේවල්! එදා මේ විපක්ෂය සිදු කළේ සරල, සාධාරණ දෙයක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

තව දේවල් කියන්න තිබෙනවා, මේ කාරණය සම්බන්ධයෙන්. Grade 6, ideal වෙන්නේ ඇයි? 6 ශ්‍රේණිය උචිත වෙන්නේ ඇයි? අපේ වාගේ රටවල දරුවන් 6 ශ්‍රේණිය වනකොට තමයි යටිතල පහසුකම් ඇතුළු ඒ ඔක්කොම ප්‍රශ්නත් එක්කම මේ වාගේ විෂයයන් සඳහා මානසිකව - mentally - සූදානම් වෙන්නේ. ඒ වාගේම, පාසලට - ගුරුවරුන්ට - ඒ දරුවන් කළමනාකරණය කරන්න පුළුවන් වෙන්නේ එතකොටයි. මේ විපක්ෂයේ කට්ටිය පාර්ලිමේන්තුවේ දාලා බලාගන්නවා වාගේ ළදරු පාසලකට එහෙම කරන්න බැරි වෙයි. ගුරුවරුන්ට ඒ දරුවන්ව manage කරන්න පුළුවන් වෙන්න ඕනෑ; ඒ සම්පත් ටික කළමනාකරණය කර ගන්න පුළුවන් වෙන්න ඕනෑ. එහෙම නම්, මේ කියපු කාලය ඇතුළේ තමයි වඩා හොඳින් මේ තාක්ෂණික කටයුතු සඳහා කළමනාකරණය කරලා දරුවෙකුට උගන්වන්න පුළුවන් වෙන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තමයි තිබෙන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මට තවත් විනාඩි 3ක් ලබා දෙන්නම් කිව්වා, අපේ ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තවත් විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

විපක්ෂය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව දැන් එක දිගට බොරු කියලා අහු වෙනවා. ඒ නිසා මම විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයට කියනවා, ඒ වෙනුවට අඩුම ගණනේ කියන්න කලින් ඒවා ගැන සොයා බලන්න කියලා. අපි දරුවන්ට තොරතුරු තාක්ෂණය උගන්වන්න ඕනෑ. ඒ වෙනුවෙන් යටිතල පහසුකම් සංවර්ධනය කරන්න ඕනෑ. ඔයගොල්ලෝ 2016 සිට ගුරුවරුන් බඳවා ගත්තේ නැහැ. ඔයගොල්ලෝ 2016 සිට බඳවා ගත් රාජ්‍ය සේවකයාට විශ්‍රාම වැටුප හැදුවේ නැහැ. අපි පසුගිය කැබිනට් මණ්ඩල රැස්වීමේදී තමයි පත්වීම් ලිපියට අදාළව ඒ කාරණය වෙනස් කළේ. පසුගිය කැබිනට් මණ්ඩල රැස්වීම වෙනකල් ඔයගොල්ලන් 2016 සිට රාජ්‍ය සේවයට බඳවාගත් සේවක සේවිකාවන්ගේ පත්වීම් ලිපිවල විශ්‍රාම වැටුප පිළිබඳ සඳහන් කර තිබුණේ, දායක විශ්‍රාම වැටුපක් ඉදිරියේදී ක්‍රියාත්මක වෙනවා කියලායි. ඔබතුමන්ලා විශ්‍රාම වැටුප අහෝසි කරපු අය. පසුගිය කැබිනට් මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරලා තමයි අපි ඒක වෙනස් කළේ. මොකද, අපි රාජ්‍ය සේවයට ලක්ෂයක් බඳවා ගන්නවා. ඒවාත් එක්ක පත්වීම් ලිපි දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විපක්ෂයේ මෙතුමන්ලා මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ මාතෘකාව ගෙන ආවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන හිතලා නොවෙයි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වූ කලී අපේ සමාජය මේ තිබෙන තැනින් පියවර ගණනාවක් ඉදිරියට ගෙන යන්න, අනාගතය සඳහා සිදු කරන ක්‍රියාවලියක්; අපේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් සිදු කරන ක්‍රියාවලියක්. අපි කාටවත් ආපසු ඉස්කෝලේ යන්න වෙන්නේ නැහැ. මේ අය හිතුවාට ආපසු ඉස්කෝලේ යන්න බැහැ. මොකද, දරුවන්ටයි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙන්නේ. ඒ නිසා තමයි මේ ගැන සබුද්ධික සංවාදයක් හදන්න කියලා කිව්වේ. දැන් විපක්ෂ නායකතුමා කිව්වා, අසභ්‍යකරණයට උදාහරණයක්. මොකක්ද ඒ? මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමාත් මේ ගැන කිව්වා දැන්. අර 6 ශ්‍රේණිය ඉංග්‍රීසි මොඩියුලයේ තිබෙනවා ලු, "buddy.net" කියා website එකක් පිළිබඳ කරුණක්. ඒක තමයි ලු, අසභ්‍යකරණය. මේක එක් උදාහරණයක් විතරයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ විදියට පාර්ලිමේන්තුව පාවිච්චි කරලා බොරු කියන එක, සමාජයක් නොමඟ යවන එක සුදුසුද? ඒ නිසා මේ අඩු පාඩුව අඩු පාඩුවක් ලෙස සිදු වුණාද, එහෙම නැත්නම් මේක දේශපාලන කුමන්ත්‍රණයක කොටසක්ද කියලාත් සොයනවා. අපේ ගරු නියෝජ්‍ය ඇමතිවරු, ඇමතිවරු මේ ගැන තවත් ඉස්සරහට කරුණු කියාවි.

මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කරන එක වළක්වන්න බෙහෝ අය විවිධ උපාය මාර්ග, උපක්‍රම, කුමන්ත්‍රණ සිදු කළා. ඒ නිසා තමයි ඒ අය මේ website එකක් පිළිබඳ කරුණ කියලා, මේක අසභ්‍යකරණය වෙනවා කියලා කිව්වේ. පොතේ පාට වැඩියි, වෙන කොඩියක පාට කියලා කිව්වා; ඒ කොඩි දැක්කාම ඒ ගොල්ලන් වෙනස් වෙනවා කිව්වා. අනේ! මිනිස්සු තමන්ගේ ලිංගික සහකරුවා සොයා ගන්නා එක ජීව විද්‍යාත්මක වෙනස්කමක්. මේ ගොල්ලෝ හිතනවා පාට දැක්කාම ඒවා වෙනවා කියලා. මේ අය පාරේ යනකොට බලාගෙන යන්න ඕනෑ. මොකද, වැඩිපුර පාට පෙනෙනවා නේ. මේ විපක්ෂය සිදු කරපු ඒ දේශපාලන කුමන්ත්‍රණයක් එය. මේක දේශපාලන කුමන්ත්‍රණයක්, අනාගත දරුවන්ගේ අධ්‍යාපනය විනාශ කරන. ඇයි, අපි කැබිනට් මණ්ඩලය ලෙස මේ තීන්දුව ගන්න තීරණය කළේ? විපක්ෂයේ සමහර අය දැන් කිව්වා නේ, "අපි කැමැතියි මේක කරන්න" කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, තවත් විනාඩි දෙකයි ඔබතුමාට තිබෙන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
හොඳමයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

පසුගිය දවස්වල අපි දැක්කා, අපේ සමාජයේ දරුවන්, ඒ වාගේම අම්මලා නොමඟ යවන්න තවදුරටත් උත්සාහ කරන ආකාරය. හැබැයි, අපේ සමාජය ඇතුළේ සංවර්ධනයේ මට්ටම පිළිබඳ අදහසක් අපට තිබෙනවා. ඒ නිසා අධ්‍යාපනය කොහොමද ව්‍යාප්ත වෙලා තිබෙන්නේ කියලා අපි දන්නවා. ළමයි 200ට අඩු පාසල් 5,000ක් අපේ රටේ තිබෙනවා. ඒ හැම පාසලකටම පහසුකම් ඕනෑ. පාසල්වලට පහසුකම් දීලා හැම දරුවෙක්ම මේ අධ්‍යාපනයේ කොටස්කරුවන් බවට පත් කර ගන්න ඕනෑ. අධ්‍යාපනය මඟ හැරෙන්න දෙන්නේ නැතිව, මේ රටේ හැම දරුවෙකුම අධ්‍යාපනය සඳහා ගෙන යන ගමනකට යන්න තමයි අපි ආණ්ඩුව හැටියට තීන්දු තීරණ ගත්තේ.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

ඒ තීරණය ගනිද්දී උතුර ද, දකුණ ද, නැඟෙනහිර ද, බටහිර ද කියා නැතිව මුළු රටේම දරුවන්ට එක හා සමානව උගන්වන්නයි, එක දරුවෙකුවත් අධ්‍යාපනය මඟ හැර නොයන ක්‍රමයක් හදන්නයි අපි තීන්දු කළේ. නමුත්, විපක්ෂයේ උත්සාහය වුණේ මොකක්ද? කොටසක් තියලා කොටසක් අරගෙන යන්නයි. "හැමෝම ඉගෙන ගත්තොත් ගස්වල පොල් කඩා ගන්නවත් එකෙක් නැහැ" කියලා ඉතිහාසයේ කථා කරපු අයට අප කියන්නේ මේකයි. ලෝකයේ මිනිස්සු දැන් තමන්ගේ දරුවන්ට උගන්වන්නේ හඳ අල්ලන්න නොවෙයි. දැන් අඟහරුවල පදිංචි වෙන්නයි යන්නේ. ඒ නිසා අපි අපේ දරුවන්ට අඩුම තරමේ ලෝකය එක්ක ඉස්සරහට යන්න අවශ්‍ය කරන දැනුම, ඒ වෙනස්කම් සහිත ප්‍රායෝගික අධ්‍යාපනය ලබා දීම කළ යුතුයි. ඒ සඳහා වෙච්ච අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පටන් ගනිද්දී කකුලෙන් ඇදලා කොටසක් නවත්වන්න විපක්ෂයේ කණ්ඩායමක් උත්සාහ කළා. හැමෝම නොවෙයි. අපි දන්නවා දේශපාලන පක්ෂ ගණනාවක් අර විශ්වාස භංගයට අත්සන් කළේත් නැහැ කියලා. සබුද්ධික සංවාදයක් නම් විශ්වාස භංගයකට අත්සන් කරන එක නොවෙයි කරන්න ඕනෑ, ඉස්සෙල්ලාම. විපක්ෂ නායකවරයා හැමෝටම ආදර්ශයක් දෙන්න ඕනෑ, "අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රටට අවශ්‍යයි. විරුද්ධ වෙනවා වෙනුවට අප කරන්න ඕනෑ මේ ප්‍රතිසංස්කරණ කර ගැනීම සඳහා, සිදු වෙලා තිබෙන මේ අඩු පාඩු හඳුනාගෙන ඒවා address කරන එකයි" කියලා. ඊට කලින් ගිහිල්ලා විශ්වාස භංගයක් අත්සන් කළා. අද විශ්වාස භංගය ලාච්චුවේ දාගෙන ඉන්නයි වෙලා තිබෙන්නේ, විපක්ෂ නායකවරයාට. ඇයි? ඒක දෙන්න විධියක් නැහැ. විපක්ෂයේ කණ්ඩායම් ද ඒකට එකඟ නැහැ. ඒ නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිටුපස තිබුණු දේශපාලන කුමන්ත්‍රණය පරද්දන්න හැම දරුවෙක්ම පාසල්වලට අරගෙන එන්න ඕනෑ. පාසලේ 6 වසරට හැම දරුවෙක්ම අරගෙන එන්න ඕනෑ. එක වසරට, අපේ රටේ ලක්ෂ 3ක් පමණ දරුවන් ඉන්නවා. ඒ ලක්ෂ 3ම පාසලට ගේන්න ඕනෑ. පොල් ගෙඩිය අතට දීලා, "ගිහිල්ලා ගහපන් ආණ්ඩුවට විරුද්ධව! ගිහිල්ලා ගහපන් හරිනිට විරුද්ධව!" කියලා, "හරිනි ගෙදර පලයන්! අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එපා!" කියලා උද්ඝෝෂණය කරමින් යනවා.

අධ්‍යාපන ඇමතිතුමිය වන අපේ හරිනි අමරසූරිය අගමැතිතුමිය විතරක් නොවෙයි, ජනාධිපති අනුර දිසානායක සහෝදරයා ඇතුළු අපි ආණ්ඩුව හැටියට මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගේනවා කියලා පොරොන්දු වුණා. ඒකට නායකත්වය දෙනවා, හරිනි අමරසූරිය මැතිනිය. අප මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගේන්නේ රටේ හැම දරුවෙක්ම අධ්‍යාපනයේ ඉහළට ගෙන යන්නයි. ඒ වෙනුවෙන් තමයි මේ කුමන්ත්‍රණ පරද්දලා 2026 වසරේදී පළමු වසරේ සිට පටන් ගත්තු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, යටිතල පහසුකම් සංවර්ධනය, විෂය මාලා සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය සඳහා ගුරුවරුන් බඳවා ගැනීම වාගේම මහ ජනතාව දැනුවත් කිරීමේ ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නේ. ඒ සියල්ල කරන ගමන් විපක්ෂය සිදු කරන මේ දේශපාලන කුමන්ත්‍රණයත් පරාජය කරලා 2027දී 6 වසර අධ්‍යාපන ප්‍රතිසංස්කරණත් පටන් අරන් සියලු දරුවන් අධ්‍යාපනයේ ඉහළට ඔසවා තැබීම සඳහා ගෙන යන ක්‍රියාමාර්ගය අඛණ්ඩව ක්‍රියාත්මක කරනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නිශ්චිතව ඉස්සරහට ගෙන යනවා කියන කාරණය කියමින් මම නවතිනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.05]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට හිතා ගන්නවත් බැරි කථාවක්, එතුමාගේ කථාව. අධ්‍යාපන ධවල පත්‍රිකාව ගෙනාපු 1981 ඉඳලා මේ රටේ අධ්‍යාපනයේ කරන්න හදපු අලුත් වෙනස්කම් සියල්ලට විරුද්ධව පාරට බැහැපු අය දැන් ඇවිල්ලා කථා කරනවා, විපක්ෂය මේකට විරුද්ධයි කියලා. අපේ කිසි විරෝධතාවක් නැහැ. අපේ සහයෝගය අපි දුන්නා. අපේ සහයෝගය දිගටම තිබෙනවා. හැබැයි, 2020-2024 ගෙනාපු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවට අත්සන් කළේ නැහැ, හරිනි අගමැතිතුමිය. පුළුවන් නම් කියන්න, අත්සන් කරලා තිබෙනවාද කියලා. අත්සන් කරලා නැහැ ඒකට. අඩුම තරමින් ඒකටවත් අත්සන් කරන්නේ නැතුව තමයි දැන් 2024-2025 අලුත් අධ්‍යාපන ප්‍රතිපත්ති ගේන්න හදන්නේ.

ඊළඟ එක තමයි, මේ සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන ආයතනයට අදාළව සිද්ධ වුණු විගණනය. ඒ පිළිබඳව මම දැන් සඳහන් කරනවා. මොකද, තමුන්නාන්සේලා පැය ගාණක් මහන්සි වුණා මේ වැඩේට. මුළු දවසක්ම පාර්ලිමේන්තුවේ කාලය කා දැම්මා. මෙන්න, රුපියල් මිලියන 483ක් විනාශ කරපු හැටි, තමුන්නාන්සේලාගේ පක්ෂයේ ප්‍රතිපත්ති හදපු අය. අද වනකොට අනිවාර්ය නිවාඩු යවා තිබෙන දර්ශන මහත්මයා ඇතුළු කට්ටිය තමයි මේ වැඩේ කරලා තිබෙන්නේ. කරුණාකරලා ඒක හොඳට බලන්න.

ඊළඟට, මම විශේෂයෙන්ම කථා කරන්න කැමැතියි ජනාධිපතිවරයා යාපනයට ගිහිල්ලා කරපු ප්‍රකාශය ගැන. වෛරය පිරිමහන්න අනුරාධපුරය පසු කරලා මිනිස්සු යාපනයට එනවා ලු, උතුරට එනවා ලු, සිල් ගන්න. ප්‍රභාකරන් මේක කිව්වා නම් අපට අඩුම තරමේ කල්පනා කරන්න තිබුණා දෙපාරක්. මේ රටේ ජනාධිපතියි මේ කියන්නේ. මේ රටේ බුද්ධාගම ආරක්ෂා කරන්න ඕනෑ කියලා නවවන ව්‍යවස්ථාවේ සඳහන් කරලා තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අත තියලා දිවුරලා, ජනාධිපති තමයි මේ කථාව කියන්නේ. එහේ ගිහිල්ලා වෙන කාරණයක් කිව්වා නම් අපට පිළිගන්න තිබුණා, අර ශ්‍රීතරන් මහත්තයා කිව්වා වාගේ. එතුමා කිව්වා, යාපනයේ තිබෙනවා කෝවිල් 2ක් කුඩු කරලා, ඒක හදලා දෙන්න කියලා. ඒක හදන්න කථා කෙරුවා නම් අන්න ඒකට අපේ කිසි ප්‍රශ්නයක් නැහැ. අපි ඒකට සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. ඒ විතරක් නොවෙයි, bottom trawling ප්‍රශ්නය සම්බන්ධව කථා කරන්න තිබුණා. නමුත්, ඒක වුණේ නැහැ. මම දැන් අහන්න කැමැතියි, මෙහෙම පළිගන්න, මේ රටේ සිංහල බෞද්ධයෝ මොකක්ද මේ ආණ්ඩුවට කරපු වැරැද්ද කියලා. මොකක්ද කරපු වැරැද්ද?

ඒ වාගේම, මම දැන් කියන්න කැමැතියි, ශ්‍රීතරන් මහත්මයා ගැන. දැන් එතුමා වැඩ කරනවා අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ. එතුමා ඒකට පත් වෙන්නේ කොහොමද? මේ රටේ මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ කුඩා දේශපාලන පක්ෂවල නියෝජිතයා විධියටයි. එතුමා ගිහිල්ලා මොකක්ද CC එකේ කරන්නේ? ආණ්ඩුවේ ඔක්කෝටම පක්ෂව අත උස්සනවා. අට පාරක් අත ඉස්සුවා මේ වැරදි පත්වීම්වලට. ආණ්ඩුව ගෙනාව හැම එකකටම හූමිටි තිය තියා හිටියා.

දැන් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් පත් කරනකොට ඒකට එතුමා අත උස්සනවා. ආචාර ධර්ම පද්ධතියේ 25වෙනි වගන්තියේ තිබෙනවා බැඳීම් හා ගැටීම් පිළිබඳ ප්‍රශ්න තිබෙනවා නම් ඒක එතුමා ප්‍රකාශ කරන්න ඕනෑ කියලා. නමුත්

ඒක ප්‍රකාශ කරන්නේ නැහැ. දැන් එතුමාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව නඩු දාලා තිබෙනවා. පූනකරි වැවේ අක්කර 1,200ක් සූර්ය විදුලි ව්‍යාපෘතියකට පවරා දීමේදී මිලියන 40ක් ඒ මහත්මයාගේ bank account එකට ඇවිල්ලා තිබෙනවා කියනවා. තව මිලියන 30ක් ශ්‍රීතරන් සාරන්සන්ට ඇවිල්ලා තිබෙනවා. ඒ මුදල් පරිහරණය පිළිබඳව එතුමාට විරුද්ධව චෝදනා ඇවිල්ලා තිබෙනවා. ඒ චෝදනා සම්බන්ධවම ඉලංගෛයි තමිල් අරසු කච්චි පක්ෂයෙන් එතුමාට කියලා තිබෙනවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් ඉවත් වෙන්න කියලා. මේ රටේ විපක්ෂයේ කුඩා දේශපාලන පක්ෂවල දේශපාලන නියෝජිතයා විධියට එතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කළේ ආණ්ඩුවට පක්ෂව අත උස්සන්න නොවෙයි. ඒ නිසා ඇත්තටම එතුමා ඉල්ලා අස් විය යුතුයි. මොකද හේතුව? මේ රටේ විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම්වල ඉල්ලීම අනුව එතුමා එතැනට පත්වෙලා අද ආණ්ඩුවට පක්ෂව අත උස්සනවා. ඒ විතරක් නොවෙයි, එතුමාට විරුද්ධව තවත් චෝදනා ගණනාවක් තිබෙනවා. ඇත්ත වශයෙන් අද එතුමා පාර්ලිමේන්තුවේ විපක්ෂයේ දේශපාලන පක්ෂවලට තිබෙන අයිතිය පාවා දීලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මොකද, එතුමා අද ආණ්ඩුවෙන් සියලු දේවල් ලබා ගන්නවා. එතුමාගේ පෞද්ගලික ප්‍රශ්න ටික බේරා ගන්න ආණ්ඩුවට කත් අදිමින්, එතුමාගේ දේවල් කර ගන්න එක තමයි දැන් කරන්නේ. උතුරේ ජනතාවගේ ශක්තිය, සහයෝගය අපට හැම දාම තිබුණා. හැබැයි, අද මේ එක පුද්ගලයෙක් විසින් උතුරේ දමිළ ජනතාවගේ අයිතීන් පාවා දීලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අවසන් කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව මොහොතක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

විශේෂයෙන්ම එතුමා හමුදා නිලධාරීන් පත් කිරීම් ගණනාවකට අත උස්සලා තිබෙනවා. ඒ පිළිබඳව උතුරේ දේශපාලන පක්ෂ අතර විශාල විවාදයක් තිබෙනවා කියන එකත් මතක් කරමින්, එතුමාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඉන්න කිසි අයිතියක් නැති තත්ත්වයකට පත් වෙලා තිබෙන බවත් ප්‍රකාශ කරමින්, එතුමාට එයින් අයින් වෙන්න කියාත් ප්‍රකාශ කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.11]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපි කථා කරන්නේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය පිළිබඳවයි. මේ සභාවේදී ප්‍රකාශයට පත් වුණා, මීට කලින් ඉදිරිපත් වෙලා තිබෙන සියලු අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි විරුද්ධ වුණා කියලා. ඒ වාගේම විශේෂයෙන් NEP වැඩසටහන එනකොට ඒකට අපේ අග්‍රාමාත්‍යතුමිය අත්සන් කළේ නැහැයි කියලා ප්‍රකාශ වුණා. ඔව්, අපේ දේශපාලන ඉතිහාසය තුළම පැවති, යෝජනා වුණු බොහෝ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධ වෙන්න මූලික හේතුව තමයි, ඒ ප්‍රතිසංස්කරණ යෝජනා වුණේම, ඒ ප්‍රතිසංස්කරණ අරමුණු කර ගත්තේම, රාජ්‍ය අධ්‍යාපනය ශක්තිමත් කරනවා වෙනුවට රාජ්‍ය අධ්‍යාපනය දුර්වල කරලා, අධ්‍යාපනයේ බර දෙමාපියන් මත පටවමින් අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමේ දිශාවට යොමු කිරීම වීම. ඒ නිසා තමයි අපි ඒවාට විරුද්ධ වුණේ. NEP යෝජනා එනකොට එතුමිය ආංශික අධීක්ෂණ කාරක සභාවේදී NEP යෝජනාවලට විරුද්ධ වුණේ, ඒකට අත්සන් නොකළේ නිකම් නොවෙයි. එතුමිය විතරක් නොවෙයි ඒ වෙනකොට අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටි සාතිෂය බහුතරය, විශ්වවිද්‍යාල ආචාර්යවරු, ගුරුවරු විශාල පිරිසක් NEP යෝජනාවලට විරුද්ධව එතුමන්ලාගේ අදහස් ප්‍රකාශ කළා. ඒ නිසා තමයි ආණ්ඩුවට ඒ වෙලාවේ සිද්ධ වුණේ ඒක අකුළා ගන්න.

මීට පෙර කථා කළ මන්ත්‍රීතුමා හිතනවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියන්නේ ආණ්ඩුව ගේන හැම එකටම විරුද්ධ වෙන්න ඕනෑ එකක් කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මා දන්නා තරමින් නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියන්නේ එහෙම එකක් නොවෙයි. සාධනීය යෝජනා තිබෙනවා නම් ඒක එන්නේ ආණ්ඩු පක්ෂයෙන්ද, විපක්ෂයෙන්ද කියලා බලන්නේ නැතිව ඒ සාධනීය යෝජනා පිළිබඳ අදහස් අරගෙන, ඒවාට පක්ෂ වීම හෝ විපක්ෂ වීම ඒ සභාවේ සාමාජිකයන්ගේ වගකීමක්. නමුත් වක්‍රාකාරයෙන් හෝ සෘජුවම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන්ට බලපෑම් එල්ල කිරීමක් තමයි අපි මීට මොහොතකට කලින් දැක්කේ. ඒ නිසා මම හිතනවා අපි ඒ පිළිබඳව මීට වඩා ටිකක් බැරෑරුම්ව කල්පනා කරලා බලන්න ඕනෑ කියලා.

කොහොම වුණත්, මේ යෝජනා කරලා තිබෙන "අධ්‍යාපන ප්‍රතිසංස්කරණය" කියන එකට ඉතිහාසයක් තිබෙනවා. සමහරු කියනවා, මේක කඩිමුඩියේ ආපු එකක් කියලා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාව පිළිබඳ සාකච්ඡාව දශක ගණනාවක් තිස්සේ තිබෙන එකක්. අපට මතකයි, 2010-2012 කාලය තුළ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් හැටියට ආරම්භ කරපු ඒ සංවේදී මාතෘකාව සම්බන්ධයෙන් වූ සාකච්ඡාවට, අධ්‍යාපන ක්ෂෙත්‍රයට සම්බන්ධ වෙලා ඉන්න වෘත්තීය සමිති ඇතුළු අංශ ගණනාවක්, ඒ වාගේම සිවිල් බුද්ධිමතුන්, සමහර ප්‍රගතිශීලී දේශපාලන පක්ෂ ඒ වෙලාවේත් සම්බන්ධ වුණු බව. ඒ විතරක් නොවෙයි, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ අවශ්‍යතාව අවධාරණය කළා. ඒ සාකච්ඡාවල දිගුවක් හැටියට තමයි, 2018 වෙනකොට සියලු දේශපාලන පක්ෂ ඒ අයගේ දේශපාලන දෘෂ්ටිවාද අනුව යමින්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ යෝජනාව ඉදිරිපත් කරලා තිබුණේ. සමහරු තමන්ගේ ලිබරල් දේශපාලන දැක්මත් එක්ක, අධ්‍යාපනය ලිබරල්කරණය උදෙසා වන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා කරනවා. සමහර අය

[ගරු අනුර කරුණාතිලක මහතා]

ප්‍රගතිශීලී දේශපාලන මතවාදයත් එක්ක, රාජ්‍ය අධ්‍යාපනය ශක්තිමත් කරමින්, දරුවන් සහ දෙමාපියන් මත ඇති වෙලා තිබෙන බර අඩු කරන්න අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රතිසංස්කරණ අවශ්‍යයි කියන කාරණය මතු කරනවා. ඒ සන්දර්භය තුළ තමයි, අද අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කියලා කථා කරන, ඇත්තටම ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනසක් ඇති කරන අධ්‍යාපන ක්‍රියාවලිය යෝජනා වෙලා තිබෙන්නේ. මේ ගැන මිථ්‍යා මත ගොඩක් තිබෙනවා. "PowerPoint Presentation එකක් විතරයි මේකේ තිබෙන්නේ" කියලා විපක්ෂ නායකවරයා මේ ගැන කථා කරන හැම දවසේම කියනවා. හැන්සාඩ් වාර්තා අරගෙන බැලුවොත් පෙනේවි, එතුමා හැමදාම කියන්නේ එකම කථාව බව. එතුමාගේ සමහර ගෝලයෝත් ඉන්නවා, ඒ කථාවම කර ගහගෙන යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ ළඟ තිබෙනවා, "ශ්‍රී ලංකා සාමාන්‍ය අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනසක්" යන මැයෙන් අපි කථා කරන අධ්‍යාපනයේ වෙනස පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරලා තිබෙන ලියවිල්ල. මේක භාෂා තුනෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ තිබෙනවා. හැබැයි, ජපන් භාෂාවෙන් නැහැ. මොකද, එතුමා වැඩියෙන් expert ජපන් භාෂාවට නේ. මම දන්නේ නැහැ මේක ජපන් භාෂාවෙන් තිබෙනවාද කියලා. එහෙම තිබෙනවා නම්, අපේ නියෝජ්‍ය ඇමතිතුමා උත්තර දෙයි. මෙහි පසුබිම, යෝජිත අධ්‍යාපන පරිවර්තනයේ දැක්ම, ඉලක්ක සහ අරමුණු, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව අවබෝධ කර ගැනීම, යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා වන තාර්කිකය, යෝජිත අධ්‍යාපන පරිවර්තනයේ ප්‍රධාන අංග ආදී වශයෙන් සියලු විස්තර මේ ප්‍රකාශනය තුළ අන්තර්ගත වෙලා තිබෙනවා. හැබැයි, සමහරු මේකේ දකින්නේ, PowerPoint presentation එකක් විතරයි. ඒක අල්ලා ගන්න එක හේතුවක් තිබෙනවා. සාමාන්‍යයෙන් මේ වාගේ ප්‍රකාශනයක් තිබෙන කොට, කිසියම් කණ්ඩායමකට මේ වාගේ දෙයක් පැහැදිලි කරන්න ලෝකයේ අද පිළිගත් සම්මතය තමයි, PowerPoint presentation එකකට ඒ පිළිබඳ කරුණු, අන්තර්ගතය සැකෙවින් ඇතුළත් කරලා සාකච්ඡා කරන එක. ඒක තමයි ඔය අල්ලාගෙන කථා කරන්නේ, PowerPoint presentation එකක් විතරයි මෙතැන තිබෙන්නේ කියලා.

මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ අපේ ජාතික අධ්‍යාපන ඉලක්ක මොනවාද කියලා කරුණු අටකින් පැහැදිලි කරනවා. ඒ අතර තිබෙනවා, දේශීය හා ගෝලීය අභියෝගවලට ප්‍රතිචාර දක්වමින් ජාතියේ සංස්කෘතික හා පාරිසරික උරුමය ආරක්ෂා කිරීම; ඉගෙනීමට ඉගෙනීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා සිහිබුද්ධියෙන් සහ ස්වයංවිඥානවත් ඉගෙනුම ලබන්නෙකු ප්‍රවර්ධනය කිරීම. "සිහිබුද්ධියෙන් සහ ස්වයංවිඥානවත්" කියන්නේ කවුරුවත් ලියලා දෙන එකක්, කොහෙන් හරි ඇහිඳ ගත්ත එකක් කියවන්නේ නැතුව සිහිබුද්ධියෙන් තමන් කියන්නේ මොකක්ද, තමන් ප්‍රකාශ කරන්නේ මොකක්ද කියලා දැන ගැනීමයි. එසේ ස්වයංවිඥානවත්ව හැසිරෙන පුරවැසියෙක් බිහි කරන අධ්‍යාපන ක්‍රියාවලියක් මේකෙන් යෝජනා කරනවා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. සංස්කෘතික විවිධත්වයට ගරු කරමින්, ජාතික සංහිඳියාව, ජාතික අඛණ්ඩතාව සහ ජාතික සමගිය පෝෂණය කරන දේශප්‍රේමී ශ්‍රී ලාංකික පුරවැසියෙකු බිහි කිරීම කියන කාරණයත් තිබෙනවා.

මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව සමහර පාර්ශ්ව කථා කරන්න උත්සාහ කරනවා, ජාතික සංස්කෘතියෙන් විතැන් කරන, ජාතිකත්වය ගැන හිතන්නේ නැති, ශ්‍රී ලාංකිකයෙක් හැටියට හිතන්නේ නැති, අන්ත ලිබරල් පුරවැසියෙක් හදන්න යනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ප්‍රකාශනය තුළ තිබෙන ජාතික අධ්‍යාපන ඉලක්ක මොනවාද කියන එක හොඳින් කියවා බලන්න කියලා මම ඒ අයට ආරාධනා කරනවා. ඒ විතරක් නොවෙයි. ඔය ඉංග්‍රීසි භාෂා මොඩියුලයේ තිබෙන කාරණය හැරෙන්න මේ වෙනකොට ප්‍රකාශයට පත් වෙලා තිබෙන මොඩියුලවල තිබෙන එක ගැටලුවක් කියන්න. පිටු දෙකක තමයි ඔය තත්ත්වය තිබෙන්නේ. හැබැයි, ඒ පිටු තුළත් එවැනි නැඹුරුවක් හදන්න ක්‍රියාකාරකම් යෝජනා වෙන්නේ නැහැ. නමුත්, ඒක බරපතළ වැරැද්දක්. අපි ඒක පිළිගන්නවා. ඒ බරපතළ වැරැද්ද කරපු අයට නිවැරදි ක්‍රියාවලියකින් පසුව දඬුවම් ලැබිය යුතුයි. ඒ වැරැද්ද නිවැරදි විය යුතුයි. ඒක වෙනම කාරණයක්. හැබැයි, ඒ පිටු දෙකක තිබෙන කාරණය අරගෙන මේ සමස්ත ක්‍රියාවලියම එක පැත්තකින් අසභ්‍යකරණය කරලා අලුත් වචනයක් ඉදිරිපත් කරලා, "දේශීය සංස්කෘතියට අනුව ශ්‍රී ලාංකිකයෙකු හැටියට කල්පනා කිරීමෙන් විතැන් කරන දරුවෙකු බිහි කරනවා" කියනවා. මම හිතන විධියට අන්න ඒ හරහා තමයි මේ අය මේ යෝජනා කරලා තිබෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධ වෙන්නේ. ඔව්, වැරදි පෙන්වා දෙනවා තමයි. ඒක සාධනීය සාකච්ඡාවක් නම්, ඒ සාධනීය සාකච්ඡාවට - මේ වාගේ වැරැද්දක් තිබෙනවා, ඒක අපි නිවැරදි කළ යුතුයි, අනාගතයේදී ඒ වාගේ වැරැද්දක් සිද්ධ නොවෙන්න අපි අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි කියන සාකච්ඡාවට සම්බන්ධ වෙනවා නම් කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒ වාගේ කරුණක් මුල් කරගෙන මේ සමස්ත ක්‍රියාවලියම එක තේමාවකට ලඝු කරන්න උත්සාහ කරනවා නම් අන්න එතැන තමයි වැරැද්ද තිබෙන්නේ; අන්න එතැන තමයි වගකිව යුතු විපක්ෂයක් හැටියට තම වගකීම ඉටු නොකරන්නේ කියන එක මේ වෙලාවේ මම මතක් කරන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි. මෙතැනදී සමහර අය කථා කළා මේ දේවල්වලට අවශ්‍ය වෙන යටිතල පහසුකම් ප්‍රමාණාත්මකව හදලා නැහැ, ඒ නිසා මේ අධ්‍යාපන ක්‍රියාවලිය සම්පූර්ණ කරන්න පුළුවන්කමක් නැහැ කියලා. ඔව්, කනගාටුවට කරුණක් තිබෙනවා. දශක ගණනාවක් තිස්සේ විවිධ ආණ්ඩු කටයුතු කරපු ආකාරය නිසා; විශේෂයෙන් පාසල් පද්ධතියට, රාජ්‍ය අධ්‍යාපනයට ප්‍රමාණවත් අරමුදල් සම්පාදනය නොකරපු නිසා අද අපේ පාසල් පද්ධතිය තිබෙන්නේ කනගාටුදායක තැනක. හොඳ, ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දෙන්න පුළුවන් යටිතල පහසුකම් අපේ පාසල් පද්ධතිය තුළ නැහැ. ඒ නිසා තමයි අපි මේ අවුරුද්දේ විතරක් බිලියන 17ක් වෙන් කරලා අවශ්‍ය වන යටිතල පහසුකම් ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර තිබෙන්නේ. හැබැයි, "අපි ඉස්සෙල්ලාම යටිතල පහසුකම් හදමු; 10,126ක් වන පාසල් පද්ධතිය සම්පූර්ණ කරලා මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ආරම්භ කරමු" කියලා කවුරු හරි කියනවා නම්, ඒක ප්‍රායෝගික නැහැ. ඒක නොවෙයි ඇත්ත. අපට අවශ්‍යයි, සමාන්තර ගමනක් යන්න. ඒ නිසා තමයි හුදෙක් විෂය මාලාවේ වෙනස්කම්වලට විතරක් සීමා නොකර, එක පැත්තකින් මානව සම්පත ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය කරන්න වැඩ පිළිවෙළක් සකස් කරන අතරේ, පාසල තුළ තිබෙන යටිතල පහසුකම් - පාසල තුළ තිබෙන්න ඕනෑ පහසුකම් මොනවාද, පන්ති කාමරයේ තිබෙන්න ඕනෑ පහසුකම් මොනවාද කියන එක- වර්ධනය කරන්නත් අපි කටයුතු කර තිබෙන්නේ. ඒ වාගේම විෂයමාලා වෙනස්කම්වලට අනුරූපීව ළමයාගේ විභාග කේන්ද්‍රීයව තිබෙන බර අඩු කර හුදෙක් දැනුම විතරක් උකහා ගන්නා අධ්‍යාපන ක්‍රමයක් වෙනුවට ක්‍රියාකාරකම් ඔස්සේ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් ලබා ගන්න පුළුවන් වන විධියට එක පැත්තකින් විෂය මාලාව වෙනස් කරන්නත්, ඒ විෂය මාලාවට අනුරූප වන ඇගයීම් ක්‍රියාවලිය වෙනස් කරන්නත් මේ ප්‍රතිසංස්කරණ තුළ අපි යෝජනා කර තිබෙනවා.

මෙතැනදී කථා වුණා, හැම classroom එකකම smart board එකක් නැහැ, digital platform එකක් නැහැ, ඒ නිසා මේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්න අමාරුයි කියලා. මේ විධියට කියන අයගෙන් මම අහන්න කැමතියි, ඔබතුමන්ලා මේ මොඩියුල පරීක්ෂා කර බැලුවාද කියන එක.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මම වැඩිපුර විනාඩි තුනක් ගන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ අයගෙන් මම අහන්න කැමතියි, මේ මොඩියුල උගන්වන්න classroom එකේ smart board එකක් අනිවාර්යයෙන්ම තිබෙන්න ඕනෑද කියන එක ගැන. එහෙම අවශ්‍යතාවක් නැහැ. එහෙම කියන අය බොරු කියන්නේ. හැබැයි අපි දන්නවා, සමහර පාසල්වලින් දෙමව්පියන්ට ලිපි යවා තිබෙනවා, smart boards අවශ්‍යයි කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අමාත්‍යාංශය පැත්තෙන් මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වැඩිපුර විනාඩි තුනක් ලැබෙනවා, ගරු ඇමතිතුමනි.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
අමාත්‍යාංශයේ චක්‍රලේඛයක් හෝ උපදෙසක් නැතිව ඒ විධියට කටයුතු කරපු වගකීම් විරහිත විදුහල්පතිවරු කවුද; smart boards මිලදී ගැනීම සඳහා දෙමව්පියන්ට බර පටවන්න කටයුතු කරපු විදුහල්පතිවරු කවුද කියන එක සොයා බලා ඔවුන්ට විරුද්ධව නිසි පියවර ගත යුතුයි කියන එකත් මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

ඒ වාගේම අපේ ගරු විපක්ෂ නායකතුමා විශේෂයෙන් සඳහන් කළා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඉගැන්වීම සඳහා පරිගණකයක් නැහැ, ඒ නිසා මේක ඇතුළත් කරපු එක වැරදියි කියලා. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා ඒ පිළිබඳ ප්‍රකාශයක් කළා. හැබැයි, මේ මගේ අතේ තිබෙන්නේ මීට කලින් තිබුණු 6 වසර Information and Communication Technology පොත. මේක ආරම්භ කරලා තිබෙන්නේ කවදාද? මේක ආරම්භ කරලා තිබෙන්නේ, පළමුවෙනි මුද්‍රණය සිදුකර තිබෙන්නේ, 2015දී. එතකොට 2015 ඉඳලා බලයේ හිටියේ කවුද? එතුමා ඒ වෙනකොටත් විපක්ෂ නායකද? මම දන්නා තරමින් නම් එහෙම නැහැ. එතුමා ඒ ආණ්ඩුවේ ඇමතිවරයෙක්. එතකොට එතුමා කිව්වාද, අපේ රටේ හැම ඉස්කෝලෙකම පරිගණක නැහැ, ඒ නිසා තොරතුරු තාක්ෂණ විෂය උගන්වන්න බැහැ, උගන්වන්න පහසුකම් නැහැ, ඒ නිසා මේ පොත ඉදිරිපත් කරපු එක වැරදියි කියලා? නැහැ, එහෙම කිව්වේ නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, එහෙමත් තිබෙනවා. ඉතින් යටිතල පහසුකම් එනතුරු සමහර හොඳ දේවල් දරුවන්ගෙන් ඈත් කරලා තියන්න අපට බැහැ. ඒ නිසා අපි මේ අවුරුද්දේ smart boards ලබාදීම සඳහා අවශ්‍ය මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ඒක ක්‍රියාත්මක කරමින් යනවා. මේ මාර්තු මාසය වෙනකොට පාසල් 1,600 ගණනකට smart boards ලබා දීම සඳහා අපි වැඩ පිළිවෙළක් සකස් කරමින් ඉන්නවා. අපි විශ්වාස කරනවා, ඉදිරි කාලය තුළ අවශ්‍ය අරමුදල් සම්පාදනය කරලා ඒ හැම පාසලකටම අවම වශයෙන් එක ඩිජිටල් උපකරණයක් හෝ ලබා දෙන්න පුළුවන් විධියට ඒ පහසුකම් ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන් බව.

ඒ වාගේම තමයි, සමහර අය කියනවා මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීමත් එක්ක, විශේෂයෙන් මේ මොඩියුල කියන දේවල් ක්‍රියාත්මක කිරීමත් එක්ක අපේ රටේ අධ්‍යාපනය මේ පොදු රාජ්‍ය මණ්ඩලීය - Commonwealth - framework එකෙන් එළියට යනවා කියලා. එහෙම වුණොත් අපේ රටේ දරුවන්ට ලෝකයේ අනෙක් රටවල විශ්වවිද්‍යාලවලට ඇතුළත් වෙන්න බැරි වෙයි කියලා මතයක් හදනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තටම Commonwealth standards ගත්තොත්, එහි තිබෙන ප්‍රධාන කරුණුවලින් එකක් තමයි වසර 13ක පාසල් අධ්‍යාපනය. අනික් එක අ.පො.ස සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග. මේ යෝජනා කරන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය සහ අ.පො.ස උසස් පෙළ විභාගය ජාතික මට්ටමේ විභාග හැටියට ක්‍රියාත්මක වෙනවා. ඒ පිළිබඳව කිසිම වෙනස්කමක් නැහැ. ඊළඟට සාමාන්‍යයෙන් තිබෙන්නේ, Sri Lanka Qualifications Framework - SLQF - එක educationවලට. ඒ යටතේ steps 12කට සම්බන්ධ වෙනවා. මේ අධ්‍යාපන ක්‍රියාවලියෙන් අන්න ඒ Sri Lanka Qualifications Framework එකේ තල 12ට කිසිම විධියක බලපෑමක් සිද්ධ වෙන්නේ නැහැ. එතකොට Commonwealth standards එක්ක Commonwealth framework එකෙන් කිසිම විධියකින් deviation එකක් මේ යෝජනා කරන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ පවතින්නේ නැහැ කියන එක මම මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම තවත් සමහර අය කියනවා, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සකස් කළේ මේ ආණ්ඩුව නොවෙයි, වෙනත් පිරිසක් කියලා. මම කලින් සඳහන් කළා වාගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය පිළිබඳ කාලයක් තිස්සේ දීර්ඝ සාකච්ඡාවක් තිබුණා. ජාතික ජන බලවේගය හැටියට අපෙත් සාකච්ඡාවක්, අපෙත් කිසියම් අදහස් ප්‍රමාණයක් තිබුණා. ඒ අදහස් ප්‍රමාණය තමයි "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ තිබුණේ. ඒ තුළ සාමාන්‍ය අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනසක්, ව්‍යුහාත්මක වෙනස්කම් අපි යෝජනා කරලා තිබුණා. ඒ තමයි, 1 වසර සිට 5 වසර දක්වා; 6 වසර සිට 9 වසර දක්වා; 10 සහ 11 වසර; ඒ වාගේම 12-13 වසර තුළ ඒ ව්‍යුහාත්මක වෙනස්කම් ඇති වෙන්න ඕනෑ කොහොමද කියන එක. ඒ වාගේම 9 වසරේදී ළමයාට තමන්ගේ නිපුණතාව දැනෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් අදහසක් ගන්න, නිපුණතා test එකක් ජාතික මට්ටමින් තියන්න ඕනෑ කියලා අපි යෝජනා කළා. ඒ වාගේම අපි දන්නවා, අපේ රටේ දරුවන්ගෙන් සියයට 48ක් අඩුම ගණනේ අ.පො.ස සාමාන්‍ය පෙළවත් සම්පූර්ණ කරන්නේ නැතුව පාසල් අධ්‍යාපනය හමාර කරන බව. හැබැයි, මේ දරුවන් සමාජයට එකතු වන්නේ කිසිම වෘත්තීය නිපුණතාවක්, පළපුරුද්දක් නැතිව. ඒ නිසා අපි යෝජනා කළා, මේ ක්‍රමය තුළ පාසල් අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනය එකතු කරන්න ඕනෑ කියලා. විශේෂයෙන් සාමාන්‍ය අධ්‍යාපනයට අකමැති, ඒ පිළිබඳ විභවතාවක් නැති දරුවන් වෘත්තීය අධ්‍යාපනයට යොමු කිරීම සඳහා අපි අවස්ථාවක් හදන්න ඕනෑ. අපි යෝජනා කරන මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ ඒ අදහස තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. සමහර අය කරුණු

[ගරු අනුර කරුණාතිලක මහතා]

නොදැන මේ ගැන කථා කරනවා. මේ ගැන කථා කරන්න ගියාම බොහෝ දෙනෙක් කියනවා, ඔවුන් ඒක දැනගෙන හිටියේ නැහැ කියලා. බොහෝ දෙනෙක් ඒ කියන කරන දේවල්වලින් පෙනෙනවා, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ අරමුණ සහ අන්තර්ගතය පිළිබඳ අවබෝධයක් නැතිව තමයි කථා කරන්නේ කියලා. තවත් කිහිප දෙනෙක් ඉන්නවා, දැනගෙන වුණත් තමන්ගේ පටු අභිලාෂ, පටු අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය විවේචනය කරන. හැබැයි, මේ රටේ සාතිශය බහුතරයකගේ එකඟතාව මත ඒ අයගේ විශ්වාසය දිනා ගනිමින් අපි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් ඉස්සරහට අරගෙන යනවා. ඒ හරහා මේ රටේ දරුවන්ගේ අනාගතය, රටේ අනාගතය වෙනස් කරනවා කියන එක සහතික කරමින් මම නිහඬ වනවා.

බෙහෙවින්ම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.30]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කරුණු දැනගෙන කථා කරන්න කියලා අපේ නියෝජ්‍ය ඇමතිතුමෙකු කියනවා. හැබැයි, අපට ලැබිලා තිබෙන කරුණු ඔබතුමන්ලා පිළිගන්නවාද දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට ලැබී තිබෙනවා, 2025 නොවැම්බර් මස 04වැනි දා විගණකාධිපතිවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය වෙත යවන ලද වාර්තාව. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීවරයා මේ වාර්තාව උදේ සභාගත කළා. මේ තිබෙන ඒවා අපි කියනකොට තමුන්නාන්සේලා මේවාත් බොරුයි කියන්න උත්සාහ දරනවා, ඒක ඔබතුමන්ලාගේ දැනුම පිළිබඳ ප්‍රශ්නයක්.

ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, මේ වාර්තාවේ 10වන පිටුවේ 2.3(ඉ)(iv)හි මෙසේ සඳහන් වනවා:

> "1 හා 6 ශ්‍රේණිවල පළමු වාරය සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වාදීමට නියමිත පොත් සංඛ්‍යාව 106ක් ලෙස විගණනයට ඉදිරිපත් කර තිබුණද ඊට අදාළ මොඩියුල සංඛ්‍යාව ඉදිරිපත් නොකෙරුණි. 1 හා 6 ශ්‍රේණිවල දෙවන හා තෙවන වාරයේ මොඩියුල සංඛ්‍යාව ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ලබා දුන් තොරතුරු හා දෙපාර්තමේන්තු මඟින් ලබා ගත් තොරතුරු අනුව පිළිවෙළින් 31ක් හා 46ක් වශයෙන් වෙනස්කම් පැවතුණි. ඒ අනුව සකස් කරන සියලු මොඩියුල එක් ප්‍රධාන ස්ථානයකින් මෙහෙයවීම හා අධීක්ෂණ නොවීම තුළ ඒ ඒ විෂයය යටතේ පිළියෙළ කළ යුතු ලෙස හඳුනාගන්නා ලද මොඩියුල අත්හැරීමේ අවදානමක් නිරීක්ෂණය විය."

මේක කියන්නේ විගණකාධිපති. මේක කියවන්න. ඊළඟට මේකේ තිබෙන ඉතා වැදගත් කාරණය තමයි, viii වැනි කාරණය. එතුමා කලින්ම දැකලා තිබෙනවා, මේවායේ තිබෙන මුද්‍රිත දෝෂ. එතුමා දැකලා තිබෙනවා, මේකේ තිබෙන විවිධ තාක්ෂණික දෝෂ. අද මේගොල්ලන් විගණකාධිපතිවරයෙක් පත් කරන්නේ නැහැ. ඇයි? 2025 විගණනය තුළ තිබෙන මේගොල්ලන්ගේ හොරකම්, ජඩකම්, කුපාඩිකම්, බැරිකම් සියල්ල හෙළි වෙයි කියන බයට. මේවා කියවන්න. මේකේ මොකක්ද කියන්නේ, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි?

එම වාර්තාවේ 2.3(ඉ)(viii)හි සඳහන් කාරණයත් මම කියවන්නම්. එහි මෙසේ සඳහන් වනවා:

> "1 හා 6 ශ්‍රේණිවල දෙවන හා තුන්වන වාර සඳහා මොඩියුල 151 සකස් කර තිබෙන බව ආයතනය විසින් විගණනයට ඉදිරිපත් කර තිබුණු නමුත් ඒ සඳහා වන තාක්ෂණික සහාය ලබා ගැනීම, අක්ෂරවල නිවැරදිතාවය පරීක්ෂා කිරීම සහ අනුමැතිය ලබා ගැනීම හා ISBN අංක ලබා ගැනීම යන කාර්යයන් සිදු කර නොතිබුණු අතර ..."

මේවා කරලා නැහැ. ඒක නිසා තමයි ඔය දෝෂය ආවේ. ඔයගොල්ලන් අපට කියනවා, තොරතුරු දැනගෙන ඇවිල්ලා කියන්න කියලා. හැබැයි, විගණකාධිපති එවලා තිබෙන තොරතුරුවත් ඔයගොල්ලන් කියවලා නැහැ. ඔයගොල්ලන්ගේ උගත්කම ඔළුවට ගන්න එපා. මොකද, ඔයගොල්ලන්ගේ උගත්කම තිබෙන්නේ ඔය වාඩිවෙලා ඉන්න තැන. ඒක දැන් තැළිලා තිබෙන්නේ. දැන් තව කෙනෙකු ඇවිල්ලා කියනවා, බොරු කියන්න එපා කියලා. එයාලා අපිට බොරු කියන්න එපා කියනවා. අපි බොරු කියනවා නම්, බොරුවේ උපත එයාලා; බොරුව මැව්වේ එයාලා. මම දැක්කා, නාමල් රාජපක්ෂ මහත්මයාගේ බල්ලාගේ බෙල්ලේ පවුම් 8ක් තිබෙනවා, ආපු ගමන් ගලවා ගන්නවා කිව්වා. කිව්වේ නැද්ද, ඒ බොරුව? කිව්වේ නැද්ද, බොරුව? එහෙම බොරු කියලා, බොරු හදලා, බොරු මවලා, බොරුවෙන්ම බලය අරගෙන බොරුවෙන්ම යන්න හදනවා.

තවත් මන්ත්‍රීතුමියක් උදේ කිව්වා, ඊසොප්ගේ උපමා කථා අතරේ තිබෙන එක් කථාවක්. මට ඒක හරියටම මතක නැහැ, ආ, ලියාගත්තා, "තකතීරුවන්ගේ බොරුකාරයෝ" කියලා. එහෙම නොවෙයි කියන්න තිබුණේ මන්ත්‍රීතුමිය. "මාලිමාකාරයෝ බොරුකාරයෝ" කියලායි කියන්න තිබුණේ. ඒක ගැළපෙනවා. ඇයි? මම එක බොරුවක් කියන්නද? බොරු නම් ගොඩක් තිබෙනවා. දරුවන්ගේ අභ්‍යාස පොත් ඇතුළු පාසල් උපකරණ සඳහා අයකරන VAT එක සියයට බින්දුව කරනවා කියපු බොරුව. එහෙම බොරුවක් කිව්වා නේද, මාලිමාවේ ජනාධිපතිතුමා? බොරුව තළලා විතරක් නොවෙයි, මිරිකලා ඔයගොල්ලන්ට තවම පොවනවා. ඒ බොරුව ඉදිරියට ගෙනියන තවත් උදවිය ඉන්න බව මම පස්සේ කියන්නම්.

ඊළඟට කිව්වා, මේක කුමන්ත්‍රණයක් කියා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අන්න එතැනින් මම කථාව පටන් ගන්නම්. ඒ කුමන්ත්‍රණය හැදුවේ කොහොමද, කාටද, කුමක් උදෙසා ද කියන කාරණය ගැන මම කියන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ආණ්ඩුවේ ඉදිරි පෙළ අසුනේ ඉන්න පළමුවෙනි ඇමතිවරයා ගන්නම්කෝ, ජෙල් නේ? "දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේ කිව්වා, පස් දාලා තළනවා කියලා. එතුමාගේ තරම බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාව, රටේ ජනතාව තේරුම් ගත්තා. ඉරි තැළුවාම, එතැන පස් දාලා තැළුවාම හරියි කියලා කිව්ව එකෙන් එතුමාගේ උගත්කම, වියත්කම තේරුම් ගත්තා. ඊළඟ කෙනා ගැන කියන්න දෙයක් නැහැ, "බික් කුච්චන්". අනාගෙන, නා ගෙන මුළු ආණ්ඩුවම විනාශ කරලා තිබෙන්නේ. ඒ ඇමතිතුමාගේ දැනුම පිළිබඳව බලද්දී ඒ ඇමතිතුමාත් ජෙල්. ඊළඟ පුටුවේ ඉන්නේ මහා සංඝ රත්නයට පරුෂ වචනයෙන් බැණලා කථා කරන, ඕනෑම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඊළඟට ඉන්නවා, "බික් කුච්චන් part 2". ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි හිතුවේ නැහැ, හැබැයි අද බාල බෙහෙත් ගෙනැල්ලා තිබෙනවා. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, මම කිව්වේ මේ කී වෙනි පුටුව ගැනද? 1, 2, 3, 4, 5වෙනි පුටුව නේද? ඊළඟට, 6වෙනි පුටුවේ ඉන්නවා, වරායේ ඉඳලා වරාය ඇමතිකම කරපු කෙනා. මහා කන්ටේනර් හොරකමෙන් පස්සේ ඇමතිකමත් ජනාධිපතිතුමා නැති කළා. ඊළඟ පුටුවෙන් පොඩ්ඩක් එහා පැත්තට ගියාම කියන්න දෙයක් නැහැ. කාට හෝ වැරදුණු ගමන්, ආණ්ඩුවේ ඔක්කෝම මඩ ගා ගත්තාම ඇවිල්ලා හෝදනවා. ඊළඟට එහා පැත්තට ගියාම ඉන්නවා, හාල්වලින්, පොල්වලින්, සීනිවලින් ගහපු අය. ඡන්දය දුන් ඡන්ද දායකයා සහ රටම දන්නවා, JVP එකේ ඉන්නේ මේ රටට එලක් නැති බොරු කියන උදවිය බව. ඒ වාගේම උගත්කම කියන කාරණය කිව්වාට, ඒක ඉටු වෙන්නේ නැහැයි කියන කාරණය පිළිබඳව දන්නේ නැති උදවිය බව. හැබැයි ඒක රැකගෙන හිටියා, අගමැති හරිනි අමරසූරිය. අගමැතිතුමිය එතුමිය ගත්ත වැඩ පිළිවෙළ කොතැනකදීවත් විවේචනය කළේ නැහැ, මේ කාරණය හැර.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එහෙමනම් අද ඇයි මේ යෝජනාව ආණ්ඩුව ගෙනෙන්නේ? අපි කලින් ඇහුවා, මේ විශ්වාස භංගය ගෙනෙමු, කථා කරමු කියලා. අගමැතිතුමිය - අධ්‍යාපන ඇමතිතුමිය- මේ වෙලාවේ රටේ නැහැ. අපි ගෙනෙන්න ඕනෑ යෝජනාව අද අගමැතිතුමිය රටේ නැති වෙලාවේ ඔබතුමන්ලා ගෙනෙන්නේ ඇයි? ඒක තමයි ඔබතුමන්ලාගේ කුමන්ත්‍රණය. ඒ නිසා සමහරු කියනවා, විශ්වාස භංගය ගේන්න කියලා. විශ්වාස භංගය ගෙනෙන්න කලින් මහත්තයෝ ජනාධිපතිතුමා අපව දිනෙව්වා. ඒවා නැවැත්තුවා, 2027ට ගෙනියන්න. ඒ නිසා විශ්වාස භංගය ගෙනෙන්න ඉස්සෙල්ලා, විශ්වාස භංගය දිනන්න පුළුවන් තැන ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාම පිළිගත්තා. එම නිසා මේ ප්‍රතිසංස්කරණ 2027ට කල් දැම්මා. අපි කියපු නිසා මේක වැරදියි කියලා පිළිඅරගෙන තිබෙනවා. ඒක නිවැරදි කරමුයි කියා කියලා තිබෙනවා. ඒ නිසා විශ්වාස භංගය එන්න කලින් අපි දිනවලා තිබෙනවා; අපි දිනලා තිබෙනවා. මේ වෙන මොකක්වත් නොවෙයි. මේ යෝජනාව ගෙනාවාට ස්ථිර කරන්නේ කවුද? ඒ යෝජනාව ස්ථිර කිරීමේ ඊළඟ කාරණය මොකක්ද? මේ පුටුව එතැනට යන්න ඕනෑ, ඒ පුටුව ගන්න ඕනෑ, ජේවීපීකාරයෙක්ට. මොකද, NPP අයිතිය තිබෙන ආණ්ඩුව තමයි මේ. මේ ආණ්ඩුව JVP එකට අයිති නැහැ. ඒ නිසා JVP එක උත්සාහ කරනවා, NPP එක ඊළඟට ගොඩනගන ඒ නායිකාව නැති කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියට හිනායන්න ඕනෑ. මොකද, මම දන්නා විධියට ඔබතුමිය NPP එකේ. ඔබතුමියලා ඊළඟ බලය හදන්න හිටියේ. ඇයි? මෙයාලා ඔක්කෝම අසාර්ථකයි, ජනාධිපතිතුමා ඇතුළුව. නැද්ද, මම අහන්නේ? තව එහාට දේවල් කියන්න පුළුවන් කර ගත්ත දේවල්. වඳුරු තෙල් හැදුවා, වඳුරෝ ඇල්ලුවා. ඒ නිසා JVP එකේ ඉන්න ඉදිරි පෙළම අසාර්ථක වනකොට NPP එකේ දේශපාලනය විනාශ කරන ක්‍රමය ඇතුළේ හැදුවා. ඒක නිසා තමයි අද මේ සභාව කල් තැබීමේ යෝජනාව ගෙනැල්ලා එතුමිය නැති වෙලාවේ එතුමියට උත්තර දෙන්න බැරි විධියට වැඩ පිළිවෙළ හැදුවේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එක එක ආශාවන් හැමෝටම තිබෙනවා. මේක විවෘතව ශුද්ධ සිංහලෙන් කියන්න ඕනෑ, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි. හරිනි අමරසූරිය මැතිතුමිය තුළ තිබෙන සමහර පෞද්ගලික කාරණා රහසක් නොවෙයි, අද මුළු රටටම. ඇයි ඒක හෙළි කළේ? එතුමිය අසාර්ථක කරවන්න ඕනෑ නිසායි. ඒ අසාර්ථකභාවය තුළ JVP එකට අවශ්‍ය ඊළඟ නායකත්වය ගොඩනගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න ඕනෑ. මේකට අධ්‍යාපනය පාවිච්චි කරපු එක වැරදි නැද්ද? හය වසරේ දරුවාගේ පෙළ පොතට මේක දාලා තමන්ගේ ආශාවන්, දේශපාලන කුමන්ත්‍රණ ඉටු කර ගන්න මේ රටේම අධ්‍යාපනය හදාරන දරුවන් පාවිච්චි කරන එක වැරදියි කියන කාරණය සම්බන්ධයෙනුයි අපි හිටගෙන තිබෙන්නේ. ඔබතුමන්ලා අධ්‍යාපනය හදන එකට නොවෙයි අපි විරුද්ධ. ඔබතුමන්ලා අධ්‍යාපනය හදන්න. හැබැයි, අධ්‍යාපනය හදන මුවාවෙන් මේ කරන්නේ මොකක්ද? එකක්, JVP එකේ දේශපාලනය ස්ථාවර කර ගන්න එක. අනෙක් එක, JVP එකට අභියෝගයක්ව තිබෙන NPP එකේ හරිනි අමරසූරිය මැතිනිය එළවන්න හදන වැඩ පිළිවෙළයි මේ කරන්න හදන්නේ. ඒකට ඉස්කෝලේ යන දරුවා පාවිච්චි කරන එක සාධාරණයි ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? මේක තමයි දේශපාලන කුමන්ත්‍රණය. වෙන අරමුණක් නැහැ. අපි පැහැදිලිව කියනවා, මේ කුමන්ත්‍රණය හරහා ගොඩනගන්න හැදුවේ කුමක්ද කියන කාරණය.

අද එක එක අවශ්‍යතා තිබෙන උදවියට ඒවා ඉටු කර ගන්න පුළුවන්. අවුරුදු 18 ලැබුවාම අපට ඕනෑ නම් විවාහ වෙන්න පුළුවන්. හැබැයි, ලිංගිකව හැසිරෙන එක අපට ප්‍රසිද්ධියේ කොතැනක හෝ කරන්න පුළුවන්ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? අපට ඒක කරන්න බැහැ. ඒක සදාචාර නැහැ, ශීලාචාර නැහැ. ඒක සමාජය පිළිගන්නේ නැහැ. ඒ නිසා සමලිංගික කාරණා නීතිගත කරලා අධ්‍යාපනයට ගෙනෙන එක, මේ සම්බන්ධව උගන්වන කාරණය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, එහෙම පිරිසක් ඉන්නවා. ඒ පිරිසට අවශ්‍ය නීතිය ගෙන ඒම ගැන වෙන තැනක කථා කර ගන්න. ඒකට දරුවා පාවිච්චි කරන්න එපා. ඒකට පාසල පාවිච්චි කරන්න එපා. ඒකට පොත පත පාවිච්චි කරන්න එපා. ඒ පිරිසගේ අවශ්‍යතාව කොතැනද තිබෙන්නේ, කොහොමද ඒක කරන්නේ කියන එක ගැන වෙනම සාකච්ඡා කර ගනිමු. හැබැයි, ඒක අපේ රටට, අපේ සංස්කෘතියට, අපේ ආගමට ගැළපෙන්නේ නැහැ. ඒකයි අපි එතැනදී විරුද්ධතාව ප්‍රකාශ කරන්නේ. ඔබට, අපට විවෘතව ගිහිල්ලා නීතියෙන් බැඳුණු දේ කරන්න බැරි නම්, ඒක දකින කොටම සමාජය අප්‍රසන්න කරලා පිළිකුල් කරනවා නම්, සමලිංගික කාරණා සියල්ල වෙබ් අඩවියට දාලා ගුරුවරු හරහා පාසල් දරුවාට උගන්වන එක වැරැදියි, ඒක කරන්න එපා කියලා තමයි අපි කිව්වේ. එහෙම නැතුව වෙන මොනවාවත් නොවෙයි. ඒ නිසා ඒක තේරුම් අරගෙන ජනාධිපතිතුමා කිව්ව දේ අහන්න. ජනාධිපතිතුමා එපා කියද්දීත්, ජනාධිපතිවරයා මේ වැරැද්ද අපි හදමුය කියද්දීත් අද මේ යෝජනාව ආණ්ඩු පක්ෂය විසින් ගෙනැල්ලා තිබෙනවා. හරිනි අමරසූරිය අගමැතිතුමියගේ චරිතය පිළිබඳව, එතුමියගේ අභ්‍යන්තරයේ තිබෙන සුළු වැරැද්ද, අතපසුවීම එහෙම නැත්නම් එතුමියගේ ඒ වැඩ පිළිවෙළ ගැන පෙන්වා දෙන්න අද ආණ්ඩු පක්ෂයේ සිටින සමහර JVP එකේ කට්ටිය කටයුතු කරනවා. එහෙම කටයුතු කරන්නේ NPP එකේ කට්ටිය නොවෙයි. ඒ නිසා පරිස්සම් වෙන්න. NPP එකේ කට්ටිය දන්නේ නැහැ, මේ JVP එකේ කට්ටියගේ කුමන්ත්‍රණ ගැන. ඒගොල්ලන් ගේම ගහන්නේ කොහොමද කියන කාරණය අපි පසුව කියන්නම්. මේක මම කිව්වාට පසුව ආණ්ඩුව තියාගෙන, බලය තියාගෙන, ජනාධිපතිකම් තියාගෙන, අධිකරණය තියාගෙන, පොලීසිය තියාගෙන අපට මඩ ගහනවා. ඒ උත්පත්තියේ, ජන්මයේ හැටි. උඩට හිච්චි වීරප්පන්. යටට මොකක්ද දන්නවාද අදින්නේ? කෝපි කඩේ දයාවතීගේ මල් මල් චීත්තේ. ඇයි, ඒ? මඩ බලකාය හදලා, මඩ ගහලා, චරිතය ඝාතනය කරන්න කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ අයට ඊළඟ ආත්මයේ සිදු වන දෙයක් තිබෙනවා. ඔබතුමන්ලා දැකලා ඇති, සුනඛයෙක් තවත් සුනඛයෙක් දැක්කාම ඉස්සෙල්ලාම ගිහිල්ලා පුසුඹ බලන්නේ කොහේද කියලා. ඒ, සුනඛයාගේ පිටුපස. ඒ, ඇයි දන්නවාද? තමන්ගේ ගඳ අනික් සුනඛයාගේ තිබෙනවාද කියලා බලන්න. ඒ වාගේ දේශපාලන චරිත තිබෙනවා. උඩට වීරප්පන් වෙලා, යටට දයාවතීගේ මල් මල් චීත්තය ඇඳලා කටයුතු කරන කට්ටිය කෝපි කඩේ ඉන්න දයාවතීගේ නයිට්ටිය ඇන්දා නම් මීට වඩා හොඳයි කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුසිල් රණසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.40]

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

සමහර හොරු දුවනවා, "මෙන්න හොරෙක්, මෙන්න හොරෙක්" කියමින්. ඒ වාගේ අපට හොරු කියමින් අන්න හොරකම් කළා, හාල්වලින් හොරකම් කළා කිය කියා දුවනවා; ඒ විධියට සමහර මහත්වරු කථා කරනවා. එතුමාගේ උගත්භාවය සහ පාර්ලිමේන්තු ඉතිහාසයේ අත්දැකීම් ප්‍රමාණය පෙනෙනවා, විගණන වාර්තාව ගැන එතුමා කියපු කාරණයෙන්. සාමාන්‍යයෙන් ආයතනයක විගණනය කරන්නේ ඊට කලින් සිදු වෙලා තිබුණු ඒවා ගැන. විගණනය කරලා, විගණන වාර්තාව නිකුත් කරන්න මාස ගණනාවක් ගත වෙනවා. මාස කිහිපයකට කලින් විගණන වාර්තාවක් අරගෙන කියනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා අපි සූදානම් වෙලා නැහැ කියලා. ඒ කාලය වනවිට අපි සූදානම් වෙලා හිටියේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි වාරය සඳහා මොඩියුල 94ක් print කරන්න, ඊට පසුව තවත් 188ක් print කරන්න අවශ්‍ය කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මේ වනවිට සම්පාදනය කරලා තිබෙන්නේ. ඒක නිසා ඕවා කියද්දී පොඩ්ඩක් පරිස්සම් වෙන්න. අපි මේ කටයුතු කරලා තිබෙන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ නම කිව්වේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
අද අපේ ආණ්ඩු පක්ෂයේ කථිකයෝ ටිකක් සැරයි. ඒකට හේතුව මේකයි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන්, අධ්‍යාපනයේ කරන වෙනස්කම් සම්බන්ධයෙන් අපිත් එක්ක කථා කරන්න එන්න එපා. මෙතැන ඉන්න බොහෝ දෙනෙක් ඔබතුමන්ලා ගෙනාපු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, අධ්‍යාපනයට ගෙනාපු වෙනස්කම් සම්බන්ධයෙන්, අධ්‍යාපනය විකුණන්න හදපු, -

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්ථාවර නියෝග 86. (අ) යටතේ මම මේ කාරණය අහන්නේ. මම කියපු කාරණය ඔබතුමා වරදවා තේරුම් අරගෙන, ගරු ඇමතිතුමනි. මගේ ළඟ මේ තිබෙන්නේ, 2025 නොවැම්බර් 04වැනි දා ඔබතුමන්ලා 2026දී කරන මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව විගණකාධිපතිවරයා විසින් විගණනය කරපු කාරණා. ඔබතුමාට ඒ ගැන තේරෙන්නේ නැත්නම් වැඩක් නැහැ.

රීති ප්‍රශ්නයට විනාඩියක් තිබෙනවා. විනාඩිය අවසන් වෙන්න තව කල් තිබෙනවා. හිච්චි වීරප්පන් මේ සභාවේ කථානායකත් නොවෙයි, මුලසුනත් නොවෙයි. ඒක නිසා මට කාලය ලබා දෙන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා කරුණාකරලා මේකේ තිබෙන දේ ඇහුවා නම් මෙහෙම වෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය පැහැදිලියි. ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
මම කියපු කාරණය තමයි එතුමා පැහැදිලි කරන්නේ. ඒ නිසා එහි විශේෂ දෙයක් නැහැ. අපි කොහොමත් දන්නවා, ඔබතුමන්ලා රෝස පාට පොත පෙරළලා "point of Order", "point of Order" කියලා හැමදාම ඉල්ලන බව. ඒවාට අපි අහු වෙන්නේ නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඉගෙන ගන්න, ඉගෙන ගන්න.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ඔව්, ඔබතුමන්ලාගෙන් ගොඩාක් දේවල් අපට ඉගෙන ගන්න තිබෙනවා. අපි ඒ ගැන දන්නවා. දේශපාලනය කරද්දී අපි දැන්

ඉගෙන ගනිමින් ඉන්නවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් මම කිය කියා හිටියේ. ඔබතුමන්ලා අපිත් එක්ක හැප්පෙන්න එන්න එපා. මෙතැන විපක්ෂයේ ඉන්න කිහිප දෙනෙක් හැරෙන්න අනෙක් ඔක්කෝම පසුගිය කාලයේ මොනයම්ම හෝ ආණ්ඩුවක කොටස්කරුවෝ. ආණ්ඩු හොඹවලා තිබෙනවා. නැත්නම් ඒ ආණ්ඩුවල කොටස්කරුවෝ වෙලා ඉඳලා තිබෙනවා. පසුගිය අවුරුදු 30, 40, 50 ඇතුළේ අපේ රටේ අධ්‍යාපනය වෙනස් කරන්න අධ්‍යාපනයට විවිධ වර්ගයේ ප්‍රතිසංස්කරණ මේ ආණ්ඩුවලින් ගෙනැල්ලා තිබෙනවා. ඒ හැම එකකම අන්තර්ගතය වෙලා තිබුණේ නිදහස් අධ්‍යාපනයට ෂොට් එක දීම, අධ්‍යාපනය විකුණන එක. එහෙම නැත්නම් නිදහස් අධ්‍යාපනයට වළ කපන්න. ඒවාට අරගළ කරපු මිනිස්සු, අපි. වසන්ත සමරසිංහලා, නලින්ද ජයතිස්සලා, සුනිල් හඳුන්නෙත්තිලා එක්කෝ අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ, නැත්නම් වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ, ශිෂ්‍ය ව්‍යාපාරයේ ඉඳලාම ඒවාට අරගළ කරපු මිනිස්සු. එම නිසා ඔබතුමන්ලා ගෙනාපු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් අකුරක් නෑර අපි දන්නවා. ඒවාට අරගළ කරලා අපට ඒ සම්බන්ධයෙන් හොඳ අත්දැකීම් තිබෙනවා. මට මතකයි, අධ්‍යාපනය විකුණන්න ගෙනාපු මව්කිරි කළමනාකරණය කියන පාඨමාලාව ක්‍රියාත්මක කිරීම නවත්වා ගත්තේ අපේ නලින්ද ජයතිස්ස ඇමතිතුමා ඒ කාලයේ වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ කැඳවුම්කරු විධියට මාරාන්තික උපවාසයකට වාඩි වෙලා බව. ඒ හින්දා වෙන මොනවා ගැන කථා කළත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන අපිත් එක්ක කථා කරන්න එන්න එපා. ඒ ගැන අපි හොඳින් දැනුවත්. අපට ඒ සම්බන්ධයෙන් අත්දැකීම් තිබෙනවා. අපි හැමෝම වාගේ විශ්වවිද්‍යාල ජීවිතයේදී ඒවාට සම්බන්ධ වෙලා තිබෙනවා. අපි එදා ඔබතුමන්ලාගෙන් අධ්‍යාපනය බේරා ගන්න අරගළ කළේ ඔබතුමන්ලා නිදහස් අධ්‍යාපනයට වින කටින්න හදපු නිසායි. අපි ඒ වෙනුවෙන් ලොකු වැඩ කොටසක් කරලා තිබෙනවා. අපි දැන් බලයට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා අධ්‍යාපනය හොඳ දිහාවට වෙනස් කරන්න, අධ්‍යාපනය දියුණු කරන්න අධ්‍යාපනයට නව ප්‍රතිසංස්කරණ අපි ගෙනැල්ලා තිබෙනවා.

අපට අද වනකොට සිද්ධ වෙලා තිබෙනවා, මේ ගෙනාපු ප්‍රතිසංස්කරණවලට වළ කපන එකට විරුද්ධව ඔයගොල්ලන් එක්ක ආපසු අරගළයක් කරන්න. ඒක තමයි මේ කරන්නේ. කොහොමද ඉස්සෙල්ලා පටන් ගත්තේ? ඉස්සෙල්ලා පටන් ගත්ත විධිය නොවෙයි දැන් තිබෙන්නේ. දැන් සැර බාල කරලා කියනවා, "අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අපි කැමැතියි" කියලා. එහෙම තමයි දැන් කියන්නේ. "අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගේන්න, ඒත්..." කියලා කථාවකට එනවා. "අපි කිව්වේ නැහැ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නවත්වන්න කියලා" තමයි දැන් කියන්නේ. දැන් එතැනට පල්ලම් බැහැලා තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් උද්ඝෝෂණ කරන්න, පෙළපාළි යන්න, රැලි තියන්න, දෙමව්පියෝ අවුස්සන්න සැලසුම් හදලා තිබුණේ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට විරුද්ධ වෙලා, ඒක මතවාදයක් විධියට ජනතාව අතරට අරගෙන ගිහිල්ලා, ජනතාවගේ හිත දිනා ගෙන ඒ ඔස්සේ බලයට එන්න තමයි ඒ අය සැලසුම් හදලා තිබුණේ. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් පස්ස බිම ඇනගෙන ඉන්නේ. අද තමයි ඇත්තටම රටේ ජනතාව දැන ගන්නේ මේ මොකක්ද කරන්න ආවේ කියලා. එම නිසා ඒ ගැන වැඩිය කථා කරන්න එන්න එපා.

ඊළඟට, විශ්වාස භංග යෝජනාව ගනිමු. මේ අය මුලින්ම විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න හැදුවා, අපේ ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාට එරෙහිව. ඒ ගැන ඔබතුමන්ලාට මතකයි නේ. ඊට පසුව කථානායකතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න හැදුවා. පසුගිය දවස්වල කිව්වා, බාල බෙහෙත් ගෙනාවා, එම නිසා සෞඛ්‍ය ඇමති නලින්ද ජයතිස්ස මහතාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න ඕනෑය කියලා. දැන් අගමැතිතුමියට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න ඕනෑය කියනවා. අනේ, විශ්වාස භංග යෝජනා ගේන්න. හතරවැනි විශ්වාස භංග යෝජනාවවත් ගේන්න. අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ වනකොට අවුරුද්දකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. අපට පාර්ලිමේන්තු අත්දැකීම් නැහැ. ඒ නිසා විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්නේ කොහොමද කියලා අපේ පාර්ලිමේන්තු ජීවිතයේදීත් අපි දැක ගන්න කැමැතියි. ඒ නිසා විශ්වාස භංග යෝජනාවක් ගේන්න. ඒකට පස්ස ගහන්න එපා.

අගමැතිතුමිය ලෝක ආර්ථික සමුළුවට සහභාගි වෙන්නයි ගියේ. එතුමිය ඒ සමුළුවට නොයා ඉන්නද කියාත් ඇහුවා. නමුත්, ජනාධිපතිතුමා සහ කැබිනට් මණ්ඩලයෙන් කිව්වා, නැහැ, ඒ සමුළුවට ඔබතුමිය යන්න ඕනෑ කියලා. හැබැයි, විශ්වාස භංග යෝජනාව ගෙනාවොත් එතුමිය ඒ වැඩකටයුතු නවත්වලා එනවා. ආණ්ඩුවෙන් දැන් විශ්වාස භංග යෝජනාවට දින දෙන්න හදනවා. නමුත්, මෙතුමන්ලා එපා කියනවා. ලබන සතියේ පාර්ලිමේන්තු රැස්වීම් පවත්වන්නේ නැහැ. ඊළඟ පාර්ලිමේන්තු සතියේ නිදහස් දිනය යෙදෙනවා. ඒ නිසා එදාටත් නිවාඩු. එම නිසා කාලය සීමිතයි. මොකක්ද, මේ කරන්න හදන්නේ? මේගොල්ලන් කල්මරනවා. අගමැතිතුමිය නැහැ නේ, එතුමියගේ මුහුණ බලාගෙන කියන්න ඕනෑ, ඒ හින්දා එතුමිය නැතුව විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න බැහැ කියලා කල් මරනවා. ඒක තමයි, න්‍යාය. අපට ඒවා හොඳට තේරෙනවා. ඔයගොල්ලන් හැරෙනකොට අපට තේරෙනවා, මොකක්ද මේ වෙන්න යන්නේ කියලා.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් මේ කට්ටිය මොකක්ද කියන්න පටන් ගත්තේ? සමලිංගික නැමියාව. ඒ සඳහා උදාහරණ වශයෙන් ගෙනෙන්නේ 6 ශ්‍රේණිය පුරවැසි අධ්‍යාපන මොඩියුලයේ තිබෙන පිට කවරයේ පාට ටික. ඒ පාට ටික ගැන කියනවා. Web link එකක කථාවක් ගැනත් කියනවා. සමලිංගික නැමියාවට පාවිච්චි කරන ඒ පාට සහිත පිට කවරය නිර්මාණය කරලා තිබෙන්නේ ඒකේ එක කොටසක් විධියටයි කියනවා. ඒ වාගේම එම පිට කවරයේ දේදුන්නේ පාට තිබෙනවාය කියනවා. දැන් අපේ දරුවෝ දේදුන්න ගැන කවි කියන්න ඕනෑ නැද්ද? දේදුන්න සහිත චිත්‍ර පාට කරන්න ඕනෑ නැද්ද? දේදුන්න සහිත චිත්‍ර අඳින්න ඕනෑ නැද්ද? අපේ කිරි අම්මලා, දරුවෝ බලා ගන්න අය දේදුන්න ගැන දරුවන්ට කතන්දර කියන්න ඕනෑ නැද්ද? මේ පොත්වල පිට කවරවලට, ඒවායේ තිබෙන චිත්‍රවලට; රූපවලට කහ පාට, නිල් පාට කියන පාට පාවිච්චි කරන්න ඕනෑ නැද්ද? මම ළඟ print කරපු modules ගණනාවක් තිබෙනවා. මේ module එකේ පිට කවරයෙන් පෙන්වන කථාව මොකක්ද? ඊළඟ module එකේ පිට කවරයෙන් පෙන්වන කථාව මොකක්ද? මේ ආදී වශයෙන් modules සිය ගණනක් තිබෙනවා. මේ ඔක්කෝම modules ටික පැත්තකට දාලා එක පිට කවරයක තිබෙන කහ පාට, නිල් පාට, කොළ පාට ඉස්මතු කරලා කියනවා, මේ තිබෙන්නේ දේදුන්නේ පාට, මෙන්න සමලිංගිකයි කියලා. මේ අය ඒක තමයි කරන්නේ. මේ අය ඒවායෙන් අධ්‍යාපනය සම්බන්ධයෙන් දෙමව්පියන් තුළ තිබෙන බොහොම සංවේදී තැන් අවුස්සනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සාහසික ප්‍රහාරයක් එල්ල කරනවා. දරුවන්ගේ මනසේ චිත්‍ර අඳිනවා, අපිව නැති කරන්න තමයි ආණ්ඩුව හදන්නේ කියලා. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නිසා අපේ දරුවෝ යැව්වොත් ඉවරයි කියලා දෙමව්පියන් තුළ දෙගිඩියාවක්, විචිකිච්ඡාවක් නිර්මාණය කරනවා. ඒක තමයි මේ කරන්න හදන්නේ. ඒක කරන්න එපා. ඔබතුමන්ලාගේ අරමුණ අපට හොඳට තේරෙනවා. දැන් මෙතැන උඩ පැනගෙන කථා කළා විගණන වාර්තාවක් ගැන. ඒ කථාව ඇතුළේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් තිබුණු සාධනීය

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

විවේචනය මොකක්ද කියලා මට කියන්න. හරි සිද්ධිමය විවේචනයක් තිබෙනවාද? මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පැත්තෙන් විද්‍යාත්මක විවේචනයක් එතැන තිබෙනවාද? මොනවා හෝ කතන්දර ටිකක් කියනවා.

විරුද්ධ පාර්ශ්වය පැත්තේ පක්ෂ කිහිපයක හොඳම කථාකාරයෝ ටිකක් ඉන්නවානේ. ඒ කට්ටියට බොරුවක් කියන්න පුළුවන් සමාජය හෙල්ලෙන්න. ඒ කට්ටියට ඕනෑම දෙයක් ඇත්ත වාගේ අවධාරණය කරන්න පුළුවන්. හරි කථාකාරයෝ! ඒවා ගෙනැල්ලා තමයි මේ සභාවට ඔබන්නේ. ඒවා ගෙනැල්ලා සමාජය හෙල්ලෙන්න, දෙමව්පියන්නේ මොළ හෙල්ලෙන්න කියනවා, "අම්මෝ! මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට දරුවෝ නම් එවන්න එපා" කියලා. එතැන තමයි දැන් තෝරාගෙන තිබෙන්නේ. නැහැ, අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනැල්ලා තිබෙන්නේ නිකම් ආවට ගියාට නොවෙයි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් පසුගිය අවුරුදු 20, 30 ඇතුළත අපේ සමාජය කථා කරලා තිබෙනවා. ඔබතුමන්ලාටත් කියන්න සිද්ධවෙලා තිබෙනවා, "අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අපි විරුද්ධ නැහැ" කියලා. ඒ කියන්නේ, මේ සමාජය තුළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් කථාවක් තිබෙනවා, සාකච්ඡාවක් තිබෙනවා, බලාපොරොත්තුවක් තිබෙනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඕනෑ. විභාග පාදක, කට පාඩම් කරලා විභාගවලට මුහුණ දෙන මේ තිබෙන අධ්‍යාපන ක්‍රමය ඇතුළේ තිබෙන්නේ, දක්ෂතා තිබෙන කිහිප දෙනෙක් විතරක් තෝරාගෙන කටයුතු කරන ක්‍රමයක්. ළමයින්ගේ සැබෑ දක්ෂතා, කුසලතා, විභවතා හඳුනාගෙන හැමෝගේම දක්ෂතා එළියට ගන්න පුළුවන් අධ්‍යාපන ක්‍රමයක් නොවෙයි තිබෙන්නේ. මේ අධ්‍යාපන ක්‍රමය මඟින් දක්ෂතා සීමිත ප්‍රමාණයක් පමණයි හඳුනා ගන්නේ. එක් විභාගයකින් තෝරා ගන්න වෙන්නේ සීමිත කුසලතාවක් සහිත දරුවන් පමණයි. ඒ නිසා මේ අධ්‍යාපන ක්‍රමය විභාග පාදක වෙලා තිබෙනවා, විභාග තරගයක් ඇවිල්ලා තිබෙනවා. ඒ හින්දා දරුවන් මත විශාල විභාග පීඩනයක් පැටවිලා තිබෙනවා. මේකෙන් දරුවෝ හෙම්බත් වෙලා ඉන්නේ.

6 වසරේ දරුවෝ ගත්තාම, ඒ කට්ටිය 5 වසරේ ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දීලා, විභාගවලින් හෙම්බත් වෙලා, ලොකු බලාපොරොත්තුවක් තබාගෙන සිටියා 6 වසරට ගියාම අපට විභාග නැහැ, අපට නිදහසේ ඉගෙන ගන්න පුළුවන් කියලා. ඒ නිසා දෙමව්පියෝත් බලාපොරොත්තුවක් තබාගෙන සිටියා. මොකද, 5 වසර ශිෂ්‍යත්වයට පන්ති යවලා, past papers ලියවලා, ලියවලා, එපාවෙලා, හෙම්බත් වෙලා සිටියේ. ඒ නිසා දෙමව්පියෝත් බලාපොරොත්තුවෙන් ඉන්නවා, 6 වසරේදී තමන්ගේ ළමයින්ට ඒ නිදහස හම්බවෙයි කියලා. ඒක තමයි මේ කට්ටිය විනාශ කළේ. ඒ බලාපොරොත්තුවට තමයි මේ කට්ටිය ෂොට් එක දුන්නේ. එතැන තමයි සංවේදී තැන. මේ විපක්ෂය එතැන තමයි තෝරන්නේ. එහෙම නැතුව මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් සාධනීය, විද්‍යාත්මක විවේචනයක්, කරුණු දැක්වීමක් කොහේවත් නැහැ. එම නිසා මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් එවැනි අපරාධයක් කරන්න එපා කියන ඉල්ලීම මම කරන්න කැමැතියි.

ඊළඟට, දෙමව්පියන් කරන උද්ඝෝෂණ කරවන්නේ ජාතික ජන බලවේගයේ අපියි කියලා කියනවා. එක අතකින් අපි සතුටු වෙනවා, 6 වසරට යන්න සිටින දරුවන්ගේ දෙමව්පියන්ගෙන් බහුතරයක් ජාතික ජන බලවේගයට සම්බන්ධයි නම්. ඒක හොඳයි. හැබැයි, දැන් තැන තැන නැඟෙන විරෝධතාවලින් කියන්නේ; දෙමව්පියෝ ඒ විරෝධතාවලින් කියන්නේ මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්න කියන එකයි. ඒවා දෙමව්පියෝ විසින්ම ස්වේච්ඡාවෙන්ම හදා ගත් ඒවා හැරෙන්න, සැලසුම් සකස් කරලා ක්‍රියාත්මක කරන ඒවා නොවෙයි. හැබැයි, ඔබතුමන්ලා කරපු ඒවා? උපවාසයට වාඩි වුණාම එතැන සිටින 10දෙනා, 15දෙනා ගැනම අපි දන්නවා. එතැන ඉන්නේ කවුද කියලා ඔවුන්ගේ මුහුණුවලින්ම අපි දන්නවා. මාලිගාවල වැටිලා හිටපු, ඒ තැන්වලටම වෙලා හිටපු, අන්තේවාසිකයෝ වගේ හිටපු කට්ටිය තමයි එතැන සිටියේ. ඔවුන් වීරයෝ වාගේ කෑ ගහනවා. ඒ කට්ටියගේ උද්ඝෝෂණවලට ගෙනාපු කට්ටිය කවුද කියලා අපි දන්නවා. ඒ නිසා දෙමව්පියන්ගේ ඇත්ත වුවමනාවලට, ඔවුන්ගේ බලාපොරොත්තුවලට පහර දෙන්න එපා. අධ්‍යාපනය සම්බන්ධයෙන් තිබෙන සංවේදීම කාරණාවලට පහර දෙන්න එපා. දරුවන්ගේ සහ දෙමව්පියන්ගේ බලාපොරොත්තු සුණු විසුණු කරන්න එපා. අපි මෙතැනින්වත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ආරම්භ කරලා අපේ අධ්‍යාපන ක්‍රියාවලිය වෙනස් කරන්න ඕනෑ. මේ තිබෙන ක්‍රමවේදය වෙනස් කරන්න ඕනෑ. ලෝකයේ දියුණුතම රටක් බවට පත් වෙන්න නම්, මේ වෙනස තුළින් අපි ඉස්සරහට යන්න ඕනෑ. අපි මෙය මූලික මට්ටමින් ආරම්භ කරලා තිබෙන්නේ. තව බොහෝ දුරක් යන්න තිබෙනවා. යටිතල පහසුකම් දියුණු කරමින්, මානව සම්පත දියුණු කරමින් ඉස්සරහට යන්න තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබේ සහයෝගය දෙන්න කියලා අපි ඉල්ලන්න කැමැතියි. ඒ නිසා මේ විනාශය කරන්න එපා. දෙමව්පියෝ, දරුවෝ ලොකු බලාපොරොත්තුවක් තබාගෙන ඉන්නේ. අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන දන්නා විද්වතුන් ලොකු බලාපොරොත්තුවක් තබාගෙන ඉන්නේ. ඔවුන් කාලයක් තිස්සේ යෝජනා කරපු එක, රටේ ජනතාව කාලයක් තිස්සේ බලාපොරොත්තු වෙච්ච දේ සම්බන්ධ ක්‍රියාවලිය දැන් කරලා තිබෙන්නේ. මේක අපේ ආණ්ඩුවක් ඇතුළෙත් ආරම්භ කරන්න බැරි වුණොත්, මේ වෙලාවෙත් ආරම්භ කරන්න බැරි වුණොත්, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රටට නැති වෙනවා, මේ වෙනස කරන්න බැරි වෙනවා කියන සැකය, කනස්සල්ල ගොඩක් දෙනෙකුට තිබෙනවා. ඒ නිසා තමයි ඔවුන් පාරට බැහැලා ඉන්නේ. ඒ නිසා සාකච්ඡාව හොඳයි. ඒ සාකච්ඡාව ඇතුළත අපි තව තවත් ජනතාව දැනුවත් කරන්න ලැහැස්තියි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කියන්නේ මොනවාද, අපි කරන්නේ මොනවාද කියන එක සම්බන්ධයෙන්. අද විවාදයත් ඒ සඳහා ඉවහල් වෙයි කියන කාරණාව මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඊළඟට, ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA took the Chair.*

[අ.භා. 2.54]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ ඉතාම වැදගත් සාකච්ඡාවක් සිද්ධ වෙන ඓතිහාසික දවසක් අද. හේතුව, 1982 ජනවාරි 21වැනි දා තමයි ධවල පත්‍රිකාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. මට ඉදිරියෙන් ඉන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ රටේ විශාලතම අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට එරෙහිව මිනිස්සු මරලා, ළමයින්ව පාරට ඇදලා, මේ රටේ සමස්ත විනාශයම ආරම්භ කරපු දවස. ඒ, මීට අවුරුදු 44කට කලින්. අද රැව් පිළිරැව් දෙනවා, මෙතන dance දාන ගමන්. අවුරුදු 44කට කලින් මේ රටට කරන්න පුළුවන් බරපතළම විනාශය අවියෙන්, මතවාදයෙන් සිදු කළා. ලෝකයත් එක්ක එකතු වෙන්න තිබුණු ඉංග්‍රීසි අධ්‍යාපනය මත පදනම්ව මේ රටේ අධ්‍යාපනයට ගෙනෙන්න තිබුණු ඒ ඓතිහාසික වැඩමුළුව කඩාකප්පල් කරපු, ජාති ජාතිත් හෙණ ගහන ඒ කාලකණ්ණි අපරාධය කරපු අය අද අපිට ඇවිත් කියනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල වටිනාකම් පිළිබඳව. ඒක තමයි මෙතැන තිබෙන ලස්සනම කථාව. අද ඓතිහාසික දිනයක්. අවුරුදු 44ක් කියන්නේ මම ඉපදිලා නැහැ. එදා ඒක වුණා නම් මම අධ්‍යාපනය ලබන්නෙත්, මගේ දරුවෝ අධ්‍යාපනය ලබන්නෙත් එදා අධ්‍යාපන ප්‍රතිසංස්කරණය යටතේ කියලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දැනගත යුතුයි, ඩිජිටල් ත්‍රස්තවාදීන් ද ඇතුළත්ව.

මගේ සර් අද මේ ගරු සභාවේ ඉන්නවා. එතුමාගේ කථාවත් මම අහගෙන හිටියා. ඔව්, ඔබතුමා කියපු කථාවලටත් කරුණු ටිකක් කියන්න තිබෙනවා. හේතුව, ඔබතුමා staff එකේ නොහිටියා නම්, අද ජනාධිපති, ජනාධිපති ධුරයට යන්නේත් නැහැ. ඔබගේ උදවු ටික ගැනත් අපි දන්නවා. ඒකත් හොඳට මතක තියාගන්න, සර්. මම සර්ගෙන් උදවු ඉල්ලුවේ නැහැ. නමුත් ඔබතුමාගේ උදවු බොහොමයක් ජනාධිපතිතුමාට අධ්‍යාපන කාලසීමාවේදී සහායක් ලෙස ලැබුණා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම නමක් කිව්වේ නැහැ. සර් හින්දා අවස්ථාව දෙන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නම කිව්වේ නැහැ.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
නමක් කිව්වේ නැහැ. සර් හින්දා දෙන්න.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ව්‍යාංගයෙන් යමක් කිව්වා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
එහෙම ගන්න බැහැ සර් මේක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නමක් ප්‍රකාශ කළේ නැහැ. ගරු මන්ත්‍රීතුමා කථාව කරගෙන යන්න.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
එහෙම ගන්න බැහැ, සර්. හරි, මෙහෙමයි. මම ඒ කාරණාව කියන්නම්. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මේ ඔබතුමාගේ කාලය.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
බොහොම ස්තූතියි. මට ඉතාම වැදගත් කරුණු ටිකක් කියන්න තිබෙනවා. සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් බලාපොරොත්තු වෙනවාය කිව්වා. සිහිබුද්ධිමත් පුරවැසියෙක් නිර්මාණය කරන්න ඕනෑ කිව්වා. ඇත්ත. සිහිබුද්ධිමත් පුරවැසියන් ඉන්නවා නම් බලය දෙනවා යැ, නේද? සිහිබුද්ධිමත් පුරවැසියන් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් හදන්න ඕනෑ තමයි. කථාව හරි. ඔබතුමා කියපු එක ඇත්ත, සර්.

ඊළඟ එක, ජාතික සමඟිය, ශ්‍රී ලාංකීය පුරවැසියා හදන්න ඕනෑ කිව්වා. ජාතික සමඟිය, ශ්‍රී ලාංකීය පුරවැසියා හදන්න; ඉතිහාසය විෂය අනිවාර්ය නොකර කරන විධිය කියන්න ඕනෑ. හේතුව, විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි හැරුණුකොට ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම්, ඊට අමතරව සියලු ආගම්වල අය හදාරන එකම විෂය ඉතිහාසය විෂයයි. ඉතිහාසය විෂය මඟින් තමයි රටක පුරවැසියාට

[ගරු අමිල ප්‍රසාද් මහතා]

රට පිළිබඳ හැඟීම එන්නේ. ඉතිහාසය විෂයෙන් තමයි අපි ශ්‍රී ලාංකිකයෝ කියන හැඟීම එන්නේ. ඉතිහාසය විෂය අනිවාර්ය නොකර මේ ප්‍රතිසංස්කරණය හරහා මේක කරන්නේ කොහොමද කියන එක ආණ්ඩුව පැහැදිලි කරන්න වුවමනායි.

ඊළඟට ජාතික සමඟියෙන් පස්සේ තව කාරණා කියනවා. මේකට අග්‍රාමාත්‍ය ධුරය දරන පුද්ගලයා සම්බන්ධ කථාවක් නැහැ. අග්‍රාමාත්‍ය ධුරය දරන පුද්ගලයා සම්බන්ධයෙන් කිසිදු ප්‍රශ්නයක් නැහැ. ඇත්තටම අපි අගය කරනවා. මේ වෙලාවේ වෙන රටකට ගිහිල්ලා රාජ්‍ය තාන්ත්‍රිකව හැසිරීම අග්‍රාමාත්‍ය ධුරය දරන කෙනා පිළිබඳ අපට වටිනාකමක් පෙන්නුම් කරනවා. මෙතැන තිබෙන්නේ අධ්‍යාපන ඇමති ධුරය පිළිබඳ ප්‍රශ්නයක්. එහෙම නැතිව කාන්තා, පිරිමි මොකක්වත් නැහැ. අපට පුළුවන්, අග්‍රාමාත්‍යතුමිය වෙන රටකට ගිහිල්ලා මේ රට නියෝජනය කිරීම අගය කරන්න. මේ ආණ්ඩුවේ අගමැතිතුමිය හැර වෙන කවුරු ගියත් ඔය රාජ්‍ය තාන්ත්‍රික ගෞරවය මේ රටට ගන්න බැහැ. ගිය කවුද ගෙනාවේ, එහෙම ගෞරවයක්? කාටද ගේන්න පුළුවන් වුණේ? ඒ නිසා අපි රටවැසියන් විධියට අග්‍රාමාත්‍ය ධුරය දරන පුද්ගලයා, එහෙම නැත්නම් අග්‍රාමාත්‍යතුමියව වර්ණනා කරමින් අගය කරනවා, රට වෙනුවෙන් වැදගත් මනුස්සයෙක් ලෙස කටයුතු කිරීම පිළිබඳව. පසුගිය අවුරුදු එකහමාරට ආණ්ඩුවේ වෙනත් කිසිම කෙනෙකුට බැරි වුණා, ඔය මට්ටමට රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් හැසිරෙන්න. හැබැයි, අග්‍රාමාත්‍ය ධුරය දරන පුද්ගලයාගේ අධ්‍යාපන ඇමති ධුරය පිළිබඳ ප්‍රශ්නයක් තමයි මෙතැන සාකච්ඡාවට ගැනෙන්නේ. ඒක තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය.

ඊළඟට, ආණ්ඩුවේ අය සැරින් සැරේ කියපු කාරණාවලට උත්තර ටිකක් දෙන්නත් තිබෙනවා. වසන්ත සමරසිංහ ඇමතිවරයා කිව්වා, ධර්ම චක්‍රය ගැන මොකක්දෝ කථාවක්. මා අහන්නේ මේ සභා ගර්භයේ තිබෙන අර රාජ්‍ය ලාංඡනයේ උඩ කොටසේ මොකක්ද තිබෙන්නේ කියලායි. මේ සභාවේ ඉන්න කට්ටිය පුළුවන් නම් කියන්න, මේ රාජ්‍ය ලාංඡනයේ ඉහළින් තිබෙන රවුමේ මොකක්ද තිබෙන්නේ කියලා. මේකට නොවෙයිද, "ධර්ම චක්‍රය" කියන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මේක වැරදි නම් ගලවලා අයින් කරන්න කියන්න.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මේක වැරදි නම් ගලවලා ඔබතුමන්ලාගේ අර පොතේ තිබෙන එක දාන්න කියලාද අපට දැන් මේ කියන්නේ? අපට කියනවා, කරුණු අධ්‍යයනය කරලා එන්න ලු. විපක්ෂ නායක බොරු කියනවා ලු. කරුණු අධ්‍යයනය කරන්න දෙයක් තිබෙනවා යැ, මේ රාජ්‍ය ලාංඡනයේ තිබෙන්නේ ධර්ම චක්‍රය නේ. මේ තිබෙන්නේ මොකක්ද? මේක ධර්ම චක්‍රය නොවෙයි නම්, ඉස්සෙල්ලා මේක ගලවන්න එපා යැ. එතකොට 6 ශ්‍රේණියේ ළමයෙක් පාර්ලිමේන්තුවේ මහජන ගැලරියට ඇවිල්ලා බලලා මේ ධර්ම චක්‍රය පෙන්නලා "මේ මොකක්ද?" කියලා අහවි.

ඊළඟ ප්‍රශ්නය මේකයි. Module system එකේ අඩුපාඩුත් තිබෙනවා. මොනවාද, අඩුපාඩු? ඔන්න ඔය කියපු කාරණාවෙන්ම උදාහරණයක් ගන්න පුළුවන්. ආගම වාගේ විෂයකට මත කිහිපයක් තිබෙනවා. ළමයින් ගිහිල්ලා තැන් තැන්වලින් කරුණු අහගෙන ඇවිල්ලා ඒ ගැන වාර්තා කරද්දී ඒ මත දෙක-තුනටම අදාළ කරුණු එනවා. එතකොට ඒවායෙන් කෝකද, නිවැරැදි වෙන්නේ? ඒ නිසා module system එක සමහර විෂයන්වලට අසාර්ථකයි කියලා පෙන්වන්න මේක හොඳ උදාහරණයක් බවට පත් වෙනවා. හැබැයි, සමහර විෂයන්වලට ඒක හොඳයි. ඒක නරකයි කියලා කියනවා නොවෙයි. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මෙච්චර ඉක්මනට ක්‍රියාත්මක කරන්න යෑමේ උත්සාහයේ ප්‍රශ්නයකුයි තිබෙන්නේ.

අපි කරුණු සොයා බලන කොට පෙනෙන, අධ්‍යාපන අමාත්‍යාංශය පැත්තෙන් තිබෙන ප්‍රශ්නය මොකක්ද? NIE එකයි, අධ්‍යාපන අමාත්‍යාංශයයි ලැහැස්ති වෙලා හිටියේ නැහැ, මේ අවුරුද්දේ මේක කරන්න. මේක කඩිමුඩියේ ආපු එකක්. එහෙම වෙන්න හේතුව මේකයි. ගිය අවුරුද්දේ අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන් දෝෂාරෝපණ එල්ල වුණා, රට පැත්තෙන්. ආපු ගමන් හදිස්සියේ; කඩිමුඩියේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරන්න යෑමේ ප්‍රතිඵලයක්, මෙය. එහෙම නැතුව, කවුරුවත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එපා කියලා කියන්නේ නැහැ. මොකද, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එපා කියලා කියන්න, විපක්ෂය පැත්තේ ජේවීපීකාරයෝ ඉන්නවා යැ? JVP මානසිකත්වයෙන් ඉන්න නියෝජ්‍ය ඇමති කෙනෙක් දැන් කියනවා, මේ රටේ නිදහස් අධ්‍යාපනය රැක ගන්න එතුමන්ලා මාර අරගළයක් කළා කියලා. ඔව්, නිදහස් අධ්‍යාපනය රැක ගන්න කියලා මේ රටට ගෙනෙන්න හදපු යහපත් හැම ප්‍රතිසංස්කරණයක්ම විනාශ කළා. මීරිගම හදන්න ගිය පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට එරෙහිව නලින්ද ජයතිස්ස මහත්මයා පාරවල් දිගේ දිව්වා. මේ රටේ මිනිසුන්ගෙන් මම අහනවා, පෞද්ගලික වෛද්‍ය විද්‍යාලවල ඉගෙන ගන්න වෙනත් රටවලට යන අපේ ළමයින් මෙහේ ඉඳලා ඉගෙන ගත්තා නම් ඒක වරදක්ද කියලා. ඔන්න ඕවා තමයි අධ්‍යාපනය රැක ගන්නවා කියලා ඒගොල්ලන් පෙනී හිටපු ඒවා. දැනුත් මේ ප්‍රශ්නය එතැන තිබෙනවා.

එකදු ප්‍රතිසංස්කරණයක් වෙනුවෙන්වත් ඉදිරිපත් වෙන්න නොදුන්නු කණ්ඩායමක් බලයට ඇවිල්ලා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන අපට වර්ණනාවන් කරනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කියන්නේ ලොකු වැඩක්. මොකක්ද ඒ ලොකු වැඩේ? ලංකාවේ වත්මන් අධ්‍යාපනය සම්බන්ධයෙන් තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මම කියන්නම්. ලංකාවේ පළමු ශ්‍රේණියට ඇතුළත් වන ළමයින් අතරින් සියයට 15යි, රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් කර ගන්නේ. ඉතිරි සියයට 85ට අවස්ථාවක් නැහැ. පෞද්ගලික විශ්වවිද්‍යාලවලට ඉඩ දෙන්නේත් නැහැ. ත්‍රස්තවාදීන් සියයට 85කට ඒ අවස්ථාව අහිමි කරනවා. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් ඒ සියයට 85 ප්‍රමාණය අඩු කරන්න ගන්නා ක්‍රියාමාර්ග මොනවාද? ඔන්න ඕවා තමයි සාකච්ඡා කරන්න ඕනෑ දේවල්. මොකක්ද, තිබෙන විසඳුම, ඉහතින් කියපු සියයට 15 සියයට 60, 70 දක්වා ඉහළට ගෙන යන්න? ඒ සඳහා ලෑස්තිද? ඒවා තමයි ඇත්ත ප්‍රතිසංස්කරණ.

දෙවැනි ප්‍රශ්නය මෙයයි. ගෝලීයකරණය අද වෙද්දී වෙනස් වෙලා. 1982 ලංකාවේ ඉංග්‍රීසි පමණක් ප්‍රමාණවත් වුණාට දැන් ලෝකයේ බලය ඉන්දියාවට, චීනයට හැරෙනවා; ජපානය දිහාවට මිනිස්සු යන්න පටන් ගන්නවා. ඊශ්‍රායලය එක්ක අපේ ගනුදෙනු වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා ඒ රටවල භාෂා දැනුම මේ රටට අත්‍යවශ්‍යයි. මොකද, තව අවුරුදු 15කින්, 20කින් එන පුරවැසියාට ඉංග්‍රීසි භාෂාවට අමතරව චීන භාෂාව, ඉන්දියානු භාෂා ඇතුළු බොහෝ භාෂා වුවමනා කරනවා. මගේ ප්‍රශ්නය, ඔබතුමන්ලා මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළේ ඒකට විසඳුම් හොයාගෙන තිබෙන්නේ කොහෙන්ද කියන එකයි.

ඊළඟ කාරණාව මෙයයි. මේ වෙලාවේ මේ ප්‍රතිසංස්කරණ අස්සේ කියනවා, තරගකාරිත්වයක් ගැනත්. ඔව්, තරගකාරිත්වයත්

එක්ක බිහි වන දේ තමයි ටියුෂන්. ටියුෂන්වලට විරුද්ධව තැන් තැන්වල ඕනෑම දෙයක් කියන්න පුළුවන්. හැබැයි, ටියුෂන් නවත්වන්න ඕනෑ නම් ලංකාවේ පාසල් පද්ධතියට පහසුකම් වැඩි කරන්න ඕනෑ. එවිට ශිෂ්‍යත්ව විභාගය තරගකාරි විභාගයක් වෙන්නේ නැහැ. කළ යුත්තේ විභාග නවත්වලා තරගය නවත්වන එක නොවෙයි. පහසුකම් ටික දුන්නාම ළමයි ඒ පාසල්වලට යන්න පටන් ගන්නවා. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළේ පාසල්වලට අවශ්‍ය පහසුකම් ප්‍රමාණය ඉහළ නංවන්න ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද?

ඊළඟ ප්‍රශ්නය මෙයයි. විශ්වවිද්‍යාල පද්ධතිය ගැන මම කිව්වා. වැඩිපුර විශ්වවිද්‍යාල තිබෙනවා නම් අ.පො.ස. (උසස් පෙළ) අධ්‍යාපනයට මෙච්චර තරගයක් එන්නේ නැහැ. හැබැයි, ඒ එකක් ගැනවත් කල්පනා කරන්නේ නැතුව අභ්‍යන්තරයේ කුඩා කුඩා වෙනස්කම්වලින් මේක කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මතක තියාගන්න, මේ තරගය අනිවාර්යයෙන් රාජ්‍ය පාසල් පද්ධතියෙන් පෞද්ගලික පාසල් පද්ධතියට යනවා කියන එක. මොකද, පෞද්ගලික පාසල්වල විභාග නැතුවා නොවෙයි නේ. එඩෙක්සල් විභාග තිබෙනවා නේ, කේම්බ්‍රිජ් විභාග තිබෙනවා නේ. ඒ නිසා විභාග බර අඩු කරන්න අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙනවා කියන එකේ ප්‍රතිඵල අම්මලා, තාත්තලා භුක්ති විඳියි. ඒක ඉදිරි කාලයේදී ඔබ ගෙනෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින්ම දකින්න පුළුවන් වේවි.

ඊළඟ එක තමයි, නිදහස් අධ්‍යාපනය විනාශ කරන්න විපක්ෂය කටයුතු කරනවා කියන චෝදනාව. 1990 දශකයේ මුල් කාලයේ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයා අධ්‍යාපනය ලබන දරුවන්ට නිල ඇඳුම් ටික, ඊට අමතරව දිවා ආහාරය ඇතුළු බොහෝ දේවල් ලබා දුන්නා. ඒවා නිදහස් අධ්‍යාපනය විනාශ කරන්න ගත්තු ක්‍රියාමාර්ගද කියලා මම අහන්න කැමැතියි. මේ රටේ අධ්‍යාපනය නිදහස් කරන්න, දරුවන්ට නිදහසේ ඉගෙන ගන්න අවස්ථාව හැදුවේ කවුද? මධ්‍ය මහා විද්‍යාලවලින් ආපු මිනිස්සු තමයි, අපි. ඒ නිසා නිදහස් අධ්‍යාපනය ගැන ඔබේ පාඩම් අපට ඕනෑ නැහැ. රාජ්‍ය විශ්වවිද්‍යාලවල ඉගෙන ගත්තේ අපි. රාජ්‍ය විශ්වවිද්‍යාලවලට අමතරව මධ්‍ය මහා විද්‍යාලවලින් අධ්‍යාපනය ලබපු මිනිස්සු, අපි. ඒ නිසා අපට කාගේවත් ටියුෂන් ඕනෑ නැහැ, නිදහස් අධ්‍යාපනය ගැන. මා අදටත් පෞද්ගලික අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිරත වන නිසා, පෞද්ගලික අධ්‍යාපනයේ වැදගත්කම ගැනත්, නිදහස් අධ්‍යාපනයේ වැදගත්කම ගැනත් මාත් එක්ක කථා කරන්න විවාදයකට එන්න කියලා ඕනෑම කෙනෙකුට අභියෝග කරනවා. ඒ කියන්නේ විනාඩි 5ක, 10ක විවාදයකට නොවෙයි. අපි කථා කරමු, පැය 4ක්, 5ක්. ඒ, කවුරුවත් දිනන්නවත්, කවුරුවත් පරදින්නවත් නොව, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවුරුදු 30කට, 40කට වැදගත් වන හින්දා. ඒ නිසා ඕනෑම කෙනෙක් විවාදයකට එන්න. එච්චරයි කියන්නේ. මම ලෑස්තියි. *[බාධා කිරීම්]* ආ! සර් වුණත් කමක් නැහැ, එන්න. මම ලැහැස්තියි. *[බාධා කිරීම්]* එච්චරයි. *[බාධා කිරීම්]* එච්චරයි. හරි. *[බාධා කිරීම්]* ඒ ගැන පසුව තමයි කථා කරමු කිව්වේ. පසුව කථා කරමු. *[බාධා කිරීම්]* සර් වුණත් කමක් නැහැ, එන්න. *[බාධා කිරීම්]*

ඊළඟ කාරණාව තමයි,- *[බාධා කිරීම්]* සර් සම්බන්ධව කියන්නම්. *[බාධා කිරීම්]* ඊළඟ කාරණය මේකයි. *[බාධා කිරීම්]* ඔව්. මෙතුමා හොඳ එකක් කියනවා. මේ හේවගේ මැතිතුමා කියනවා, ගුත්තිලයි, මුසිලයි කියලා. ඇත්ත. *[බාධා කිරීම්]* ඒක තමයි, අපි හැප්පිලා බලමු, මුසිලද, ගුත්තිලද දක්ෂ කියලා. අපි වෙලාවක හම්බ වෙමු, සර්. හරිද?

ඊළඟ කාරණාව මේකයි. JVP එක පොඩි හින්දා නේ, මිනිස්සු අවුරුදු 60ක්ම ඡන්දය දුන්නේ නැත්තේ. JVP එක පොඩි හින්දා, JVP එක මොකද කළේ? හැදුවා, ලොකු මිනිසුන්ගෙන් NPP කියලා එකක්. ඒක ඇතුළට තමයි හරිනි අමරසූරිය මැතිනිය ඇතුළු අනෙක් ඔක්කෝම ටික ආවේ. බොරු ආචාර්ය පට්ටම්, මහාචාර්ය පට්ටම්- *[බාධා කිරීම්]* සර් ආවේත් එහෙම. නමුත් සර් යටින් ඉඳලා තිබෙන්නේ JVP එකේ. මම පසුව හොයා බැලුවා. සර් මුලින් JVP එකේ ඉඳලා තිබෙන්නේ. හොරා වාගේ ඉඳලා අපි දන්නේ නැති වුණාට. දැන් එළිපිට එනවා NPP වගේ. ඒක වෙනම කථාවක්.

ඊළඟ එක මොකක්ද? මේ ගෙනාපු ආචාර්ය, මහාචාර්යවරුත් දැන් පොඩි වෙලා නේ. ප්‍රධාන ප්‍රශ්නය ඒක නේ. සමහරුන්ට තිබෙන්නේ හොර අධ්‍යාපන සුදුසුකම්. අධ්‍යාපන සුදුසකම්වලින් කට්ටිය ගෙනාවා කියලා, "අපිට තමයි ඔක්කෝම ඉන්නේ. කෙහෙල් ගෙඩිය නැට්ටෙන් ගැලවෙන එක ගැනත් හොයන්න තරම් පර්යේෂණ කරන මිනිස්සු ඉන්නවා" කියපු ආණ්ඩුවේ ලොකු මිනිස්සු ටික දැන් පොඩි පොඩි මිනිසුන් බවට පත් වෙලා නේ. ඒක නේ ප්‍රධාන ප්‍රශ්නය. 6 වසර පොත පිළිවෙළට හදා ගන්න බැරුව, ඒ අස්සේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හදන්නයි කථා කරන්නේ. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදනවා නම් කල්තියා අපට දන්වන්න කියලා. පිටුවෙන් පිටුව අපට එවන්න. හේතුව, පිටුවෙන් පිටුව සාකච්ඡා කරන්න වෙනවා, ඔබ හදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල.

ඊළඟ කාරණාව තමයි, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණත් එක්ක එන ඊළඟ ප්‍රශ්නය. ඒ ගුරු මාර්ගෝපදේශනයන් පිළිබඳවයි. ගුරුවරු කාලයක් තිස්සේ කියනවා, පෙළපොත් හිඟය පිළිබඳ ප්‍රශ්නය ගැන. ඒ මදිවාට දැන් 6 වසර පෙළපොත් කට්ටල දෙකක් පිට වෙලා තිබෙනවා. ඒ වාගේම, ගුරුවරුන්ට අවශ්‍ය කරන පුහුණුවීම් නැහැ; විද්‍යා විෂය ධාරාව හදාරන්න තිබෙන පාසල් ප්‍රමාණවත් නැහැ. නිදහස් අධ්‍යාපනය විධිමත් අධ්‍යාපනයක් කරන්න ඕනෑ නම්, එම ප්‍රතිසංස්කරණවලට අනිවාර්යයෙන්ම ප්‍රමුඛතාව ලබා දිය යුතුයි. ගුරුවරුන්ට තිබෙන විශේෂිතම උපාධිය අධ්‍යාපනවේදී උපාධියයි. අධ්‍යාපනවේදී උපාධිය සම්බන්ධයෙන්, පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධයෙන් බරපතළ ගැටලු නිර්මාණය වෙලා තිබෙනවා. විද්‍යාවේදී උපාධිය සම්බන්ධයෙන් ඒගොල්ලන් ගන්නා ක්‍රියාමාර්ගය පිළිබඳව කඹ ඇදිල්ලක් ඇති වෙලා තිබෙනවා. මේවා තමයි අධ්‍යාපනය ඇතුළේ තිබෙන අභ්‍යන්තර අර්බුද.

ඊළඟ ප්‍රශ්නය මේකයි. සාමාන්‍ය පෙළ විභාගය අවසන් වෙලා මාස ගණනක් යනවා, උසස් පෙළ අධ්‍යයන කටයුතු පටන් ගන්න. උසස් පෙළ විභාගය ඉවර වෙලා මාස ගණනක් යනවා එහි results එන්න. Results ඇවිල්ලා මාස ගණනක් යනවා, විශ්වවිද්‍යාලයට යන්න. ළමයෙකු ප්‍රථම උපාධිය කොයි වයසින් සම්පූර්ණ කරනවාද කියන එක ගැන තීරණයක් ගන්න ඕනෑ, රටක් විධියට. හේතුව, ලෝකයේ හැම රටක්ම අධ්‍යාපනයට වෙන් කරන කාලය අඩු කරද්දී අපි මැද්දේ සෑහෙන කාලයක් නාස්ති කරනවා. මෙන්න මේවා ගැන අවධානය යොමු කරන්න ඕනෑ. මේවා ගැන මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල කොහේද තිබෙන්නේ?

ඊළඟ ප්‍රශ්නය තමයි, විදේශීය විශ්වවිද්‍යාලවලට යන්න පුළුවන් වන විධියට අපේ දරුවන්ට ප්‍රතිඵල ලබා දීම නිසියාකාරයට සිද්ධ වෙනවාද කියන එක. මෙන්න, ඇත්ත ප්‍රතිසංස්කරණ අස්සේ සාකච්ඡාවට ගත යුතු දේවල් ටික.

ඊළඟ කාරණය තමයි, විභාග ක්‍රමයේ වැදගත්කම. විභාග ක්‍රමය අවශ්‍ය නැහැ කියලා හිතනවා, AI යුගයට කලින්. දැන් කවුරුත් දැන ගන්න ඕනෑ දෙයක් තිබෙනවා. ඒ තමයි module system එකට ලකුණු ලබා දෙන කොට අර්බුදයක් ඇති වෙනවා කියන එක. ඒ අර්බුදය මේකයි. Homework දුන්නාම, විභාගයේ ලකුණ ලැබෙන්නේ ඒකට නම්, ඒ ප්‍රශ්නය අන්තර්ජාලයට යොමු කරලා උත්තරය අරගෙන ලියන්න පුළුවන්. ගුරුවරුන් මුහුණ

[ගරු අමිල ප්‍රසාද් මහතා]

පාන ප්‍රශ්නය ඕකයි. 1980ට මේක ගැළපෙනවා. අද අර්බුදයක් තිබෙනවා. විභාග පවත්වන්නේ නැතුව -විභාග ක්‍රමය නැතුව- ගෙදර වැඩ ටික දීපු ගමන් ළමයා මොකද කරන්නේ? ප්‍රශ්නය ගත්තා; අන්තර් ජාලයට දැම්මා; උත්තරය ගත්තා. අන්තිමට ඒ ප්‍රතිඵලවලින් තෝරා ගැනීම් කළාම දක්ෂයා බිහි වෙන්නේ නැහැ. ඇත්ත තමයි, මේ කාල සීමාව තුළ මේ අධ්‍යාපන ක්‍රමය තුළ අදක්ෂයන් බිහි වුණා තමයි. හැබැයි, දක්ෂයෝත් බිහි වුණා. නමුත් මේ නව ක්‍රමය හරහා දක්ෂයන් බිහි වීම සම්බන්ධයෙන් අර්බුදයක් මතු වෙනවා. හේතුව, හැමෝම මේ ලේසි ක්‍රමය හොයා ගන්න දරන උත්සාහය නිසා අවසානයේදී දරු දැරියන් දක්ෂතාවෙන් ඉහළට ඒම වෙනුවට පහසුවෙන් උත්තර සොයන්න යාමේ ප්‍රතිඵලයක් ලෙස බරපතළ අධ්‍යාපනික අර්බුදයකට යන්න ඉඩ තිබෙනවා. මේක අලුත් යුගයක කරන ප්‍රතිසංස්කරණයක්. ඔබ ආණ්ඩුවක් ලෙස ඉදිරිපත් වුණාට, මේ ප්‍රතිසංස්කරණ කරන්නේ නිලධාරින් නේ. ඒ නිසා නිලධාරින්ගෙන් මේ ප්‍රශ්නවලට උත්තර ඕනෑ. ඔබෙන් උත්තර ගන්න බැහැ. ඔබ මොන උත්තර දෙන්නද? පාරවල් ගණනේ රස්තියාදු වෙවී හිටපු මිනිස්සු උත්තර දෙන්න දන්නවාද, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන? හැම අධ්‍යාපන ප්‍රතිසංස්කරණයකටම විරුද්ධ වෙච්ච මිනිස්සු ඒවායේ තිබෙන හොඳ ගැන කවදාවත් කථා කරලා තිබෙනවාද? නිලධාරින්ගෙන් අහන්න, මේ ප්‍රශ්නවලට මොනවාද තිබෙන උත්තර කියලා.

ශිෂ්‍යත්ව විභාගය අරගෙන බලන්න. දැන් ශිෂ්‍යත්ව විභාගය අහෝසි කරනවා නම්, ඒ සඳහා ගන්නා විකල්ප ක්‍රියාමාර්ගය මොකක්ද? මොකද, අපි ශිෂ්‍යත්ව විභාගය සමත් වෙලා මධ්‍ය මහා විද්‍යාලවලට ගිය මිනිස්සු; අදටත් අපේ දරුවොත් ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් කරවන්න බලාපොරොත්තුවෙන් ඉන්න මිනිස්සු. ඊළඟ ප්‍රශ්නය මොකක්ද? ශිෂ්‍යත්ව විභාගය වෙනුවට ගුරුවරයා පාදක කරගෙන ලකුණු ලබා දීමේ ක්‍රමයකට ගියොත්, එතැනදී ඇති වන අර්බුදවලට උත්තර කොහෙන්ද හොයා ගන්නේ? සමහර තැන්වල ගුරුවරු තමන් කැමති කෙනාට වැඩිපුර ලකුණු ලබා දෙනවා. සමහර අය දක්ෂයා අමතක කරලා දමනවා. මේ වාගේ ප්‍රශ්නත් මේක ඇතුළේ තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, අධ්‍යාපන ඇමති ධුරය දරන මනුස්සයා සම්බන්ධයෙන්ම කියන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
තමන්ගේ විශ්වවිද්‍යාලයේ විපක්ෂ නායකවරයා ඉගෙන ගනිද්දී, රටේම මිනිස්සුයි, මේ ආණ්ඩුවේ මිනිස්සුයි එතුමා GCE O/L ෆේල් කියලා කියද්දී කියන්න බැරි වුණා නේ, තමන්ගේ ශිෂ්‍යයා O/L pass කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. කාලය අවසානයි.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
එහෙව් ගුරුවරු ඉන්න රටක තමයි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්න යන්නේ.

ඉතාම වැදගත් කාරණාවක් සඳහන් කරලා මම කථාව අවසන් කරනවා. මට ඒකට බොහොම පොඩි වෙලාවක් දෙන්න.

1943 නිදහස් අධ්‍යාපන පනත ගෙනාපු වෙලාවේ සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහත්මයා කිව්වා, "ගඩොලින් තනා තිබූ රෝමය කිරි ගරුඬින් නිම කළ බවට ඔගස්ටස් අධිරාජයා උදන් ඇනුවේ කෙසේද, කටු කොහොලින් පිරී තිබුණු ලංකාවේ අධ්‍යාපන ක්‍රමය දැයේ දරුවන්ට නොමිලේ දායාද කිරීමෙන් ඔගස්ටස් අධිරාජයාට වාගේම මටත් උදන් අනන්නට තරම් සතුටක් ලැබෙනවා" කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ඒ නිසා මේ ආණ්ඩුවටත් ආඩම්බර වෙන්න පුළුවන්. ඒ මොකටද? නිදහස් අධ්‍යාපනය තුළට අස්වාභාවික කාමය මුසු කිරීමේ අරමුණ ඉෂ්ට වීම කියන කාරණාවට. 6 වසරේ පොතට පොඩි කොටසක් යෑම ආණ්ඩුවට "පොඩි" වෙන්න පුළුවන්. නමුත් ඒ දරුවන් අතරට සහ සමස්ත අධ්‍යාපන පද්ධතිය තුළට සමලිංගිකත්වය පිළිබඳ අදහස ඇතුළු කිරීම සුළුපටු නැහැ. නමුත් ඔබත් ඔබේ කණ්ඩායමත් අනිවාර්යයෙන්ම ඒ වෙනුවෙන් ආඩම්බර වෙනවා ඇති.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ඒ වාගේම, රබර් සෙරෙප්පු දෙක දමාගෙන, උදේට රොටී කෑල්ල කාලා පාසල් යන තඹුත්තේගම ළමයා අතටත් අසභ්‍ය වෙබ් අඩවි-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.10]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන සභාව කල් තබන අවස්ථාවේදී ආණ්ඩු පාර්ශ්වයෙන් ඉදිරිපත් කළ යෝජනාව ගැන තමයි අපි මේ විවාද කරගෙන යන්නේ. පසුගිය සතියේ, ඊට කලින් සතියේ කථා බහට ලක් වුණු දේවල් බැලුවාම අපට හිතුණේ අද දවසේ අපට විශ්වාස භංග යෝජනාවක් ගැන විවාද කරන්න වෙයි කියලායි. නමුත් අගමැතිතුමියට විශ්වාස භංග යෝජනාවක් ගෙන එන්න කථා කළ මෙතුමන්ලා අගමැතිතුමිය ගැන හොඳ කියමින්, ඒ කටයුත්ත පහු කරමින් ඉන්න නිසා ආණ්ඩුව පැත්තෙන් අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල වැරදි, අඩුපාඩු, වෙච්ච දේවල්, වෙන්න තිබුණු දේවල් ගැන, විවේචන සියල්ල ගැන උදේ ඉඳලා සාකච්ඡා වුණා. ඇත්තටම කුලුනු 5ක් මත පදනම්ව තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු වෙන්නේ. එතකොට එයින් එකක් වන 6 ශ්‍රේණියේ විෂය මාලාව වෙනස් කිරීම මේ වසරේ කල් තබා තිබෙනවා. මොකද, එතැන ගැටලු කිහිපයක් මතු වෙලා තිබුණා. ඒ ගැන සාකච්ඡා වුණා. විශේෂයෙන්ම ඉංග්‍රීසි මොඩියුලයේ web link එකක් පළ වීමේ ගැටලුව ගැන සාකච්ඡා වුණා. ඒ සම්බන්ධව කෙරෙන පරීක්ෂණ සියල්ල එක්ක ඒ කටයුත්තට යම් කාලයක් අරගෙන තිබෙනවා. ඒ කියන්නේ, ගැටලුවක් දෙකක් තිබුණා. නමුත් ඒ ගැටලු නිවැරදි කරගෙන යනවා වෙනුවට, ඒ ගැටලුව මත පදනම් වෙලා වෙනත් කථාවක්, හරිම නරක ආකාරයේ පෙළ ගැස්මක් සහිත කථාවක් මෙතුමන්ලා විසින් දිගට ගොඩනැඟීම නිසා යම් ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණය කියන ක්‍රියාවලිය අනිවාර්යයෙන්ම සියලුදෙනාගේ විශ්වාසයෙන් ඉදිරියට යන්න ඕනෑ දෙයක්. ඒක option එකක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. හැම දරුවෙක්ම ඉගෙන ගන්න ඕනෑ. ඒ නිසා සියයට 90ක් පිළිගත්තත්, අනෙක් සියලුදෙනාටත් පිළිගන්න පුළුවන් විධියට සැක සංකා නැති කරලා තමයි මේ ගමන යන්න ඕනෑ. ඒ නිසා ඒකට යම් කාලයක් අරගෙන තිබෙනවා.

මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් පසුගිය සති දෙකේ ඇති වෙච්ච මේ අසභ්‍යකරණයේ සාකච්ඡාව තුළ ඔබතුමියත් මූලාසනයේ ඉන්න වෙලාවේ සමඟි ජන බලවේගයේ හැසිරීම ගැන තමයි මම ඇත්තටම වැඩිපුර අදහස් දක්වන්න බලාපොරොත්තු වෙන්නේ. මොකද, අනෙක් දේවල් ගැන කථා කළ නිසා. විපක්ෂ නායකතුමා උදේ කථා කළා. එතුමා හොඳ තැනකින් කථාව පටන් ගත්තා, සබුද්ධික සාකච්ඡාවකට ඉඩක් ඕනෑය කියලා. සබුද්ධික සාකච්ඡාවකට ඉඩක් ඕනෑ, සබුද්ධික සාකච්ඡාවකට අපි සූදානම් කිව්වා. හැබැයි අද මේ විවාදය අතරේ අපට තේරුණා ඒ සබුද්ධික සාකච්ඡාවේ තරම. මට තේරුණු විධියට සමහර කූඩැල්ලන් මෙට්ටය උඩින් තියන්න කොච්චර උත්සාහ කළත් මෙට්ටය උඩට යන්නේම නැහැ, කොහොම හරි රූටලා බිමට තමයි වැටෙන්නේ. මොකද, නැවත අර කුණුහරුප කථාවලට මේ සාකච්ඡාව ගොනු කරන්න, ලඝු කරන්න විතරමයි ඔවුන්ගේ අවධානය සහ ක්‍රියාකාරිත්වය යන්නේ. ඉන් එහා දෙයක් කරන්න තේරෙන්නේ නැහැ.

ඒ වාගේම හිතන්නකෝ, දැන් මේ කරන විවේචන ගැන. සබුද්ධික සාකච්ඡාවක් ඕනෑය කිව්වාට, සබුද්ධික සාකච්ඡාවක් ගොඩනඟපු විධිය මම කියන්නම්, එකින් එක. මීට මාස කිහිපයකට කලින් ගෙනාපු ප්‍රධාන විවේචනය තමයි ඉතිහාසය සහ සෞන්දර්යය විෂය නිර්දේශය තුළ නැහැ කියන එක. මට මතකයි, මෙතැන ඒක කියලා නැටුවේ නැති එක විතරයි. ඉතිහාසය සහ සෞන්දර්යය නැහැ කියලා මොනවා හෝ කරගනියි කියලා හිතෙන මට්ටමට සමහරු ඇඟලුවා. ඊට පසුව ඒ ගැන පැහැදිලි කරලා, අරගෙන පෙන්නුවා, මෙන්න තිබෙනවා කියලා. ඊට පස්සේ ඒ කථාව ඉවර වුණා. ඊට පස්සේ ඉංග්‍රීසි මොඩියුලයේ web link එක සම්බන්ධ ප්‍රශ්නයක් ආවා. ඒක බරපතළ ප්‍රශ්නයක්. මම දැක්කා කියනවා, ඒක බරපතළ ප්‍රශ්නයක් විධියට භාර ගත්තේ නැහැ කියලා. නැහැ, භාරගත්තා. බරපතළයි කියලා භාරගත්තා. ඒක ලොකු ප්‍රශ්නයක්. මොකද, එහෙම වෙන්න බැහැ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලදී. ඒ නිසා තමයි මේ වන විට ඒ ගැන පරීක්ෂණ තුනක් ක්‍රියාත්මක වෙන්නේ. ඒ අනුව, අභ්‍යන්තර පරීක්ෂණයේ මූලික කටයුතුවලින් අනතුරුව වැඩ තහනම් කිරීම, අනිවාර්ය නිවාඩු යැවීම කරලා තිබෙනවා. ඉදිරියට තවත් පරීක්ෂණවල ප්‍රතිඵල ලැබෙන්න නියමිතව තිබෙනවා. මේ සම්බන්ධයෙන් ඉතාම serious ලෙස කටයුතු කරනවා. මොකද, එහෙම දේවල් වෙන්න බැහැ. ඒ කාරණය සම්බන්ධයෙන් කරන්න තිබෙන්නේ ඒක නේ. ඔබතුමන්ලා මෙතැන සිටියත් කරන්න තිබෙන්නේ ඒක. වැරැද්දක් වුණාට පස්සේ කරන්න තිබෙන්නේ ඒක. එතකොට, ඒ අනුව කටයුතු කරලා තිබෙනවා.

ඊළඟට, එතැනින් කථාව අරගෙන තවත් කථාවක් කියනවා මම දැක්කා. විපක්ෂ නායකතුමා උදේ පැය භාගයක් විතර අරගෙන ධර්ම චක්‍රය ගැන කථා කළා. මේ ධර්ම චක්‍රය නොවෙයි වෙන එකක් දාලා තිබෙන්නේ, ආගම විනාශ කරනවා කියලා කථාවක් කිව්වා. මේ මගේ අතේ තිබෙන්නේ සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලය විසින් 2024.08.29වැනි දා ලබා දීපු නිර්දේශය. රාජකීය පණ්ඩිත හාමුදුරුවන් වහන්සේලා හයනමක් මේ මණ්ඩලයේ මුලසුන දරන්නේ. ඔය පොතේ තිබෙන ධර්ම චක්‍රය තමයි පාවිච්චි කළ යුත්තේ කියන නිර්දේශය නිල වශයෙන් ලබා දීලා තිබෙනවා. එතකොට ඒක තමයි රජයට ලබා දෙන්නේ. ඒ වාගේම, පසුගිය අවුරුදු 10, 20 තුළ සම්බුද්ධත්ව ජයන්තියට ගහපු සමරු කාසි සඳහාත් මේ ලාංඡනය තමයි පාවිච්චි කරලා තිබෙන්නේ. මේ කාරණාවලට අදාළ ලේඛන මම **සභාගත*** කරනවා.

ඒ නිසා ඇත්තටම එතුමාගේ තර්කයට කිසිම පදනමක් නැහැ. යම්කිසි සංකේතයක් ගැන විවාදයක් තිබෙන මොහොතක, හැම තිස්සේම ඒ ආගමික සංස්ථාව විසින් පත් කරන නිල ආයතනයක නිර්දේශය තමයි පිළිගන්න වෙන්නේ. ඒ ගැන සංවාද විවාද හෙටත් ඇති වෙයි, තව අවුරුදු 10කින්, 15කිනුත් ඇති වෙයි. හැබැයි, කිසිම පදනමක් නැතිව උදේම මොකක් හෝ උස්සගෙන එනවා, ඇවිල්ලා අඳිනවා, බිල්ලෙක් හදනවා, භයානකකමක් හදනවා. ඒක තමයි ගොඩනඟපු සබුද්ධික සාකච්ඡාව. දැන් එකින් එක ගන්නවා නේ.

ඊළඟට, එතැනින් එහාට ගිහින්, පොතේ කවරයේ දේදුන්නක් තිබෙනවා කිව්වා. ඒකෙන් ළමයි සමලිංගිකත්වයට හුරුවෙනවා කිව්වා. මම දන්නේ නැහැ ඔබතුමන්ලාගේ මානසිකත්වය එහෙමද දන්නේ නැහැ. මොකද, මම නම් හිතන්නේ නැහැ එහෙම වෙයි කියලා. අපේ කාලයේ පෙළපොත්වල දේදුනු තිබුණේ නැද්ද? ඒ නිසා මේක හරිම නරක විවේචනයක්. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වාගේ දෙයක් පිළිබඳව විවේචන ඉදිරිපත් කරන්න පුළුවන්. මොකද, ඒවායේ අඩුපාඩු තිබෙන්න පුළුවන්. හැබැයි, ඒ ගැන කථා කරන්නේ නැතුව එතුමන්ලා මේ සාකච්ඡාව ලිංගික, අසභ්‍ය, නරක තැනකට ගෙන ගියා. මම දැක්කා, එක් වෙලාවක ඕස්ට්‍රේලියාවේ පෙළපොතක තිබෙන පවුල ගැන කථාවක් අරගෙන සමාජවාදී posts හදාගෙන, පවුල ගැන වැරදි අදහසක් දෙන්න හදනවා කියලා නැවතත් සමලිංගික කථාවක් කිව්වා. පස්සේ තමයි ඒක ඕස්ට්‍රේලියාවේ පොතක් කියලා තොරතුරු එළියට ආවේ.

ඊළඟට, ගරු අගමැතිතුමියට එරෙහිව ඉතාම ද්වේශසහගත ව්‍යාපාතියක් ක්‍රියාත්මක කළා. බලාගෙන ඉන්නවා වාගෙයි සමහරු කියන්නේ. ද්වේශසහගතව, ඉතාම අශිෂ්ට විධියේ ප්‍රහාරයක් ක්‍රියාත්මක කළා. ඒ සම්බන්ධ වචන කිව්වා මේ පාර්ලිමේන්තුවේ. අපි කනගාටු වෙනවා, මූලාසන ගරු මන්ත්‍රීතුමියනි. යම් යම් වචන කිව්වා මේ පාර්ලිමේන්තුවේ. එවැනි වචන කියලා තමයි කථා කළේ. මේ මුළු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියම අසභ්‍යකරණයක්, දරුවන්ට වෙන මොකක්හරි පුරුදු කරන්න හදන වැඩක් විධියට තමයි අර්ථ ගැන්වුවේ. හැබැයි, දැන් කිරලා, මැනලා බැලුවාට පස්සේ මොකක්වත් නැහැ. ඒ ඔක්කොම

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

විවේචන පුස්. දැන් වටේ කැරකි කැරකි ඉන්නවා. ඒ නිසා දැන් විශ්වාස භංග යෝජනාව ගැනත් එක එක කථා කිය කියා ඉන්නවා. අගමැතිතුමියට එරෙහිව ඉතාම ද්වේශසහගතව කටයුතු කරමින් ඉන්න මොහොතේ විපක්ෂයේ සමහර පක්ෂවල සමහර මන්ත්‍රීවරු ඒ ගැන ඍජුව කථා කළා, ඒකට එතුමන්ලා හවුල් වෙන්නේ නැහැ කියලා. ඒ ගැන ගජේන්ද්‍රකුමාර් මන්ත්‍රීතුමාට, ඒ වාගේම දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන්ට අපි ඇත්තටම ස්තුතිවන්ත වෙනවා. මොන තරම් දේශපාලන මතභේද තිබුණත් සමහර දේවල් ගැන විවාදයක් තිබෙන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ළමා අපචාර නම්, ළමා අපචාරවලට සියලුදෙනා විරුද්ධයි. ඒකට සජබයේද, ජාතික ජන බලවේගයේද කියලා අදාළ වෙන්නේ නැහැ. කාන්තාවන්ට එරෙහි හිංසනය වෙනවා නම්, ඒකට සියලුදෙනා විරුද්ධ විය යුතුයි. එහෙම තත්ත්වයක පවා මේ කැත සෙල්ලම කරද්දී විපක්ෂයේ මන්ත්‍රීවරු ගණනාවකට මේ වෙනුවෙන් කෙළින් පෙනී සිටින්න කොන්දක් තිබුණා. ඒ ගැන අපි එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා.

මේ ගැන දැන් මොකක්ද කියන්නේ? මේ ඔක්කොම කරලා, ලොකු සැකයක්, භීතියක් රටේ හදනකොට, ආණ්ඩුවක් විධියට මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරියට, නිරවුල්ව ඉස්සරහට ගෙනෙන්න ඕනෑ කියා මා නැවතත් කියනවා. මොකක්ද දැන් ඒගොල්ලන් කළේ? දැන් ආයෙත් සබුද්ධික සාකච්ඡාවක් ගන්න කියනවා. දැන් කියනවා, අපිත් කැමැතියි කියලා. දැන් හැමෝම කථාව පටන් ගන්නේ අපිත් කැමැතියි මේක කරන්න කියලා. දැන් තනි තනියෙන් සුද්ද වෙන්න හදනවා, ඔක්කොම පව් ටික කරේ තියාගෙන ගිහිල්ලා. සාමාන්‍යයෙන් අපි පාරවල්වල බයිසිකලයෙන් යනකොට බල්ලෝ එනවා පස්සෙන්. හපන්න වාගේ දුවගෙන දුවගෙන එළවාගෙන එනවා. බයිසිකලය පදිනකල් එළවනවා. වැඩිපුර වේගයෙන් යන්න ගියොත් උන් වැඩිපුර වේගයෙන් එළවනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

මට වැඩිපුර තව විනාඩි දෙකක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

වැඩි වේගයෙන් ගියොත් වැඩි වේගයෙන් එළවනවා. හැබැයි, බයිසිකලය නැවැත්තුවොත් මොකද කරන්නේ? බයිසිකලය නැවැත්තුවොත් ඒ බල්ලා බය වෙනවා. ඌටත් හිතාගන්න බැහැ ඊළඟට කරන්නේ මොකක්ද කියලා. ඌ ආපසු හැරිලා දුවනවා. ඒ වාගේ වැඩක් තමයි මේ වෙලා තිබෙන්නේ. ආණ්ඩුව මේක කොහොමහරි ඇදගෙන යයි, දිගටම මේකේ එල්ලිලා යන්න පුළුවන් වෙයි, මේ අවුරුද්දත් ඒකෙන් ගත කරන්න පුළුවන් වෙයි කියලා ඒගොල්ලන් හිතුවා. අන්තිමට ඒක ගැන වෙන ප්‍රවේශයක් ගත්ත ගමන්, "අපි නම් එහෙම කිව්වේ නැහැ, ඇයි නැවැත්වුවේ, අපරාදේ නේ" වාගේ ඒවා කියනවා. සබුද්ධික සාකච්ඡාවක් කියන්නේ මොකක්ද කියලා ක්‍රියාවෙන් ඔප්පු කරන්න ඕනෑ, වචනවලින් නොවෙයි.

විපක්ෂ නායකතුමා උදේ සභාවට ඇවිල්ලා වචන කිව්වාට වැඩක් නැහැ. මේකට විරුද්ධව දැවැන්ත මඩ ප්‍රහාර ක්‍රියාත්මක කළ, පොල් ගහපු මිනිස්සුන්ට මොකද කළේ? පක්ෂයේ තනතුරු දුන්නා. තරුණ මන්ත්‍රීවරු ඉන්නවා තවම කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නැති. හැබැයි මඩ ගැසීම; කාන්තාවකට, අගමැතිනියට එරෙහිව මඩ ගැසීම, මඩ campaign කිරීම, අසභ්‍ය අයුරින් ප්‍රකාශ නිකුත් කිරීම අද සමගි ජන බලවේගයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට එන්න සුදුසුකමක්. අපට හරි කනගාටුයි. එහෙමයි ඒක පෙන්නුවේ. ඔබතුමන්ලා ඒක ක්‍රියාවෙන් ඔප්පු කරලා පෙන්වලා තිබෙනවා. එතකොට මඩ ගහන, පොල් ගහන මිනිස්සු ටික තමයි පක්ෂයේ ඊළඟ නායකත්වය විධියට පත් කරලා තිබෙන්නේ. මම දන්නේ නැහැ, තරුණ මන්ත්‍රීවරු සහ අනෙක් පිරිස ඒක බාර ගන්නේ කොහොමද කියලා. එහෙම තත්ත්වයක් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න හදනවා නේ. ඔබතුමන්ලා කිව්වා නේ ගේනවා කියලා. හැම තිස්සේම අකුළා ගන්න ඕනෑ නැහැ, මේ තුන්වෙනි හෝ හතරවෙනි වතාව එක එක ඒවා කියපු. ඒ නිසා විශ්වාස භංගය ගෙනෙන තෙක් අපිත් බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒක, අපි ගෙනෙන්න හැදුවා වාගේ නේ දැන් කියන්නේ. අපි කුමන්ත්‍රණය කරනවා ලු. කිසි ප්‍රශ්නයක් නැහැ, අගමැතිතුමිය ඊළඟ සතියේ එයි. ඊළඟ සතියේ ඒක ගෙනෙයි කියලා අපි හිතනවා. ගෙනෙන්න, ගෙනාවාට පස්සේ ඒකට විරුද්ධව සහ පක්ෂව ඡන්දය දෙන්න සිද්ධ වෙනවා. එතකොට ඔබතුමන්ලාට බලා ගන්න පුළුවන්, අගමැතිතුමිය ගැන විශ්වාසයෙන් සහ ඒ වෙනුවෙන් පෙනී සිටින ආණ්ඩු පක්ෂයේ කීදෙනෙක් ඉන්නවාද කියලා. ඒ වාගේම විපක්ෂ නායකතුමා ගැන විශ්වාසය තබන කීදෙනෙක් විපක්ෂයේ ඉන්නවාද කියලා අපටත් බලා ගන්න පුළුවන්. මම අද කිව්වා කියලා මතක තියා ගන්න, ඒකට සමගි ජන බලවේගයෙන් ඡන්ද 40වත් හම්බ වෙන්නේ නැහැ. දැනට අපි දන්නවා, පක්ෂ ගණනාවක් ඒකට අත්සන් කරලා නැහැ, ප්‍රතික්ෂේප කරලා තිබෙන්නේ කියලා. තමන්ට කරන්න බැරි වැඩ කරලා, තමන්ට කරන්න බැරි දේවල් උස්සාගෙන ගිහිල්ලා අවසානයේ රට ඉස්සරහා ඒක හෙළිදරවු වුණාට පස්සේ දැන් ආපහු, "අපිත් කැමැත්තෙන් හිටියේ, අපිත් ආසාවෙන් හිටියේ, මේකේ හොඳ දේවල් තිබෙනවා, පරණ ඒවා උස්සාගෙන යන්න ඕනෑ නැහැ, අපි කිව්වේ ඕක නෙවෙයි" වාගේ කථා කියනවා. මොකක්ද මහත්වරුනි, මේ කථාවේ තේරුම? එක දෙයක් කියන්න, කෙළින් හිට ගන්න. විවේචන කරන්න, අවුලක් නැහැ. අන්තිමට ඒ වැඩේ කරන්නත් ඕනෑ. අද උදේ විපක්ෂ නායකතුමා කථා කළාට පස්සෙත් තව කෙනෙක් ඇවිල්ලා, පොඩි කුණුහරුප කථා ටිකක් කිව්වා. ඒක කරන්නත් ඕනෑ. ඒ කියන්නේ ඒ මානසිකත්වය වෙනස් වෙන්නෙත් නැහැ. ඊට පස්සේ ආයේ විශ්වාස භංගය ගේනවා කියනවා, ගේන්නෙත් නැහැ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පමණක් නොවෙයි. කිසිම දේකට විවේචනයක්වත් ගොඩ නඟා ගන්න බැරි වෙනවා, ඔබතුමන්ලා ඔහොම දේශපාලනය කළොත්.

මේකෙදි ආණ්ඩුවේ ස්ථාවරය පැහැදිලියි. අධ්‍යාපනය සම්බන්ධ මානව සම්පත් පුහුණුව, භෞතික සම්පත් සංවර්ධනය ඇතුළු ඒ සියලු දේවල්කරලා තිබෙන්නේ කොහොමද කියලා අපේ ඉදිරි කථාවලදී පැහැදිලි කරයි. රටේ ඊළඟ පරම්පරාවටත් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඕනෑ වෙනවා. නිරවුල්ව හිතන, දැනට වඩා හොඳට හිතන තාර්කික මිනිහෙක් බිහි කරන්න. මේ වාගේ විකාරරූපී කථාවලට අහු වෙන්නේ නැති, දේදුන්න පිට කවරයට දැම්මාට පස්සේ සමලිංගික වෙනවා වාගේ මරිමෝල් කථා බාර ගන්නේ නැති මිනිස්සු ටිකක් මේ රටේ ඉන්න ඕනෑ කියලා අපි හිතනවා. එහෙම සමාජයක් වෙනුවෙන් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍යයි. මේ මුසාව, බොරුව, අසභ්‍යකරණය මොකක්ද කියලා මට තේරෙන්නේ නැහැ. ඕනෑම මාතෘකාවක් ආවාම ලිංගිකකරණයකට, අසභ්‍යකරණයකට හරි ආසාවෙන් ඇදිලා යන මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් ඒ පැත්තේ ඉන්නවා. මට

තේරෙන්නේ නැහැ, ඒ මොකද කියලා. එක්කෝ, මානසික වෛද්‍යවරයෙකුට පෙන්වා ගන්න ඕනෑ. එහෙම පෙන්වාගෙන බලා ගන්න, මොකක් හරි අඩුපාඩුවක් තිබෙනවාද, මානසික වර්ධනයේ අඩුපාඩුවක් තිබෙනවාද කියලා. මේ හැම දෙයක්ම කුණුහරුප නොවෙයි. මේ රටේ දරුවෝ කියන්නේ කුණුහරුපයක් නොවෙයි, මොකක් හරි දැක්කාම කුණුහරුප වැඩක් කරන්න. තමන්ගේ මානසිකත්වයෙන් හැමෝම ගැන හිතන්න එපා. මම මේ ඔබතුමන්ලා හැමෝටම නොවෙයි මේක කියන්නේ. හරි පැහැදිලියි, විපක්ෂ නායකතුමා උදේ කථා කළාට පස්සෙත් හවස කුණුහරුප කියපු කිහිපදෙනෙකු හිටියා නේ. තමන්ගේ තිබෙන ඒ මානසිකත්වය පිටට පේනවා කැතට. අඩුම තරමින් අන්න ඒක නවත්වා ගන්න. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වාගේ ලොකු වැඩ ඔබතුමන්ලාට බැහැ. එහෙම ලොකු වැඩ කථා කරන්න, එහෙම සාකච්ඡාවලට යන්න බැහැ කියලා අපට දැන් තේරෙනවා. හැබැයි අඩුම තරමින් රට ඉස්සරහා තමන් කැතට පෙනෙන එක නවත්වා ගන්න.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.22]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය මූලාසනයේ ඉන්න එක ගැන සන්තෝෂයි, අපේ පක්ෂයේ මන්ත්‍රීවරියක් ලෙස.

මට පෙර ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමකු කථා කළා. එතුමාට ස්තුතිවන්ත වෙනවා, සංයමයෙන් යුතුව හොඳට කථා කිරීම ගැන. එතුමා මඩ ප්‍රචාර සම්බන්ධයෙනුත් ප්‍රකාශ කළා. එතුමා සම්බන්ධයෙන් මම එච්චර දන්නේ නැහැ. හැබැයි JVP එකේ සහ මාලිමාවේ සමාජ මාධ්‍ය හසුරුවන්නේ එතුමා කියලා තමයි මම දැනුවත් වෙලා තිබෙන්නේ. එහෙම නම්, සමාජ මාධ්‍ය තුළින් මොන ආකාරයේ කාර්යයක් කරනවාද කියන එක සම්බන්ධයෙන් එතුමාම ස්වයං විවේචනයකට ලක් වෙන්න ඕනෑ. එතුමා එහෙම මඩ ප්‍රචාරයක් නොකරනවා නම් හොඳයි. එතුමා එහෙම කරනවා නම් ඒ සම්බන්ධයෙන් සැලකිලිමත් වෙලා, නැවත කථා කරද්දී ඒ සම්බන්ධයෙන් යම් අදහසක් ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ වාගේම සබුද්ධිකව, අධ්‍යාපනය සම්බන්ධයෙන් හොඳ දැනුමක් ඇතිව මේ පිළිබඳව අපි සාකච්ඡා කරන්න ඕනෑ කියලා එතුමා සඳහන් කළා. අපි අනිවාර්යයෙන්ම ඒක පිළිගන්නවා. එතුමා දිගින් දිගටම අසභ්‍ය ප්‍රචාර ගැන සඳහන් කළා.

මම කෙළින්ම මාතෘකාවට එන්නම්. මෙතුමා කියන ආකාරයට 6 වසරේ මොඩියුලර්වල වරදක් වෙලා නැත්නම්, හරිනි අමරසූරිය ඇමතිතුමිය මේවා සම්බන්ධයෙන් ඉතා ශ්‍රේෂ්ඨ විධියට අධ්‍යයනය කරලා stakeholdersලා හම්බ වෙලා, මහාචාර්යවරු, ආචාර්යවරු, බුද්ධිමත් පිරිස එකතු කරගෙන මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හදලා තිබෙනවා නම්, ප්‍රශ්නයක් නැහැ නේ. මා හිතවත් මුනීර් මුලෆර් නියෝජ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවට එනවා. එතුමාත් වාඩිවෙලා මගේ කථාව අහගෙන හිටියා නම් හොඳයි කියලා මම හිතනවා. රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇති කරපු ඒ ආර්ථිකයෙන් කොච්චර ප්‍රමාණයක් ද මේ කණ්ඩායමට **කරන්න** පුළුවන් කියලා වර්තමාන ජනාධිපතිතුමා දන්නවා. ඒක එතුමාගේ දක්ෂතාව. එතුමාගේ ප්‍රමාණයට එතුමා දන්නවා. ඒ නිසා එතුමාගේ දේශපාලන මොළය හොඳයි. නැද්ද, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මහ ලේකම්තුමා? එතුමා දන්නවා මේක වැඩිය ඇනුවොත් කරගෙන යන්න බැහැ කියලා. නිලධාරින්ට කරගෙන යන්න දීලා, වතුරෙන් එළියට නහය දාගෙන යනවා වාගේ ආර්ථිකය අරගෙන යනවා. ඒ වාගේම, වරදින වරදින තැන් reverse කර ගන්නවා. Reverse කර ගත්ත තැන් මම කියන්නම්. විශාල ප්‍රමාණයක් reverse කරගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටට වුවමනා කරන්නේ එවැනි නායකයන් නොවෙයි. නායකයෙක් වුණාම ජේ.ආර්. ජයවර්ධන, ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, ගාමිණී දිසානායක වාගේ අය වෙන්න ඕනෑ. මෙතුමන්ලා සියලු දෙනාම අපේ රංජිත් මද්දුම බණ්ඩාර මහ ලේකම්තුමාගේ පරණ යාළුවෝ. ධර්මදාස බණ්ඩලා වැනි නායකයන් තීන්දුවක් ගත්තොත් තීන්දුවක් ගත්තා. දේශපාලනයේදී තීන්දුවක් ගත්තොත් අනිවාර්යයෙන්ම ඒ තීන්දුව ක්‍රියාත්මක කරන්න ඕනෑ. Reverse කරන්න බැහැ. මේක තමයි ලෝකයේ වැඩියෙන්ම reverse කරන ආණ්ඩුව. ජනාධිපතිතුමා බලන්නේ Facebook එක. Facebook එකේ attack එකක් ආවොත් කෙළින්ම reverse කළා. Reverse කරපුවා 15කට වැඩිය මම පෙන්වන්නම්. මේකත් reverse කළා.

දැන් මෙතුමියලා කියනවා, සබුද්ධික වශයෙන් ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් හිතන්න කියලා. මේවාට කවුරුවත් විරුද්ධ නැහැ. මේ ප්‍රතිසංස්කරණය අද කළාට පස්සේ ඊළඟ අවුරුද්දේ තව ප්‍රතිසංස්කරණයක් කරන්න වෙයි. නැද්ද? අධ්‍යාපනය සම්බන්ධයෙන් හොඳ දැනුමක් තිබෙන මන්ත්‍රීවරියක් වශයෙන් ඔබතුමිය මේ ගැන දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මේ ප්‍රතිසංස්කරණ හැමදාම වෙන්න ඕනෑ. මේ ප්‍රතිසංස්කරණවලට විරුද්ධ වුණේ කවුද? පෞද්ගලික විශ්වවිද්‍යාලවලට විරුද්ධ වුණේ කවුද? ඒ පෞද්ගලික විශ්වවිද්‍යාල පටන්ගන්න යද්දී මිනී මැරුවේ කවුද? ඒවා කළේ කවුද? මේ රටේ අධ්‍යාපනය විනාශ කළේ කවුද? JVP එක, වෙන කවුරුවත් නොවෙයි. හැම ප්‍රතිසංස්කරණයක්ම කරද්දී, රටේ හොඳ දෙයක් කරද්දී, ආර්ථිකය වර්ධනය කරද්දී, ආර්ථිකය විවෘත කරද්දී, යම් දෙයක් නිෂ්පාදනය කරද්දී, ආර්ථික ප්‍රතිසංස්කරණ කරද්දී, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරද්දී, ඒ ඔක්කෝටම අද වෙනකම් විරුද්ධ වුණේ JVP එක. හැම ආණ්ඩුවකටම ජැක් එකකුත් ගහගෙන මේ දේවල් කරපු JVP එකේ අනුර කුමාර මහත්මයා මේකේ මූලික සාමාජිකයෙක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක reverse කෙරුවේ අපි නොවෙයි. මේක කොච්චර පාඩුවක් ද, රංජිත් මද්දුම බණ්ඩාර මහ ලේකම්තුමා? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යන්න ඕනෑ සිද්ධියක් මේක. මේ පොත් ටික නිසා රුපියල් කෝටි 8කට වැඩිය පාඩුවක් සිද්ධ වෙලා තිබෙනවා. මේ පොත්වලට කවුද ගෙවන්නේ?

ඊළඟට, රනිල් වික්‍රමසිංහ මහත්මයාට විරුද්ධව නඩුව දාන්න බැහැ කියලා නීතිපතිතුමාව අයින් කරන්න යනවා. ඒක කරගෙන යන්න බැහැ කියලා නීතිපතිතුමාව අයින් කරන්න හදනවා. දැන් මේවාට ගෙවන්නේ කවුද? මේවා සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට complain කළාට පස්සේ ඔවුන් යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්නවා ද? මේවා රජයට පාඩු කිරීමක්. රුපියල් කෝටි 8කට වැඩියෙන් පාඩු කරලා මේ පොත් ටික හකුලා ගත්තා. මා මිත්‍ර ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් මේ ගැන දන්නවා. ඔබතුමා ආගමට දහමට ලැදි නියෝජ්‍ය ඇමතිවරයෙක්. මේවා සම්බන්ධයෙන් ප්‍රශ්න කරන්න. මේ මුදල් ගෙවන්නේ කවුද? මේ පොත්වලට ගෙවන්නේ කවුද? අපිද කියන්නේ මේක වැරදියි කියලා? සමලිංගිකත්වය සම්බන්ධයෙන්, පාට සම්බන්ධයෙන් අපේ තරුණ මන්ත්‍රීතුමා කිව්වා. අපිට ඒවා ගැන ප්‍රශ්නයක් නැහැ. හැබැයි, 2026දී 6 වසරට මේ දේවල් එකතු කරලා තිබෙන්නේ කවුද? 6 වසරට homosexual web එකක් ඇතුළත් කරලා තිබුණා නම්, ඔබතුමා

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

ඒක පිළිගන්නවා ද ගරු නියෝජ්‍ය ඇමතිතුමනි? රංජිත් මද්දුම බණ්ඩාර මහ ලේකම්තුමනි, වයස අවුරුදු 11ක දරුවෙක් ඕක කියෙව්වා නම් මොකද වෙන්නේ? අපිට වයස අවුරුදු 13, 14, 15 වෙනකම් අපි ඕවා ගැන දන්නේත් නැහැ. ඔය දේවල් මොනවත් දන්නේ නැහැ. වයස අවුරුදු 11ක ළමයෙක් මේ වෙබ් එකට ගිහිල්ලා බැලුවාට පස්සේ ඔලුව හොල්මන් වෙනවා නේ. ආයේ ඒ ළමයාට ඉගෙන ගන්න පුළුවන් ද? ඒගොල්ලන්ම දාලා, ඒගොල්ලන්ම අයින් කරලා, ඒගොල්ලන් අපිට බණිනවා. ඕක මෙතැන විතරක් නොවෙයි නේ වුණේ. ඔබතුමන්ලාගේ පක්ෂය මාක්ස්වාදී පක්ෂයක්. ලිබරල් විධියට හිතන ඔබතුමන්ලාගේ වටේ ඉන්න කට්ටිය ඒ ජීවිත ගත කරනවා. ඒකට අපිට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේ දේවල් දරුවන්ට පුරුදු කරන්න එපා.

කථානායකතුමාත් මේ සම්බන්ධයෙන් හොඳට දන්නවා. ඒ සියලුදෙනාම මේ සම්බන්ධව හොඳ දැනුමක් තිබෙන උදවිය. ඒකට අපිට ප්‍රශ්නයක් නැහැ. ඔවුන්ගේ පෞද්ගලික දේවල් සම්බන්ධයෙන් අපිට ප්‍රශ්නයක් නැහැ. රංජිත් මද්දුම බණ්ඩාර මහ ලේකම්තුමනි, අපේ රටේ සංස්කෘතිය අනුව, අපේ සදාචාරය අනුව, මේ රටේ තිබෙන සභ්‍යත්වය, ආගම දහම අනුව මේ රටේ ජනතාවට, දරුවන්ට මේ දේවල් හරියන්නේ නැහැ. මේක වැරදුණේ ඔතැනදී විතරක් නොවෙයි නේ, මහ ලේකම්තුමා. ඔය සම්බන්ධයෙන් සංචාරක ව්‍යාපාරයත් ලියුමක් යැව්වා. ඒකත් reverse කර ගත්තා. දැන් මේ ජනාධිපතිතුමා මොකක්ද කියන්නේ? මොඩියුල් සකස් කිරීමේදී පවතින ගැටලු, ගුරු පුහුණු ප්‍රමාදය, තාක්ෂණික ගැටලු ගැන කියනවා. ඒ ඇමතිවරිය ඉල්ලා අස්වෙන්න ඕනෑ නැද්ද, රුපියල් කෝටි 8ක් වියදම් කරලා මේක හැදුවාට? අද මේ ළමයි ඉගෙන ගන්නේ කොහොමද? මේ ළමයි අලුත් විෂය මාලාවට සූදානම් වෙලා හිටියා. 6 වසරේ දරුවන් මේකට සූදානම් වෙලා හිටියා. ළමයි තුන් ලක්ෂයක් මේකට සූදානම් වෙලා හිටියා.

ඒ විතරක් නොවෙයි. මෙන්න මේ කාරණය ගැනත් බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ප්‍රතිසංස්කරණ ඔක්කෝම කරගෙන එනකොට ආණ්ඩුවෙන් මොකක්ද කරලා තිබෙන්නේ? ආණ්ඩුවෙන් වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය අඩු කර තිබෙනවා. රුපියල් බිලියන 704ක් අධ්‍යාපනයට වෙන් කරනවා. වැටුප් සඳහා තමයි වැඩිම මුදලක් යන්නේ. වැඩි වෙලා තිබෙන්නේ වැටුප්වලට. අනෙක් ඔක්කෝම අඩු කරලා තිබෙනවා. බලන්න, 2025දී රුපියල් බිලියන 99.3ක් වූ ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කිරීම රුපියල් බිලියන 98.8ට - රුපියල් කෝටි 50කින් - අඩු කරලා තිබෙනවා. ඒ, මෙම ප්‍රතිසංස්කරණ ගෙන එද්දී. එහෙම මුදල් අඩු කරලා මේ දේවල් කරන්න පුළුවන්ද? අපි මේ දත්ත ඉදිරිපත් කරන්නේ සාධනීය ලෙස. විශ්වවිද්‍යාල සඳහා වෙන් කරන මුදල රුපියල් බිලියන 135.3 සිට 133.9 දක්වා රුපියල් බිලියන 1.4කින් -කෝටි 140කින්- අඩු කරලා තිබෙනවා. ප්‍රාථමික පාසල් 3,560ක පහසුකම් වැඩිදියුණු කරන්න වෙන් කර තිබෙන්නේ රුපියල් ලක්ෂ 60යි. පාසලකට වෙන් වන්නේ රුපියල් 1,500ක් පමණ. ඒ මුදලින් අරගෙන දෙන්න පුළුවන් මොනවාද? රුපියල් 1,500කින් පාසලකට චෝක් පෙට්ටියක් අරගෙන දෙන්න පුළුවන්ද? ඒ වාගේම ද්විතීයික පාසල් 10,000ක පහසුකම් වැඩිදියුණු කරන්න, ගිය අවුරුද්දේ වෙන් කරපු රුපියල් මිලියන 1,010ක මුදල වියදම් නොකර, ලබන අවුරුද්දට වෙන් කරන මුදල රුපියල් මිලියන 254 දක්වා සියයට 75කින් කපලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ විතරක් නොවෙයි. මැත වසර ගණනක් ව්‍යාපෘතිවලට ඇතුළත් වූ පාසල් 1,300ක පහසුකම් දියුණු කරන්න වෙන් කරන මුදල් මේ අවුරුද්දේ රුපියල් මිලියන 520 සිට 443 දක්වා අඩු කරලා තිබෙනවා. ඒ ඔක්කෝම අඩු කරලා තිබෙනවා.

ඊට පස්සේ දුප්පත් දරුවෝ යන ගම්බද පාසල්වලට වැඩේ දෙන්න යන්නේ. කිලෝමීටර තුනෙන් තුනට පාසල් පටන් ගන්නවා කියලා ජනාධිපතිතුමා කිව්වා. දැන් ඒ කථා නැහැ. මේ අවුරුද්දේ 1 ශ්‍රේණියට සහ 6 ශ්‍රේණියට අලුත් විෂය නිර්දේශ හඳුන්වා දෙනවා. වියදම අඩු වෙන්නේ එතකොට ඒකෙන්. මේ මුදලින් මේ ප්‍රතිසංස්කරණ කරන්නේ කොහොමද? ඔක්කෝම වියදම් කපලා, අඩු කරලා, නැති කරලා ගිය අවුරුද්දට වෙන් කරපු ටිකත් වියදම් කරන්නේ නැතුව ඒවාත් කාබාසිනියා කරලා, මේ අවුරුද්දට වෙන් කරන මුදල් ප්‍රමාණය අඩු කරලා තිබෙනවා. 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සමත් අඩු ආදායම්ලාභීන්ගේ පවුල්වල දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දීම සඳහා වෙන් කරන මුදලින් රුපියල් ලක්ෂ 450ක් අඩු කරලා තිබෙනවා. අන්තිමට ක්‍රීඩා පාසල්වල සිසුන්ට පෝෂ්‍යදායී ආහාර දෙන්න තිබුණු මුදලින් රුපියල් ලක්ෂ 800ක් කප්පාදු කරලා තිබෙනවා. ඒ ඔක්කෝම කරලා ප්‍රතිසංස්කරණවලට විරුද්ධද, නැද්ද කියලා අපෙන් අහනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඊට අමතරව මට තව විනාඩි දෙකක් ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ආණ්ඩුව යන්නේ තනිකර රුයිතෙට. ඔක්කෝම reverse කරනවා. එහෙම reverse කරපු ඒවා කිහිපයක් මම කියන්නම්. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට දේශීය සිසුන් ඇතුළත් කර ගැනීම reverse කළා. විගණකාධිපති පත් කිරීම reverse කළා. දණ්ඩ නීති සංග්‍රහය අනුව සිසුන්ට දඬුවම් කිරීම corporal punishment එක reverse කළා. වැව් සීමා ලකුණු කිරීම, ඩඩ්ලිත් එක්ක ෂේප් වෙලා reverse කළා. විදුලි බිල වැඩි කරන්න ගිහිල්ලා ඒකෙන් ෂොට් එක වැදුණාම ඒක reverse කළා. රුපියල් 72,000 බැගින් plug base එකත් ගැහුවා, මතකද? ඒක reverse කළා. ඒ ඉෂාර නානායක්කාරගේ නේද? ඊට පස්සේ විල්පත්තු හරහා වූ මාර්ගය, ඒකත් reverse කළා. SupremeSAT චන්ද්‍රිකාවේ පාඩුව කියන්න ගිහිල්ලා ඒක reverse කළා. සුවසැරිය ගිලන් රථයේ පාට වෙනස් කරන්න ගිහිල්ලා ඒක reverse කළා. උතුරේ ඉඩම් නිරවුල් කිරීමේ ගැසට් එක ගහන්න ගිහිල්ලා ඒක reverse කළා. Windscreen එකේ අලවන නීතිඥ, වෛද්‍ය වැනි නාම පුවරු ඉවත් කර ගන්න කියලා ඒකත් reverse කළා. සතොස සහල් ප්‍රමාණය ආදී ඔක්කෝම reverse; හැම එකක්ම reversed. කරන්න ගිහිල්ලා අයින් කරන්න කිව්වාම reverse කරනවා. ඔක්කෝම පස්සට. පාසල් වහන වෙලාව පස්වරු 2.00 කරන්න ගිහිල්ලා ඒකත් reverse කළා. ඊට පස්සේ බටලන්දේ ප්‍රශ්නය දමන්න ඇවිල්ලා, ඒක reverse කළා. අන්තිමට රණවිරු සැමරුමට President එන්නේ නැහැ කියලා, Facebook එකෙන් ඒකට පහර ගැහුවාම ඒක reverse කළා. ඔක්කෝම reversed නේ.

ජනාධිපතිවරයා වැඩ කරන්නේ කොහොමද? එතුමා Facebook එක බලලා ඔක්කෝම reverse කරනවා. එහෙම පුළුවන්ද, රටක් කරන්න? දැන් බලන්න, ඔබතුමන්ලා නීතිපතිතුමා ඉවත් කරන්න යනවා. විරුද්ධ පක්ෂයේ කථා කරන හැම එකාටම නඩු දමන්න කියලා නීතිපතිතුමාට කිව්වා. අපිටත් නඩු දමන්න කිව්වා. මගේ නඩුවේදී මොකක්ද කිව්වේ? අපරාධ වරදක් අනාවරණය නොවේ කියලා කිව්වා. අවුරුද්දක් ගිහිල්ලා CID එකෙන් රුපියල් ලක්ෂ 1,000කට වැඩිය වියදම් කරලා තිබෙනවා.

නීතිපතිතුමා පාවිච්චි කළා, අපිට පහර ගහන්න; කථා කරන මිනිස්සුන්ට පහර ගහන්න. නීතිපති ගිහිල්ලා පරීක්ෂා කරලා ඇවිල්ලා කිව්වා, රනිල් වික්‍රමසිංහ මහත්මයාට විරුද්ධව නඩු දමන්න බැහැ කියලා, ඊට පස්සේ නීතිපති ඉවත් කරන්න හදනවා. තවම විගණකාධිපතිතුමාව පත් කර ගන්න බැහැ. එම තනතුරට තමන්ගේ යහළුවෝ පත් කරන්න try කරනවා. අනුර කුමාර මහත්මයා ඒ දවස්වල මෙතැන අපිත් එක්ක සටන් කළේ, සාධාරණය වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, යහ පාලනය වෙනුවෙන්. දැන් තනිකර කරන්නේ මොනවාද? ජේ.ආර්. ජයවර්ධනලා සිය ගුණයක් හොඳයි. ලංකාවේ හිටපු අය අතරින් හොයන්නත් බැහැ, මදුරෝ වාගේ පිටරටවල හිටපු අය අතරින්වත් හොයන්න බැහැ. ඒකාධිපති නායකයෝ හොයන්න වෙනවා, එතුමාගේ model එක හොයන්න. එතුමා අද තනිකරම වැඩ කරන්නේ කොහොමද? කථා කළොත් ගැහුවා. හාමුදුරුනමක් විරුද්ධව කථා කළොත් ගැහුවා. පිල්ලෙයාන් කථා කළා. පිල්ලෙයාන් හිරේ දාලා පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් හොයනවා කියලා තාම ඇතුළේ. මොකක්ද මේ කරන්නේ? ගහන, කියන, කථා කරන, කථා කරන අය හිරේ දමනවා. අපි දැක්කා, තුසිත හල්ලොලුවත් බැංකු ගිණුමක් ගැන කථා කළා. ඔහුවත් හිරේ දැම්මා. *[බාධා කිරීම්]* හිනා තමයි. ආණ්ඩු පක්ෂයේ ඉන්න කොට හිනායනවා, හරි සැපයි. හැමදාම ආණ්ඩු බලය තිබෙන්නේ නැහැ. නියෝජ්‍ය ඇමතිතුමා, ඒක හිතේ තියාගන්න.

ආණ්ඩු බලය තිබියදීත් මම ඒවාට විරුද්ධව කථා කළා. විපක්ෂයේ ඉන්නකොටත් විරුද්ධව කථා කළා. ඒ නිසායි කියන්නේ, ආණ්ඩු බලය තිබියදී හරි සැපයි. අවුරුද්දයි, දෙකයි ඒ කාලය යනවා දැනෙන්නේත් නැහැ. ගියාට පස්සේ, මේ පැත්තට ඇවිල්ලා බලන්න. මෙතැන ඉන්නේ එක්කෙනායි දෙන්නායි. ඊට පස්සේ ඔබතුන්ලාටත් අන්ත පිරිසක් බලයට එන්න පුළුවන්, රාජපක්ෂවරු හිටියා වාගේ. ඒ නිසා ඔබතුමන්ලා මේක හොඳට හිතේ තියාගන්න. මේ රටේ අසාධාරණය කරලා, නීතිය අතට අරගෙන, ඉතිහාසයේ කිසිම දවසක අධිකරණයට මේ වාගේ ඇඟිලි ගහලා නැහැ,

මේ අගවිනිසුරුතුමා ගියාට පසුව අහනවා, ඇයි නඩු dismiss කරන්නේ කියලා. FR එකක් දැම්මාම විනාඩි 5ක්වත් නඩුවක් අහන්නේ නැහැ. ඔක්කෝම දේශපාලනීකරණය කරලා. අපි කියන්නේ, මේ ප්‍රතිසංස්කරණ හරි විධියට ගේන්න, හරි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න, stakeholdersලා සමඟ කථා කරන්න, සැලසුම් සහගතව කටයුතු කරන්න, ඒවාට මුදල් වෙන් කරන්න, ගුරුවරුන් පුහුණු කරන්න කියලායි. මේ දේවල් හරියට කරන්න. මේවා try කරන්න, reverse කරන්න ගේන්න එපා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ආගම දහමට බර පුද්ගලයෙක් නිසා මේ පිළිබඳව දන්නවා නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු නවයක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.33]

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற வரலாற்று முக்கியத்துவம் வாய்ந்த கல்வி மறுசீரமைப்புத் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு பெருமையடைகின்றேன்.

கல்வி மறுசீரமைப்பானது, பிரதானமாக ஐந்து தூண்களைக்கொண்டு மேற்கொள்ளப்பட்டு இருக்கின்றது. அதுமாத்திரமன்றி, இதில் பல்வேறு நல்ல விடயங்களும் உட்புகுத்தப்பட்டு இருக்கின்றன. ஆனாலும், எதிர்க்கட்சியினர் தேடிப்பிடிக்கின்ற விடயங்கள் ஆபாசமான முறையிலே இங்கு முன்வைக்கப்படுகின்றன. அவ்வாறே அவர்களுடைய செயற்பாடுகள் இருக்கின்றன. புதிய கல்விச் சீர்திருத்தத்திலுள்ள மிகவும் முக்கியமான ஒரு விடயத்தை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். ஒவ்வொரு வருடமும் கிட்டத்தட்ட மூன்று இலட்சம் மாணவர்கள் புதிதாக பாடசாலைகளுக்கு உள்வாங்கப்படுகின்றார்கள். கடந்த காலங்களில் க.பொ.த. சாதாரண தரத்தை அடையும்பொழுது, கிட்டத்தட்ட இரண்டு இலட்சம் மாணவர்கள் எந்தவித தொழிற் கல்வியையும் பெறாமல் அல்லது பெறுபேறுகளில் முன்னேற்றம் காணாமல் வெறும் கையுடன் வெளியேறும் நிலை காணப்பட்டது. நானும் ஓர் ஆசிரியனாக இருந்தவன் என்ற வகையில், கடந்த காலங்களில் இவ்விடயம் தொடர்பில் வேதனைப்பட்டதுண்டு. கல்வித் திட்டத்தில் மறுசீரமைப்பு வராதா என்று ஏங்கிய நாட்கள் பல உண்டு. ஆண்டுதோறும் ஓரிலட்சம் மாணவர்கள் மட்டுமே உயர் கல்வியை நோக்கிச் செல்கின்றார்கள். மிகுதி இரண்டு இலட்சம் மாணவர்களும் கல்வியை இடைநடுவில் விட்டு, நடுவீதியில் இருந்த நிலைமைதான் கடந்த காலங்களில் காணப்பட்டது. எனினும், நாங்கள் புதிய கல்விச் சீர்திருத்தத்தில் மாணவர்களுக்குத் தொழிற் கல்வியைத் தரம் 9இலிருந்து வழங்குவதற்கான ஏற்பாடுகளை உள்வாங்கி இருக்கின்றோம். இதனூடாக மாணவர்கள் க.பொ.த. சாதாரண தரப் பரீட்சையில் சித்தியடையாதபோதும், ஏதோவொரு வகையான தொழிற் கல்வியைப் பெற்று எதிர்காலத்தில் தங்களுடைய வாழ்க்கையைச் சரியான முறையில் அமைத்துக்கொள்வதற்கு வாய்ப்பு ஏற்படுத்திக் கொடுக்கப்படுகின்றது. மாணவர்களுடைய எதிர்காலம் சிறப்பான முறையில் அமைவதற்கான வாய்ப்பை குறிப்பாக, பொருளாதார ரீதியில் முன்னேறுவதற்கான வாய்ப்பை இந்தப் புதிய கல்விச் சீர்திருத்தம் வழங்கியிருக்கின்றது.

மாணவர்களுக்குத் தொழிற் கல்வியை வழங்குவதற்காகப் பாடசாலைகளில் தொழிற் கல்விக்கூடங்களை அமைக்க இருக்கின்றோம். இது தொடர்பான திட்டமிடலில் சில குறைபாடுகள் காணப்படலாம். அவற்றைத் திருத்திக்கொண்டு, இந்தக் கல்விச் சீர்திருத்தத்தை முன்னோக்கிக் கொண்டுசெல்ல வேண்டிய தேவை இருக்கின்றது. அந்தக் குறைபாடுகளை ஆக்கபூர்வமான முறையில் எடுத்துக் கூறவேண்டிய கடப்பாடு ஆளும் தரப்பினருக்கும் இருக்கின்றது; எதிர்த்தரப்பினருக்கும் இருக்கின்றது. எனினும், தரம் 6 ஆங்கிலப் பாட moduleஇல் காணப்படுகின்ற சிறியதொரு தவறைப் பூதாகரமாக்கி, அவ்விடயம் தொடர்பான அறிவு இல்லாத தரம் 5இலிருந்து வருகின்ற மாணவர்களையும் அவர்களது பெற்றோரையும் குழப்ப நிலைக்கு உள்ளாக்குகின்றார்கள் இந்த எதிர்க்கட்சியினர். புதிய கல்விச் சீர்திருத்தத்திலுள்ள நல்ல விடயங்களை எடுத்துக் கூறாமல், இந்த விடயத்தைப் பெரிதுபடுத்தி மக்களைக் குழப்பும் செயற்பாட்டில் அவர்கள் ஈடுபட்டு இருக்கின்றார்கள். பெற்றோர்களாக இருக்கட்டும், மாணவர்களாக இருக்கட்டும், அவர்கள் குழம்பவில்லை. மேலும், ஓரினச் சேர்க்கையாளர்களின் நிறம் தொடர்பான விடயங்களையும் கூறியிருந்தார்கள். இவ்வகையான விஷமத்தனமான விடயங்களைப் பிஞ்சு மனங்களில் விதைக்கின்ற வகையிலே, இவ்வகையான செயற்பாடுகளை

[ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා]

அறிமுகப்படுத்தும் வகையிலே இவர்கள் கருத்துகளைக் கூறி வருகின்றார்கள். அதாவது, இவ்வாறானதொரு விடயம் இருக்கின்றதென பச்சிளம் பிள்ளைகளுக்குத் தெரியப்படுத்தும் வகையிலான செயற்பாடுகளிலேயே இவர்கள் தொடர்ச்சியாக ஈடுபட்டு வருகின்றார்கள்.

இந்தப் பத்தாவது பாராளுமன்றத்தில் பெண் பாராளுமன்ற உறுப்பினர்களை இழிவான முறையில் பேசுகின்ற, அவர்களை விமர்சிக்கின்ற செயற்பாடுகள் தொடர்ச்சியாக இடம்பெற்று வருகின்றன. அதை நான் வன்மையாகக் கண்டிக்கின்றேன். இந்தச் சந்தர்ப்பத்தில் மகாகவி சுப்பிரமணிய பாரதியார் அவர்களுடைய பெண்ணியம் தொடர்பான ஒரு கவிதை எனக்கு ஞாபகம் வருகின்றது.

" மாதர் தம்மை இழிவு செய்யும் மடமையை கொளுத்துவோம்"

அதாவது, பெண்களை இழிவாகப் பேசும் சமுதாயத்தை இல்லாமலாக்குவோம் என்ற வகையிலே இந்தக் கவிதை வரி அமைந்திருக்கின்றது.

அந்த வகையில், பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான கௌரவ (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்கள் தொடர்பாக நான் ஒருசில விடயங்களை இங்கு கூற விரும்புகின்றேன். இலங்கையின் வரலாற்றில் கிடைத்தற்கரிய பொக்கிஷமாக எங்களுடைய கல்வி அமைச்சர் காணப்படுகின்றார். கல்வித்துறை தொடர்பான பூரண அறிவுடைய, நிபுணத்துவம் வாய்ந்த ஒருவரை நாங்கள் கல்வி அமைச்சராக நியமித்திருக்கின்றோம். அவருடைய காலப் பகுதியில், அவரது தலைமைத்துவத்தின்கீழ் கல்வித்துறையில் பாரியதொரு புரட்சியை நாங்கள் நிச்சயமாக ஏற்படுத்துவோம். அது மட்டுமல்ல, அவர் மிகுந்த ஆளுமையுள்ளவராகவும் இருக்கின்றார். அப்படிப்பட்ட ஒருவரை மிகவும் கீழ்த்தரமான வார்த்தைப் பிரயோகங்கள்மூலம் தனிப்பட்ட ரீதியாக எதிர்கட்சியினர் தாக்கி வருகின்றார்கள். இது மிகவும் மனவேதனைக்குரிய விடயமாகும். கற்றவர்கள் கூடுதலாக இருக்கின்ற இந்தச் சபையில் முன்னுதாரணமாக விளங்கவேண்டிய எதிர்க்கட்சி உறுப்பினர்கள் இந்த Galleryஇல் உள்ளவர்களைக்கூட பொருட்படுத்தாமல் இவ்வாறான செயற்பாடுகளில் ஈடுபடுகின்றார்கள். இதனை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம்.

எமது வடக்கு மாகாணத்தைப் பொறுத்தவரையில், அங்கு கல்வித்துறையில் பாரிய குறைபாடுகள் காணப்படுகின்றன. அம்மாகாணமானது, கல்வித்துறையில் தொடர்ச்சியாக வீழ்ச்சியடைந்த நிலையில் காணப்படுகின்றது. இதற்குப் பிரதான காரணமாக இருப்பது, மாகாண மட்டத்தில் இடம்பெறுகின்ற இடமாற்றம்தான். அங்கு இடமாற்றம் சரியான முறையில் நடைமுறைப்படுத்தப்படுவதில்லை. குறிப்பாக 2025, 2026ஆம் ஆண்டு காலப் பகுதியில் இடமாற்றம் சரியான முறையில் நடைபெறவில்லை. இதன் காரணமாக அங்கு கல்வித்துறையில் பாரிய பாதிப்பு ஏற்பட்டிருக்கின்றது. வவுனியா, முல்லைத்தீவு, மன்னார் மாவட்டங்களில் கிட்டத்தட்ட 40 சதவீதமான ஆசிரியர்கள் இடமாற்றம் பெற்றுச் சென்றிருக்கிறார்கள். ஆனால், அந்த ஆசியர்களுக்குப் பதிலாக நியமனம் பெறுபவர்கள் அங்கு வராமல் இருக்கின்றார்கள். குறித்த பாடங்களுக்குரிய ஆசிரியர்கள் இல்லாத நிலையில், க.பொ.த. உயர் தர மாணவர்கள் பரீட்சைக்குத் தோற்றவேண்டிய துர்ப்பாக்கிய நிலைமை ஏற்பட்டு இருக்கின்றது. எனவே, இந்த இடமாற்றக் கொள்கையில் நாங்கள் மாற்றங்களை ஏற்படுத்த வேண்டும்.

இறுதியாக ஒரு விடயத்தைக் கூற விரும்புகின்றேன். நாங்கள் எதிர்காலத்தில் பட்டதாரி ஆசிரியர்களை நியமிக்க இருக்கின்றோம். இதற்காக நடத்தப்படுகின்ற பரீட்சையில் மாவட்ட ரீதியாக வெட்டுப்புள்ளியை இட்டு, அந்தந்த மாவட்டங்களிலுள்ள வெற்றிடங்களுக்கு ஏற்ப ஆசிரியர்களை நியமிப்பதனூடாக இவ்வாறான இடமாற்றப் பிரச்சினைகளுக்குத் தீர்வைப் பெற்றுக்கொள்ள முடியும். வட மாகாணம் யுத்தத்தால் பாதிக்கப்பட்டுள்ளதுடன், மிக மோசமாக பௌதிக வளத்திலும் பாதிக்கப்பட்டு இருக்கின்ற காரணத்தினால் எமது அரசாங்கம் நிச்சயமாக எதிர்காலத்தில் இது தொடர்பில் சிறந்ததொரு முடிவை எடுக்கும். பெண்களை இழிவுபடுத்தும் வகையில், இந்தச் சபையில் கீழ்த்தரமான வார்த்தைகளைப் பயன்படுத்துவதைத் தவிர்த்துக்கொள்ள வேண்டுமென மீண்டும் ஒருமுறை கேட்டு, விடை பெறுகின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හතක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.43]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்றைய தினம் இந்தச் சபையில் நடைபெறுகின்ற கல்விச் சீர்திருத்தம் சம்பந்தமான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் பல்வேறு விதமான கருத்துகள் முன்வைக்கப்படுவதுடன், பல்வேறு விடயங்களும் பேசப்படுகின்றன. மேலும், ஆளுந்தரப்பினரும் எதிர்த்தரப்பினரும் தத்தமது கருத்துகளை முன்வைக்கின்றனர்.

இந்த நாட்டில் பல்வேறு காலப்பகுதியில் கல்விச் சீர்திருத்தம் மேற்கொள்ளப்பட்டு இருக்கின்றது. அந்த வகையில், 1972, 1980, 1997, 2007, 2015ஆம் ஆண்டுகளில் கல்விச் சீர்திருத்தம் வெற்றிகரமாக மேற்கொள்ளப்பட்டு இருக்கின்றது. தற்போது அமுல்படுத்தப்பட்டுள்ள கல்விச் சீர்திருத்தமே பொது மக்களுடைய எதிர்ப்பைப் பெற்றுத் தோல்வியடைந்த ஒரு கல்விச் சீர்திருத்தமாக இலங்கையின் வரலாற்றில் இடம்பிடித்து இருக்கின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கையின் எதிர்காலம் சிறந்து விளங்க வேண்டும். அதற்கேற்ப மாணவர் சமூகத்தை உருவாக்க வேண்டுமென்ற அடிப்படையில்தான் கல்விச் சீர்திருத்தம் மேற்கொள்ளப்படுகின்றது. கல்விச் சீர்திருத்தமானது ஒவ்வொரு காலகட்டத்திலும் தேவைப்படுகின்ற ஒரு விடயமாகக் காணப்படுகின்றது. ஏனெனில், உலகில் ஏற்படுகின்ற மாற்றங்களுக்கு ஏற்ப எமது நாட்டின் கல்வித் திட்டமும் மாற வேண்டும். எனவே, கல்விச் சீர்திருத்தமானது கட்டாயமாக மேற்கொள்ளவேண்டிய ஒரு விடயமாகக் காணப்படுகின்றது. தற்பொழுது கொண்டுவரப்பட்டுள்ள கல்விச் சீர்திருத்தத்தை எதிர்க்கட்சியினர் என்ற ரீதியில் நாங்கள் வரவேற்கின்றோம். அதை எதிர்க்கக்கூடிய பாராளுமன்ற உறுப்பினர்கள் இந்தச் சபையில் இருப்பார்களா? என்று நாங்கள் கேட்க விரும்புகின்றோம்.

இந்தக் கல்விச் சீர்திருத்தத்தின்மூலம் கொண்டுவரப்படுகின்ற விடயங்கள் எவ்வாறானவை என்பதைத்தான் நாங்கள் இங்கு பார்க்க வேண்டும். இன்று எதிர்க்கட்சியினர் இந்தக் கல்விச் சீர்திருத்தத்திலுள்ள பிழைகளைச் சுட்டிக்காட்டும்பொழுது, அவற்றைக்கூட திருத்த முடியாத நிலையில் ஆளும் தரப்புப் பாராளுமன்ற உறுப்பினர்கள் இருப்பதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. இன்று காலையில் இருந்து நடைபெறுகின்ற இந்த விவாதத்தில் ஆளுந்தரப்பு உறுப்பினர்கள் எதிர்க்கட்சித் தலைவர் கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் பற்றியே அதிகமாகப் பேசுகின்றார்கள். ஆளும் தரப்பினர் இந்தக் கல்விச் சீர்திருத்தத்திலுள்ள நல்ல விடயங்களைத் தெளிவாக விளங்கப்படுத்துவார்களென நாங்கள் எதிர்பார்த்தோம். ஆனால், அப்படி நடக்கவில்லை. எதிர்க்கட்சியினர்தான் இந்தக் கல்விச் சீர்திருத்தம் தொடர்பான பிரச்சினைக்குப் பிரதான காரணம், அவர்களால்தான் இந்த விடயம் தள்ளிப்போடப்பட்டு இருக்கின்றது, அவர்களால்தான் இந்தப் பிரச்சினை உருவாக்கப்பட்டு இருக்கின்றது என்று சொல்கின்றார்களே ஒழிய, அதற்கான தீர்வு பற்றி கூறவில்லை. தாங்கள் விட்ட பிழையை ஒத்துக்கொள்ளக்கூடிய மனப்பான்மை இன்னும் அவர்களிடம் வரவில்லை என்பது மிகவும் கவலையளிக்கிறது. ஒன்றரை வருடங்களாக இந்த அரசாங்கத்துடன் பயணித்துக்கொண்டு இருக்கின்ற இவர்கள், இப்பொழுதும் விமர்சனங்களை முன்வைக்கின்றவர்களாக இருக்கின்றார்களே ஒழிய, இந்த விடயத்துக்கு ஒரு தீர்வை முன்வைக்கவில்லை. எனவே, இந்த விடயத்தில் பக்குவமடைய வேண்டுமென நான் ஆளும் தரப்பினருக்குச் சொல்லிவைக்க விரும்புகின்றேன். மேலும், இந்த விடயத்தைச் சரியாக உள்வாங்கி, இதற்கான மாற்று நடவடிக்கையை மேற்கொள்ள வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

கல்விச் சீர்திருத்தம் சம்பந்தமான இன்றைய விவாதத்தில் நம்பிக்கையில்லாப் பிரேரணை சம்பந்தமாகக் கூடுதலாகப் பேசுகின்றார்கள். எதிர்க்கட்சியினரால் கொண்டுவரப்படுகின்ற நம்பிக்கையில்லாப் பிரேரணை தொடர்பான ஓர் எதிர்பார்ப்பை ஏன் இன்று அரசாங்கம் ஏற்படுத்தி இருக்கின்றது? அந்த நம்பிக்கையில்லாப் பிரேரணை கொண்டுவரப்படுவதன் நோக்கத்தை யார் விரும்புகின்றார்கள் என்பதை நாங்கள் பார்க்க வேண்டும். எதிர்க்கட்சியினராகிய நாங்கள் நம்பிக்கையில்லாப் பிரேரணையைக் கொண்டுவருவதும் கொண்டுவராமல் இருப்பதும், அரசாங்கத்தின் செயற்பாடுகளை விமர்சிப்பதும் விமர்சிக்காமல் இருப்பதும் எங்களுடைய விருப்பம்! நம்பிக்கையில்லாப் பிரேரணையை எப்போது கொண்டுவரப் போகின்றீர்கள்? எப்படிக் கொண்டுவரப் போகின்றீர்கள்? அடுத்த கிழமை விடுமுறை இருப்பதால் உடனே கொண்டுவாருங்கள் என்று ஆளும் தரப்பினர் கூறுவதைப் பார்க்கும்போது, அரசாங்கத் தரப்பினர் பிளவடைந்து இரண்டு பிரிவினராக பிரிந்து இருக்கின்றார்களா? என்ற சந்தேகம் எங்கள் மத்தியில் காணப்படுகின்றது. ஆகையால், நாங்கள் சொல்லுகின்ற விடயம் என்னவென்றால், இந்தக் கல்விச் சீர்திருத்தம் சம்பந்தமான விடயத்தில் நீங்கள் இன்னும் கூடுதலான அக்கறையைச் செலுத்த வேண்டும் என்றுதான்.

இன்று நீங்கள் மேற்கொண்டிருக்கின்ற கல்விச் சீர்திருத்தத்தில் பல குறைபாடுகள் காணப்படுகின்றன. இன்று கல்வித்துறையில் திறமைமிக்க பலர் இருக்கின்றார்கள். அவர்களுடன் இது தொடர்பில் எந்தவித பேச்சுவார்த்தையும் நடத்தப்படவில்லை. அதேபோல், பாராளுமன்றக் குழுக்களிலும் இது சம்பந்தமான கலந்துரையாடல்கள் நடைபெறவில்லை. இவ்வாறு கொண்டுவரப்படுகின்ற கல்விச் சீர்திருத்தத்தின்மூலம் எதிர்கால கல்விச் செயற்பாடுகள் எவ்வாறு சிறப்பாக அமையும் என்பது கேள்விக்குறியாகக் காணப்படுகின்றது. புதிய கல்விச் சீர்திருத்தம் நடைமுறைப்படுத்தப்படும் இந்த நேரத்தில், நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற திருகோணமலை மாவட்டத்தில் எந்தப் பாடசாலை தொழில்நுட்ப ரீதியாக நல்ல மட்டத்தில் இருக்கின்றது? மத்திய அரசாங்கத்தின்கீழ் இருக்கின்ற பாடசாலைகளிலுள்ள வகுப்பறைகளில் smart TV அல்லது ஸ்மார்ட் தொழில்நுட்பம் இருக்கின்றதா? மாகாண சபைகளுக்குக் கீழுள்ள பாடசாலைகளில் இவ்வாறான வசதிகள் ஏற்படுத்தப்பட்டு இருக்கின்றனவா? என்பதை நாங்கள் சிந்தித்துப் பார்க்க வேண்டும்.

இவ்வாறான அடிப்படைத் தேவைப்பாடுகளை ஏற்படுத்திக் கொடுக்காமல் புதிய விடயங்களைக் கொண்டுவரும்பொழுது, அதை எவ்வாறு மாணவர்கள் ஏற்றுக்கொள்வார்கள் என்பதை நாங்கள் சிந்திக்க வேண்டும். இன்று நாங்கள் தொழில்நுட்பம் சம்பந்தமான கல்விச் செயற்பாடுகளை அறிமுகப்படுத்தி, அவற்றை நடைமுறைப்படுத்தும்பொழுது, பாடசாலை மாணவர்கள் மாத்திரமல்ல, அவர்களது பெற்றோரும் சிரமத்தை எதிர்நோக்கவேண்டிய ஒரு சூழல் காணப்படுகின்றது. இன்று பாடசாலைகளில் smart TVs மற்றும் தொழில்நுட்ப வசதிகள் இருந்தாலும், மாணவர்கள் வீட்டிலிருந்து படிப்பதற்கு அவர்களிடம் Tablets போன்ற தொழில்நுட்பம் சார்ந்த உபகரணங்கள் இருக்கின்றனவா? என்பதையும் நாங்கள் சிந்திக்க வேண்டும். இவ்வாறான பல விடயங்கள் இதில் இருக்கின்றன. இவற்றுக்கான தீர்வை நாங்கள் உடனடியாக எட்ட முடியாதென்றே நான் நினைக்கின்றேன்.

ஆளுங்கட்சி, எதிர்க்கட்சி என்ற வேறுபாட்டைத் தாண்டி, நாங்கள் எல்லோரும் ஒன்றுபட்டு சரியானதொரு கல்விச் சீர்திருத்தத்தை இந்த நாட்டில் கொண்டுவர வேண்டும். தற்போது நடைமுறையிலுள்ள கல்வித் திட்டத்தில் பல குறைபாடுகள் இருப்பதை நாங்கள் ஏற்றுக்கொண்டு இருக்கின்றோம். சென்ற அரசாங்கம்தான் இந்தக் கல்வித் திட்டத்தைக் கொண்டுவந்து அமுல்படுத்தியதென தொடர்ச்சியாகச் சொல்லிக்கொண்டு இருப்பதை விடுத்து, புதிதாக உருவாக்கப்பட்டு இருக்கின்ற உங்களுடைய அரசாங்கத்தின்மீது மக்கள் வைத்திருக்கின்ற நம்பிக்கையைக் காப்பாற்றும் முகமாக நீங்கள் எல்லோரையும் ஒன்றுதிரட்டி குறிப்பாக எல்லாக் கட்சித் தலைவர்களையும் ஒன்றுபடுத்தி, இவற்றுக்கான சரியான தீர்வுகளை வழங்குவதற்கு முன்வர வேண்டும். அந்த அடிப்படையில், சரியானதொரு தீர்மானத்தைக் கொண்டுவந்து இந்தப் பாராளுமன்றம் மூலமாகச் சிறந்ததொரு கல்வித் திட்டத்தை அமுல்படுத்த முடியும் என்பதை இந்த இடத்தில் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට මිනිත්තු දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.51]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

අද මේ සභාව කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් යම්කිසි ශිෂ්ට, රාමුගත සාකච්ඡාවක් අපි ඇති කරගැනීමේ වුවමනාවක් ඇත්තටම තිබෙනවා. රජය බලයට පත් වෙලා මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් කථා කරන්න පටන් ගත්ත දවසේ ඉඳන්ම විපක්ෂය මේ කතිකාව මෙහෙයවනු ලැබුවේ, අතිශයින් ගෝත්‍රවාදී, ජාතිවාදී, ආගම්වාදී වාගේම මේ වෙනකොට ස්ත්‍රී විරෝධී කතිකාවකටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම බොහොම සතුටු වෙනවා, ඔබතුමිය මුල් පුටුවේ ඉන්න මේ වෙලාවේ මට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන. අපි හැමෝටම එකඟ වෙන්න පුළුවන් දේවල් තිබෙනවා, දේශපාලනයේදී. ඒ වාගේ මෙන්න මේ කාරණයත් අපි හැමෝටම එකඟ වෙන්න පුළුවන් දෙයක්. අද වෙනකොට ගරු අගමැතිතුමිය ශ්‍රී ලංකාව නියෝජනය කරමින්, ජාත්‍යන්තර තලයේදී ඇගයීම් ලබමින්, ජාත්‍යන්තර දේශපාලනයට, ජාත්‍යන්තර ආර්ථික සාකච්ඡාවලට එකතු විය යුතු කරුණු මතු කරමින්, කාන්තාවන් වෙනුවෙන් කථා කරමින්, කාන්තාවන්ගේ දේශපාලන නායකත්වය වෙනුවෙන් කථා කරමින් දීප්තිමත් කාර්යභාරයක් ඉෂ්ට කරමින් පවතිනවා. එවැනි කාර්යභාරයක් ඉෂ්ට කරන කාන්තාවක් සම්බන්ධයෙන්, එවැනි කාර්යභාරයක් ඉෂ්ට කරන රටේ අගමැතිවරිය සම්බන්ධයෙන් පසුගිය කාලයේදී මේ විපක්ෂය හැසිරුණේ කොහොමද කියන එක පිළිබඳව මම අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. ඉතාම කනගාටුදායක, ඉතාම තුච්ඡ, නිහීන ආකාරයෙන්, කාන්තාවක් සම්බන්ධයෙන් ප්‍රසිද්ධ වේදිකාවල, පොදු අවකාශවල කථා නොකළ යුතු ආකාරයේ සංවාදයක් තමයි විපක්ෂය විසින් පසුගිය මාස කිහිපය තුළ මෙහෙයවනු ලැබුවේ. මේක, එතුමිය අගමැතිවරිය බවට පත්වෙච්ච කාලයේ සිටම විපක්ෂයේ සමහර දේශපාලනඥයන් විසින් පොහොර දමමින් හදපු සාකච්ඡාවක්.

අගමැතිතුමිය සම්බන්ධයෙන් ප්‍රවාදයක් ගොඩ නැඟීම, එතුමියගේ පෞද්ගලික ජීවිතය සම්බන්ධයෙන් ප්‍රවාදයක් ගොඩ නැඟීම -නිශ්චිත වශයෙන් කියන්න ඕනෑ, ප්‍රවාදයක් ගොඩ නැඟීම කියන එක- තමයි ඒ අය කරන්නේ. කාන්තාවකගේ ලිංගික දිශානතිය ගැන, ලිංගිකත්වය ගැන හිතමින් ඉන්න විපක්ෂයක් බවට අද මේ විපක්ෂය පත් වෙලා තිබෙනවා. මේ, කාන්තාවකගේ ලිංගිකත්වය, ලිංගික දිශානතිය ගැන ප්‍රවාද කතන්දර හදන විපක්ෂයක්; තමන් හිතමින් ඉන්න දේවල් මත පදනම්ව කතන්දර හදන විපක්ෂයක්. ඒක අනෙක් අයත් එක්ක බෙදාගන්න කටයුතු කරනවා, ප්‍රසිද්ධ අවකාශයේ; මහජන අවකාශයේ. කිසිදු ලජ්ජාවක් නැතුව දරුවන්ට, අම්මලාට, තාත්තලාට හැමෝටම පෙනෙන රූපවාහිනී තිරය තුළදී මේ වාගේ දේවල් ගැන කථා කරනවා. රටේ අගමැතිවරිය කියන එක පැත්තකට දමන්න, කාන්තාවකගේ ලිංගිකත්වය ගැනයි මේ කථා කරන්නේ. ලංකාවේ කිසිදු කාන්තාවකට ඒ ආකාරයේ හිරිහැරයක් සිද්ධ විය යුතු නැහැ. නමුත්, ඉතාම අවාසනාවන්ත ලෙස අපි හැමෝටම ඒක බලාගෙන ඉන්න සිද්ධ වුණා. පෞද්ගලිකව මම අදටත් කනගාටු වෙනවා, එවැනි කැත පන්නයේ හිරිහැරයක් රටේ දෙවැනි පුරවැසියාට සිද්ධ වීම බලාගෙන ඉන්න ලැබීම පිළිබඳව. ඒ වාගේම මම ඉතාම ස්තුතිවන්ත වෙනවා, ඒකට විරුද්ධව ඉදිරියට පැමිණි ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරියන් විතරක් නොවෙයි, ඒ සම්බන්ධයෙන් ඉදිරියට ඇවිල්ලා ඒ ගැන, ඒ සකච්ඡාව මතු කිරීමට ඉදිරිපත් වෙච්ච සියලු කාන්තාවන්ට, සියලු කාන්තා සංවිධානවලට. මොකද, එවැනි බලවේගයක්, එවැනි හඬක් නැත්නම් අද මේ විපක්ෂය මේ සාකච්ඡාව පිටිපස්සට ගන්නේ නැහැ. අද දෙතුන් දෙනායි කෑ ගැහුවේ. අදත් කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය ඔය පුටුවේ ඉන්නකොටත් කථා කළා. එහෙම අදත් ඒ දෙතුන් දෙනා කෑ ගැහුවාට මට නම් සියයට සියයක් විශ්වාසයයි එවැනි සාකච්ඡාවක් රට තුළ ඇති වුණේ නැත්නම්, අද මේ විපක්ෂයේ හැමෝම ඇවිල්ලා ඕක තමයි කියන්න බලාගෙන හිටියේ කියලා. ඒක හින්දා තමයි අසභ්‍යකරණය ගැන සාකච්ඡාව, විපක්ෂ නායකතුමා කිසිම ලජ්ජාවක් නැතිව ඇති කළේ. ඒක ලජ්ජාවක් නැතුව ඇති කළා විතරක් නොවෙයි, ඒක ප්‍රවර්ධනය වන ආකාරයේ මාධ්‍ය සන්දර්ශන ඊයේ පෙරේදා වෙනකොටත් කරමින් තිබුණා. මෙතැන ඇවිල්ලා සබුද්ධිකත්වය ගැන කියනවා. පිටිපස්සෙන් ගිහිල්ලා අගමැතිතුමියට අපහාස වෙන ආකාරයේ, කාන්තාවන්ට අපහාස වෙන ආකාරයේ, ආන්තීකරණයට ලක් වෙච්ච ජනතාවට අපහාස වෙන ආකාරයේ මාධ්‍ය සන්දර්ශන කරනවා. මෙන්න මේ කාරණයෙන්, මේ තත්ත්වයෙන් අපේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධව තිබිච්ච සාකච්ඡාව මුදා ගෙන, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් මෙතැන බරපතළ සාකච්ඡාවක් ඇති කර ගැනීමට, එහි අවශ්‍යතාව සම්බන්ධයෙන් සාකච්ඡාවක් ඇති කර ගැනීමට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වූ ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මැදිහත්වීම ඇත්තටම අගය කරන්න අවශ්‍යයි.

අපි මේ වෙලාවේ තවත් දෙයක් තේරුම් ගන්නට ඕනෑ. ඒ තමයි, විපක්ෂයක් වුණාම දේශපාලන විවේචන කිරීම, දේශපාලනය සම්බන්ධයෙන් නොඑකඟතා පැවතීම ගැන ගැටලුවක් නැහැ. ඒක ගැටලුවක් නැහැ. ඒකට නේ, විපක්ෂය ඉන්නේ. නමුත් ඒ නොඑකඟතා ඉදිරිපත් කිරීමේදී අඩුම ගාණේ තමන්ට ඒ නොඑකඟතා ගැන පාර්ලිමේන්තුවේ කථා කළ හැකි ආකාරයට ඒ නොඑකඟතා ඉදිරිපත් කරන්නට ඕනෑ. විශ්වාස භංගයක් ගැන කථා කළා. විශ්වාස භංගයක් ගැන කථා කළාට අද වෙනකොට ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ගන්න බැරුව හැකිළෙමින් ඉන්නවා. ඒ මදිවට මෙතැනට ඇවිල්ලා කියනවා, අපි ස්ථිර කරලා දෙන්න යනවා ලු, ජනතා විමුක්ති පෙරමුණේ අගමැතිවරයෙක් පත් කර ගන්න යනවා ලු. දැන් ඒගොල්ලන් ගේන විශ්වාස භංගය අපි ද ස්ථිර කරලා දෙන්න ඕනෑ? අපි ස්ථිර කරන විශ්වාස භංගයක් නැහැ. ඔයගොල්ලන් විශ්වාස භංගය ගේන්න. විශ්වාස භංගය ගේන්න කියලා අපි මේ අභියෝගයක් කරන්නේ. විශ්වාස භංගය අරගෙන එන්න. විශ්වාස භංගය අරගෙන ආවාම අපි බොහොම පැහැදිලිව පෙන්වන්නම් අගමැතිතුමිය වෙනුවෙන් රජයේ කී දෙනෙක් පෙනී සිටිනවාද කියලා. අගමැතිතුමිය වෙනුවෙන් අපි සාමූහික වගකීමක් දරන්නේ. අගමැතිතුමිය රටේ නැති අවස්ථාවේදීත් එතුමියගේ කීර්ති නාමය වෙනුවෙන්, එතුමියගේ අමාත්‍යාංශය වෙනුවෙන් අපි ඉදිරිපත් වෙන්නේ ඒක නිසායි. අපි ඉදිරිපත් වෙනවා. ඔයගොල්ලන් ඔයගොල්ලන්ගේ දේශපාලනඥයන් වෙනුවෙන් ඉදිරිපත් වෙන්නේ නැතුව ඇති. නමුත් අපි එහෙම නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරියකට වැරැද්දක් වුණාම ඒක එතුමියගේ ඇඟ උඩ දාලා බේරෙනවා. අපට මතකයි නේ, වතු කම්කරුවන්ගේ ප්‍රශ්නයේදී කරපු දේ මොකක්ද කියලා. අපි එහෙම කරන්නේ නැහැ. අපි සාමූහික වගකීමක් දරනවා. අගමැතිතුමියගේ කීර්ති නාමය වෙනුවෙන්, අගමැතිතුමිය වෙනුවෙන් අපි හැමෝම පෙනී සිටිනවා. අදත් පෙනී සිටිනවා. විශ්වාස භංගය ඕනෑ වේලාවක ගේන්න, අපි එදාටත් පෙනී ඉන්නවා. අනිවාර්යයෙන් පරද්දනවා. ඒක වෙනම දෙයක්. නමුත් මේ වෙනකොට විපක්ෂයට බැරි වෙලා තිබෙනවා, දේශපාලන විවේචනයක් හරියට ගොනු කර ගන්න, අධ්‍යාපන ප්‍රතිසංස්කරණය වැනි බරපතළ සාකච්ඡාවක් සම්බන්ධයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතැනදී තේරුම් ගන්න ඕනෑ කාරණය මෙන්න මේකයි. මේ රටේ අම්මලා, තාත්තලා; අද මේ 6 වසරට යන්න බලාගෙන හිටපු දරුවන්ගේ දෙමව්පියන් සමහර අය උද්ඝෝෂණ කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වෙනුවෙන්. මිනිස්සුන්ට මේ ප්‍රතිසංස්කරණ අවශ්‍යයි; මේ රටේ දරුවන්ට මේ ප්‍රතිසංස්කරණ

අවශ්‍යයි; ගුරුවරුන්ට මේ ප්‍රතිසංස්කරණ අවශ්‍යයි; අපේ රටේ සාමාජයට, ආර්ථිකයට ඉදිරියට යෑම සඳහා අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණ අවශ්‍යයි.

මොනවාද, මේ ප්‍රතිසංස්කරණවලින් බලාපොරොත්තු වෙන්නේ? අපේ රටේ දරුවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා, - විශේෂයෙන් ග්‍රාමීය දරුවන්, අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්- අධ්‍යාපනයෙන් නිරන්තරයෙන් හැළෙන. ඔවුන්ට පහසුකම් නැහැ. ගුරුවරුන්ට ප්‍රවේශය නැහැ; පාසල්වලට ප්‍රවේශය නැහැ; හොඳ විෂය නිර්දේශයන්වලට ප්‍රවේශය නැහැ; යාවත්කාලීන - update - කරපු විෂයන්වලට ප්‍රවේශය නැහැ; වෘත්තීය අධ්‍යාපනයට ප්‍රවේශය නැහැ. ඉතින් මේ ප්‍රවේශය අපි හදන්නට ඕනෑ.

අද වෙනකොට අපේ දරුවන් මත්ද්‍රව්‍ය භාවිතයට පුරුදු වෙලා තිබෙනවා. නාගරික දරුවනුත් ඉන්නවා. ග්‍රාමීය දරුවනුත් ඉන්නවා. ආතතිය, මානසික රෝග ඇති වෙලා තිබෙනවා. මේවා තමයි දරුවන්ට තිබෙන ප්‍රශ්න. අද වෙනකොට අධ්‍යාපනය අම්මලා තාත්තලාට බරක් වෙලා තිබෙනවා. දරුවන්ටත් බරක්, අම්මලා තාත්තලාටත් බරක්, අධ්‍යාපනය. අපි මේ ක්‍රමය වෙනස් කරන්නට ඕනෑ. ඉගෙන ගත්තාට, ඉගෙන ගෙන මොකක්ද කරන්නේ කියන එක ගැන බලාපොරොත්තුවක් නැහැ; අපේක්ෂාවක් නැහැ; රැකියා ලබා ගැනීමේ හැකියාවක් නැහැ.

අපේ රටේ අධ්‍යාපනය ලබපු පිරිස අතර පවතින විරැකියාව ඉහළයි. අපේ රටේ educated unemployment කියන එක සාමාන්‍ය විරැකියාවට වඩා ඉහළයි. ඒ කියන්නේ, අධ්‍යාපනය ලබන අයට රැකියා ලබා ගැනීමේ ගැටලුවක් තිබෙනවා, ලංකාවේ. මේවා අප විසඳන්න ඕනෑ ප්‍රශ්න නොවෙයිද? මේවා අපි විසඳන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් පැහැදිලිව concept note එකක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබෙනවා. ඒ ඉදිරිපත් කරන ලද concept note එක අඩු ගානේ කියවලාවත් ආවා නම්, මෙතැන හොඳ සංවාදයක් කර ගන්න තිබුණා. නමුත්, එහෙම කරලාවත් නැහැ. ඒ concept note එකේ බොහොම පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා, අපේ රටේ වෘත්තීය අධ්‍යාපනයට, විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපනයට ඇති ප්‍රවේශය දරුවන්ට ඉතා සීමිත බව. අපි ඒක ලබා දෙන්න ඕනෑ. මොකද, අනාගත ලෝකයත් එක්ක යන රටක් ගැන නේ අපි හැමෝම කථා කළේ. එවැනි රටක් ගැන තමයි අපි හැමෝම සිහින දකින්නේ. එහෙම සිහින දකින්න නම් අපි දරුවන් අනාගතය වෙනුවෙන් සූදානම් කරන්න ඕනෑ. විද්‍යා, තාක්ෂණ දැනුම, වෘත්තීය අධ්‍යාපනය අපි දරුවන්ට ලබා දෙන්න ඕනෑ. නිපුණතා, කුසලතා, soft skills ආදිය අපි දරුවන් තුළ ඇති කරන්න ඕනෑ. ඒවා අපේ එක්තරා පන්තියක් අත විතරක් තිබෙන්න අවශ්‍ය නැහැ. ඒවා එක්තරා ආදායම් මට්ටම්වලට ඉහළින් ඉන්න දරුවන් අත විතරක් තිබෙන්න අවශ්‍යතාවක් නැහැ.

ඉංග්‍රීසි අධ්‍යාපනය ගැන කියමින් පාර්ලිමේන්තුවේදී හිනාවෙන තත්ත්වයක්, එවැනි සමාජයක් ඇති වෙලා තිබෙනවා. ලංකාව එහෙම වෙන්න ඕනෑ නැහැ. අපේ රටට එහෙම වෙන්න අවශ්‍යතාවක් නැහැ. අපේ රටේ හැම දරුවෙකුටම හොඳ අධ්‍යාපනයක් ලැබීමට අයිතියක් තිබෙනවා. ඒ හොඳ අධ්‍යාපනය ලබා දීමේ වගකීම, යුතුකම රජයට තිබෙනවා. අගමැතිවරිය අධ්‍යාපන ඇමතිතුමිය හැටියට සූදානම් වුණේ, සූදානම් වෙන්නේ සහ ඉදිරියට සිද්ධ කරන්නේ ඒ කර්තව්‍යයයි. ඒ කර්තව්‍යයට සහයෝගය ලබා දීමයි කරන්න ඕනෑ.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාව අගය කරන්න ඕනෑ, මේ ඔක්කොම ගාලගෝට්ටි මැද්දේ අඩුම ගණනේ අර වාගේ කුණුහරුප කියන්නේ නැතිව මහත්මා දේශපාලනයක් කිරීමට ඉදිරිපත් වීම සම්බන්ධයෙන්. එතුමා කියලා තිබුණා, කමක් නැහැ මේක අයින් කරන්න, අයින් කරලා මේ education reform එක කරන්න කියලා. ඒ වාගේ මන්ත්‍රීවරු ඇත්තටම තමන්ගේ පක්ෂය ඇතුළේ මේවාට අරගළ කරන්න ඕනෑ. අර කොහේවත් ඉන්න, කුණුහරුප කියන, campaign කරන, මඩ campaign කරන, කාන්තාවන් හිංසනයට ලක් කරන මිනිසුන්ව කෘත්‍යාධිකාරී මණ්ඩලවලට පත් කරලා ඒගොල්ලන්ට ඔටුනු පලඳනවා. මේ රටේ විපක්ෂ නායකතුමායි එහෙම කරන්නේ, රටේ අගමැති ධුරයට කාන්තාවක් පත් වෙලා ඉන්න අවස්ථාවේදී. කාන්තාවන්ට අපහාස කරන මිනිසුන්ට පක්ෂයේ තනතුරු ලබා දෙනවා. ඒවාට විරුද්ධ වෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියලාත් ඒවාට විරුද්ධ වෙන්න ඕනෑ. ඇත්තටම අපි මේ රට ඉස්සරහට ගෙන යන්න නම් යහපත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විතරක් නොවෙයි, යහපත් දේශපාලන සංස්කෘතියක් ද අවශ්‍යයි. ඒ දේශපාලන සංස්කෘතියේ අනිවාර්ය කොටසක් තමයි කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය සහ ඒ අයට නිසි ගෞරවය ලබා දීම, පුරවැසියන්ට නිසි ගෞරවය ලබා දීම. මම හිතනවා, එවැනි තත්ත්වයකට රට මෙහෙයවා ගැනීමට මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා අපට අවස්ථාවක් ලැබෙයි කියලා.

බොහොම ස්තුතියි, කාලය ලබා දුන්නාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA left the Chair and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[ප.ව. 4.02]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நாங்கள் கல்விச் சீர்திருத்தம் தொடர்பாக விவாதித்துக்கொண்டு இருக்கின்றோம். இங்கு பேசிய ஆளுங்கட்சியைச் சேர்ந்த MPsஇன் பேச்சுக்களை நாங்கள் கேட்டுக்கொண்டு இருந்தோம். குறிப்பாக, எனக்கு முன்னர் பேசிய கௌரவ பாராளுமன்ற உறுப்பினர் உட்பட பலர்,

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

எதிர்க்கட்சியினராகிய நாங்கள் கௌரவ பிரதம அமைச்சர் அவர்களை விமர்சிப்பதாகச் சொன்னார்கள். நாங்கள் கௌரவ பிரதம அமைச்சர்மீது அதிக மரியாதை வைத்திருக்கிறோம். அவர் நன்கு படித்தவர்; மிகச் சிறந்த குடும்பத்தைச் சேர்ந்தவர். அவர் இந்த நாட்டின் பிரதமராக இருப்பதையிட்டு நாங்கள் பெருமைப்படுகின்றோம். நாங்கள் பிரதமர் அவர்களுக்கு எதிராக எந்தவொரு வார்த்தையையும் கூறவில்லை என்பதை எல்லோரும் தெளிவாக விளங்கிக்கொள்ள வேண்டும்.

கல்விச் சீர்திருத்தம் என்பது இந்த நாட்டுக்குக் கட்டாயம் அவசியமான ஒன்றாகும். இதனை எப்போதே செய்திருக்க வேண்டும். எதிர்ப்பு மற்றும் அரசியல் காரணங்களுக்காக இதனைச் செய்யாமல் இருந்தார்கள். இந்நிலையில், கௌரவ பிரதமர் ஹரினி அமரசூரிய அவர்கள் இந்த educational reformஐக் கொண்டுவந்து நடைமுறைப்படுத்துவதாக மிகத் தெளிவான தீர்மானத்தை எடுத்து, இதனை நடைமுறைப்படுத்த முனைந்தார்கள். இதனை நாங்கள் பாராட்டுகின்றோம். எந்த வகையிலும் இது பிற்போடப்படக் கூடாது. இந்த educational reform கட்டாயம் செய்யப்பட வேண்டும். இதில் உள்வாங்கப்பட்டுள்ள சில subjects சம்பந்தமாகத்தான் பிரச்சினை இருக்கிறது. குறிப்பாக, பாலியல் தொடர்பான - ஓரினச் சேர்க்கை தொடர்பான - சில அம்சங்கள்தான் மத, சமய, கலாசாரம் சார்ந்து பிரச்சினையை ஏற்படுத்தி இருக்கின்றது. மதத் தலைவர்களும் புத்திஜீவிகளும் பாலியல் சம்பந்தமாக உட்புகுத்தப்பட்டுள்ள பாடம் அகற்றப்பட வேண்டுமென்ற கோரிக்கையை விடுத்தார்களே தவிர, இந்த educational reform நிறுத்தப்பட வேண்டுமென யாரும் கோரிக்கை விடுக்கவில்லை.

இந்த நாட்டிலுள்ள syllabus, system எல்லாமே outdated. அயல் நாடான இந்தியா போன்ற நாடுகள் தகவல் தொழில்நுட்பத்தில் - information technologyஇல் - முன்னேறி எங்கேயோ சென்றுகொண்டு இருக்கும்போது, இன்னும் நமது பல்கலைக்கழகங்களில் 5-10 வருடங்களுக்கு முன்னர் தயாரிக்கப்பட்ட syllabusதான் கற்பிக்கப்படுகின்றது. அதனை மாற்றியமைப்பதற்கான வழிவகைகள் இல்லை; போதியளவு நிதி ஒதுக்கீடு இல்லை. நாங்கள் எங்களுடைய syllabus மற்றும் systemஇல் மாற்றத்தைக் கொண்டுவராத வரை எங்களுடைய மாணவர்களுக்குச் சிறந்ததோர் எதிர்காலத்தை ஏற்படுத்திக் கொடுக்க முடியாது. பாடசாலைக் கல்வி, பல்கலைக்கழக கல்வி என்பன படித்துவிட்டு வெறுமனே வீட்டில் இருப்பதற்கு அல்ல.

தமது பிள்ளைகள் படித்து முடிந்தவுடன், குடும்பத்தைப் பாதுகாக்கக்கூடிய வகையில் மிகச் சிறந்த தொழிலுக்குச் செல்ல வேண்டுமென பெற்றோர் ஆசைப்படுகின்றார்கள். தற்பொழுது, இச்சபையில் கௌரவ பிரதம அமைச்சர் அவர்கள் இங்கில்லாவிட்டாலும், அவரால் கொண்டுவரப்பட்ட educational reformஐ நாங்கள் வரவேற்கின்றோம். அதில் எந்தவித மாற்றுக் கருத்தும் கிடையாது. அதனை implement பண்ணுவதற்குத் தேவையான முழு ஒத்துழைப்பையும் நாங்கள் வழங்குவோம். அதில் எந்தப் பிரச்சினையும் கிடையாது. ஆனால், அது சமய, கலாசார, விழுமியங்களைப் பேணும் வகையில், எல்லா மதங்களும் ஏற்றுக்கொள்ளக்கூடிய வகையில் இருக்க வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, புதிய கல்விச் சீர்திருத்தத்தை நடைமுறைப்படுத்துவதை ஒரு வருடம் பிற்போடுவது - postpone பண்ணுவது - என்பது மிகப் பெரிய தவறாகும். சிலவேளை 2027ஆம் ஆண்டில்கூட இது நடைமுறைப்படுத்தப்படாமல் போகலாம். எனவே, இந்த educational reform நடைமுறைப்படுத்தப்பட வேண்டும். உடனடியாக இதில் மாற்றம் கொண்டுவரப்பட வேண்டும். குறிப்பாக, subjectsஇல் மாற்றம் கொண்டுவரப்பட வேண்டும்; syllabusஇல் மாற்றம் கொண்டுவரப்பட வேண்டும். பாடசாலைகளில் மாத்திரமல்ல, பல்கலைக்கழகங்களிலும் இந்த systemஇல் changeஐக் கொண்டுவரும்போதுதான் எங்களால் எதிர்காலத்தில் நல்லதொரு சமூகத்தை உருவாக்க முடியும்.

Sir, I would like to say a few words on behalf of the thousands of young Sri Lankans whose dreams are shaped or, too often, shattered by our education system.

Every year, nearly 180,000 students qualify for university entrance through the GCE Advanced Level Examination. But, only around 45,000 are admitted to State universities. That means, more than 135,000 qualified students are left out, not because they fail, but because our system fail them. Our State universities alone, where lecture halls are overcrowded, facilities are strained and the academic staff is under pressure, cannot meet this growing demand. That is why non-State universities have become not a luxury, but a necessity today. They must complement State universities, but not replace free education.

However, Sir, educational expansion must be done responsibly. We need a clear National Policy, strict accreditation, foreign university partnerships, public-private partnerships, student protection mechanisms and scholarship support for deserving students. Education reform must also prioritize teachers, accuracy of curricula and stakeholder consultation. Education is not a political issue; it is a national responsibility. When over 135,000 qualified students are denied opportunity for university education each year, Parliament has a moral duty to act wisely and inclusively.

Reform education, but reform it carefully; expand access to education, but protect its quality; listen to criticism, because constructive opposition strengthens democracy, as the future of our children is too important to undergo trial and error.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.08]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධ ඉතාම වැදගත් විවාදයකටයි අපි සම්බන්ධ වෙන්නේ.

අපි මේ විවාදය බලාපොරොත්තු වුණේ මෙහෙම නොවෙයි. ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත් කරන කල් තැබීමේ යෝජනාවක් හැටියට වඩා, විපක්ෂයෙන් විශ්වාසභංග යෝජනාවක් ගෙනැල්ලා ඒක අද සහ හෙට විවාදයට ගත්තා නම් අපි වඩාත් කැමතියි. හැබැයි, අද මොකක්ද මේ විපක්ෂයට වෙලා තිබෙන්නේ කියන එකත් හොඳටම පැහැදිලියි. විපක්ෂයේ ඔක්කෝටම නොවෙයි මම එහෙම කියන්නේ. විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා නායකත්වය දෙන යම් කණ්ඩායමකටයි මම ඒක කියන්නේ. ලෝකයේ ජනතාව තුළ විවිධ ඇදහිලි සහ විශ්වාස පවතිනවානේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒවා දෙස කෙනෙක් විද්‍යානුකූලව බලනවා; තව කෙනෙක් සම්ප්‍රදාය හා විශ්වාසය මත බලනවා. පොල් ගහන එක, සීනිගම ගිහිල්ලා මිරිස් අඹරන එක වාගේ දේවල් සමහර ජනතාව ඒ අයගේ විශ්වාසය අනුව විශ්වාස කරනවා. ඒවා විශ්වාස කරන ජනතාව තුළත් විශ්වාසයක් තිබෙනවා, බොරු හේතු මත මිරිස් ඇඹරුවොත්, පොල් ගැහුවොත් ඒක ආපස්සට වදිනවා කියලා. සමහර විට ඒ ජනතාව විශ්වාස කරන ආකාරයේ කලබැගෑනියක්, සංසිද්ධියක් විපක්ෂයට වෙලා තිබෙන්නත් පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවස පුරාම මේ විවාදයේ දී මම දැක්කා මේ විපක්ෂයේ මන්ත්‍රීවරු කියන්න හදනවා අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට ඒගොල්ලන් විරුද්ධ නැහැ කියලා. හැබැයි, මතුගමට ගිහිල්ලා ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ පිළිරුව ඉදිරිපිට දී මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට විරුද්ධව උද්ඝෝෂණය කළේ කවුද? සජිත් ප්‍රේමදාස, දිලිත් ජයවීර, ජගත් විතාන ඇතුළු කණ්ඩායම. ඒගොල්ලෝ කිව්වේ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එපා කියලා. මෙතැනට ඇවිල්ලා කියනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධ නැහැ කියලා. මේ තිබෙන්නේ "අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට එරෙහිව, හරිනිට එරෙහිව සජබ කාන්තාවෝ කතරගම දී පොල් ගසති." ඒගොල්ලන් තමයි ඒවා කළේ. නමුත් මෙතැනට ඇවිල්ලා කියනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධ නැහැ කියලා. ඊයේ-පෙරේදා සිද්ධියක් මේක. "මොඩියුලයට එරෙහිව හෝමාගම පුංචි සභාවේ විපක්ෂය කළු වෙයි." අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධව ප්‍රාදේශීය සභාවේ සජබ මන්ත්‍රීවරු කළු පටි බැඳ ගෙන ගියා විතරක් නොවෙයි, පාරට බැහැලා උද්ඝෝෂණය කරනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එපා කියලා. මේ වාගේ තවත් තැන් තැන්වල සජබයේ මන්ත්‍රීවරු යොදාගෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එපා කියලා උද්ඝෝෂණ කළා. මම දැක්කා, රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා එතුමාගේ පාක්ෂිකයෝ කිහිප දෙනෙක් අරගෙන අනුරාධපුරයේ තැන් තැන්වල උද්ඝෝෂණ කරනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එපා කියලා. සජබයත් එක්ක හරි හරියට හවුලට ජන අරගළ පක්ෂයත් -මම හිතන හැටියට පෙරටුගාමී සමාජවාදී පක්ෂය තමයි එක - බෝඩ් උස්සා ගෙන උද්ඝෝෂණය කරනවා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එපා කියලා. මේ තමයි ඒ කණ්ඩායම්. දැන් ඒ අයට එල්ල වෙන බරපතළ විරෝධය නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට කැමතියි කියලා මෙතැනට ඇවිල්ලා කිව්වාට, එළියේ ඉන්න තමන්ගේ පුංචි පුංචි කල්ලි මෙහෙයවලා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නතර කරන්න උද්ඝෝෂණය කරනවා.

එහෙම කළාට කමක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි හරිහමන් තර්කයක්, ප්‍රතිපත්තියක් මත පදනම් වෙලා නම්. සමහර විරෝධතා තිබෙනවා, ඒ විධියේ. හැබැයි, මේගොල්ලෝ කියන්නේ මොකක්ද? දැන් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට විරුද්ධව කටයුතු කරන එක්කෙනෙක් තමයි දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. මම ඊයේ අහගෙන හිටියා, එතුමා කියන ප්‍රධාන දෙයක් තමයි ඒගොල්ලෝ ඉගෙන ගන්න කාලයේ රූල් පහේ පොත් තිබුණාය, දැන් රූල් පහේ පොත් නැහැ කියන එක. ඔන්න අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධ වෙන්න හේතුවක්! ඒ වාගේම, නාමල් රාජපක්ෂ මැතිතුමාගේ කණ්ඩායමේ කියලා මම හිතන මධුර විතානගේ මැතිතුමා ප්‍රසිද්ධ ටීවී නාලිකාවකට ඇවිල්ලා කියනවා, මේ මොඩියුල බැලුවාම සමහර ඒවායේ print එක අනෙක් පැත්තෙන් පෙනෙනවාලු. රූපයක් බැලුවාම අනෙක් පැත්තෙනුත් ඒක පෙනෙනවා ලු. මේ ප්‍රතිසංස්කරණවල එතුමාට තිබෙන ප්‍රශ්නය තමයි ඒක. ඔන්න මොඩියුලවල ප්‍රශ්නය!

සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාට අනුව නම්, එතුමාට මේක තේරෙන්නේ අධ්‍යාපන අසභ්‍යකරණයක් හැටියට. අපි මේ ප්‍රතිසංස්කරණ හඳුන්වා දීලා ක්‍රියාත්මක කරන්න පටන් ගත් මොහොතේ සිටම එතුමා හඳුන්වා දුන් වචනය තමයි, "අධ්‍යාපන අසභ්‍යකරණය." ගරු විපක්ෂ නායකතුමා කොහේට හරි වෙලා මේ කථාව අහගෙන ඉන්නවා නම් මට ඇවිල්ලා කියන්න, මේ පොත් දැක්කාම, හය ශ්‍රේණියේ දරුවන්ගේ මොඩියුල ටික දැක්කාම ඔබතුමාට එන අසභ්‍ය සිතුවිලි මොනවාද කියලා? මේ පුරවැසි අධ්‍යාපනය පොතේ පිට කවරය දැක්කාට පස්සේ සජිත් ප්‍රේමදාස මැතිතුමාට එන අසභ්‍ය සිතුවිල්ල මොකක්ද? මේ පොතේ පිට කවරය දැක්කාම එතුමාට සමලිංගික නැඹියාවක් එනවාද? මට භය හිතෙන්නේ හදිසියෙන්වත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ පොත කියවන්න හරි ගත්තොත්, - මම දන්නවා, ගොඩක් අය මේ පොත අතටවත් අරගෙන නැහැ කියලා - මේ පුරවැසි අධ්‍යාපන පොතේ එක තැනක තිබෙනවා, මේ මොඩියුල් එකේ තිබෙනවා, කණ්ඩායම් ක්‍රියාකාරම් සඳහා උපදෙස් කියලා. පොඩි පිරිමි ළමයි දෙන්නෙක්, යාළුවෝ දෙන්නෙක්, කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට යන විධිය දැක්වෙන රූපයක් ඇඳලා තිබෙනවා. පිරිමි ළමයි දෙන්නෙක් එක්ව යන විධිය ඇඳලා තිබෙනවා. මේක දැක්කාමත් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට, සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාට වගේ ප්‍රශ්නයක් වෙයිද දන්නේ නැහැ. මේ රූපයත් අසභ්‍යකරණයක්ය, මේ රූපය දැක්කාමත් එතුමාට ලිංගික නැඹියාවක් පිළිබඳ අදහසක් එනවා කියලා හිතෙන්න පුළුවන්. පොඩි ළමයි දෙන්නෙක්, යාළුවෝ දෙන්නෙක් එක්ව ඉස්කෝලේ යන රූපයක් තිබෙන්නේ. ඒ වාගේ ඒවා ඕනෑ තරම් තිබෙනවා නේ. එතුමාටම හරියන ගම්මන්පිල හිටපු මන්ත්‍රීතුමාට මේ පොත පෙරළාගෙන පෙරළාගෙන යන කොට මොකක්ද හිතෙන්නේ? පොඩි දරුවෝ එළියට බැහැලා පරිසරයේ දේවල් අධ්‍යයනය කරන කොට දේදුන්නක් දැක්කාම - දේදුන්නේ පාට දැක්කාම - උන්නැහේට මතක් වෙන්නේ, සමලිංගික කොඩිය ලු. ඒක දැක්කාම LGBTQ එකට අදාළ කොඩිය මතක් වෙනවා ලු. ඉතින් ප්‍රශ්නය තිබෙන්නේ කාගේද? ප්‍රශ්නය තිබෙන්නේ හයේ පන්තියේ දරුවන්ගේවත්, ඒ දෙමව්පියයන්ගේවත් නොවෙයි. ප්‍රශ්නය තිබෙන්නේ මේවා දැක්කාට පස්සේ එහෙම අසභ්‍යකරණයට ලක් වෙලා තිබෙන, ඒ ආකාරයේ ලිංගික නැඹියාවේ සිතුවිලි පහළ වෙන සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා ඇතුළු කණ්ඩායමට.

මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මේ දරුවන් වෙනුවෙන් කරපු ඉතාම හොඳ වැඩක්. ඒක නතර කරන්නට සාහසික ලෙස යොදාගත් දේවල් මොනවාද? මෙන්න මේ දේවල්. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ කාලයේ පත් කරපු, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා තියාගෙන හිටපු ආණ්ඩුකාරයෙක් වන කීර්ති තෙන්නකෝන් පුරවැසි අධ්‍යාපන පොතේ තිබෙන පාට පෙන්වලා එයාගේ ෆේස්බුක් එකේ ලියනවා, මේ පාට දැම්මාම සමලිංගික නැඹියාවක් එනවා කියලා. ඉතින් මෙහෙම තමයි මේ විපක්ෂය හැසිරෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකටම හරියන්න විමල් වීරවංශත් එකතු වෙනවා. මේකටම හරියන්න තව වෘත්තීය සමිති නායකයෙකුත් එකතු වෙනවා. මෙන්න මේ හතර පස්දෙනාගේ කල්ලිය විසින් 6 ශ්‍රේණියේ දරුවන්ට විවර වෙන්නට තිබුණු ලෝකයක් අකුල් හෙළලා බාධා කළා. ඒක පැහැදිලිව කියන්න

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ඕනෑ. ඒ කණ්ඩායම ඉතාම දුෂ්ට අරමුණින් බලය ලබා ගන්න ඕනෑ දෙයක් කරනවා. හය පන්තියේ දරුවෙක් වුණත් කමක් නැහැ, ඒ හරහා ඒ අයට බලය ලබා ගන්න පාර කපා ගන්න පුළුවන් නම්. ඒකට තමයි මේ දරුවෝ ටික යොදා ගන්න හැදුවේ. තමන්ට බලය ලබා ගැනීමට එක එක වංගු ගහන්න, ඒ වෙනුවෙන් දේශපාලන කණ්ඩායම් එකතු කරන්න, ඒ වෙනුවෙන් ජනතාව කුපිත කරවන්න තමයි සජිත් ප්‍රේමදාස, දිලිත් ජයවීර, විමල් වීරවංශ, නාමල් රාජපක්ෂ සහ අර එක වෘත්තිය සමිති නායකයෙක් කටයුතු කළේ. මෙන්න මේ කණ්ඩායම තමයි 6 ශ්‍රේණියේ දරුවන්ට විවර වෙන්න තිබුණු මේ දොරටුව වැහුවේ.

නමුත් කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපන පනත ගෙනැල්ලා ඉදිරිපත් කරපු උදාන වාක්‍යයත් ලජ්ජා නැතුව කියනවා. කන්නන්ගර මැතිතුමා මීට අවුරුදු 80කට කලින් කිව්වේ, ඔගස්ටස් අධිරාජ්‍යා කිව්වාය කියලා, "ගඩොලින් තැනූ රෝමය මම කිරි ගරුඬෙන් තැනුවෙමි" කියන උදාන වාක්‍ය. නමුත් මේ විපක්ෂයේ කට්ටියට ඕනෑ, ගඩොලින් හදපු රෝමය කඩොලින්ම තියන්නයි; වැහුණු පොතක්ව තිබුණු අධ්‍යාපනය වැහුණු පොතක් හැටියටම තියන්නයි. ඒ අය මේක විවෘත කරන්න සූදානම් නැහැ. එල්ලෙන්න වැලේ වැල් නැතුව ඉන්න කොට කොහේ හරි එල්ලෙනවා.

ඒකේ තව එකක් තමයි, අද "මව්බිම" පත්තරේ තිබෙන්නේ. මුල් පිටුවේ තිබෙනවා, "බුදු දහම ආරක්ෂා කිරීමේ වගන්තිය ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීමේ සූදානමක් ඇති බව හිටපු ජනපති රනිල් කිව්වා" කියලා. මම මේකේ වීඩියෝව ගෙනැල්ලා බැලුවා, "අද දෙරණේ" ගිය එක. එහෙම කිව්වා නම්, "දෙරණ" ඒක නොදා ඉන්න කිසිම හේතුවක් නැහැනේ. අඩුම ගණනේ මේ කථාව ඒකේවත් නැහැ. "බුදු දහම ආරක්ෂා කිරීමේ වගන්තිය ව්‍යවස්ථාවෙන් ඉවත් කරන්න සූදානමක් තිබෙනවා කියලා රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය." කියලා තිබෙනවා. මොකක්ද මේ කියන්නේ? එහෙම කියලාත් නැහැ, මම දන්නා හැටියට. මම තවත් පත්තර කිහිපයක බැලුවා. මේ පත්තරයේ විතරයි මෙහෙම තිබෙන්නේ. මේ කියන්න හදන්නේ ආණ්ඩුව බුදු දහමට එරෙහිව කටයුතු කරන්න හදනවා කියන එක. ඒක නේ මේ කියන්න හදන්නේ. එතුමා අපේ කොළඹ ජාතික රෝහලේත් පසුගිය දවස්වල ප්‍රතිකාර ගත් නිසාත්, සමහර විට තනි ධමනියෙන් වැඩ කරන කොට මොළයට ලේ සැපයුම අඩු වෙන්න ඉඩකඩ තිබෙන තත්ත්වය නිසාත් මෙහෙම කියැවෙන්න ඉඩකඩ තිබෙනවාද කියලා බලන්න ඕනෑ. අපි ලෑස්තියි, එතුමා ක්ලිනික්වලට ගෙනැල්ලා ඒ ප්‍රතිකාර කරන්නට. මේකත් මේ කුමන්ත්‍රණයේම කොටසක්.

මේකම තමයි අල්ලා ගත්තේ විපක්ෂ නායකතුමාත්, තව කිහිප දෙනෙකුත් අපි ධර්ම චක්‍රය වෙනස් කරන්න කටයුතු කළාය කියන්න. මේ කාරණය මම නැවතත් කියනවා. හේතුව මේකයි. මේක නොදැන කරපු වැඩක් නොවෙයි. මේ පොත පෙන්වලා කිව්වේ එහෙම නේ. ආණ්ඩුව ධර්ම චක්‍රයත් වෙනස් කරලා කිව්වා. රනිල් වික්‍රමසිංහ කිව්වාය කියලා "මව්බිම" පත්තරේ දාපු ඒ campaign එකේ දිගුවක් තමයි මේක. "ආණ්ඩුව ධර්ම චක්‍රයත් වෙනස් කරලා. බලන්න කෝ මේ වාගේ ආණ්ඩුවක්." ඒකයි කියන්න හදන්නේ. මේ කාරණයට අදාළ කරුණු අපේ නජිත් ඉන්දික මැතිතුමාත් සභාගත කළා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ තාත්තා ආණ්ඩු කරන කාලයේ 2550 සංවත්සරයට 2006 අවුරුද්දේ ගහපු කාසියේ තිබෙන්නේත් ගරාදි 24 සහිත ධර්ම චක්‍රයමයි. ඊළඟට, 2600 වැනි සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් 2011දී - ඒත් එතුමන්ලාගේ ආණ්ඩුව; මහින්ද රාජපක්ෂ මැතිතුමා හිටපු ආණ්ඩුව - නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමන්ලාගේ පක්ෂය නියෝජනය කරපු ආණ්ඩුව රුපියල් 1,000 කාසිය වාගේ දේවල් නිර්මාණයට යොදා ගත්තේ අර ගරාදි 24 ධර්ම චක්‍රයම තමයි. මේවා අලුත් දේවල් නොවෙයි. ඊළඟට, මේ කාරණය ගැන කියපු සජිත් ප්‍රේමදාස මැතිතුමන්ලාගේ පක්ෂය ආණ්ඩුව කරපු 2015 ඉඳලා 10වැනි ශ්‍රේණියේ බුද්ධ ධර්මය ගුරු මාර්ගෝපදේශයේ තිබෙන්නේත් ඒකම තමයි. එදා ඉඳලා ධර්ම චක්‍රය තිබිලා තිබෙන්නේත් ඒ විධියටම තමයි. මේ තිබෙන්නේ 11වැනි ශ්‍රේණියේ බුද්ධ ධර්මය ගුරු මාර්ගෝපදේශය. මේකේ තිබෙන්නේත් අර ගරාදි 24 තිබෙන ධර්ම චක්‍රයම තමයි. මේ ගැන සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලය බොහොම පැහැදිලිව නිර්දේශ කර තිබෙනවා. මේ මණ්ඩලය නියෝජනය කරන්නේ අපේ රටේ සිටින ඉතා කීර්තිමත්, ධර්මධර, විනයධර අපේ හාමුදුරුවන් වහන්සේලායි. රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජය කීර්ති මහ ස්වාමීන්ද්‍රයන් වහන්සේ, අග්‍ර මහා පණ්ඩිත අතිපූජ්‍ය ත්‍රිකුණාමලයේ ආනන්ද නායක ස්වාමීන් වහන්සේ, උඩරට අමරපුර නිකායේ අනුනායක කිවුලේගෙදර නාරද ස්වාමීන් වහන්සේ ඇතුළු කණ්ඩායම තමයි අර ගරාදි 24 ධර්ම චක්‍රය පිළිබඳ නිර්දේශ කරන්නේ. මේවා, මේ අය දන්න දේවල්. හැබැයි ධර්ම චක්‍රයේ එල්ලිලා හරි කමක් නැහැ, ආණ්ඩුව බුදු දහමට නිගරු කරනවා, අපහාස කරනවා කියලා බොරුවක් සමාජ ගත කරන්න බැලුවා. ඒ ගොල්ලන්ගේ ආණ්ඩුව තිබුණු කාලයේ -2015න් පසුව- ගුරු මාර්ගෝපදේශ පොත්වල තිබුණු ඒ සංකේතය පිළිබඳව දැන ගෙනම ඒ බොරුව කළා.

මෙහෙම විපක්ෂයක්! මෙහෙම විපක්ෂයක් එක්ක තමයි අපට වැඩ කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීවරුනි. විපක්ෂය කියලා කිව්වාට අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට එරෙහිව මේ අය සකස් කරපු විශ්වාස භංගයට විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු; දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරු අත්සන් කළේ නැහැ කියලා මම දන්නවා. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමන්ලා ඇතුළු ඔය සිටින මන්ත්‍රීවරු අත්සන් කළේ නැහැ. අපි එදා ඒ ගැන අහනකොට විශ්වාස භංගයට තව අත්සන් ඕනෑ කියලා කිව්වා. ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් විශ්වාස භංගයක් ඉදිරිපත් කරන්න අත්සන් 20ක් තිබුණා නම් ඇති. ඒ ගොල්ලෝ විශ්වාස භංගයට අත්සන් කරන එක ගැන සාකච්ඡා කරද්දී ගත්තු ෆොටෝ එකේ මන්ත්‍රීවරු 22ක් හිටියා. එතැන හිටපු තුන්දෙනෙක් විතර අත්සන් කරලා නැහැ වාගේ තමයි පෙනෙන්නේ. ඉතින් අපි කියන්නේ, කරුණාකරලා ඔය විශ්වාස භංගය ගේනවා නම් ගෙනෙන්න. විපක්ෂයේ මන්ත්‍රීවරු තමන්ගේ හෘද සාක්ෂියට එකඟව සජිත් ප්‍රේමදාස ඇතුළු කුඩා කණ්ඩායමක කුමන්ත්‍රණවලට අහු වෙන්නේ නැතිව වැඩ කළා. අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? අන්න, ඒ විශ්වාස භංගයට අත්සන් නොකරපු මන්ත්‍රීවරුන්ට පහර දෙන්නට විපක්ෂයේ මන්ත්‍රීවරු කටයුතු කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව විනාඩි දෙකක් ගන්නවා.

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සම්බන්ධ කරගෙන එල්ල කරපු ප්‍රහාරය ගත්තොත්, ඒක මේ විශ්වාස භංගයට අත්සන් නොකිරීමේ ප්‍රතිඵලයක් වෙන්න පුළුවන්. ඔබතුමන්ලාටත් මේ ප්‍රහාරය ඒ

වාගේ කල්ලියකින් එන්න පුළුවන්. එහෙම තමයි ඒ ගොල්ලෝ කටයුතු කරන්නේ. මේ පිටුපස තව ගොඩක් දේවල් තිබෙනවා. අපට පෙනෙනවා, ඒ ගොල්ලෝ අද බොරු බිල්ලෝ මවලා, විශේෂයෙන් බුදු දහම සම්බන්ධයෙන් ආණ්ඩුව අනුගමනය කරන ප්‍රතිපත්තිය පිළිබඳව සාහසිකව බොරු කියමින්, හදන්න හදන දෙයක් තිබෙනවා. මොකද, ඒ ගොල්ලෝ දන්නවා ක්‍රම ක්‍රමයෙන් ක්‍රම ක්‍රමයෙන් තමන් කරපු වැරැදිවලට නීතිය ක්‍රියාත්මක වෙන්න පටන් ගන්නවා කියලා, නඩු අහන්න පටන් ගන්නවා කියලා. මේ ගොල්ලෝ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීමට එරෙහිවත් කටයුතු කරපු අය. මේ ගොල්ලෝ, විගණකාධිපතිවරයෙක් පත් කිරීමට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කුමන්ත්‍රණය කරන අය. මොකද, ඒ කටයුතු හරියට සිදු වුණොත් තමයි ඒ ගොල්ලෝ කරපු දේවල්වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක වෙන්න පටන් ගන්නේ. ඒවා අඩපණ කරන්න උත්සාහ කරමින් සිටින අතරේ අනෙක් පැත්තෙන් කරන දේ තමයි, මේ ආකාරයට ඉතාම සාහසික බොරු මත පතුරුවමින්, 6 පන්තියේ දරුවෙකුගේ හරි කමක් නැහැ ඇගේ එල්ලෙමින් ආණ්ඩුවට විරුද්ධව දේශපාලන ව්‍යාපාර ගොඩනඟන්න හදනවා, තමන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක වීම වළක්වාගන්නට. එහෙම නැත්නම් මේ වගේ බොරු ප්‍රවෘත්ති පළ කරන්න විධියකුත් නැහැ, ඇත්තටම මේ වගේ එකක් කියන්න හේතුවකුත් නැහැ. ඒක නිසා අද දවස තුළම පෙන්නුම් කරන්නේ වෙන මොකුත් නොවෙයි.

මම අපේ රටේ 6 ශ්‍රේණියේ දරුවන්ගේ දෙමව්පියන්ට; මේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ බලාපොරොත්තු වන දෙමව්පියන්ට විශේෂයෙන්ම මේ කාරණය කියන්න කැමැතියි. 21වන සියවසට ගැළපෙන දරුවෙක්; පුරවැසියෙක් නිර්මාණය කිරීම වෙනුවෙන්, 21වන සියවසේ අභියෝග ජයග්‍රහණය කරන්න පුළුවන් පුරවැසියෙක් නිර්මාණය කර ගන්නට අවශ්‍ය කරන, "ජීවිතය සඳහා තාක්ෂණවේදය", "ව්‍යවසායකත්වය සහ මූල්‍ය සාක්ෂරතාව", "තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය", මේ ආදී විෂය කරුණු ඇතුළත්ව මේ මොඩලය සකස් කරලා තිබෙන්නේ ඔබේ දරුවා වෙනුවෙන්. ඔබේ දරුවාට ඒ අනාගත ලෝකය විවෘත වන එක වළක්වන්නට බොරු කියමින්, කුමන්ත්‍රණය කරමින්, ජනතාව අවුස්සමින් කටයුතු කරන්නේ වෙන කවුරුත් නොවෙයි, විපක්ෂයේ පොඩි කණ්ඩායමක්. අන්න ඒ කණ්ඩායම පිළිබඳව අවබෝධ කර ගන්න. රට ඉස්සරහට යන එක වළක්වන්න කරන්න පුළුවන් හැම දේම ඒ කණ්ඩායම කරනවාය කියන එකත් ඔබ මතක තබා ගන්න. එම නිසා මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල තිබුණු දෝෂය නිවැරදි කරගෙන, ඒ දෝෂය කරපු අයට දඬුවම් කරලා අපි මේ ගමන ඉස්සරහට යමු. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉදිරියට අරගෙන යෑම වෙනුවෙන් ඔබ හැමදෙනාගේම සහයෝගය බලාපොරොත්තුවෙන් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.28]

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කරනකොට කියන්න ඕනෑ, විශේෂයෙන්ම මේ රටට අලුත් අධ්‍යාපන ක්‍රමයක් අවශ්‍යයි. අපි ඒකට විරුද්ධ නැහැ. ඇත්තටම තිබෙන ක්‍රමයේ අඩු පාඩු තිබෙනවා. 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගත්තොත්, ඇත්තටම එතැන ප්‍රශ්නයක් ඇති වුණේ නැහැ. නමුත්, 6 ශ්‍රේණියේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ප්‍රශ්නයක් තිබෙනවා. ඒක ගරු ජනාධිපතිතුමාත් පිළිගත්තා, ආණ්ඩුවත් පිළිගත්තා. එම නිසා ඒක අවුරුද්දකට කල් දමා තිබෙනවා. ඒ වැරදි නිවැරදි කරලා දරුවන්ට ලබා දෙන්න කියලා අපි කරුණිකව ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම අධ්‍යාපනය කියලා කියන්නේ රටේ මූලිකම අවශ්‍යතාවක්. අධ්‍යාපනයට ඉහළින් එකක් නැහැ. විශේෂයෙන්ම මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සකස් කරනකොට දෙමව්පියෝ ඉන්නවා, දරුවෝ ඉන්නවා, ගුරුවරු ඉන්නවා, විදුහල්පතිවරු ඉන්නවා, කලාප හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරු ඉන්නවා, ඒ වාගේම අධ්‍යාපනයට සම්බන්ධ විශේෂඥවරු ඉන්නවා. ඒ අයත් එක්ක සාකච්ඡා කරලා මෙම ප්‍රතිසංස්කරණ පහළ මට්ටමින් ආරම්භ කළා නම් ප්‍රශ්නයක් මතු වෙන්නේ නැහැ. මේක විශාල ප්‍රශ්නයක්. ආණ්ඩු පක්ෂය, විපක්ෂය කියලා නැහැ, මේ රටේ සියලුම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලැබෙන්න ඕනෑය කියන මතයේ අපි ඉන්නවා. ඒකේ කිසි වෙනසක් නැහැ.

මම විශේෂයෙන් සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යවරිය හැටියට ගරු අග්‍රාමාත්‍යතුමිය පුත්තලමේ සංචාරයකට සහභාගි වුණා. එතුමිය පුත්තලම අධ්‍යාපන කලාපයේ අඩු පාඩු සොයා බලා කටයුතු කිරීම සම්බන්ධයෙන් අපි එතුමියට ස්තුතිය පළ කරනවා. අපි පෞද්ගලිකව එතුමියට මඩ ගහන්න යන්නේ නැහැ. කාන්තාවක්ද, පිරිමියෙක්ද කියලා මෙතැනදී ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. නමුත්, අධ්‍යාපන විෂය තුළ ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම මේ ප්‍රශ්නය එන්න ඉස්සෙල්ලා ගරු කාදිනල්තුමා හිරු නාළිකාවේදී ප්‍රකාශ කළා, මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඒ පිළිබඳව ගරු ජනාධිපතිතුමාව දැනුවත් කළා. එම නිසා අපි තොරතුරු සොයා බලා මේ කටයුතු කරනවා නම්, ආණ්ඩු පක්ෂයට ඇඟිල්ල දිගු කරන්න ඕනෑත් නැහැ, විපක්ෂයට ඇඟිල්ල දිගු කරන්න ඕනෑත් නැහැ.

විශේෂයෙන්ම පුත්තලම අධ්‍යාපන කලාපය ගැන කියනවා නම්, පුත්තලම අධ්‍යාපන කලාපය තුළ විද්‍යා ගුරුවරු, ඉංග්‍රීසි ගුරුවරු, ICT ගුරුවරු, ගණිතය ගුරුවරු ඇතුළු 500ක පමණ ගුරු පුරප්පාඩු තිබෙනවා.

ඒ ගුරුවරු නැතුව අධ්‍යාපනය ඉස්සරහට ගෙනියන්නේ කොහොමද? ඒකට මුල් තැන දෙන්න ඕනෑ. භෞතික සම්පත්, මානව සම්පත් නැත්නම් මේ ළමයින්ට උසස් අධ්‍යාපනයට ඉදිරියට යන්න බැහැ. අලුත් අධ්‍යාපන ක්‍රමයේදී මේවාත් ඇතුළු වෙන්න ඕනෑ.

අනෙක් කාරණය, පුත්තලම අධ්‍යාපන කලාපයේ පාසල් 213ක් තිබෙනවා; ළමයි 8,267ක් ඉන්නවා. පුත්තලම අධ්‍යාපන කලාපය තුළ පාසල් විශාල ප්‍රමාණයක තව වැඩ තිබෙනවා කරන්න. පුත්තලම අධ්‍යාපන කලාපය දෙකට කැඩෙන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් කල්පිටිය සහ මදුරන්කුලිය කොට්ඨාස දෙක යාබදව කටයුතු කරන්න කියලා මම කියනවා. පුත්තලම අධ්‍යාපන කලාපය කලාප දෙකකට වෙන් කරලා දෙන්න කියමින්, මම මේ ලේඛනය **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා]

புத்தளம் கல்வி வலயத்தில் வட மாகாணத்திலிருந்து இடம்பெயர்ந்து வந்த சகோதரர்களின் பிள்ளைகள் படிக்கும் பத்துக்கும் மேற்பட்ட பாடசாலைகள் இருக்கின்றன. அந்தப் பாடசாலைகளில் பௌதிக வளப் பற்றாக்குறை மற்றும் teachers பற்றாக்குறை இருக்கின்றது. இதனை நிவர்த்தி செய்ய வேண்டுமென நான் கௌரவ கல்வி அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன். எங்களுடைய புத்தளம் கல்வி வலயத்தில் President's Science College எனும் கல்லூரியொன்று இருக்கின்றது. இது புத்தளம் வாழ் மக்களின் முக்கியமானதொரு சொத்து! நான் இந்தச் சந்தர்ப்பத்தில் முன்னாள் பிரதியமைச்சரும் புத்தளத்தின் நகராதிபதியாக இருந்தவருமான எனது நண்பர் மர்ஹூம் பாயிஸ் அவர்களை நினைவுகூர வேண்டும். ஏனெனில், நாங்கள் மாகாண சபையில் இருக்கும்போது, அவருடைய யோசனையின் பிரகாரமே இந்த President's Science College உருவாக்கப் பட்டது. இன்று இக்கல்லூரியானது சிறப்பான முறையில் இயங்கி வருகின்றது. இதனையிட்டு நாங்கள் சந்தோஷமடை கின்றோம். இந்தப் பெருமை மர்ஹூம் பாயிஸ் அவர்களையே சேரும்.

எங்களுடைய கட்சியின் தலைவரான கௌரவ றிஸாட் பதியுதீன் அவர்கள் வட மாகாண சபையின்கீழ் இருந்த பாடசாலையை வடமேல் மாகாண சபையின்கீழ் கொண்டு வந்து புத்தளம் கல்வி வலயத்துடன் சேர்த்தார். அந்தப் பாடசாலையிலும் பல குறைபாடுகள் இருக்கின்றன. அவற்றையும் கௌரவ கல்வி அமைச்சர் அவர்கள் நிவர்த்தி செய்துதர வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். புதிய கல்விச் சீர்திருத்தமானது நல்ல முறையில் அமைய வேண்டும். இதற்கான செயன்முறையில் எல்லோரும் உள்வாங்கப்பட வேண்டும். எதிர்க்கட்சி, ஆளுங்கட்சி என்ற பேதம் இல்லாமல் எல்லோரும் ஒன்றுபட்டு இலங்கையிலுள்ள அனைத்து மாணவர்களுக்கும் நல்லதொரு கல்வித் திட்டத்தை உருவாக்க வேண்டும். அதற்கு நாங்கள் ஒத்துழைப்போமெனக் கூறி, මේ අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් හේවගේ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.34]

**ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්තරා මනුස්සයෙක් රෑ බාර් එකකට ගිහිල්ලා ඔළුව සාක්කුවට වැටෙන තරමට බීලා පාරට බැහැලා වාහනයට නැඟලා one-way පාරක වාහන එන දිශාව පැත්තට වාහනය පදවා තිබෙනවා. එහෙම වාහනය පදවනකොට පොලීසියෙන් වාහනය නවත්තලා අහලා තිබෙනවා, "කොහේද මිනිහෝ යන්නේ?" කියලා. එහෙම අහනකොට ඒ මනුස්සයා කිව්වාලු, "මම යන අහ නම් දන්නේ නැහැ. හැබැයි, මම පරක්කුයි. ගිය අනෙක් අය ඔක්කෝම එනවා" කියලා. ඒ කෙනා කිව්වාලු, මම යන්න පරක්කුයි, ගිය වාහන ටික මගේ පැත්තට එනවා කියලා. මට මේ කථාව මතක් වුණේ අපිත් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගේන්න පරක්කුයි කියන එක දැණුනු නිසායි. මේ විපක්ෂය කථා කරන විධියට ඇත්තටම මීට අවුරුදු 30කට, 35කට, 40කට කලින් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගේන්න පුළුවන්කම තිබුණා නම්, මෙහෙම අවාසනාවන්ත ඉරණමක් මේ පාර්ලිමේන්තුවට අත් වෙන්නේත් නැහැ; රටට අත් වෙන්නේත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉතිහාසයේ අහලා තිබෙනවා, ගුත්තිල-මූසිල කථාව. ඒක පොඩි කාලේ අපට උගන්වපු කථාවක්. ගුරුවරයාට අභියෝග කළ මූසිල ගැන කථාව තමයි අපි අහපු කථාව. අද ඒ හිටියා වාගේ මූසිලයෙක් මේ පාර්ලිමේන්තුවේත් දකින්න ලැබීම භාග්‍යයක් නොවෙයි, අපේ අභාග්‍යයක් කොට සලකනවා. ගුරුවරුන්ට එහෙම challenge කරන මිනිසුන් දැකීම අභාග්‍යයක්. ඒකෙනුත් පෙන්නුම් කරන්නේ වෙන මොකක්වත් නොවෙයි, මෙවැනි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වහ වහා අවශ්‍යයි කියන කාරණාව. ඒ විතරක් නොවෙයි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙනකොට නලින්ද ජයතිස්ස ඇමතිතුමා සඳහන් කළ විධියට විපක්ෂයේ කුඩා කණ්ඩායම සමාජයේ පොඩි විචිකිච්ඡාවක් හැදුවා. ඒ හින්දා තමයි අධ්‍යාපන ඇමතිතුමිය වන හරිනි අමරසූරිය අගමැතිතුමියට විරුද්ධව විශ්වාස භංගයක් ගේන්නේ. අර ගින්නට තව පෙට්‍රල් ටිකක් දාලා ගිනි තියන්න තමයි ඒ විශ්වාස භංගය ගේන්න හැදුවේ. අගමැතිතුමිය ඉල්ලා අස්වෙන්න ඕනෑ; යන්න ඕනෑ කිව්වා. මේක අගමැතිතුමිය යන්න ඕනෑ එකක් නොවෙයි. මේක ආණ්ඩුව ගෙනාපු එකක්. විෂය භාර අමාත්‍යතුමිය හැටියට එතුමිය මේක ඉදිරිපත් කළා. නමුත් මේක ආණ්ඩුවේ වැඩක්. තනි කරලා, හුදෙකලා කරලා ගහලා, NPP, JVP බෙදලා මේක හරියන්නේ නැහැ. මේක ආණ්ඩුවේ වැඩක්. බිම පොඩියට ගිනිකූරු පත්තු වෙනකොට තමයි සජිත් ප්‍රේමදාසලා විශ්වාස භංග යෝජනාව නමැති මහා බවුසරයෙන් මේක ගිනි තියන්න පෙට්‍රල් වක් කරන්න හැදුවේ. හැබැයි එතුමන්ලා පෙට්‍රල් වක් කරන්න හදනකොට සමාජයේ ප්‍රතිචාරය ටිකෙන් ටික ඔවුන්ට දැනෙන්න පටන් ගත්තා. ඊට පස්සේ තමයි පල්ලම් බැස්සේ. එක්තරා මන්ත්‍රීවරයෙක් විශ්වාස භංගය reverse කරන කථාවක් කිව්වා. ඇයි ඒක reverse කරන්නේ? බය නැතුව විශ්වාස භංගය ගෙනෙන්න. සජිත් ප්‍රේමදාසට ජින්තු මදිද, ඒක ගෙනෙන්න? මෙතුමන්ලා මේක ගෙනෙන්නේ නැත්තේ වෙන මොකක්වත් නිසා නොවෙයි. මෙතුමන්ලා ඒක ගෙනාවොත් ඒක "ඇනකොන්ඩා 02" බවට පත් වනවා.

මොකද අපට මතකයි, මීට කලින් වතුකරයේ අහිංසක දුප්පත් ජනතාවගේ පඩි වැඩි කරන්න යෝජනාවක් ගෙනාපු වෙලාවේ අධ්‍යාපනය භාරව කටයුතු කරන කාන්තාවෝ, ඒ වාගේම සජිත් ප්‍රේමදාසගේ කණ්ඩායම ඒකට විරුද්ධ වුණු බව. අපි දැක්කා, වතුකරයේ ජනතාව ඔක්කෝම සජිත්ලාට, නාමල්ලාට, දිලිත්ලාට විරුද්ධව නැඟිට්ට හැටි. ඒ ජනතාව පොල් ගහලා පින්තූර පුච්චලා දැම්මා. ඒක තමයි "ඇනකොන්ඩා 01". ඔබතුමන්ලා මේ විශ්වාස භංගය ගෙනාවොත් ඒක තමයි "ඇනකොන්ඩා 02". මොකද, අද සමාජයේ දරුවෝ, අම්මලා තාත්තලා මේ අධ්‍යාපන ක්‍රමයෙන් හෙම්බත් වෙලා, පීඩාවට පත් වෙලා දරුවොත් විනාශ වෙලා, අම්මලා තාත්තලාගේ කාලයත් විනාශ වෙලා, ධනයත් විනාශ වෙලා ඉන්නේ. නව ලෝකය දකින්න නැති දරුවෝ, ඒ අම්මලා තාත්තලා අද බලන් ඉන්නවා, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙන්නේ කොයි වෙලාවේද කියලා. මේ විපක්ෂය හින්දා ඒක අවුරුද්දකට කල් ගිහිල්ලා තිබෙනවා. ඒකේ වගකීම සම්පූර්ණයෙන් ගන්න ඕනෑ මේ විපක්ෂය. ඔය විපක්ෂය ආණ්ඩු පක්ෂයේ ඉන්නකොටත් ඔහොම තමයි.

ඔය විපක්ෂය ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට විසඳපු නැති ප්‍රධාන ප්‍රශ්න දෙකක් තිබෙනවා. එකක් තමයි, මේ රටේ තිබෙන දුප්පත්කම විසඳුවේ නැති එක. මෙතුමන්ලා ඒක පැටව් ගස්සවා

වර්ධනය කළා. දෙවැනි එක තමයි, නූගත්කම විසඳුවේ නැති එක. මෙතුමන්ලා ඒකත් පැටව් ගස්සවා වර්ධනය කළා. මොකද, මේ අය ආණ්ඩු පක්ෂයේ හිටපු එකේත්, අද විපක්ෂයේ ඉන්න එකේත් පැවැත්ම තිබෙන්නේ ජනතාවගේ නූගත්කමයි, දුප්පත්කමයි ඇතුළේ. රට දුප්පත් නම් ඒ මත කරණම් ගහන, ඒක පාවඩයක් කරගෙන සිංහාසනයට එන්න උත්සාහ ගන්න මිනිස්සු තමයි මේ. දුප්පත්භාවය තියාගන්න තමයි ඔවුන් වැඩ කළේ. අපි දුප්පත්භාවය තුරන් කරන්න තමයි CDCs ගෙනැල්ලා, Councils 14,000ක් හදලා වැඩ කරන්නේ. එතකොට ඉතින් පශ්චාත්භාගය රත්වෙනවා. පාණ්ඩුකම්බල ශෛලාසන උණු වෙනවා. ඒ විතරක් නොවෙයි. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා නව ලෝකය දැකගන්න පුළුවන් නිර්මාණශීලි, විචක්ෂණශීලි, අනාගත අභියෝග ජයගන්න ළමයෙක් නිර්මාණය වෙනවා. එතකොට මේ අයගේ දේශපාලනය තුරන් වෙනවා. ඒකට තමයි මේ බය වෙලා ඉන්නේ.

එවැනි දරුවෝ හැදෙනවාට, ලොකු මොළයක් සහිත මිනිස්සු නිර්මාණය වෙනවාට චූටි මොළයක් තිබෙන විපක්ෂ නායකවරයා බයයි. විපක්ෂ නායකවරයා මොකක්ද කියන්නේ? ඉතාම සංවේදී, මේ රටේ ජනතාවගේ ඇට, ලේ, මස් නහරවලට, ඇට මිදුලුවලට බද්ධ වෙච්ච කාරණාවක් තමයි ආගම. ඒ ආගම තමයි එතුමන්ලා ඉස්මතු කරන්නේ, ගිනි තියන්න හදන්නේ. එක්තරා මන්ත්‍රීවරයෙක් කිව්වා, ජේවීපී ත්‍රස්තවාදියෝ කියලා. අන්න, ත්‍රස්තවාදියෝ. ආගම ඉස්මතු කරගෙන රට ගිනි තියන්න සංවේදී කාරණා කියනවා. ඒවා බොරු. ඒවා ඇත්ත නම් කමක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ නලින්ද ජයතිස්ස ඇමතිතුමා ඉතා පැහැදිලිව මේ ගැන කිව්වා. ගෞරවනීය නායක ස්වාමීන් වහන්සේලා යෝජනා කරපු, සම්බුද්ධ සමරුවටත් පාවිච්චි කරපු ධර්මචක්‍රය, මේ සභාවේ තිබෙන රාජ්‍ය ලාංඡනයේ ඉහළ කොටස පෙන්වා ඒක ගලවන්න කියලා අදත් කියනවා. ඒක ගැලෙව්වොත් ඊළඟට ආයෙත් රට ගිනි තියනවා, මේ පාර්ලිමේන්තුවේ මෙච්චර කල් තිබ්බ ධර්මචක්‍රය ගැලෙව්වා කියලා. ඒක තමයි එතුමන්ලාට කරන්න ඕනෑ. අද බාල දේශපාලනයට ඕනෑ, තාර්කික, බුද්ධිමත් කතිකාවක් නොවෙයි. මේ වාගේ සුළු කාරණා මත රට ගිනි තියලා ඒ ගිනි මතින් බලයට පත් වෙන්නයි එතුමන්ලාට ඕනෑ. දැන් පාර්ලිමේන්තු සභා ගැබේ ඉහළ තිබෙන රාජ්‍ය ලාංඡනය පෙන්වා අහනවා, එහි තිබෙන ධර්මචක්‍රය ගලවන්නේ නැත්තේ ඇයි කියලා. ඒක ගැලෙව්වොත් ඊට පහුවැනි දා ඉඳලා රට ගිනි තියනවා. ඒකටයි මේ සූදානම් වෙන්නේ. අපි ඒකට අහුවෙන්නේ නැහැ. ඒ නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මේ රටට අවශ්‍යයි. මේ රටේ දුගී දුප්පත්භාවය තුරන් වෙන්නත්, ඒ වාගේම නූගත් පරපුරක් නැතුව බුද්ධිමත් පරපුරක් බිහි වෙන්නත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍යයි. ඒ ගැන කල්පනා කරලා බලන්න.

අපි දන්නවා, ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ප්‍රධාන කුලුනු 5ක් තිබෙන බව. මේකෙදි syllabus එක වෙනස් වෙන එක විතරක් නොවෙයි වෙන්නේ. සාමාන්‍යයෙන් විෂය නිර්දේශය නේ, අවුරුදු 8න් 8ට වෙනස් වෙන්න ඕනෑ. අවුරුදු 8ක් යනකොට මේ නූතන - modern - ලෝකයේ දැවැන්ත පරිවර්තන වෙනවා, තාක්ෂණ පිම් ගහලා වර්ධනය වෙනවා, ආකල්ප වර්ධනය වෙනවා. ඒ සියලු දේවල් දරුවන්ට දෙන්න නම් ඒවා විෂය නිර්දේශයට ඇතුළත් කරලා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙන්න ඕනෑ. මීට පෙර 2015දී තමයි විෂය නිර්දේශය වෙනස් වුණේ. එහෙනම් 2023දී තමයි නැවත එය වෙනස් වෙන්න ඕනෑ. 2023දී ආණ්ඩුවේ හිටපු අය දරුවෝ මොට කරන්න සංශෝධන ගෙනාවේ නැහැ. 2024දී ගෙනාවේත් නැහැ. ඒ නිසා තමයි අපි 2025දී මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනාවේ.

අපි භාර ගත්තේ හොඳ රටක් නම්, හොඳ, කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් නම්, මෙහෙම ගෙනෙන ප්‍රතිසංස්කරණ දශමයක්වත් අඩු නොවී ගෙනෙන්න තිබුණා. මේ වාගේ සංකීර්ණ ක්‍රියාවලියක්; අධ්‍යාපනයේ දැවැන්ත පරිවර්තනයක් කරනකොට පොඩි පොඩි අඩුපාඩුකම් වෙන්න පුළුවන් බව මොළේ කළඳක්වත් තිබෙනවා නම් තේරුම් ගන්න පුළුවන්. ඒවා හදාගෙන ඉස්සරහට යන එක තමයි ජාතියට දෙන සහයෝගය; ළමයින්ට දෙන සහයෝගය. පොඩි පොඩි අඩුපාඩුවත් නොවෙන්න තිබුණා, අපි රට භාර ගන්නකොට තිබුණේ සියයට සියයකින්ම හොඳ මට්ටමේ පවතින රාජ්‍ය සේවයක් නම්. මෙතැනදී අපි බලන්න ඕනෑ, කුමන්ත්‍රණයක් වුණාද, නැද්ද, හිතාමතා එහෙම දේවල් ඇතුළත් කළාද, නැද්ද කියලා. දැන් ඒවා ගැන අපි හොයාගෙන යනවා. එහෙම ඒවා ගැන හොයාගෙන යනකොට, හනුමෝ ඇවිල්ලා ගිනි තියන්න පටන් ගත්තාද, නැද්ද? ඒවාත් අපි හොයන්න ඕනෑ. මේකේ මුල කොතැනද කියාත් හොයන්න ඕනෑ. අපි ඒවා ගැන හොයනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ප්‍රතිසංස්කරණ ගෙනෙනකොටම මේ අය මේ සමාජයට දැවැන්ත අපරාධයක් කළා. අපි ආවේ අපේ පාලන කාලය තුළ මේ සමාජය අඩුම ගණනේ අඟල් භාගයකින් හෝ ඉහළට ඔසවන්න. හැබැයි, මේ කතිකාවත් එක්ක මොකද වුණේ? ඒ ගැන කල්පනා කරලා බලන්න. දැන් මේගොල්ලන් කියනවා, මේකේ පිටු ගණන මෙච්චරයි, අලාභය රුපියල් කෝටි මෙච්චරයි කියලා. පිටු ගණන් කරන්න පුළුවන්. පිටු ගණනට මුදල ගණනය කරලා, මුදල්වලින් අලාභය මනින්න පුළුවන්. කවදා හරි ඒවා recover කර ගන්න පුළුවන්. හැබැයි, ඔයගොල්ලන් සතියක්, දෙකක් තිස්සේ සමාජයට වැපිරූ ඒ අස්වැන්න මනින්න පුළුවන්ද? එක්තරා මනුස්සයෙක් කෑමක් අරගෙන යනවා, මිහින්තලයේ හාමුදුරුවන් ළඟට. දැන් පොඩි දරුවන්ගේ අත්වල තිබෙන phonesවල මොනවාද තිබෙන්නේ? කවුද, අසභ්‍යකරණයට ලක් කළේ? මේ විපක්ෂය විසින් මේ සති දෙක තුන ඇතුළත මේ සමාජය අඩි දෙක තුනක් නොවෙයි, අඩි දහයක් පහළොවක් වළ පල්ලට ඇද දැම්මා. මේ රටට කළ මේ විනාශයට ඔය වීරවංශලා, ගම්මන්පිලලා වග කියන්න ඕනෑ. ඒවා මනින්න පුළුවන්ද? අද පොඩි එකෙකුගේ අතේ තිබෙන phone එකක් අරගෙන බලන්න. ඒවායේ තිබෙන්නේ මොනවාද? ඒවා ගැන කථා කරන්න පුළුවන්ද? ඒවා පහදා දෙන්න පුළුවන්ද? ඒවා මනින්න පුළුවන්ද? හැමෝම මේවා තේරුම් ගන්න ඕනෑ. අපි බලයට ආවේ දශමයක් හෝ මේ සමාජය ඉහළට ඔසවා තබන්න. හැබැයි, මේ ප්‍රතිසංස්කරණ කරණ කොටගෙන ඔයගොල්ලන් මේ සමාජය වළ පල්ලට ඇද දැම්මා, අඩියක් දෙකක් නොවෙයි, අඩි දහයක් පහළොවක් පමණ. ඒවා මනින්න බැහැ. ඒවා යළි හදන්න බැහැ. ඒවායෙන් දරුවන්ගේ මනසට ඇතුළු වන විෂබීජ මකන්න බැහැ. ඒ වාගේ දැවැන්ත අපරාධයක් මේ කර තිබෙන්නේ. නමුත්, අපි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නතර කරන්නේ නැහැ.

විපක්ෂයේ එක් මන්ත්‍රීවරයෙක් කිව්වා, අධ්‍යාපනයට වෙන් කරපු මුදල් කපලා කියලා. 2015 අවුරුද්දේ GDP එකෙන් අධ්‍යාපනයට වෙන් කරපු ප්‍රමාණය නොවෙයි, 2019 අවුරුද්ද වෙනකොට තිබුණේ. අධ්‍යාපනයට වෙන් කර තිබුණු මුදල් ඔය එක්සත් ජාතික පක්ෂයේ සජිත්ලා කපා හැරලා තිබුණේ. අපි බලයට එනකොට GDP එකෙන් සියයට 1.8 ගණනක් අධ්‍යාපනයට වෙන් කර තිබුණේ. හැබැයි, මේ අවුරුද්දේ එම ප්‍රමාණය සියයට 2.04ක් දක්වා වැඩි වෙලා. ඔවුන් නම් කියන්නේ, අධ්‍යාපනයට වෙන් කරපු මුදල් කපලා කියායි. ඔයගොල්ලන් තමයි දරුවන්ගේ අධ්‍යාපනය මොට වෙන්න කටයුතු කළේ. ඒ කාලයේ අධ්‍යාපනයට වෙන් කරපු මුදල් ඔය සජිත්ලා කපනකොට අත ඔසවපු කට්ටිය ඔයගොල්ලන් තමයි. නමුත්, අපි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නතර කරන්නේ නැහැ. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙනකොට, විපක්ෂය සෙත්තපෝච්චි වෙනවා කියන එක විතරක් තේරුම් ගන්න කියලා මම සඳහන් කරන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් වෙන් කර තිබෙනවා.

[பி.ப. 4.44]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
வணக்கம்! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இந்த அவையில் கல்விச் சீர்திருத்தம் சம்பந்தமாக உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

ஒரு நாட்டின் கல்வித் திட்டமானது, சமகால இயல்பு நிலைக்கு ஏற்ற வகையில் மாற்றியமைக்கப்பட வேண்டும். இலங்கையில் கடந்த பல வருடங்களாகப் பல்வேறு காரணங்களால் கல்விச் சீர்திருத்தம் மேற்கொள்ளப் படவில்லை. குறிப்பாக, பொருளாதார நெருக்கடி, கொரோனா தொற்று உட்பட இன்னும் பல காரணங்களால் உரிய காலத்தில் கல்விச் சீர்திருத்தம் மேற்கொள்ளப்படவில்லை. உலகளாவிய ஒழுங்கில் நாடுகளுக்கு இடையிலான போட்டித் தன்மைக்கு ஏற்றவகையில் எமது கல்வித் திட்டம் மாற்றியமைக்கப்பட வேண்டும். அது மாத்திரமன்றி, எமது சமூகம் சவால்களை எதிர்கொள்ளக்கூடிய வகையிலும் கல்விச் சீர்திருத்தம் இருக்க வேண்டும். அந்த வகையில், கொண்டுவரப்படுகின்ற கல்விச் சீர்திருத்தமானது எமது நாட்டிலுள்ள இளைஞர்களுக்கு அல்லது எமது சமூகத்துக்கு ஒரு வரப்பிரசாதமாக இருக்க வேண்டும் என்பதே எமது எதிர்பார்ப்பாகும்.

இன்று நடைமுறையிலுள்ள கல்வி முறைமையில் பல நெருக்கடிகள் இருக்கின்றன. குறிப்பாக, பல்கலைக்கழகம் வரை சென்று கல்வியைக் கற்றுவிட்டு, தொழிலைப் பெற்றுக்கொள்வதில் பாரிய நெருக்கடிகளை இளைஞர், யுவதிகள் எதிர்கொள்கின்றார்கள். எமது நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்பக்கூடிய வலுவான சமூகத்தை உருவாக்கக்கூடிய வகையில் தற்போதைய கல்வித் திட்டம் இல்லை என்ற எண்ணக்கரு இருக்கின்றது. சமூகத்தை மாற்றியமைப்பதற்குப் பல நிகழ்ச்சித்திட்டங்கள் இருந்த போதிலும், இன்று பாடசாலைக் கல்வி முறைமையானது நெருக்கடியான, போட்டித்தன்மை மிக்கதாக மாறியுள்ளது. இளைஞர், யுவதிகள் தற்கொலை செய்கின்ற அளவுக்கு போட்டித் தன்மை இருக்கின்றது. இவ்வாறான சூழ்நிலைகளை மாற்றியமைக்கக்கூடிய வகையில் இந்தக் கல்விச் சீர்திருத்தம் அமைய வேண்டும் என்ற எதிர்பார்ப்பு எமக்கு இருக்கின்றது.

மிக முக்கியமான விடயம் என்னவெனில், இந்தக் கல்விச் சீர்திருத்தத்தை அமுல்படுத்த முன்னர், கடந்த காலங்களில் எமது நாட்டின் வட, கிழக்குப் பிரதேசங்களில் ஏற்படுத்தப்படாமல் விடுபட்டிருந்த உட்கட்டுமான வசதிகளை மேம்படுத்தவேண்டிய தேவை இருக்கின்றது. ஏனெனில், புதிய கல்விச் சீர்திருத்தத்தை அமுல்படுத்தும்போது, கடந்த காலங்களில் காணப்பட்ட பல ஏற்றத்தாழ்வுகளின் அடிப்படையில் பாரிய பிரச்சினைகள் உருவாக்கப்படலாம். பல தேசிய பாடசாலைகள் வளம்மிக்க பாடசாலைகளாக இருக்கின்றன. அதேநேரம், கிராமப் புறங்கள் மற்றும் கஷ்டப் பிரதேசங்களில் மிகுந்த வளப்பற்றாக்குறையுடன் பாடசாலைகள் இயங்குகின்றன.

அந்தப் பாடசாலைகளில் போதிய கட்டிட வசதிகள், தளபாட வசதிகள் இல்லை. இவ்வாறான சூழ்நிலையில் புதிய கல்விச் சீர்திருத்தத்தின் பயன் அங்குள்ள மாணவர்களை எவ்வாறு சென்றடையும்? என்ற கேள்வி எழுகின்றது. கல்விச் சீர்திருத்தம் செய்யப்படவேண்டிய கட்டாயம் இருக்கின்ற பொழுதும், அடிப்படைக் கட்டுமானங்களை எவ்வாறு கொண்டுசெல்வதென்ற வினா எங்களுக்குள் இருக்கின்றது. ஏனெனில், கடந்த காலங்களில் பல பகுதிகளில் அடிப்படைக் கல்வியைக்கூட மாணவர்கள் பெறுவதில் பல பிரச்சினைகள் இருந்தன. மிக முக்கியமாக பாடசாலைக் கல்வியில் மட்டுமல்ல, பல்கலைக்கழகக் கல்வியில்கூட ஏற்றத்தாழ்வுகள் காணப்படுகின்றன. பல்கலைக்கழகக் கல்வியானது, தொழில் சந்தைக்கு ஏற்றவாறு அல்லது பட்டதாரிகள் உள்நாட்டிலும் வெளிநாட்டிலும் தொழில் வாய்ப்பைப் பெற்றுக்கொள்ளக் கூடிய வகையில் அமைய வேண்டும் என்பதுதான் எங்களது எதிர்பார்ப்பாக இருக்கின்றது.

பல பாடசாலைகளில் மிகக் குறைந்தளவிலான மாணவர்கள் இருக்கின்றார்கள். அவர்களுக்கு இந்தக் கல்விச் சீர்திருத்தத்தின் பயன் எவ்வாறு சென்றடையும்? அங்குள்ள ஆசிரியர் பற்றாக்குறை எவ்வாறு நிவர்த்தி செய்யப்படும்? உதாரணத்துக்கு, பல பாடசாலைகளில் அதி நவீனமான 'ஸ்மார்ட்' வகுப்பறைகள் இருக்கின்றன. அதேநேரம், யுத்தத்தால் மிக மோசமாகப் பாதிக்கப்பட்ட வட, கிழக்குப் பிரதேசங்களிலுள்ள பாடசாலைகளில் வகுப்பறைகள்கூட இல்லாமல் இருக்கின்றன. அங்கு சில கட்டிடங்கள் இடிந்து விழக்கூடிய நிலையில் இருக்கின்றன.

நாம் இந்தக் கல்விச் சீர்திருத்தத்தை வரவேற்கின்றோம். எனினும், இது எவ்வாறு இலங்கையின் சகல பகுதிகளிலும் அமுல்படுத்தப்படும் என்ற திட்ட முன்வரைவு முன்வைக்கப்பட வேண்டும். அதற்கு அப்பால், பல பாடங்களில் பல்வேறு காலப்பகுதிக்குரிய, பல பிரதேசங்களுக்குரிய வரலாறுகள் மறைக்கப்பட்டு இருக்கின்றன. இந்த விடயத்தை அரசாங்கம் நல்ல சிந்தனையுடன் முன்னெடுக்குமென நாங்கள் எதிர்பார்க்கின்றோம். அதற்கான ஆரம்ப கட்டப் பணிகள் நடைபெறுவதாகச் சொல்லப்படுகின்றது. தமிழர்களின் வரலாறு, அவர்களின் பாரம்பரியங்கள், அவர்களுடைய சமத்துவமான தன்மைகள் மிகக்கூடிய அளவில் குறித்த பாடங்களில் உட்புகுத்தப்பட வேண்டும்.

மேலும், சமத்துவ உணர்வு எல்லா மாணவர்களிடத்திலும் ஏற்படக்கூடிய வகையில், சிறந்ததொரு கல்வி முறைமை உருவாக்கப்பட வேண்டும். அவ்வாறு செய்தால்தான் எதிர்காலத்தில் எமது சமூகம் உட்பட எல்லோரும் இணைந்து பயணிக்கக்கூடியதாக இருக்கும். மேலும், நாட்டில் வளமானதொரு சமூகத்தை உருவாக்கக்கூடிய, பொருளாதார முன்னேற்றத்தை ஏற்படுத்தக்கூடிய செயற்றிட்டங்களை முன்னெடுக்கக்கூடியதாக இருக்கும். இந்தக் கல்விச் சீர்திருத்தம் மிகச் சிறந்ததாக இருந்தாலும், இதை அமுல்படுத்தும்போது பல்வேறு பிரதேசங்களில் பாரிய தடங்கல்கள் ஏற்படுமாக இருந்தால், அது பாரிய பின்னடைவை ஏற்படுத்தும். எனவே, இதை அமுல்படுத்து கின்ற விடயத்தில் அரசாங்கம் மிகக் கவனமாகவும் பொறுப்புடனும் செயற்பட வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
Sir, give me a few seconds, please.

அந்த வகையில், எல்லா மாணவர்களுக்கும் இந்தக் கல்விச் சீர்திருத்தத்தின் பயன் சென்றடையக்கூடிய வகையில் உவப்பானதாக மாற்றியமைக்கப்பட வேண்டுமெனக் கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.51]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව මුළු රටේම විශාල සාකච්ඡාවක් ඇති වෙලා තිබෙන වේලාවකදී, ඒ පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කියන්නේ සමහර විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් වඩා ජනතාව උනන්දු වෙන සංවාදශීලී මාතෘකාවක්ය කියන කාරණය මම මුලින්ම කියන්න ඕනෑ. ඒක අපි පිළිගනු ලබනවා. එය එසේම විය යුතුයි. ඒ සම්බන්ධව දෙමව්පියන්ට අයිතියක් තිබෙනවා. දෙමව්පියන්ට වඩා දරුවන්ටත් අයිතියක් තිබෙනවා. මොකද, අපි ඔක්කෝම දරුවන්ගේ අනාගතය ගැන තමයි මේ තීන්දු ගන්නේ. ඒ නිසා මේ ගැන පුළුල් සාකච්ඡාවක් කොයි තරම් කළත් වැඩි වෙන්නේ නැහැ. ඒ අනුව අද මේ සභාවේ අපි මේ සාකච්ඡාව සිදු කරන එකත් වැදගත් වෙනවා.

මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගත්තාම, ජාතික ජන බලවේගය වශයෙන් අපි 2018 තරම් ඈත කාලයක ඉඳලා තමයි වර්තමාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා වන මූලික සාකච්ඡා පටන් අරගෙන කමිටු හදාගෙන විශාල වැඩ කොටසක් කළේ. අපි අවුරුදු 6ක විතර කාලයක් ඒ සම්බන්ධව සංවාද කළා. ඒ අනුව මේ නිශ්චිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අපේ දේශපාලන ව්‍යාපාරය තුළ එක්කෙනෙක්-දෙදෙනෙක් නොවෙයි, අතිවිශාල පිරිසක් සම්බන්ධ වෙලා සංවාද කර සකස් කළ එකක් ලෙස හඳුන්වා දෙන්න පුළුවන්.

ඒ වාගේම ඔබතුමන්ලාට මතක ඇති, අනුර කුමාර දිසානායක සහෝදරයා ජනාධිපති අපේක්ෂකයා වශයෙන් ඉන්නකොට අපි ප්‍රධාන ප්‍රතිපත්ති 10ක් වෙන වෙනම ඉදිරිපත් කළ බව. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන පොදු ප්‍රතිපත්ති මාලාවට අමතරව අපේ සංස්කෘතික ප්‍රතිපත්තිය, අපේ අධ්‍යාපන ප්‍රතිපත්තිය, ආර්ථික ප්‍රතිපත්තිය, විදේශගත ශ්‍රී ලාංකිකයන් සඳහා වන ප්‍රතිපත්තිය ආදී වශයෙන් ප්‍රතිපත්ති 10ක් වෙන වෙනම ඉදිරිපත් කළා. එතැනදී අපි අපේ අධ්‍යාපන ප්‍රතිපත්තිය වෙනම ඉදිරිපත් කළා. ලංකා ඉතිහාසයේ එහෙම එකක් ඉදිරිපත් වෙලා නැහැ, ජනාධිපති අපේක්ෂකයෙකුගෙන්. මොකක් හරි එකක් ඉදිරිපත් කරනවා, ප්‍රතිපත්ති මාලාවම ඇතුළත් කරලා. නමුත් අපි තවත් ප්‍රතිපත්ති නවයකුත් එක්ක අධ්‍යාපනය සඳහා වෙනම ප්‍රතිපත්තියක් ඉදිරිපත් කළා. මොකද අපි දන්නවා, සංවාදයකින් තොරව අපට අපේ පක්ෂය තුළවත් මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුමත කර ගන්න බැහැ කියන එක. ඒ නිසා අපි ඉතාම පුළුල් සංවාදයක් කරලා තමයි මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කළේ. අනික, අවුරුදු ගණනක් තිස්සේ ශිෂ්‍ය ව්‍යාපාර, ගුරු සංගම්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ කණ්ඩායම් ඇතුළේ අපි කරන ලද අරගලයේම දිගුවක් තමයි මේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ "අධ්‍යාපන ප්‍රතිසංස්කරණ" ලෙස ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපට හෘදය සාක්ෂිය වශයෙන් ගැටුමකුත් නැහැ, බුද්ධිමය ගැටුමකුත් නැහැ, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන්. ඒක අපි හිතපු දේට ගොඩක් කිට්ටුවෙන් යනවා. අපි කවුරුත් දන්නවා, අපි හිතන දේම කර ගන්න වෙන්නේ නැහැ කියන එක. මොකද, අපි සමාජයක් ඇතුළේ නේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරන්නේ. එතකොට මිලියන 22ම ඒකට සම්බන්ධ වෙනවා. ඒ නිසා එහෙම විශාල සංවාදයක් කරලා තමයි කටයුතු කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාව වරම දුන්නේ, ජාතික ජන බලවේගය පක්ෂයට. ඉතින්, අපට ආණ්ඩු බලය ලැබුණාට පස්සේ අධ්‍යාපන අමාත්‍යාංශය ලෙස අපි කළ දේ තමයි, අපේ ප්‍රතිපත්ති, ඒ කරුණු සහ සාරය මීට අදාළ ආයතනවලින් කාලයක් තිස්සේ කරගෙන එන අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට එකතු කරන්න කටයුතු කිරීම. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහාම වෙන් වූ ආයතනයක් තිබෙනවා, ලංකාවේ. පෙළපොත් සඳහාම තිබෙනවා ජාතික අධ්‍යාපන ආයතනය. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහාම තිබෙනවා, National Education Commission එක. ඊට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශය, ඒ යටතේ වන දෙපාර්තමේන්තු තිබෙනවා. අපි කළ දේ තමයි අපේ අරමුණු සඳහා යන්න, ජනවරම ලැබිච්ච ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සාරයත්, එහි නිශ්චිත, ඉතා වැදගත් කරුණුත් අර ආයතනවලින් දිගු කාලයක් තිස්සේ කරගෙන එන අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට එකතු කරපු එක. ඒගොල්ලන්ගේ mandate එකත් ඒක. එතකොට සැලකිය යුතු ප්‍රමාණයකින් අපි සමත් වෙලා තිබෙනවා, පළමුවැනි අවුරුද්දේදීම මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අපට ජන වරම ලැබිච්ච ප්‍රතිපත්තියේ සාරය සහ කරුණු ඉදිරිපත් කරන්න. ඒවා කරුණු වශයෙන් කියන්න දැන් වෙලාව නැහැ. නමුත් ජනතාව කැමති වුණේ ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයට. වෙන වෙන අය හදපු ඒවාට නොවෙයි. තවත් අපේක්ෂකයන් ගණනාවක් ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කළා නේ. නමුත් ජන වරම දුන්නේ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට. ඒ නිසා ඒක නොකර ඉන්න අපට බලයකුත් නැහැ. ආණ්ඩු බලය ලැබුණාය කියලා ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඕනෑවට වඩා වෙනස් කරන්න අපට බැහැ. ඉතාම ප්‍රායෝගික, ඉතාම නිශ්චිත හේතුවක් නිසා මොනවා හරි දෙයක් නොකර සිටීම හැරුණුකොට ජන වරම ක්‍රියාත්මක කරන්න අපි බැඳිලා ඉන්නවා.

ජනතාව අපට ඡන්දය දුන්නේ, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලටත් එක්කම තමයි. ඒ නිසා අපි සපථ කර කර කියන්න අවශ්‍ය නැහැ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරනවාය කියලා. ඒක default; ඒක අනිවාර්යයෙන්ම කරන්න ඕනෑ; ඒක negotiate කරන්න බැහැ, කාටවත්. අපි කරන්න ඕනෑ. හැබැයි ඒක කරන්න වෙලා තිබෙන්නේ, ජාතික ජන බලවේගයේ අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදකයන්ට පමණක් නොවෙයි. දැන් ඒ අයට අමතරව නිලධාරීන් පෙළැන්තියකුත් ඉන්නවා. ඉතාම විශිෂ්ට විද්‍යාඥයන්, ශාස්ත්‍රඥයන් ඒ ආයතනවල ඉන්නවා; අතිවිශාල අත්දැකීම් ප්‍රමාණයක් ඒ ආයතන සතුව තිබෙනවා. ඒ නිසා අපි ඒ ආයතන ගැන විශ්වාස කරනවා. ඒ ආයතනවල අයගේ

[ගරු බිමල් රත්නායක මහතා]

හැකියාව තුළින් තමයි ලංකාව මෙච්චර කාලයක් ඉස්සරහට ඇවිල්ලා තිබෙන්නේ. ඉතින් ඒක කරගෙන යද්දී වෙච්ච පැහැදිලි අඩුපාඩුවක් තිබෙනවා. අපි ඒ ගැන කනගාටු වෙනවා. දැනට දඬුවම් කරලාත් තිබෙනවා, නිශ්චිත වශයෙන් ඒ ක්‍රියාවට සම්බන්ධ වෙච්ච කිහිපදෙනෙකුට. තවත් හොයලා බලන්නත් ඕනෑකම තිබෙනවා, ඊට අදාළ අධීක්ෂණ ක්‍රියාවලියේ තිබිච්ච අඩුපාඩුකම් ගැන. ඒ නිසා 6 වසර module එකේ යම් කිසි අඩුපාඩුවක් සිදුවීම කනගාටුවට කරුණක් මිස ඒක තවත් කෙනෙකු විවේචනය කරන්න ගන්න ඕනෑ එකක්ය කියලා අපි හිතන්නේ නැහැ. අපි අවංකව කනගාටු වෙනවා, හොඳට කරගෙන ආපු කටයුත්තට ඒ වාගේ දෙයකින් බාධා වීම ගැන.

ඇත්තටම ඒ බාධා වීමට හේතුව, එතැන අඩුපාඩුවක් තිබීම. එම නිසා එය විවේචනයට ලක් වීම ප්‍රශ්නයක් නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ, විවේචනයේ අරමුණ මොකක්ද කියන එකයි. විවේචනයේ අරමුණ වන්නේ, අපේ අගමැතිතුමියව කෑලි කෑලිවලට ඉරලා ඉරලා දමන එකද? අන්තිම තිරශ්චීන විධියට, මනුස්සයෙකුට කරන්න පුළුවන් නරකම විධියට එතුමිය ඉවර කරන එකද වැරැද්ද විවේචනය කිරීමේ අරමුණ? නැත්නම්, 6 ශ්‍රේණියේ දරුවන්ට මොනවා වුණත් කමක් නැහැ, ආණ්ඩුවට ෂොට් එකක් දී ගත්තොත් ඇති වාගේ අරමුණක්ද? අපට පෙනෙන විධියට, ඒක තමයි මෙම විවේචනයේ අරමුණ. මම හිතන විධියට, මෑත ඉතිහාසයේ මෙතරම් වෛරයට ලක් කළ, මෙතරම් කුඩු පට්ටම් කරන්න උත්සාහ කළ අධ්‍යාපන ඇමතිවරයෙක් නැහැ. ඒ මොනවා කළාටද? අගමැති හරිනි අමරසූරිය මැතිනිය අධ්‍යාපනය වෙනුවෙන් කටයුතු කරනවා කියන එක අපි ලේවලින් අත්සන් කරලා දෙන්න ඕනෑ නැහැ නේ. එතුමියගේ මුළු ජීවිත ඉතිහාසයේම එහෙම තමයි තිබෙන්නේ. ඒ කිසිම දෙයක් නොසලකා මොන තරම් නම් දුෂ්ට, වෛරී සහගත විවේචන විපක්ෂයේ කණ්ඩායම ගොඩනැඟුවාද? ඔවුන්ට ගැතිකම් කරන මාධ්‍යවල මොනවාද ප්‍රචාරය වුණේ? මම දුටුවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල 6 ශ්‍රේණියේ කොටස නතර කරන්න කැබිනට් මණ්ඩලයේදී අපි තීන්දුව ගත්ත දවසේ ඉඳලා ආපස්සට දවස් තුනක් මාධ්‍යවල ප්‍රචාරය වුණු දේවල්. මොනවාද ඒවායේ තිබුණේ? දූෂිත දේශපාලනයට කඩේ යන පෞද්ගලික නාළිකා කිහිපයක් තිබෙනවා. එක නාළිකාවක අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධව වෙන් කළ ගුවන් කාලය සියයට 80යි. තව නාළිකාවක සියයට 77යි. රටට අඳුර ගෙනෙන නාළිකාවකුයි, නයි ගෙනාපු නාළිකාවකුයි තිබෙනවා. ඒ දෙක ගත්තොත්, අඳුර ගෙනෙන නාළිකාවේ සියයට 80ක් ගුවන් කාලය අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධව වෙන් කරලා තිබුණා. විරුද්ධව කියන්නේ, එය බුද්ධිමය සංවාදයක් නොවෙයි නේ. අන්තිම කුණු කථා කියන්නේ. ඒ වාගේ මට්ටමේ කථා. අනෙක් නාළිකාවත් ඒ වාගේම තමයි. අපි තව බැලුවාම, එහෙම තමයි.

ඒ දවස් තුනේම ප්‍රචාරය වුණු දේවල් ගත්තොත්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සහමුලින්ම විරෝධී ප්‍රචාරයක් කළා. ඒකට අදාළ කරන කටයුතු මෙතැන විපක්ෂයේ ගොඩක් මන්ත්‍රීවරුත් කළා. තිබුණු අරමුණ මොකක්ද? අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධව කටයුතු කිරීම. එසේ විරුද්ධ වන්නේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධ වෙන්න ඕනෑ නිසා විතරක් නොවෙයි. ආණ්ඩුවේ මොකක් හෝ අඩුපාඩුවක් හොයාගෙන ඒ අඩුපාඩුව හරහා ආණ්ඩුවට උපරිම damage එකක් කිරීමට. හැබැයි, අපි හැම වෙලාවේම බලන්න ඕනෑ දේ තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවට ගහන ෂොට් එකක රටට වදිනවාද, නැද්ද කියන එක. ඒකයි බලන්න ඕනෑ. මම ඒක හැම දාම කියලා තිබෙනවා. ආණ්ඩුව විවේචනය කළාට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒක රටට වදිනවාද කියන එක බලන්න ඕනෑ. මට කන්ටේනර් සිද්ධිය සම්බන්ධව මොන තරම් විවේචන කළාද? කිසි ප්‍රශ්නයක් නැහැ. ඒක රටට වදින්නේ නැහැ නේ. මට නේ වදින්නේ. මටයි, මගේ දරුවන්ටයි, මගේ අම්මාට, තාත්තාට ඒකෙන් බලපෑමක් තියෙයි. මම එය ශත පහකට ගණන් ගන්නේ නැහැ. මොකද, මම ඒක කරලා නැති නිසා. ඒවා රටට වදින්නේ නැහැ. හැබැයි, මෙකෙදි ආණ්ඩුවට කරන විවේචනය තුළ රටට වද්දනවා.

6 ශ්‍රේණියේ දරු පැටවුන්ට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නැති කළේ විපක්ෂය සහ ඒගොල්ලන්ට කඩේ යන තුච්ඡ මාධ්‍ය. ඒක තමයි ඇත්ත. ඒක හරවන්න බැහැ, අනෙක් පැත්තට. විවේචනය කිරීම ප්‍රශ්නයක් නැහැ. විවේචනයේ අරමුණ, destruction එක නිසා තමයි අද මේ ප්‍රශ්නය ඇති වෙන්නේ. අපි දැක්කා යම්කිසි ව්‍යාකූලතාවක් තිබෙනවා. අර අම්මලා වගයක් සල්ලි දීලා හෝ නැතුව ගිහිල්ලා පොල් ගැහුවා. අපි දැක්කා ව්‍යාකූලතාවක් තිබෙනවා. එම ව්‍යාකූලතාවට යොදා ගත් සිද්ධියකුත් තිබෙනවා. ඒක නිසා තමයි අපි තීන්දු කළේ 6 ශ්‍රේණියේ දරුවන්ට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නතර කරන්න. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරගෙන යද්දී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑ තරම් අඩුපාඩුකම් වෙන්න පුළුවන්. ඔබතුමාත් හිටපු ගුරුවරයෙක්. ඔබතුමන්ලා ඇති තරම් පුහුණු වෙලා කරන දේවල්වලත් අඩුපාඩුකම් වෙන්න බැරිද? අපි කථා කරන්නේ ගුරුවරු 250,000ක් ගැන. ගුරුවරු 250,000ක් උගන්වනකොට අඩුපාඩුකම් වෙන්න බැරි නැද්ද? අපේ ගරු රුවන් මාපලගම සහෝදර මන්ත්‍රීතුමාත් බොහොම දක්ෂ ගුරුවරයෙක්. උගන්වනකොට අඩුපාඩුකම් වෙන්න පුළුවන්. හැබැයි, පරණ එකේ අඩුපාඩු වුණාට ප්‍රශ්නයක් නැහැ. මොකද, පරණ එක හැදුවේ ඒගොල්ලෝ නේ. විභාගවල papers කොච්චර leak වුණාද? අපි බලයට එනකොට මේ රටේ අච්චු පොත් බෙදා ගන්න බැරිව තිබුණේ. ඒවාට කවුරුවත් පෙළපාළි ගියේ නැහැ. මොකද, පරණ systems නේ. හැබැයි, දැන් අලුත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල කුඩා හෝ ව්‍යාකූලතාවක් ඇති වුණොත් මොකද වෙන්නේ? මේගොල්ලෝ අනිවාර්යෙන්ම ඒක පාවිච්චි කරනවා දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් කරන්න. ගුරුවරුන්ගෙන් අඩුපාඩුකම් විය හැකියි. ඕනෑම අධ්‍යාපන ප්‍රතිසංස්කරණයකදී අඩුපාඩුකම් විය හැකියි.

ලංකාවේ හිටියා මහාචාර්ය චන්ද්‍රා ගුණවර්ධන කියලා ඉතා විශිෂ්ට අධ්‍යාපනඥවරියක්. එතුමිය Open University එකේ Professor කෙනෙක්. එතුමිය ලිව්වා තුලනාත්මක අධ්‍යාපන පොත් රාශියක්. එතුමිය කෙළින්ම ලියපු දෙයක් තමයි, "ඕනෑම අධ්‍යාපන ක්‍රමයක ලීවරය වන්නේ ගුරුවරයාය" කියන එක. අලුත් එකට අදාළවත් අඩුපාඩුකම් වෙන්න පුළුවන්. කෙසේ වෙතත් විපක්ෂය ඊට පස්සේ ඒ අඩුපාඩුකම් ඔක්කෝම විවේචනය කරාවි. මේගොල්ලන්ට කඩේ යන නාළිකා ගිහින් live දීලා කියාවි, අන්න අර ටීචර් "ල" යන්න වරද්දලා, අන්න අර ටීචර් "ම" යන්න වරද්දලා කියලා. මේගොල්ලන් එහෙම කරන්න පුළුවන්. ඊට පස්සේ පොල් ගහන්න ඉඩ තිබෙනවා ඒ ටීචර්ලාට විරුද්ධව. මේ කට්ටිය ඒ ජාතියේ බඩු. ඒ ව්‍යාකූලතාවට දරුවන් ලක් කරන්න ඕනෑ නැති නිසා තමයි අපි ඒක නතර කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැක්කා FB එකේ ලස්සන කවියක් තිබෙනවා, මෙන්න මෙහෙම:

"සාමා අමර සල් ගස් යට තවම ඇත - ඒ සල් ගසේ තවමත් මල් පිපෙනු ඇත

සල් ගස හැරෙන්නට වෙන ගස් එමට ඇත - එය දැනගන්නවට සමහරු කැමැති නැත"

ඒ කැමැති නැති කට්ටියගෙන් වැඩි පිරිසක් මෙතැන ඉන්නවා. අපි කනගාටු වෙන්නේ ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, අසූ ගණන්වල, අනූ ගණන්වල ලංකාවේ තිබුණු තත්ත්වය. ඒ කාලයේ ලොකු මතයක් තිබුණා; ඇත්ත තත්ත්වයක් තිබුණා, "කොළඹට කිරි - ගමට කැකිරි" කියලා. දැනුත් එහෙම තමයි. හැබැයි, දැන් ලෝකය ඊට වඩා ගෝලීයකරණය වෙලා, connect වෙලා, දැන් ඇති වෙලා තිබෙන තත්ත්වය තමයි, "ලෝකෙට කිරි - ලංකාවට කැකිරි" වෙලා තිබීම. ඒ නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍යයි, ලෝකයයි ලංකාවයි සංසන්දනය කළාම, ලෝකයේ මට්ටමට ලංකාව ගෙන යන්න. ඒ නිසා තමයි මේ කියන්නේ, "සාමා අමර සල් ගස් යන තවම ඇත - ඒ සල් ගසේ තවමත් මල් පිපෙනු ඇත" කියලා. ඒවාත් තිබෙනවා. හැබැයි, "සල් ගස හැරෙන්නට වෙන ගස් එමට ඇත" කියලාත් කියන්න වෙනවා. අපි දන්නවාට වඩා ලොකු ලෝකයක් තිබෙනවා. අපේ රටට වඩා විවිධ ක්ෂේත්‍රවලින් දක්ෂ රටවල් තිබෙනවා. අපිත් දක්ෂ පැති තිබෙනවා. එම රටවලුත් දක්ෂයි. "එය දැනගන්නවට සමහරු කැමැති නැත". අපට ජන වරම ලැබී තිබෙන්නේ, මේ රටේ පොදු ජනතාවගේ, සාමාන්‍ය පන්තියේ මිනිසුන්ගේ දරුවන්ට උගන්වලා මේ ගේම ගහන්න; ඒ පොඩි උන් ශක්තිමත් කරන්න. මම මීට කලින් රූපවාහිනී විවාදයකදීත් කිව්වා, ලංකාව සතුව තිබෙන එකම nuclear weapon එක තමයි කන්නන්ගර මැතිතුමා දීපු නොමිලේ අධ්‍යාපනය කියලා. දේශපාලන ව්‍යාපාරයක් විධියට අපි ඒ nuclear weapon එක තවත් ශක්තිමත් කරනවා මිස කිසිම ආකාරයකින් ඒක දුර්වල කරන්නේ නැහැ.

මම දැක්කා, චෝදනා ගණනාවක් එල්ල කර තිබෙනවා. මම 'ටක්' ගාලා ඒ ගැනත් කියන්නම්. මේක ලෝක බැංකු ණයක් කියලා කියනවා. නැහැ, අපි මේ මොහොතේ සිදු කරන අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට ලෝක බැංකුවෙන් ණයක් අරගෙන නැහැ. ඒක බොරුවක්. දෙක, පෙළපොත් සල්ලිවලට ගන්න වෙනවා කියලා මතයක් හදනවා. ඒකත් බොරු. පෙළපොත් අලුතිනුත් ගහලා නොමිලේ දීලායි තිබෙන්නේ. මගේ දරුවා අලුත් පොත් ටික දැක්කාම "සුස්" ගානවා, ඒගොල්ලන්ට මේ වාගේ ලස්සන පොත් තිබුණේ නැහැ කියලා. මම දැක්කා, වමේ කියලා කියා ගන්නා වෘත්තීය සමිතියක නායකයෙක් කියනවා, QR codes 47ක් තිබෙනවා, ඒවා සල්ලිවලට ගන්න ඕනෑ කියලා. QR කියන්නේ මොකක්ද? QR කියන්නේ, “Quick Response”. Phone එකෙන් ඒක scan කළාම මඩොල් දූව පොත එනවා. Phone එකෙන් scan කළාම කථා කරන විධිය එනවා. අද ලංකාවේ හැම කෙනාම වාගේ smartphones පාවිච්චි කරනවා. ඒක තවදුරටත් අමුතු device එකක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි; ඒක දැන් අමුතු, luxury device එකක් නොවෙයි. දැන් smartphones පාවිච්චි කරනවා. ඉතින්, ඒ ගැන බොරු කිව්වා, QR codes සල්ලිවලට ගන්න වෙනවා කියලා. ඒ වාගේම කිව්වා, දූප්පතුන් පිටමං කරනවා කියලා. දූප්පතුන් පිටමං වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දන්නවා, ඔබතුමා දැන් වෙලාව ඉවර බව කියන්නයි හදන්නේ කියලා. භෞතික වශයෙන් තිබෙන ඇති නැති පරතරය අඩු කරන්න අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කරලා තිබෙන ගෙවීම් ප්‍රමාණයක් තිබෙනවා. ශිෂ්‍යාධාර මුදල වැඩි කරලා තිබෙනවා; ශිෂ්‍යත්වලාභීන් ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා; මහපොළ ශිෂ්‍යාධාර මුදල වැඩි කරලා තිබෙනවා; දරුවන්ට shoes දෙනවා; නිල ඇඳුම් දෙනවා. මම ඒ තොරතුරු ටික සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා.

මේ අර පරණ කට පාඩම් කරලා ගත්තු, පසුගිය රනිල්ගේ ආණ්ඩුවට, චන්ද්‍රිකාගේ ආණ්ඩුවට එල්ල කරපු විවේචන ටිකම අපටත් එල්ල කරනවා මිස පාඩම් කරලා ඇවිල්ලා කථා කරනවා නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩියක් ලබා දෙන්න, මගේ කථාව අවසන් කරන්න. මම එකක් කියන්න කැමැතියි. අප හැම කෙනාටම මේ අධ්‍යාපනය ගැන කියන්න දෙයක් තිබෙනවා නේ. දැන් හර්ෂ ද සිල්වා මැතිතුමා ඔය vanilla bonds ගැන, එක එක bonds ගැන කිව්වාම ගොඩක් අය කථා කරන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඒක ගැන දන්නේ ඔබතුමා වාගේ අය විතරයි නේ, නේද? මම කියන්නේ මේකයි. සමහර මාතෘකා තිබෙනවා ආර්ථිකයේ ඉතාම තියුණු දේවල්, ඉතාම වැදගත් දේවල් වුණත්, සංවාදයට 4දෙනෙකු, 5දෙනෙකු විතරක් සම්බන්ධ වන. මොකද, ඒක දන්නේ සුළු පිරිසයි. නමුත්, අධ්‍යාපනය එහෙම නොවෙයි. මේ රටේ ඉන්න මිලියන 22ටම කියන්න දෙයක් තිබෙනවා. ඒ නිසා අපි හැම කෙනාම හිතනවා, අපි හැම කෙනාම කියන දේවල් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ තිබෙන්න ඕනෑ කියලා. එහෙම හිතන එකේ කිසිම වැරැද්දක් නැහැ. හැබැයි, ප්‍රතිපත්ති සම්පාදනයට ආවාම එහෙම හිතන එක වැරැදියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දන්නවා දැන් වෙලාව පහු වුණා කියලා. ධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් මම මේ කාරණයත් කියා කථාව අවසන් කරන්නම්. අධ්‍යාපන ප්‍රතිසංස්කරණයකදී මොකක්ද වෙන්න ඕනෑ? මේ ආණ්ඩුවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ගැන නොවෙයි මම මේ කියන්නේ. ඇත්තටම මම ඒ කාරණා ලියා බැලුවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණයකදී වෙන්න ඕනෑ දේවල් මේවායි: ජාතික අපේක්ෂා තෘප්ත වෙන්න ඕනෑ; අධ්‍යාපනය ලබන දරුවාගේ අනාගතය එමගින් ගොඩ යන්න ඕනෑ; අසමානතාව අඩු වෙන්න ඕනෑ; දරුවාට අධ්‍යාපනයේ බර අඩු වෙන්න ඕනෑ; විභාග කේන්ද්‍රීය බව අඩු වෙන්න ඕනෑ; ළමා කාලය ඒ අයට ලබා දෙන්න ඕනෑ; ඒ අය ක්‍රීඩාවට යොමු කරන්න ඕනෑ; විෂය බාහිර ක්‍රියාකාරකම්වලට යොමු කරන්න ඕනෑ; නවීන ලෝකයට ගැළපෙන කෙනෙක් කරන්න ඕනෑ. මා කියන ඒවා නොවෙයි, රටේ මිනිස්සු කියන ඒවා, මේ. ඒ වාගේම, ඒ අයගේ වෘත්තීයභාවය ඇති කරන්න ඕනෑ; ව්‍යවසායකත්වය - ඡන්දය ඉල්ලපු කෙනෙකුත් මෙතැන ඉන්නවා නේ - ඇති කරන්න ඕනෑ; soft skills වැඩි කරන්න ඕනෑ; දරුවා ගුණගරුක වෙන්න ඕනෑ; රටට ආදරය කරන්න ඕනෑ; පරිසරයට, සතුන්ට ආදරය කරන කෙනෙක් වෙන්න ඕනෑ; වෙනත් සංස්කෘතීන්ට ගරු කරන කෙනෙක් වෙන්න ඕනෑ; විවිධ සාක්ෂරතා හැකියා ඇති අයෙක් වෙන්න ඕනෑ. මාධ්‍ය සාක්ෂරතාව, ආර්ථික සාක්ෂරතාව, social media පිළිබඳ සාක්ෂරතාව ඇතුළු ගොඩක් දේවල් තිබෙනවා. දරුවා එවැනි සාක්ෂරතා අත්පත් කර ගන්න ඕනෑ. ටියුෂන් අඩු කර ගන්නත් ඕනෑ. නූතන අධ්‍යාපන ප්‍රතිසංස්කරණයකින් කර ගන්න තිබෙන ඔය වාගේ අරමුණු 100ක් විතර ලියන්න පුළුවන්. ඒවාත් කරන්න කියනවා.

ඊට පස්සේ තවත් දේවල් කියනවා. තනි තනි විෂයයන් අනිවාර්ය කරන්න කියනවා. මා දකින trend එකක් තිබෙනවා, මේ විෂය පාසල් පොතට දමන්න ඕනෑ; මේ විෂයත් පාසල් පොතට දමන්න ඕනෑ කියන. පොතට දැම්මාට කමක් නැහැ. හැබැයි, අනිවාර්ය කරන්නේ කොහොමද? අධ්‍යාපනයේ බර අඩු කරන්නත් ඕනෑ; අප ආස කරන විෂය අනිවාර්ය කරන්නත් ඕනෑ. ඔය දෙකම සම්පූර්ණයෙන්ම කරන්න බැහැ. මම මේ පෙන්වන්නේ එයයි. ඊට පස්සේ කියනවා, දක්ෂතම සියයට 5ට අවාසි වෙනවා කියලා; ඉතාම තියුණු ලෙස විභාගවලට දක්ෂ ළමයින් මේ module system එක නිසා පොඩ්ඩක් පහළට එනවා කියලා. සමහරුන්ගේ තර්කය අනුව, අධ්‍යාපනයේ බර අඩු කරන්නත් ඕනෑ; වැඩිම ළමයින් ප්‍රමාණයක් අධ්‍යාපනයෙන් ගොඩ කරන්නත් ඕනෑ; ඒ අතරේ සියයට 5ක් යැයි කියන අර අතිදක්ෂ පිරිස - ඒ කියන්නේ, examsවලට දක්ෂ දරුවන් පිරිස - ගොඩ දමන්නත් ඕනෑ. ඊට පස්සේ? අදක්ෂම සියයට 5 වෙනුවෙන් කථා කරන පිරිසකුත් ඉන්නවා. ඒකත් මේකේ accommodate වෙන්න ඕනෑ. වෙලාව මදි නිසා මම මේ ගැන කෙටියෙන් කියන්නම්.

[ගරු බිමල් රත්නායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙමව්පියන් වශයෙන් අපට ඉටු කර ගන්න බැරි වෙච්ච හීන තිබෙනවා. නමුත්, ඛලීල් ජිබ්රාන් කිව්වා වාගේ, දරුවන් අපට අයිති නැහැ; ඒගොල්ලෝ අප තුළින් ආවාට අනාගතයටයි අයිති. අපි කවුරුත් ඒක තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා තමයි අධ්‍යාපනඥයන් කියන දේවල් සහ ලෝකයේ තිබෙන best practices බලලා මේ සම්බන්ධයෙන් තීරණ ගන්නේ. ඉහත සඳහන් පරිදි අපේ අවශ්‍යතා 100ක් විතර තිබෙනවා. අපේ පෞද්ගලික ආසාවන් සහ වුවමනාත් තිබෙනවා. ඒවාත් හොඳ දේවල්. මේවා අතර balance එකක් ඇති කරන්න ඕනෑ. ඒ නිසා, සමහර විෂයයන් අනිවාර්ය නොකරන්නේ, ජාතියක් ජන්මයක් නැති නිසා නොවෙයි. සමහර විෂයයන් අනිවාර්ය නොකරන්නේ, මොකක් හරි වෙනත් දේශද්‍රෝහී අදහසකින් නොවෙයි. මේ ඔක්කෝම දේවල් දෙන්නේ අවුරුදු 10ක, 12ක, 13ක, 14ක පැටියෙකුට. මම දැක්කා සමහරු තර්ක කරනවා, අරක නැහැ, මේක නැහැ කියලා. ඒ සඳහා තමයි අධ්‍යාපනඥයන් ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයෙන් මගේ කථාව අවසන් කරනවා. අසීමිත අවශ්‍යතා ප්‍රමාණයක් ජාතියකට තිබෙනවා. හැබැයි, ලංකාව ඊළඟ අවුරුදු 10ක, 15ක කාලයට ඔසවා තබන්න නම් අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සකස් වෙන්න ඕනෑ කොහොමද කියලා තමයි මේ මොහොතේ බලන්න වෙන්නේ. ඊට පස්සේ පුළුවන් තවත් අවුරුදු 10ක් ගියාම ආයෙත් ඒක වෙනස් කරන්න. අපේ හැම වුවමනාවක්ම මේකට එකතු කරන්න බැහැ. මේ වෙලාවේදී මම ඒකත් මතක් කරන්න ඕනෑ.

අපි බෙහෙවින් කනගාටු වෙනවා, ඉතාම වෛරීසහගත ලෙස, දුෂ්ට ලෙස කරන ලද දේශපාලන ප්‍රචාරක කටයුත්තක ප්‍රතිඵලයක් ලෙස 6 ශ්‍රේණියට අදාළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පමණක් කල් දමන්න අපට සිදු වීම ගැන. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අරගලය ඔබතුමා පක්ෂය තුළ කලින් කළා නම්, ඔබතුමාගේ පක්ෂයේ ඉන්න මේ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ඉතාම දරුණු ලෙස විරුද්ධව කටයුතු කරපු උදවියටත් යම්කිසි අවබෝධයක් ලබා දෙන්න සමහර විට ඔබතුමාට අවස්ථාව තිබුණා කියලා මම හිතනවා. මම දැක්කා, මේ ළඟදී දවසක ඔබතුමන්ලාගේ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් press conference එකක් පවත්වනවා. එතුමා අඩුම ගණනේ module එකවත් කියවලා නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.12]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

විශේෂයෙන්ම අද සිදු කරන මේ විවාදයේ මාතෘකාව බොහොම වැදගත්, කාලීන මාතෘකාවක් හැටියට මම දකිනවා. මෙම කල් තැබීමේ යෝජනාවේ අවසාන ඡේදයේ ඉතාම වැදගත් වාක්‍යයක් තිබෙනවා, වාද කරන්න ඕනෑ, සංවාද කරන්න ඕනෑ කියලා. මම පැහැදිලිවම කියනවා, අපි එදා ඉඳලාම කිව්වේ එය බව. දැන් ගරු සභානායකතුමාත් කිව්වා මේක ගැන සංවාද කරන එක හොඳයි කියලා. ඔව්, සංවාද කෙරෙන්න ඕනෑ. හැබැයි, මේ ගැන සංවාද කරන්න ඕනෑ දේශපාලන අධිකාරියේ අය විතරක් නොවෙයි. විශේෂයෙන්ම රටක අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගේනකොට විෂය ප්‍රාඥයන්, ප්‍රවීණයන් ඒවා ගැන වාද කරන්න ඕනෑ; සංවාද කරන්න ඕනෑ. වාද කරලා හොඳම දේ ගේන්න ඕනෑ. මොකද, හොඳම දේ දරුවන්ට නිසා. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගේන්න පටන් ගත්ත පළමුවෙනි දවසේ ඉඳලා තියපු හැම කමිටුවකදීම අපි කිව්වා විපක්ෂය හැටියට අපි මේකට සහයෝගය දෙනවා කියලා, දැන් ඒක ඔබතුමන්ලා කණපිට හරවාගෙන හිටියාට. ඒ හැම තැනකදීම අපි කිව්වේ විපක්ෂය හැටියට අපි සහයෝගය දෙනවා, එය විනිවිදභාවයකින් යුතුව කරන්න කියලායි. ඒවායේ අරමුණු හා ඉලක්ක මොනවාද, ඒවා සම්පාදනය කරන්නේ කොහොමද, එකේ White Paper එක කොහේද තිබෙන්නේ, ඒක පෙන්නන්න, ඒවා සකස් කරන කණ්ඩායම කවුද, ඒ ඉලක්ක සාක්ෂාත් කර ගන්න තිබෙන ක්‍රමය මොකක්ද කියන මෙන්න මේ කරුණු තමයි අපි ඇහුවේ. ඒවා තමයි විද්වත් සංවාදයක් හැටියට එළියේ වෙන්න ඕනෑ. මොකද, මේ රටේ පුරවැසියාට අයිතිවාසිකමක් තිබෙනවා මේ රටේ පුරවැසියකු හැටියට පාසලෙන් එළියට යන පුද්ගලයා මොන විධියේ අධ්‍යාපනයක් ලබලාද එන්නේ කියන එක දැනගන්න. මම හිතනවා මේ රටේ සියලුදෙනාටම ඒ අයිතිවාසිකම තිබෙනවා කියලා. අපි එදා කියපු දේ පසුගිය අවුරුද්ද ඇතුළත කළා නම්, මේ modules හෝ වෙච්චා ඔබතුමන්ලාගේ සංකල්පීය පත්‍රය එළියට දාලා තිබුණා නම්, මේ අඩිය ආපස්සට නොගෙන 2026දීම මේ ප්‍රතිසංස්කරණ කරගෙන යන්න, දරුවන්ට ලබා දෙන්නට හැකියාව තිබුණා කියලා මම හිතනවා. නමුත් අපි ඒ අවස්ථාව නැති කර ගත්තා. ඒක ඔබගේ ආණ්ඩුවේ තිබෙන උඩඟුකම හැටියට තමයි මම දකින්නේ.

ඊළඟට, අපි කථා කළ වෙලාවේ ඒ තොරතුරු එළියට දුන්නේ නැත්තේ මොකද? ඒ නිසා ආණ්ඩුවට දැක්මක් නැහැ, අරමුණක් නැහැ, එහෙම නැත්නම් මේක ලියපු කෙනෙක් නැහැ, ජාතකයක් නැහැ, වැඩ පිළිවෙළක් නැහැ කියලා සමාජගත වුණා. ඇත්තටම මේක ලියපු අය හිටියේ නැහැ නොවෙයි හිටියා. හැබැයි හැංගුවා. මේකේ වැරදුණු තැන මේකයි. ඒ ආපු මාවත වෙනස් වුණා, ඇතැම් තැන්වලට දේශපාලන සගයන් රිංගවා ගැනීම නිසා ඒ ආයතන වරද්දා ගත්තා. මේ ප්‍රතිපත්ති හදන්න ඕනෑ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවයි. ඒකේ ඉන්න 12දෙනාගෙන් 8දෙනෙක්ම ඔබතුමන්ලාගේ cadresලා. මේ ප්‍රතිසංස්කරණ හදන්න විද්වතුන් ගේන්න ඕනෑ තැන දේශපාලනීකරණය වුණාම එතැනින් එහා ගැන අපට හිතන්න දෙයක් නැහැ. ඇත්තටම මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ බලය තිබෙන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයට. හැබැයි, අධ්‍යාපන අමාත්‍යාංශය මේක ක්‍රියාත්මක කිරීමේදී ජාතික අධ්‍යාපන ආයතනය සහ සම්පත්දායකයන්ගේ සහාය ගන්න ඕනෑ. නමුත් මෙතැනදී වුණේ අධ්‍යාපන අමාත්‍යාංශය මේක ක්‍රියාත්මක කිරීමේදී ජාතික අධ්‍යාපන ආයතනය bypass කරලා වෙන වෙන අයත් එක්ක වැඩ කරන්න ගිහින් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය අසාර්ථක කර ගැනීමයි. හැබැයි දැන් ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජෙනරාල්තුමියත්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්තුමාත් දං ගෙඩියට දක්කලා තිබෙනවා. ඒ ගැන අපි තව ඉස්සරහට කථා කරමු. ඇත්තටම කිව්වොත් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ උපාලි සේදර, සුනිල් ජයන්ත නවරත්න වැනි අයගේ මූලිකත්වයෙන් ඒ සංකල්පවල සහ යෝජනාවල ඉදිරි දිගුවක් හැටියට තමයි තිබුණේ. හැබැයි පරණ ඒවා වෙනස් කළා. ඒ අදහස්, යෝජනා වෙනස් කර ගන්න ජාතික අධ්‍යාපන ආයතනය ජනතා විමුක්ති පෙරමුණේ පාක්ෂිකයෙක් යැයි කියන දර්ශන සමරවීර මහත්මයා දායක කර ගත්තා. මම කියනවා, එතුමාගෙන් හැම රජයක්ම වැඩ ගත්තා හොඳ නිලධාරියකු හැටියට. නමුත් මේ ආණ්ඩුව credit

එක ගන්න ඕනෑ නිසා මේක ලිව්වේ කවුද කියන එක හංගලා තිබුණා. නමුත් දැන් වරද්දා ගත්තාට පස්සේ එතුමා දං ගෙඩියට යැව්වා කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ. තමන්ගේම පක්ෂය නිසා දර්ශන සමරවීර මන්ත්‍රීතුමා කැමැත්තෙන්ම දං ගෙඩියට හිස තියනවාද කියලා අපි දන්නේ නැහැ. නමුත් ඒක කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුවක්. අපි ඉස්සරහට මොඩියුල ගැන කථා කරනවා නම් ඒ ගැන කථා කරමු.

ගරු මධුර සෙනෙවිරත්න නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තමයි මේක අහගෙන ඉන්න වෙන්නේ. NIE එකේ අඩු පාඩු තිබෙනවා. අඩු පාඩු රැසක් තිබෙනවා. ඒවා වෙනම ශුද්ධ කරන්න ඕනෑ. ඒවායේ තිබෙන අඩු පාඩු වෙනම සකස් කරන්න ඕනෑ. ඒවා ක්‍රමවත් කරන්න ඕනෑ, සුදුකම් තිබෙන අය ගන්න ඕනෑ, පුරප්පාඩු තිබෙන ඒවා පුරවන්න ඕනෑ. ඒ අයට අවුරුදු ගණනාවකින් විදේශීය පුහුණුවක් ලැබිලා නැහැ. ඒ අයගේ දැනුම, කුසලතා, ආකල්ප දියුණු කර ගන්න, දැනුම යාවත්කාලීන කර ගන්න විදේශ පුහුණුවක් හෝ විදේශයකින් මෙහේට ගෙන්වලා පුහුණුවක් ලබා දීලාත් නැහැ. අර කිව්ව විධියට, "ලෝකයට කිරි ලංකාවට කැකිරි" කියන කියමන වෙනස් කර ගන්න නම් ලෝකය දකින්න ඕනෑ, ඒ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන අය ඒවා කෙරෙන්නේ කොහොමද කියලා දකින්න ඕනෑ. නැත්නම් ඒවා ලියන අයට ඒ දේවල් ලබා දෙන්න ඕනෑ. මේ reforms ගේන්නේ කොහොමද කියන එක ගැන සාකච්ඡා කරන්න ඕනෑ.

ඇත්තටම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කියන්නේ, මේ මොඩියුලයම නොවෙයි. එහෙම නේද නියෝජ්‍ය ඇමතිතුමා? "මොඩියුලය" කියන්නේ ඒකේ දශමයක් විතරයි. අද උදේ කම්කරු නියෝජ්‍ය ඇමතිතුමා 2015 තාක්ෂණික විෂය නිර්දේශයට අදාළ පෙළපොතේ සඳහන් වෙබ් අඩවියක් සහ ඉංග්‍රීසි මොඩියුලයේ තිබෙන වෙබ් අඩවිය පටලවා ගත්තා. 2015 තාක්ෂණික විෂය නිර්දේශයට අදාළව සකස් කළ පෙළපොතේ තිබෙන්නේ, ebuddy.net කියන එක. ඉංග්‍රීසි මොඩියුලයේ සඳහන් වෙබ් අඩවිය තිබෙන්නේ වෙන විධියකට. ඒක URL එකක්. ඒ නිසා ඒක පටලවා ගන්න එපා. ඒක වැරැදියි. හැබැයි, තාක්ෂණික පෙළපොතේ තිබෙන buddy කියන එක tool එකක්. මේ ඉංග්‍රීසි වචනය ගත්තොත්, නරක වචනයක් නොවෙයි. හැබැයි, ebuddy.net කියන්නේ, තාක්ෂණික විෂය පෙළපොත පිළිබඳව තොරතුරු ලබා ගන්න පුළුවන් වෙබ් අඩවියක්. හැබැයි, buddy කියලා තිබෙන්නේ පාවිච්චි කරන tool එකක්. ඒ වාගේම ඉංග්‍රීසි වචනය ගත්තොත්, "buddy" කියන්නේ "සගයා", "යහළුවා" කියන එක. හැබැයි, නියෝජ්‍ය ඇමතිතුමා මේ සභාජය නොමඟ යවන්න කටයුතු කළා. තොරතුරු නොදැන, විමර්ශනය නොකර කරපු ඒ ප්‍රකාශය බරපතළ වරදක් හැටියට දකිනවා. එතුමාගේ ප්‍රකාශය හැටියට නම්, මලලසේකර ශබ්ද කෝෂයෙනුත්, Oxford English Dictionary එකෙනුත් මේ වචනය පිළිබඳව තර්ක කරන්න වෙනවා. මොකද, "buddy" කියන වචනය ඒ ශබ්ද කෝෂවලත් තිබෙන නිසා.

මොඩියුලයක් කියන්නේ විශාල පද්ධතියක් තුළ තිබෙන කුඩා ඒකකයක්. අධ්‍යාපනයේදී ගත්තොත්, පාඨමාලාවක කුඩා ඒකකයක්. සමහර විට ඒක පාඩමක කොටසක් වෙන්නත් පුළුවන්. ඒ වාගේ සුළු දෙයක්. හැබැයි මේ මොඩියුලයක ලක්ෂණ තමයි, ස්වාධීනව කටයුතු කරන්න පුළුවන්, සම්මත බවක් තිබෙනවා. ඒ කියන්නේ, අනෙක් කොටස් සමඟ පහසුවෙන් සම්බන්ධ වෙන්න පුළුවන්. ඒ වාගේම හුවමාරු කළ හැකිවීම. දෝෂසහිත නම් මුළු පද්ධතියම ඉවත් නොකර, එම මොඩියුලය පමණක් අලුතින් ප්‍රතිෂ්ඨාපනය කරන්න පුළුවන්. ඒ නිසා මම සභාජයට කියනවා, මේ මොඩියුලය කියන එක මේ ගෙනෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළේ දශමයක් විතරයි කියන එක. එතැනින් එහාට ගිහිල්ලා බැලුවොත්, මහා විශාල පද්ධතියක් තමයි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කියන්නේ.

අද උදේ ඉඳන් කුලුනු පහක් ගැන කථා වෙනවා. පළමුවැනි එක, විෂය මාලා සංශෝධනය; දෙවැනි එක, මානව සම්පත් සංවර්ධනය; තුන්වැනි එක, භෞතික සම්පත් සහ යටිතල පහසුකම් සංවර්ධනය සහ අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ; හතරවැනි එක, ඇගැයීම හා තක්සේරුකරණය; පස්වැනි එක, ප්‍රජාව දැනුවත් කිරීම හා ප්‍රවර්ධනය. විෂය මාලා සංශෝධනය ගත්තොත්, ඒක ඇතුළේ තමයි, මේ module එක එන්නේ. ඒවා ලියන්න විශේෂ පුහුණුවලත් සම්පත්දායකයන් ඕනෑ, ගුරු උපදේශකවරු ඕනෑ. හැබැයි, මෙතැනදී වැරැද්දක් වුණා. මේකට හිතෙන හිතෙන අය ගත්තා. මම උදාහරණයක් කියන්නම්. ඉංග්‍රීසි module එක, ඒ අංශ ප්‍රධානී අනුරාධපුරයේ සිටියදී දැකපු, දක්ෂයෝ කිහිපදෙනෙක් ගෙනැල්ලා තමයි ලිව්වේ. මම කියන්නේ ඒකේ වැරැද්දක් නොවෙයි. එයා දැකපු අය තමයි, ඒ ගෙනාවේ. හැබැයි, මේ කාර්යභාරය පැවරී තිබෙන්නේ කාටද? ජාතික අධ්‍යාපන ආයතනය ඒ සම්පත්දායකයන් තෝරා ගත්ත ක්‍රමය මොකක්ද?

ඒක වෙන්න ඕනෑ මෙහෙමයි. පුළුවන් නම් ලංකාව පීරලා හොඳම කණ්ඩායම ගන්න ඕනෑ. මොකද, මේ ගෙනෙන්නේ ප්‍රතිසංස්කරණ. එහෙම නම් එතැනදී දක්ෂ, නිර්මාණශීලී, ලියන්න පුළුවන් අය තෝරලා ගන්න ඕනෑ. ඒ අයට ඒ ගැන පුහුණුවක් දෙන්න ඕනෑ. ඒක දේශීය වෙන්න පුළුවන්, විදේශීය වෙන්න පුළුවන්. විදේශයකට යවලා හෝ එහෙන් ගෙන්වලා හෝ ඒ අයට පුහුණුවක් දෙන්න ඕනෑ. දැන් කවදාද එහෙම පුහුණුවක් දුන්නේ? එහෙම පුහුණුවක් දුන්නාද? නැහැ. ඔබතුමන්ලා කියන්න පුළුවන්, මේවා පසුගිය ආණ්ඩුවලින් කරන්න ඕනෑ දේවල් කියලා. හැබැයි මම මේකත් කියනවා. එතකොට තිබුණා National Education Policy Framework කියලා එකක්. ඒක කුණු කූඩයට දාලා, තදියමට කරන්න ගිහිල්ලා තමයි මේක වරද්ද ගත්තේ. ඒකයි මේකේ විධිමත් බව නැති වුණේ. ඒ නිසා තමයි, අද මේ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙන්නේ. මම කියනවා, සුසිල් ප්‍රේමජයන්ත මහත්මයා ඇමතිවරයා හැටියට සිටියදී කළුතරදී කරපු pilot project එකේ, English module එකේ ඔය කියන website එක සඳහන් තැන ඒ වැරැද්ද නැහැ. එහෙම නම්, ඒක පස්සේ වෙලා තිබෙන්නේ. උදේ ඉඳන් කියැවුණා, මේ විධියේ මොඩියුලයක් සම්පාදනය කරනකොට writing panel එකක් ඉන්නවා, proofreading panel එකක් ඉන්නවා, editorial panel එකක් ඉන්නවා, Academic Affairs Board එකක් ඉන්නවා, NIE එකේ පාලක සභාව ඉන්නවා කියලා.

මේ සමහර පොත්වල තිබෙන කාරණයක් මම පෙන්වන්නම්. ඉතිහාසය පොත ලියලා තිබෙන්නේ, සෝදුපත් බලලා තිබෙන්නේ, සංස්කරණය කරලා තිබෙන්නේ කිහිපදෙනෙක් විසින්. එතකොට මේ වැරදි අහුවෙන්නේ නැහැ. ඊට අදාළ ලේඛන මම **සභාගත***කරනවා.

ඒ වාගේම English module එක ලියපු කෙනාට වැරදුණා නම්, සෝදුපත් බලද්දී ඒක අහුවෙන්න ඕනෑ; එහෙම නැත්නම් සංස්කරණයේදී අහුවෙන්න ඕනෑ; එහෙමත් නැත්නම් විෂය ප්‍රාඥයන් ඉන්න Academic Affairs Board එකේදී අහුවෙන්න ඕනෑ. ඒකේ ප්‍රවීණයෝ ඉන්නවා. එහෙම නැත්නම් NIE එකේ පාලක සභාවේ ඉන්න DDGට, DGට වාගේම සභාපති වෙච්ච අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ටත් මේක අහුවෙන්න ඕනෑ. හැබැයි, සභාපති තවමත් පුටුවේ ඉන්නවා. ඊට පහළ හිටපු DG සහ DDG ගෙදර යවා තිබෙනවා; දංගෙඩියට යවා තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

ඇත්තටම, මොකක්ද මේකේ සාධාරණත්වය? ඇත්තටම කනගාටුයි. මෙතැන රාජ්‍ය නිලධාරීන් රැඳී සිටින මැදිරියට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇවිල්ලා ඉන්නවා නම්, ලජ්ජයි! ඔබතුමා විතරක් මේකෙන් බේරුණේ කොහොමද?

English module එක විතරයි නම් වැරදුණේ, ඉතිරි මොඩියුල 13 ඉවත් කරගන්නේ ඇයි ? ඉංග්‍රීසි මොඩියුලයේ වැරදි website එක තිබෙන තැන විතරයි නම් ප්‍රශ්නය තිබුණේ, මේ පොත් පද්ධතියම අයින් කළේ ඇයි කියන එක අපි අහනවා. ඒකට උත්තරය ජනාධිපතිතුමා දීලා තිබෙනවා. එතුමාගේ Facebook page එකේ සඳහන් කර තිබෙනවා, මෙන්න මේ හේතු නිසා - modules සකස් කිරීමේදී පවතින ගැටලු, ගුරු පුහුණු කිරීමේ ප්‍රමාදය සහ තාක්ෂණික ගැටලු මඟ හරවා ගැනීමට අවශ්‍ය නිසා - මේ ප්‍රතිසංස්කරණ 2027 වර්ෂය දක්වා කල් දමනවා කියලා. විපක්ෂය නොවෙයි, ජනාධිපතිතුමායි මේක කල් දමලා තිබෙන්නේ. ඇයි ඒ? සමාජය පෙන්වපු වරදට එහා ගිහින් මේවායේ තවත් වැරදි තිබෙන නිසා. ලේකම්තුමනි, මේකේ වැරැද්ද තිබෙන්නේ කළමනාකරණය කරපු ඔබතුමාගේයි. මේ වෙනකොට අධ්‍යාපන අමාත්‍යාංශයේ පහළ නිලධාරීන් වෙව්ලමින් ඉන්නවා. ඇයි? ලේකම්තුමා වරද්දා ගත්තාම දංගෙඩියට යන්නේ ඒ නිලධාරීන් නිසා. ඒකයි අද අමාත්‍යාංශයේ වැඩ වෙන්නේ නැත්තේ. වෙන් කරපු මුදල්වලින් අමාත්‍යාංශයේ වැඩ වෙන්නේ නැත්තේ මෙන්න මේවා නිසායි. ඒ නිසා ඒවාත් අපි හදාගන්න ඕනෑ.

දෙවැනි කුලුන තමයි, මානව සම්පත සංවර්ධනය. 43,000ක ගුරු හිඟයක් තිබෙනවා. 16,000ක් සංවර්ධන නිලධාරීන් ඉන්නවා. දැන් ඒගොල්ලනුත් එළවන්න හදනවා. 23,000ක් බඳවා ගත්තත් තවත් ගුරුවරු 20,000ක් හිඟයි. එතකොට අදාළ විෂයට පුහුණු වෙච්ච ගුරුවරු නැතිව ප්‍රතිසංස්කරණය ළමයාට ගෙනියන්නේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ගුරුවරයෙක් නිසා දන්නවා ඇති, ඈත දුෂ්කර පළාත්වල ගණිතය උගන්වන්න ගණිත පුහුණු ගුරුවරයෙක් නැහැ; ඉංග්‍රීසි උගන්වන්න ඉංග්‍රීසි පුහුණු ගුරුවරයෙක් නැහැ කියන එක. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එතකොට අර කියන තක්සේරුකරණයේදී ඔය කියන නිර්ණායක, ගණිතයේ තිබෙන සංකල්ප ටික හරියට දෙන්නේ කොහොමද? මෙන්න මේ වාගේ ගැටලු අපට තිබෙනවා.

ඊළඟට විෂයයන්ට අදාළව ගත්තොත්, 1 වසර සහ 6 වසර උගන්වන සියලුම ගුරුවරු පුහුණු කරන්න ඕනෑ. එහෙම පුහුණුවක් පසුගිය කාලයේ කළාද? තෝරාගත්ත කිහිපදෙනෙක් දින 3ක් පුහුණු කර තිබෙනවා. තක්සේරුකරණය කියන්නේ අලුතින්ම එන system එකක්. මේක SBA නොවෙයි, SLAයි කරන්නේ. GPA එකක් දෙන්නයි යන්නේ. එහෙම නම් මේකට නිවැරදි පුහුණුවක් දෙන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් විදුහල්පතිවරු පුහුණු කළාද? මාතලේ විදුහල්පතිවරුන්ට දීපු එකම පුහුණුව තමයි අධ්‍යාපන ඇමතිතුමියත්, DG, NIE සහ දැන් ඔය interdict වෙලා ඉන්න නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ඇවිල්ලා කරපු රැස්වීම. පැය 3ක් එතුමා කථා කළා. ඒක තමයි දීපු පුහුණුව. ගුරු උපදේශකවරු පුහුණු කළාද? ගුරු උපදේශක තමයි දැනුම සහ කුසලතා, එහෙම නැත්නම් ආණ්ඩුවෙන් ගෙනෙන ක්‍රමවේදය ගුරුවරයා වෙත ගෙනියලා ඒක මේ රටේ ව්‍යාප්ත කරන්නේ, පාසල්වලට ගෙනියන්නේ. හැබැයි මේ ගුරු උපදේශකවරු දවස් කීයක් පුහුණු කළාද කියන එක මේ රටට පැහැදිලි කර දෙන්න ඕනෑ. ඔන්න ඔහොම තමයි මානව සම්පත සංවර්ධනය කළේ.

ඊළඟට, යටිතල පහසුකම් සහ පරිපාලන ප්‍රතිසංස්කරණය ගැන කථා කළොත්, සිසුන් 50ට අඩු පාසල් වහනවා කියනවා. ඒක තිබෙන්නේ මේ ප්‍රතිසංස්කරණ ඇතුළේ. මේවා ගැන අද සමාජය කථා කරන්නේ නැහැ. සිසුන් 50ට අඩු පාසල් වහනවා නම් මොකක්ද ක්‍රමවේදය? නගරයට යන්න බැරි, හයියක් නැති අසරණ දෙමව්පියන්ගේ දරුවන් තමයි ඒවායේ ඉතිරි වුණේ. එහෙම වුණොත් නැවත වතාවක් පාසල් හැර යන ප්‍රමාණය අඩුවෙයිද, වැඩිවෙයිද කියන එක අහන්න ඕනෑ. දුප්පත් දෙමව්පියන්ගේ දරුවන්ට මොකක්ද වෙන්නේ? ඒ අයට මේ සමාජයට එන්න තිබෙන පාර වැහෙනවා නේද?

තොරතුරු තාක්ෂණය 6 වසර module ඒකේ පළමුවෙනි පාඩම තමයි, "පරිගණකය සමඟ චාරිකාවක්" කියන එක. මම ඒක පෙන්වන්නම්. ඒ පාඩමේ අරමුණ තමයි, දරුවාට mouse එක සහ keyboard එක හුරු කිරීම. මේක කරන්නට අපේ රටේ පාසල්වල පරිගණක කීයක් තිබෙනවාද, 6 වසරේ ළමයින්ට ඉගෙන ගන්න? එහෙම නැත්නම් ගෙවල්වල පරිගණක තිබෙනවාද? ඩිජිටල් අමාත්‍යාංශයේ සමීක්ෂණය අනුව අන්තර්ජාල හරහා කටයුතු කරන කුටුම්බ තිබෙන්නේ සියයට 37යි. එහෙම නම්, මේ devices දෙන්න රජය මැදිහත් වෙන්න අවශ්‍යයි. එහෙම වුණොත්, පාසල් පද්ධතිය තුළ තිබෙන සම්පත් විෂමතාව නැති වෙනවා. 1 ශ්‍රේණියේ QR codes 43ක් ගැන ගුරු මාර්ගෝපදේශයේ තිබෙනවා. ඒවා මිලදී ගන්න නොවෙයි, ඒවා scan කරලා ප්‍රදර්ශනය කරන්න පාසල්වලට සම්පත් තිබෙනවාද? මෙන්න, තිබෙන අඩුපාඩු. අපි මේවා ගැන කථා කරන්න ඕනෑ. අපි මේවා දෙනවා නම්, ඒවාට අවශ්‍ය මේ කුලුනු පහේ තිබෙන දේවල් ටික දෙන්න ඕනෑ.

ඊළඟට, වැදගත්ම කාරණාව තමයි තක්සේරුකරණය සහ ඇගයීම. දැන් විභාග නැහැ කියනවා. මට දැනගන්න අවශ්‍යයි, O/L සහ A/L සඳහාත්, ශිෂ්‍යත්ව විභාගය සඳහාත් විභාගයක් නැද්ද කියලා. ගුරුවරයා සියයට 70ක් ලකුණු දෙනවා නම්, ඉතිරි 30 දෙන්නේ කොහොමද? මේක එන්නේ, school level assessment එකක්. මේකට හරියට ගුරුවරු පුහුණු කළාද? School-Based Assessments - SBA - ගත්තොත්, ඒවායින් ෆේල් වෙච්ච රටක්, මේක. දැන් මේ ගුරුවරු අර SBA ක්‍රමයට මේ SLA එකත් කළොත්, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ බලාපොරොත්තු වෙන දේ අපට ඉෂ්ට කර ගන්න, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, කාලය අවසානයි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම අවසන් කරනවා.

එහෙම නම්, Grade Point Average එක, එහෙම නැත්නම් GPA එක නම් එන්නේ, ඒ GPA එකට විභාග දෙපාර්තමේන්තුව වග කියන්න ඕනෑ කියලා මම කියනවා. ජාතික ඇගයීම් ආයතනය මේකට වග කියන්න ඕනෑ. මොකද, O/L සහතිකය දෙන්නේ GPA එකෙන් නම්, Advanced Level සහතිකය දෙන්නේත් GPA එකෙන් නම්, university එකට යන්නේත් එහෙම නම්, ඒ වාගේම ශිෂ්‍යත්වයත් සමහර විට GPA එකෙන් නම්, ගුරුවරයා දෙන ලකුණට විභාග දෙපාර්තමේන්තුව වග වෙන්නේ කොහොමද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, කථා කරන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
එහෙම නම් ගුරුවරයා දෙන ලකුණට - ගුරුවරයා ලකුණු දෙනකොට - විභාග දෙපාර්තමේන්තුව වග වෙන්නේ කොතැනදීද? මේ දෙන ලකුණ විභාග දෙපාර්තමේන්තුව දකින්නේ කොතැනදීද?

අපි දන්නවා, සමාජය ගත්තොත්, විවිධ තරාතිරම්වල, විවිධ උප සංස්කෘතීන්වල දෙමව්පියන්ගේ දරුවන් පාසලට එන බව. මම මේ කථා කරන්නේ ගුරුවරයාගේ පැත්තේ ඉඳලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මට මේ කාරණය කියන්න. මේ ලකුණු දෙන ක්‍රමයට විභාග දෙපාර්තමේන්තුව වග වෙන්න ක්‍රමයක් ඕනෑ. මේවා කලින් එනකොට, මම කියපු National Education Policy Framework එකේ තිබුණා, විභාග දෙපාර්තමේන්තුවේ සම්බන්ධතාවක් පළාත් 9 තුළ හදනවාය කියලා. දැන් ඒවා එන්නේ නැතුව මොකද වෙන්නේ? මෙහිදී ගුරුවරයාට මරණ තර්ජන එන්න පුළුවන්, මගේ දරුවාට ලකුණු දීපු ප්‍රමාණය අඩුයි, නැත්නම් මගේ දරුවා මීට වඩා දක්ෂයි ආදී වශයෙන් කියන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමිය.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
අපේ ගුරුවරුන් නොගත්තත්, අල්ලස් දෙන්න බලන්න පුළුවන්. හැබැයි, මම මේ කථා කරන්නේ ගුරුවරයාගේ පැත්තේ ඉඳලා. ඒ නිසා ඒ අයට ආරක්ෂාව ඕනෑ. මොකද, මේ ක්‍රමය තුළ ගුරුවරයා අනාරක්ෂිතයි. ඒ වාගේම දරුවාගේ පැත්තෙන් ගත්තොත්, දරුවා ගත්ත ලකුණ ගැන දරුවා ප්‍රශ්න කරන්නේ කොතැනදී ද, ගරු මන්ත්‍රීතුමා? අද වෙනකොට දරුවාට පුළුවන් re-correction දාන්න. දැන් මේ GPA එක ආවාම දරුවා තමන්ගේ ලකුණ ගැන ප්‍රශ්න කරන්නේ කොහොමද? දැන් තිබෙන ඇගයීම් ක්‍රමය ඔබතුමා දන්නවා. ත්‍රෛපාර්ශ්වික ඇගයීමක් තිබෙන්නේ. ළමයා ඉන්නවා, ගුරුවරයා ඉන්නවා, ඇගයීම්කරුවෝ ඉන්නවා. අපි දන්නවා, paper marking ගියාම එක paper එකක් දෙසැරයක්වත් බලනවා. එතකොට මේ දේවල්, මේ තිබෙන අධ්‍යාපන ක්‍රමය ඇතුළේ නැවත වතාවක් සකස් කර ගන්න ඕනෑ කියලා මම කියනවා. 43,000ක ගුරු හිඟයක් තියාගෙන මේ තක්සේරුව කරන්නේ කොහොමද කියලා මම අහනවා. විෂයට අදාළව ගුරුවරු ඉන්නවාද? මම කිව්වා වාගේ, විෂයට අදාළ ගුරුවරු නොවෙයි, උගන්වන්නේ. එහෙම නැති වුණාම සංකල්ප ටික දෙන්නේ කොහොමද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, අවසන් කරන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මට විනාඩියක් දෙන්න, මම අවසන් කරනවා.

පන්තියක ළමයි 50ක්, 60ක් ඉන්නකොට කාලච්ඡේදයක් ඇතුළත තක්සේරුව කරන්නේ කොහොමද? ඒ වාගේම අර DOලා 16,000ත් අයින් කර ගත්තොත් කොහොමද කරන්නේ? මට ලේකම්තුමාගෙන් ප්‍රශ්නයක් අහන්න ඕනෑ. සංවර්ධන නිලධාරීන් 16,000ගේ නඩුවක් තිබෙනවා, 29 වෙනිදා. නඩු තීන්දුව අනුව ඉවත් වෙන්නත් පුළුවන්, අන්තර්ග්‍රහණය කර ගන්නත් පුළුවන්. හැබැයි, ඒ නිලධාරීන්ට ඔයගොල්ලෝ යන්න කියනවා. හැබැයි, අර දවස් තුනේ පුහුණුව දීලා තිබෙනවා. එහෙම නම්, අධ්‍යාපන අමාත්‍යාංශයට අයිති නැති කණ්ඩායමක් රජයේ මුදල්වලින් පුහුණු කළේ කොහොමද? එහෙම නම්, ඔබතුමා මුදල් අවභාවිතාවක් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගැටලුව වෙලා තිබෙන්නේ ප්‍රජාව දැනුවත් කිරීම හා ප්‍රවර්ධනයයි. මේ ප්‍රතිසංස්කරණ ගැන කථාව ආරම්භ කරපු පළමු දිනයේ ඉඳලා පෞද්ගලිකවත්, ප්‍රසිද්ධියේත් අපි කිව්වා, ප්‍රජාව දැනුවත් කරන්න කියලා. Minutes අරගෙන බලන්න. එතැනින් තමයි මේ විරෝධය එන්නේ. මේ, ප්‍රතිසංස්කරණ කරන්න අවශ්‍යම යුගයක්, ඒ නිසා මේවා කරන්න ඕනෑ. විපක්ෂ නායකතුමාත්, මමත්, අපේ කණ්ඩායමේ සියලුදෙනාත් ඒ සියලු කමිටුවලදී කිව්වේ, මෙය කළ යුතුයි, හැබැයි විනිවිදභාවයකින් යුක්තව ඒ කටයුත්ත කරන්න එළියට දෙන්න කියලායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියගේ කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමිය.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
අවසාන වාක්‍ය දෙක කියන්න මට ඉඩ දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේවා ප්‍රාමාණික විද්වතුන්ට දීලා මේ පිළිබඳව නැවත සාකච්ඡාවක් කරන්න. පත්තරයක තිබෙනවා මම දැක්කා, ජනාධිපතිතුමා කියනවා, මේ සම්බන්ධව විශ්වවිද්‍යාල මහාචාර්යවරු, ආචාර්යවරු සහ විද්වතුන් එක්ක විවෘත කතිකාවක් කරලා ඉදිරියට මේකේ අඩුපාඩු හදා ගන්න ඕනෑ කියලා. ඒක හොඳයි. ලංකාවේ අය හොඳ නැත්නම් විදේශවල ඉන්නවා, NPP එක වෙනුවෙන් කටයුතු කරපු විද්වතුන්. ඒ අයට හරි මේක දෙන්න.

එහෙම නම් අවසාන වශයෙන් මම කියනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නැවැත්වූයේ විපක්ෂය නෙවෙයි කියලා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙනියන්න. වැරදි පාරේ යනකොට ඒ තැන් මොනවාද කියලා අපි සියලු කමිටුවලදී පෙන්වාදී තිබෙනවා. ඒක නොසලකා ගිය නිසා තමයි අද වරද්දා ගෙන තිබෙන්නේ. ඊයේ -21වැනි දා- සහ 13වැනි දා එතුමා සමඟ පැවති සාකච්ඡාවලදී මේ අඩුපාඩු දැකපු නිසා තමයි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නැවැත්වූයේ. එහෙම නැතිව සමගි ජන බලවේගය මේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නවත්වන්නට කිසිම විධියකින් අනුබල දෙන්නේත් නැහැ, දුන්නේත් නැහැ කියන එක මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මධුර සෙනෙවිරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.34]

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ ගෙනා යෝජනාවෙන් ඉතා සාර්ථක විවාදයක් ගෙන යන්න පුළුවන් කාලීන මාතෘකාවක් අපට ලබා දීම සම්බන්ධයෙන් ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට මම මුලින්ම ස්තුතිවන්ත වනවා. මේ මොහොතේදී සමාජය කථා කරන්නේත්, දේශපාලනය තුළ කථා කරන්නේත්, පොදුවේ කථා කරන්නේත් මෙන්න මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන. ඒ නිසා මේක තමයි peak එක. මේ මොහොත තමයි මේ ගැන වැඩිපුරම කථා වන කාලය.

අපි මේ සංවාදය කාලයක් තිස්සේ පවත්වාගෙන ආවා. අද දින විවාදයේදී අදහස් ප්‍රකාශ කරන්න සම්බන්ධ වෙච්ච සියල්ලන්ටම මම ස්තුතිවන්ත වනවා. එහිදී අපි දැක්කා, විවිධාකාර මතවාද. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කියන වචන ගත්තොත්, ඒක අපට ටිකක් අලුත් දෙයක් වාගේ පෙනුණාට, මේ මොහොතේ සාකච්ඡා වුණාට, ඉතිහාසය ගත්තොත්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නිරන්තරයෙන් වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමහර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වෙන්නේ ඓතිහාසිකව, ඒ මොහොතේ තිබෙන අවශ්‍යතාවන්ට අනුව. සමහර ප්‍රතිසංස්කරණ වෙලා තිබෙනවා, ඒ ක්‍රියාවලිය ඉස්සේ ස්වභාවිකව. ඉතිහාසය ගත්තොත්, අභයගිරිය සමයේ ඉඳලාම විශ්වවිද්‍යාලයක් විධියට තිබිලා, ඊට පස්සේ පිරිවෙන් විධියට ඇවිල්ලා, යටත් විජිත සමයේ මිෂනාරි විධියට අධ්‍යාපන පද්ධතියට ඇවිල්ලා, ඊට පස්සේ ඕල්කට් විද්‍යාල හැදිලා, 1943දී කන්නන්ගර ප්‍රතිපත්තිය එනතුරු විවිධාකාර ප්‍රතිසංස්කරණ ක්‍රියාවලි තමයි සිද්ධ වුණේ. යටත් විජිත කාලයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනිවාර්යයෙන් යොමු වන්න සිද්ධ වුණා. මේවා ගැඹුරු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ.

ඊළඟට, ප්‍රබල ප්‍රතිසංස්කරණ දෙකක් පිළිබඳව අපි කථා වනවා. එකක් තමයි, 1943දී සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහත්මයාගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය. ඒක ඒ මොහොතට අදාළව සමාජ මතය, අවශ්‍යතා, සම්පත් විෂමතා සහ සියලු දේවල් මත ගත්ත තීරණයක්. එතුමන්ගේ ජීවිත කථාව කියවලා බැලුවොත්, ඒ තීරණය ගන්න හේතුව දැකගන්න පුළුවන්. එතුමන්ගේ ළමා කාලය ගත කරපු විධියත් එක්ක ඒ අවශ්‍යතාව හඳුනා ගෙන තමයි එම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනැල්ලා තිබෙන්නේ. ඒ සමාජය හැටියට ගත්තොත්, ඒ කාලය හැටියට මේ ගත්ත පියවර ලොකු පියවරක්. ඒක ලෝකයේත් සංවාදගත වෙලා තිබෙනවා. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහත්මයාගේ ප්‍රතිපත්ති පිළිබඳව ලෝකයේත් කථා වෙනවා, එවැනි කාලයක ඒ විධියේ ප්‍රතිපත්තිමය කාරණාවක් කරන්න පුළුවන්ද කියලා. ඒ විධියට දැවැන්ත ප්‍රතිපත්තිමය වෙනසක් එදා සිදු වුණා. ඒක එකක්.

ඊට පස්සේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය වුණේ විෂය මාලාව - curriculum එක - ගැන විතරයි. අනෙක් ඒවා අවුරුදු අටෙන් අටට වුණු බව ඔබතුමාත් දන්නවා. නමුත්, ගැඹුරු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වුණේ නැහැ. මෙන්න මෙවැනි ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක අවශ්‍යතාව සමාජයේ හැදුණා. පසුගිය කාලයේ - 2018ට කලින් - අපිත් ගිහිල්ලා ජනතාව එක්ක මේ ගැන කථා කරලා තිබෙනවා. දෙමව්පියෝ කථා කරලා තිබෙනවා, විභාග බර ගැන, ඒ වාගේම පොත්පත්වල බර ගැන, අසමානතා - සමාන ප්‍රවේශ නැති වීම - ගැන, ගම්බද ඉස්කෝලවලට එක විධියක්, නගරබද ඉස්කෝලවලට තව විධියක්, ටියුෂන් ගැන, දැඩි තරගකාරිත්වය යනාදී දේවල් ගැන. මේවා තමයි සමාජයේ තිබුණු අවශ්‍යතා. මේ, සමාජය දැකපු විධිය.

හැබැයි අපි දැකපු විධිය වෙනස්. දේශපාලන ව්‍යාපාරයක් විධියට අපි මේ සමාජ අවශ්‍යතාවත් අරගෙන මේ ගැන විද්‍යානුකූලව බලලා අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය හදාගත්තා, 2018දී. ඊට පස්සේ 2024 වන විට මේ ප්‍රතිපත්ති ප්‍රකාශය නැවත වාරයක් මේ සමාජයට ගැළපෙන විධියට අපි හදාගත්තා. ඇත්තටම මේ ප්‍රතිසංස්කරණ එන්නේම මේ ප්‍රතිපත්තිය අපි සමාජයට ගෙන යන විටයි. ඒ කියන්නේ, ඒකේ පාරුව වාගේ තමයි ප්‍රතිසංස්කරණ එන්නේ. ඒ මොකක්ද? අපට මූලික දේවල් ටිකක් තිබුණා. මෙහිදී සමානාත්මතාව - සමාන ප්‍රවේශ, තිරසාර අධ්‍යාපනය, යාවජීව අධ්‍යාපනය, නවෝත්පාදන අධ්‍යාපනය වාගේ දේවල් තමයි අපේ මූලික පදනම වන්නේ. ඒවා ඉස්සේ තමයි අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පටන් ගන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි හිතන්නේ 1943දී ගෙනා කන්නන්ගර මැතිතුමාගේ ප්‍රතිපත්තීන් එක්ක, ඒ හා සමාන හෝ ඊට වඩා වැඩියෙන් ලොකු වෙනසක් මෙතැනදී සිද්ධ වෙනවා කියලා. ඇයි එහෙම වෙන්නේ? අපි ගත්තොත් මේ මොහොතට අදාළව ලොකු අවශ්‍යතාවක් සමාජයේ එනවා. ඊට පස්සේ මේකත් එක්ක අපි ගැඹුරු සාකච්ඡා පදනම් කරගෙන තමයි මෙන්න මේ ප්‍රතිසංස්කරණවලට එළඹෙන්නේ. ඉතින් විවිධාකාර කාරණා මතු වනවා, පසුගිය කාලයේ වෙච්ච ක්‍රියාවලියේ දිගුවක් විධියට. ඊළඟට කියනවා, මේක අපේ එකක් නොවෙයි කියලා. අපි කියන්නේ මෙන්න මේකයි. ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය අවුරුදු 2,000ක් විතර තිස්සේ තිබිලා තිබෙනවා. මේ අධ්‍යාපනයට කොහොමත් ඓතිහාසිකව අඛණ්ඩතාවක් තිබෙනවා. ඒ සමහර දේවල් දැනටත් තිබෙනවා, සමහර දේවල් නැති වෙලා. උදාහරණයක් විධියට ගණිතය විෂය ගත්තොත්, ඒ කාලයේ තිබුණු ගණිතය විෂයම තමයි දැනටත් තිබෙන්නේ. ඒ විෂයේ අඛණ්ඩතාවක් තිබෙනවා. අපි කරන්නේ අපේ ප්‍රතිපත්තියට අදාළව මේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය නිශ්චිත කරන එක විතරයි. මේ ගමන් මාර්ගය හදන එක විතරයි.

ඒ නිසා අපි හිතන්නේ අර විධියේ කාරණාවක් ගැනයි. ඒ මොකක්ද? මේක ගැඹුරු ප්‍රතිසංස්කරණයක්. ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයක්. ඒ නිසා එය සමාජයට විවෘත වන එක හොඳයි. ඒ ගැන සාකච්ඡා වෙන්න ඕනෑ. ඒ සාකච්ඡාවට අපි කැමැතියි. විශේෂයෙන්ම අපි බොහොම කැමැතියි, මේ constructive criticismවලට; අපි බොහොම කැමැතියි, අපට නිවැරදි කර ගැනීමට තිබෙන දේවල් සම්බන්ධයෙන් වන සාකච්ඡාවලට. අපි හිතනවා, අධ්‍යාපනය කියන කොටස, අධ්‍යාපනය කියන ක්ෂේත්‍රය සාමාන්‍යයෙන් ලෝකයේ ගත්තත් දේශපාලනයත් එක්ක පොඩ්ඩක් ව්‍යුක්තව තිබෙන්නේ කියන එක. අධ්‍යාපනය ඇතුළත දේශපාලන විද්‍යාව තිබෙන්න පුළුවන්. හැබැයි, අධ්‍යාපනය දේශපාලනීකරණය කරගෙන මේ ප්‍රතිපත්ති වෙනස් කරන්නේ නැහැ, ලෝකයේ කිසිම තැනක.

නමුත්, අපි මෙතැනදී ඉතා කනගාටුදායක තත්ත්වයක් දැක්කා. අධ්‍යාපනයේ ගැඹුරු ප්‍රතිසංස්කරණ අවශ්‍යතාවක් සමාජයේ තිබෙනවා. මෙන්න මේ ප්‍රතිසංස්කරණවලට යන ක්‍රියාමාර්ගයක් පටන් ගන්නකොට මුලින්ම මේක දේශපාලන ඉත්තෙක් කර ගන්නවා. දේශපාලනය මේකට ඔබාගෙන මේක නතර කරන්න හදපු ක්‍රියාවලියක් මම දැක්කා. මම කැමැති වුණේ නැහැ, අද මේ

කථාවට. මම කථා කරන්න කැමැති වුණේ මේ අධ්‍යාපන ප්‍රතිපත්තිය ගැනයි. නමුත් බොහොම කනගාටුයි, මේ දේශපාලන ක්‍රියාවලිය ගැනත් මට කථා කරන්න සිද්ධ වෙලා තිබෙනවා. අපි කියන්නේ මෙන්න මෙහෙම කාරණාවක්. ඔබතුමන්ලා ඕනෑ දෙයක් කරන්න. අපි දේශපාලනය කරනවා. ඔබතුමන්ලා, ඔබතුමියන්ලා හැම දාම විපක්ෂයේ දේශපාලනය කළා. අපි දන්නවා, මැකියාවෙලි සහ සන් ට්සු වැනි අය මේ සම්බන්ධව නොයෙක් අදහස් ඉදිරිපත් කර තිබෙන බව. මැකියාවෙලි කියලා තිබෙනවා, "දේශපාලන අවශ්‍යතාවන් හැමදේම ගන්න. ප්‍රතිවාදීන් හැම වෙලාවේම සුනු විසුනු කරන්න" කියලා. නමුත්, අධ්‍යාපනයට විතරක් දේශපාලනය ගන්න එපා. හේතුව මෙයයි. අපි ඔක්කෝම සමාජය. මේක වෙනස් කරන්නේ සමාජය. මේ පොඩි වෙනසක් සමාජයට ලොකුවට බලපානවා. පොඩ්ඩක් ඒ ගැන හිතන්න. 6 ශ්‍රේණිය ඉංග්‍රීසි මොඩියුලයේ ඒ පිටුවේ තිබුණු කොටස විතරක් අරගෙන කොච්චර දේවල් කිව්වාද? අගමැතිතුමියගේ පෞද්ගලික ජීවිතය පවා විවේචනය කරන තත්ත්වයට පත් වුණා. මේ කාරණාව සම්බන්ධයෙන් සමාජය තුළ අපි දැක්කේ බොහොම ව්‍යාකූල තත්ත්වයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

බොහොම ස්තුතියි. මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි මේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය නවත්වා නැහැ. මේක 6 ශ්‍රේණිය ඉංග්‍රීසි මොඩියුලයේ තිබුණු ප්‍රශ්නයක්. අපි මේක 7 ශ්‍රේණියට ගෙන යනවා. 1 ශ්‍රේණිය පටන් ගන්නවා, ජනවාරි 29වැනි දා.

මෙහිදී අපි කුලුනු පහක් ගැන කථා කරලා තිබෙනවා. ඒ යටතේ මානව සම්පත්, විභාග කටයුතු, පරිපාලනමය වෙනස්කම්, ජනගත කිරීම් කියන ඒ සියල්ල සිදු වෙනවා. ඒ සියල්ල අපි නවත්වා නැහැ. ඒ සියල්ල සිදු වෙනවා. ඉංග්‍රීසි මොඩියුලය කොටස විතරක් පරක්කු කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත්, මේ ක්‍රියාවලිය අපි පොඩ්ඩක්වත් වෙනස් කරන්නේ නැතුව කරගෙන යනවා. හැබැයි, මේක සුරක්ෂිතයි කියන බව ජනතාවට අපි තහවුරු කළ යුතුයි. එහෙම නැත්නම් මේක ජනතාව පිළිගන්නේ නැහැ. වෙන දෙයක් දෙන්න පුළුවන්. වෙන ඕනෑම දෙයක් ගැන කථා කරන්නත් පුළුවන්. හැබැයි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ දෙමව්පියන් පිළිගන්න ඕනෑ; ළමයි පිළිගන්න ඕනෑ; ගුරුවරු පිළිගන්න ඕනෑ. ඒක නිසා මේකේ විශ්වසනීයත්වයක් තිබෙන්න ඕනෑ. හැබැයි, විපක්ෂය විසින් මේ වපුරන දේවලුත් එක්ක ඒ විශ්වාසය ටිකෙන් ටික බිඳුණා වුණත්, අද ගමකට ගිහිල්ලා මේ ගැන කථා කරලා බලන්න. "අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධයි" කියලා තමයි ඔබතුමන්ලා කියන්නේ. නමුත්, ජනතාව දැන් සත්‍යය තේරුම් ගනිමින් සිටිනවා. ඒ නිසා අපි ඔබතුමන්ලාට කියන්නේ, එවැනි මතවාද අමතක කරන්න කියායි. අධ්‍යාපනය කියන කාරණයේදී දේශපාලනය, දේශපාලන විද්‍යාවට විතරක් සීමා කර ගන්න. මේක සමාජ වගකීමක් විධියට හිතන්න. කවදා හරි වෙනස් වුණොත් ඒ වෙනස් වෙන්නේ මේ හැමෝගේම දූ දරුවන්ගේ ජීවිත. ඒ දරුවන්ගේ ජීවිත වෙනස් වුණොත් අපි හැමෝටම හොඳයි. අද ලෝකයේ සංවාද කරන්නේ සිද්ධිය පිළිබඳව නොවෙයි, ප්‍රතිපත්තිය පිළිබඳවයි. අපි ඒකට බොහොම කැමැතියි. සිද්ධි එපා. ප්‍රතිපත්ති විවේචනවලට අපි බොහොම කැමැතියි. සිද්ධියත් තිරශ්චීන විධියට අරගෙන කරන විවේචන හින්දා මේ විශ්වසනීයත්වය නැති වුණොත් නැවතත් මොකක්ද වෙන්නේ? අපට ඒ සම්බන්ධයෙන් උදාහරණ තිබෙනවා. නමුත්, මම ඒවා ගැන කියන්න කැමැති නැහැ. එහෙම වුණොත් ඒ තත්ත්වයට පත් වෙන්න පුළුවන්. ඒක නිසා බොහොම ප්‍රවේශමෙන් හිතලා, කට පාවිච්චි කරන්න. මම කියන්නේ, ඒවා ගැන අහලා, හිතලා කථා කරන්න කියලායි.

මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පොඩ්ඩක්වත් නවත්වන්නේ නැහැ කියන එක අපි කියනවා. ඒක අපි දිගටම කරගෙන යනවා. අපි කාලයක් තිස්සේ ඒ වෙනුවෙන් මහන්සි වුණා. අපි දේශපාලන ව්‍යාපාරයක් විධියටත් ඒ වෙනුවෙන් අවුරුදු ගණනාවක් මහන්සි වුණා. අපි මේක අතට ගත්තේ නොකර ඉන්න නොවෙයි. අපි ජනතාවට ප්‍රතිඥා දෙනවා, මේ ක්‍රියාවලිය දිගටම කරනවා, නවත්වන්නේ නැහැ කියලා. ඒ නිසා අපි ජනතාවට කියන්නේ මෙච්චරයි. ඔබ අපිත් එක්ක හිට ගන්න, අප ඒ කටයුත්ත කරනවා. මොන දේ වුණත් ගඟ ගලාගෙන යනවා. ඒ වාගේ අපි ඒ කටයුත්ත කරනවා. ඒක නිසා අපි මේ කාලය ටිකක් හුස්මක් අරගෙන ගත කරමු, මේ සිද්ධිය පිළිබඳව අධ්‍යයනය කරන්න. සමහර දේවල් වෙනස් වෙනවා. ගතිකයි. ඒවා වෙනස් කර ගන්න පුළුවන්. ඒක නිසා මේ කාලය අපි ගත කරනවා, සමහර දේවල් වෙනස් කර ගන්න; අදහස් ලබා ගන්න; මේ ගැන මොකක්ද වෙන්නේ කියලා ජනතාවට තව පුළුල්ව කියන්න. අපි ඒකට කැමැතියි. ඒක නිසා අපි ඒ අවස්ථාවත් පාවිච්චි කරනවා. ඒවායෙනුත් අපි ඉගෙන ගන්නවා. ඉගෙන ගනිමින් අපි ඉදිරියට යනවා. අපිත් ඉගෙන ගන්නවා. අපි කියන්න කැමැතියි, අපිත් ඉගෙන ගන්නවාය කියන එක. අපිත් ඉගෙන ගනිමින් තමයි ඉදිරියට යන්නේ. අපි බොහොම විවෘතයි. ඒ නිසා මේ ක්‍රියාවලිය පොඩ්ඩක්වත් අපි නවත්වන්නේ නැහැ. මොකද, මේක අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විතරක් නොවෙයි. ජනතාවට අවශ්‍ය ප්‍රතිපත්තිය දෙන්නේ මෙතැනින්.

තිරසාර ප්‍රතිපත්තියක් ලංකාවේ කිසිම දෙයකට තිබුණේ නැහැ. තිරසාර ප්‍රතිපත්තියක් පටන් ගත්තා විතරයි. රේල් පීල්ලක් මත යන්නේ. ආණ්ඩු මාරු වෙනකොට මෙවැනි රේල් පීල්ලක් තිබුණේ නැහැ. අපි තමයි මේ රේල් පීල්ල හදන්නේ. ඔළු ගෙඩි මාරු වුණාට නැවත ප්‍රතිපත්ති මාරු වෙන්නේ නැති විධියට විද්‍යානුකූලව අපි එය වෙනස් කරමු. අපි එහෙම කරමු. අපි මේ ගමන ඉදිරියට යනවා. අපි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ජනතාව වෙනුවෙන් වග වන බව කියමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි, මට කථා කරන්න කාලය ලබා දුන්නාට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.47ට, 2026 ජනවාරි 23වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.47க்கு, பாராளுமன்றம் 2026 சனவரி 23, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.47 p.m. until 9.30 a.m. on Friday, 23rd January, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.